

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ

# මළගිය ඇත්තෝ සාක්කි දෙති !

ෂර්ලොක් හෝම්ස් කථා

චන්දන මෙන්ඩිස්

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# මළගිය ඇත්තෝ සාක්කි දෙති !

(1900 – 1927 දක්වා ස්ට්‍රැන්ඩ් සඟරාවේ පළවූ චිත්‍ර 30 ක් සමඟ)



Reading Purpose Only, Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


1. අභිරහස් ළමා කොල්ලය — 9
The Adventure of the Priory School

2. මළගිය අයත් සාක්ෂි දෙති ! — 68
The Adventure of the Devil's Foot

3. අතුරුදන් වූ සිටුවරිය — 115
The Disappearance of Lady Frances Carfax

4. රන් උපැස් යුගල — 154
The Adventure of the Golden Pince - Nez

5. මරු කැඳවූ ලියුම — 197
The Adventure of the Gloria Scott

6. පාපැදියේ රූමතිය — 234
The Adventure of the Solitary Cyclist



Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



ලෝහිත පරීක්ෂණය සඳහා ජෝර්ජ් හචිංසන්
නිර්මාණය කළ චිත්‍රය.

http://sherlockholmesinvestigations.blogspot.com



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# අභිරහස් ළමා කොල්ලය

බේකර් වීදියේ අපේ නිවහන වෙත පැමිණි අනුග්‍රාහකයින් වෙතින් නිරූපණය වූ නාට්‍යමය අවස්ථා බොහොමයකි. එහෙත්, එම්. ඒ., පී. එච්. ඩී. ආදී පශ්චාත් උපාධි රාශියක හිමිකරුවා වූ ආචාර්ය තෝනික්‍රොෆ්ට් හක්ස්ටබල් මහතා අපේ නිවහනට ඇතුළු වූ මොහොතේ වූ සිදුවීම, සුවිශේෂී එකක් ලෙස මගේ මතකයේ රැඳී ඇත.

ඔහු අපේ විසිත්ත කාමරයට ඇතුළු වූ පසු දොර වසා දැමුවා පමණි. මඳක් පැත්තකට ඇල වී මේසයට හේත්තු වූ ඔහු, එසැවරම කපා හෙළූ ගසක් මෙන් බිම ඇද වැටුණේය. මෙම ක්ෂණික සිදුවීමෙන් අපි තුෂ්ණිම්භූත වූවෙමු. එසැවරම නැගී සිටි හෝම්ස් කොට්ටයක් ගෙන හක්ස්ටබල් මහතාගේ හිසට තැබුවේය. මම බ්‍රැන්ඩි බෝතලය ඔහුගේ දෙතොලට ළං කළෙමි.

ආචාර්ය හක්ස්ටබල්ගේ අළු වැටුණු, සුදුමැලි වූ මුහුණෙන් පැවසුණේ ඔහු මෑතක සිට බරපතල ගැටලුවකට මුහුණ දී ඇති බවයි. දින කිහිපයක් එක් රෑ නිදි නොලබා සිටීමෙන්, දෑස් වටා අළු පැහැ ගැන්වී තිබිණ. නොකැපූ රැවුල් කොට හා නොපීරූ හිස කෙසින් තහවුරු වූයේද නොවිසඳුණු ගැටළුවයි. දූහුවිලි හා තෙල් කුණු තැවරුණු කමිස කර, ඔහු බොහෝ දුරබැහැරක සිට අප වෙත පැමිණි අයෙකු බව කියාපෑවේය.

'මේ විදියට ඔහු ඇද වැටුණේ මොකක් නිසාද වොට්සන්?'
හෝම්ස් ඇසීය.

'අධික වශයෙන් තෙහෙට්ටුවට පත්වීම, සමහරවිට තද කුසගින්නක් සමග ඇතිවූ විඩාව වෙන්නත් පුළුවනි.' හක්ස්ටබල්ගේ නාඩි පරීක්ෂා කර බැලූ මම පැවසීමි.

ඔහුගේ කබායේ උඩ සාක්කුවෙන් එළියට මතුවී තිබුණු දුම්රිය ටිකට් පත හෝම්ස් අතට ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

'උතුරු එංගලන්තයේ මැකල්ටන් ඉඳලා ලන්ඩනයට ඒමට සහ ආපසු යාමට වලංගු ටිකට් පතක්. තවම දවල් දොළහ උණේ වත් නෑ. ඔහු මෙහේ එන්න පිටත් වෙන්න ඇත්තේ බොහොම පාන්දරින්'

රැලි වැටුණු ඇසිපිය අතරින් අප සමග යොමු වූයේ අළු පැහැති නෙත් යුවලකි. ඒ දැප් හිස් බැල්මෙන්, මඳ වේලාවක් අප වෙත යොමු වී තිබිණි. අනතුරුව ලැජ්ජාවෙන් රතු වූ ඔහු නැගිටීමට උත්සාහ කළේය.

'මගේ මේ දුර්වලකම ගැන මට සමාවෙන්න හෝම්ස් මහත්මයා. මගේ හිත, ඊමණට වැඩිය කැළඹීමට පත්වෙලයි තියෙන්නෙ. මට කන්න විස්කෝතුවකුයි බොන්න කිරි වීදුරුවකුයි ලැබුණොත් මේ අමාරුව ඔක්කොම හරියාවි. අනේ ඔබට බොහොම ස්තූතියි.'

හෝම්ස් මහත්මයා, මේ වැඩේට මමම පිටත් වෙලා ආවෙ ඔබතුමාව ආපසු එක්කගෙන යන්න බලාපොරොත්තුවෙන්. මේ ගැටළුව කොයි තරම් සංකීර්ණ එකක්ද කියන එක ඔබට ඒත්තු ගන්වන්නෙ කොහොමද? ඒක මොන විදියේ විදුලි පණිවුඩයකින්වත් මට කරන්න බැරි බව මං දැන හිටියා.

'ඔබේ අසනීප ගතිය ටිකක් අඩුවුණාම................'

'නෑ. මට දැන් සනීපයි! 'මං මේ විධියට දුර්වල වුණේ කොහොමද කියලා මට හිතාගන්නවත් බෑ. ඊළඟ දුම්රියෙන් මාත් එක්ක, ඔබ මැකල්ටන් නගරයට යාවි කියල මං විශ්වාස කරනවා හෝම්ස් මහත්මයා'

'මේ මගේ මිත්‍රයා දොස්තර් වොට්සන්. ඔහු ඔබට කියාවි අපි මොන තරම් අවිවේකීද කියල. ෆෙරර්ස් ලියවිලි සම්බන්ධ පරීක්ෂණය මට භාරවෙලයි තියෙන්නේ. ඊළඟට ඇබර්ගැවනි මිනීමැරුම් නඩුවත් දැන් කොයි මොහොතේ හරි විභාගයට ගැනේවි. මේ වෙලාවේ අතිශයින්ම වැදගත් පරීක්ෂණයකට මිසක් වෙන එකකට මට ලන්ඩනයෙන් පිටවෙන්න විදියක් නෑ.

Reading Purpose Only For Print

'අතිශයින්ම වැදගත්? හෝල්ඩනස් ආදිපාදවරයාගේ එකම පුත්‍රයා පැහැරගෙන යෑම ගැන එහෙනම් ඔබට තවමත් අහන්න ලැබුණේ නැද්ද?'

'මොනවා? අර හිටපු කැබිනට් ඇමතිවරයාගේ?'

'අන්න හරි. අපි ඒක පුවත්පත් වල පළනොවී තියාගන්න උත්සාහයක් දැරුවා. නමුත් ඊයේ රෑ 'ග්ලෝබ්' පුවත්පතේ මේක ගැන දුසමාන ආරංචියක් පළවුණා. මං හිතුවා ඒක ඔබට අහන්න ලැබෙන්න ඇති කියලා.'

තම විමර්ශන විශ්වකෝෂය තැන්පත් කොට තිබූ රාක්කය වෙත අත දිගු කළ හෝම්ස්, එහි 'H' අකුර සඳහන් පොත ඉවතට ගත්තේය.

'හෝල්ඩනස්-හයවැනි ආදිපාදවරයා, නයිට් පදවි නාමධාරී. ප්‍රිවි කවුන්සිලයේ සාමාජික.................. තව තියෙනවා නම්බු නාම, තනතුරු රාශියක්................ බෙවර්ලි හි වංශාධිපති. කාස්ටන් හි ප්‍රභුවරයා. 1900 සිට හැලම්ෂයර්හි ලෙෆ්ටිනන්ට් උතුමාණන්. සර් චාල්ස් ඇපල්ඩෝර් ගේ දියණිය, එඩිත් සමග 1888 දී විවාහ විය. සියලුම තනතුරු වලට උරුමකරු වීමට ඔහුට ඇත්තේ එකම දරුවෙක් - පුතෙක් පමණි. ඔහු සැල්ටයර් සාමිවරයා වශයෙන් හැඳින්වෙයි. ආදිපාදවරයා සතු ඉඩම් ප්‍රමාණය අක්කර දෙලක්ෂ පනස්දහසක් පමණ වේ. මෙයට ලැන්කැෂයරයේ හා වේල්සයේ ඛණිජ ලවණ පතල් අඩංගු ඉඩම් ද ඇතුළත්ය. ලිපිනයන්: කාල්ටන් ටෙරස් මන්දිරය, හැලම්ෂයර්හි හෝල්ඩනස් මන්දිරය, වේල්සයේ කාස්ටන් මාලිගය. 1872 දී නාවික ඒස්නාධිනායක තනතුරට පත්විය. ප්‍රධාන රාජ්‍ය ලේකම් තනතුරට පත්වූයේ................

'ඒ මදෑ. මේ මනුස්සයා රජ පවුලේ බොහෝම සමීප ඥාතියෙක්.'

'ඒ වගේම හෝම්ස් මහත්මයා, ඔහු බොහෝම ධනවත් කෙනෙක්. මට අහන්න ලැබුණා, ගැටළු විසඳීමට ඇති ආශාව නිසාම ඔබ, රහස් පරීක්ෂණ විසඳන්න භාරගන්නවා කියල.

නමුත් මං ඔබතුමාට මතක් කරන්න කැමැතියි ආදිපාදතුමා දැනටමත් නිවේදනය කරලා තියෙනවා, ඔහු පිරිනමන තෑගි ගැන. ඔහුගේ පුතා සිටින තැන ගැන ආරංචියක් දෙන කෙනෙකුට රන්පවුම් පන්දහසක තෑග්ගක්. ළමයා පැහැර ගැනීම කළ පුද්ගලයාගේ නම දැනුම් දෙන කෙනෙකුට පවුම් දහසක තෑග්ගක්."

"රාජකීය තෑග්ගක්" හෝම්ස් කීය.

"මට හිතෙන්නේ වොට්සන් ආචාර්ය හක්ස්ටබල් එක්ක අපි උතුරු එංගලන්තය බලා පිටත්ව ගියොත් හොඳයි කියලයි.

ආචාර්ය හක්ස්ටබල් මහත්මයා, ඔබතුමා ඔය කිරි ටික බීල අවසන් කරලා, මට මෙන්න මේ කාරණා ටික පහදලා දෙන්න. සිද්ධවෙලා තිබෙන්නෙ මොකක්ද? කවදාද ඒක සිද්ධවුණේ? කොහොමද ඒක වුණේ? ඊළඟට මට කියල දෙන්න මැකල්ටන් නගරයට තුදුරු ප්‍රාථමික පාසලේ ආචාර්ය හක්ස්ටබල් කොහොමද මේකට සම්බන්ධ වෙන්නෙ? ඒ විතරක් නෙමෙයි. සිද්ධිය වෙලා දින තුනක් ගතවී ඇති බව ඔබේ නිකට දිහා බැලුවාම මට කියන්න පුළුවනි. ඉතින් මගේ සේවය ලබාගන්න එක, දින තුනක් පමා කළේ ඇයි කියලත් කියන්න."

විස්කෝතු හා, කිරි බී අවසන් වනවිට, අපේ අනුග්‍රාහකයාගේ මුහුණ යථා තත්ත්වයට පත්විය. සියල්ලම හොඳින් පැහැදිලි කිරීමට ඉන්පසු ඔහු දැඩි උත්සාහයක් දැරුවේය.

"මහත්වරුනි. මං ඔබට සඳහන් කරන්න කැමතියි මේ ප්‍රාථමික පාසල, මූලික පුහුණු පාසලක් බව. එහි නිර්මාතෘ මෙන්ම අධිපතිවරයාත් මමයි. 'රෝම කිවි හෝරේස්ගේ කාව්‍ය පිළිබඳ විචාරයක්' යන පොත ලියූ හක්ස්ටබල් මා බව කිව්වොත් ඔබට සමහර විට මා ගැන මතක් වේවි. මගේ පාසල තමයි මුළු එංගලන්තයේම තිබෙන ඉතාම ඉහළම මූලික පුහුණු පාසල. ලිවර් ස්ටෝක් සාමිවරයා, බ්ලැක්වෝටර් ආදිපාදතුමා, ශ්‍රීමත් කැත්කාට් සෝම්ස් වැනි පුද්ගලයින් පවා ඔවුන්ගේ දරුවන් නිසිමග යැවීම භාරදීල තියෙන්නේ මටයි. සති තුනකට කලින් හෝල්ඩනස්

Peradeniya Purpose Only. Not For Print.

ආදිපාද තුමා ඔහුගේ දහහැවිරිදි පුතා - සැල්ටයර් සාමි මගේ භාරයට පත්කරන්න තීරණය කළ බව ඔහුගේ ලේකම් ජේම්ස් වයිල්ඩර් අතේ දන්වල එව්වා. එතකොට තමයි මට හිතුණේ, මගේ පාසල, එවැන්නකට ලැගාවෙන්න පුළුවන් ඉහළම තත්ත්වයට ඇවිත් කියල. නමුත් මේ කාරණාව නිසා, මට මගේ ජීවිතේ ඉතාම අවාසනාවන්ත පරාජයට මුහුණ දෙන්න වේවි කියල, එද නිකමටවත් හිතුණේ නැහැ.

ගිම්හාන සැතුවේ පාසල් වාරය පටන් ගත්තේ මැයි පළමුවෙනිද. ඉනින් නියමිත පරිදි මේ ළමයා එද අපේ පාසලට බැදුණා. ඔහු ඉතා හොද දරුවෙක්. අපේ පාසලේ නීතිරීති, සිරිත් විරිත් වලට ඔහු ඉතා ඉක්මනට හැඩගැසුණා. මට දැනගන්න ලැබී තිබුණු කාරණා වල හැටියට, ඔහුට ගෙදර ගතකරන්න තිබුණේ එතරම් සතුටුදායක පරිසරයක් නොමෙයි. ආදිපාදතුමාගේ විවාහ ජීවිතය සාමකාමී එකක් නොවූ බව විවෘත රහසක්. ඒක කෙළවර වුණේ දෙදෙනාගේම කැමැත්තෙන් නීත්‍යානුකූලව වෙන්වීමෙන්. ඉන්පස්සේ ආදිපාදතුමිය එංගලන්තයෙන් පිටවෙලා ගිහිං ප්‍රංශයේ පදිංචි වුණා. මේක බොහොම ළඟදියි සිද්ධවුණේ. දරුවා වැඩියෙන්ම ආදරයෙන් හිටියේ අම්මට කියලයි අපට ආරංචි වුණේ. අම්මා ගෙදරින් පිටවෙලා ගියාට පස්සේ පුතා බොහොම කණස්සල්ලෙන් කාලය ගතකළ බවත්, ඒ නිසා ඔහුව මගේ භාරයට එවන්න ආදිපාදතුමා තීරණය කළ බවත් මට දැනගන්න ලැබුණා. සති දෙකක් ගතවෙද්දී දරුවා අපේ සිරිත් විරිත් වලට පුරුදු වුණා. අපට පෙනුණේ ඔහු බොහොම සතුටින් කාලය ගතකළ බවයි.

ඔහු අන්තිම වරට දකින්න ලැබුණේ මැයි 13 ද රාත්‍රියේ. ඒ කියන්නේ ගිය සදුද රෑ. ඔහුගේ කාමරය තියෙන්නේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ දෙවැනි තට්ටුවේ. ඒ කාමරයට යා යුත්තේ වඩාත් විශාල කාමරයක් හරහා. මේ කාමරයේ ළමුන් දෙදෙනෙක් නිද හිටියා. මේ ළමයින් දෙදෙනාට කිසිදෙයක් අහන්න ලැබුණේ වත් දකින්න ලැබුණේ වත් නැහැ. ඒ නිසා අපට හිතාගන්න පුළුවනි, සැල්ටයර් සාමි ඒ කාමරය හරහා ගමන්

http://sherlockholmesinvestigations.blogspot.com

නොකළ බව. ඔහුගේ කාමරයේ ජනේලය විවෘතව තිබුණා. මේ ජනේලය ළඟටම ශක්තිමත් අතු විහිදුණු, අයිවි මල් පඳුරක් තිබෙනවා, බිම මට්ටමේ සිටම. එතැන බිම ළමයාගේ අඩි සටහන් කිසිවක් අපට දකින්න ලැබුණේ නෑ. ඒ වුණත් කාමරයෙන් පිටවී යන්න තිබෙන එකම මාර්ගය මේක බවට කිසිම සැකයක් නෑ.

ළමයා නොමැති බව අපි දැනගත්තේ අඟහරුවාදා උදේ හතට පමණ. ඔහු ඇඳේ නිදාගෙන තිබෙන බවට සලකුණු තිබුණා. පිටවී ගිහින් තියෙන්නේ සම්පූර්ණ පාසල් නිල ඇඳුමෙන් සැරසිලයි. ඒ කියන්නේ තද අළු පැහැති දිග කලිසම සහ ඊටන් විදුහල් මෝස්තරයේ කළුපාට කබාය. කාමරයට කවුරුන් හෝ බලෙන් ඇතුළු වූ බවට කිසිම සලකුණක් නෑ. කෑගැසීමක් හෝ පොර බැදීමක් පැවැති බවට සාක්ෂියකුත් නෑ. ඒ මොකද අල්ලපු කාමරේ නිද හිටි වැඩිමල් ළමයා කොන්ටර් එතරම් තදින් නින්ද යන කෙනෙක් නෙමෙයි. එවැන්නක් තිබුණා නම් ඔහුට ඇහෙනවා.

සැල්ටයර් සාමි අතුරුදහන් වී ඇති බව දැනගත් වහාම, මම මුළු නේවාසිකාගාරයේම ළමයි, ගුරුවරු හා සේවකයින් රැස්කළා. එතකොටයි මට දැනගන්න ලැබුණේ, මේ ළමයා පමණක් නෙමෙයි, ගුරුමහත්මයෙකුත් අතුරුදහන් වී ඇති බව. ඒ, ජර්මන් ජාතික හෙයිඩෙගර් නම් ගුරුමහත්මයා. ඔහුගේ කාමරය තිබෙන්නෙත් ගොඩනැගිල්ලේ දෙවැනි තට්ටුවේමයි, නමුත් අනිත් කෙළවරේ. ඒ වගේම සැල්ටයර් සාමිගේ කාමරයේ ජනේලය මුහුණදල තිබෙන පැත්තටමයි ඔහුගේ කාමරයේ ජනේලයත් මුහුණදල තිබෙන්නේ. ඔහුත් ඇඳේ නිදාගත් බවට සලකුණු තිබුණා. ඔහු පහළට බැහැල තියෙන්නෙත් අයිවි පඳුර දිගේ බවට කිසිම සැකයක් නෑ. ඒ මොකද මල් පඳුර ළඟ බිම, ඔහුගේ අඩි සටහන් පැහැදිලිවම වැදිලා තිබුණා. ඔහුගේ බයිසිකලය සාමාන්‍යයෙන් නවත්වා තිබෙන්නේ අසල තිබෙන මඩුවක. ඒ බයිසිකලයත් අතුරුදහන් වෙලා.

හෙයිඩෙගර් මහත්මයා අපේ පාසලට බඳවාගෙන දැන් අවුරුදු දෙකක් වෙනවා. ඔහු ඉදිරිපත් කළ සහතික ඉතාම ඉහළ ඒවා. නමුත් ඔහු ශිෂ්‍යයින් අතරවත්, ගුරුවරුන් අතරවත් ජනප්‍රිය

පුද්ගලයෙක් නෙමෙයි. ඔහු බොහෝම නිශ්ශබ්ද, රළු පෙනුමක් සහිත පුද්ගලයෙක්. මේ දෙදෙනා ගැන තවමත් කිසිම ආරංචියක් නෑ. බ්‍රහස්පතින්ද උදේ වෙන කොටත් අපි දන්නේ, අඟහරුවාද උදේ අප දැන සිටි තරමමයි.

එද අපි වහාම හෝල්ඩනස් මන්දිරයට දැනුම්දීලා, හොයා බැලුවා. මන්දිරය පිහිටා තිබෙන්නේ පාසලට සැතපුම් කීපයක් ඈතින්. ඉතින් අපි හිතුවේ දරුවාට ගෙදර මතක්වෙලා සාංකාවෙන් එක්වරම පියා හොයාගෙන යන්න ඇති කියලා. නමුත් ඔවුන් දරුවා ගැන කිසිම දෙයක් දන්නේ නෑ. ආදිපාදතුමා නම් ඉන්නේ මේ ගැන බොහොම කලබල වෙලා. ඉතින් මා ඉන්නේ මොන තරම් මානසික කම්පනයකින්ද කියලා ඔබට පෙනෙනවා ඇති හෝම්ස් මහත්මයා. මං අහල තියෙනවා ගැටළු විසඳීමට ඔබට සුවිශේෂ හැකියාවක් තියෙනවා කියල. මේ ප්‍රශ්නය විසඳීමට ඔබේ ඒ සම්පූර්ණ දක්ෂතාවයම යොදන්න කියලා මං ඔබට ආයාචනා කරනවා. මේ වගේ ගැටළුවක් නම් ඔබට ජීවිත කාලෙටම ලැබෙන එකක් නෑ.'

විද්‍යාලයාධිපතිතුමා කළ විස්තරයට හෝම්ස් ඉතා සාවධානව සවන් දුන්නේය. ඉතාම සංකීර්ණ, අසාමාන්‍ය ගැටළු විසඳීමට ප්‍රියකළ ඔහු, මේ පරීක්ෂණය සඳහා යෙදවීමට කිසිදු පෙළඹවීමක් හෝ ආයාචනයක් අවශ්‍ය නොවේ. සටහන් පොත අතට ගත් ඔහු, එහි යමක් සටහන් කළේය.

'මීට කලින් ඔබ මා හමුවෙන්න ආවෙ නැති එක, ඔබේ වගකීම පැහැරහැරීමක්. මට මේ පරීක්ෂණය පටන් ගන්න වෙලා තියෙන්නේ හෝඩුවාවල් බොහොමයක් අතින් ලිස්සලා ගියාට පස්සේ. නිදසුනක් වශයෙන් අර අයිවි මල් පඳුරේ සහ එතැන බිම, පැහෙන්න සාක්ෂි තිබෙන්න ඇති. ඒ කිසිවක් විශේෂඥ නිරීක්ෂකයෙකුට නම් මඟ හැරෙන්නේ නැහැ.'

'ඒකෙ වැරැද්ද මා අතේ නෙමෙයි හෝම්ස් මහත්මයා. මේ කාරණාව ප්‍රසිද්ධියට පත්වෙනවට ආදිපාදතුමා පොඩ්ඩක්වත් කැමැති වුණේ නෑ. ඔහුගේ පවුලේ තිබෙන අර්බුදය ලෝකයා

හමුවේ එළිදරව් වෙයි' කියලා ඔහු හරිම භයයි'

'මේ පිළිබඳ පොලිස් පරීක්ෂණයක් පැවැත්තුවද?'

'ඔව් මහත්මයා, නමුත් ඒක සම්පූර්ණයෙන්ම අසාර්ථක බවයි පෙනෙන්නෙ. මුලින්ම අපට පොඩි හෝඩුවාවක් ලැබුණා. ළඟම තියෙන දුම්රිය පොළේදී පිරිමි ළමයෙක් හා තරුණයෙක් උදේ පාන්දරින්ම පිටත්වෙන දුම්රියකට නගිනවා කෙනෙක් දැකලා තිබුණා. මේ ගැන පොලීසියට වාර්තා වුණා. ඔවුන් වැඩිදුර හොයා බැලුවා. ඒ දෙදෙනා ලිවර්පූල් වලින් සොයා ගැනීමට හැකි වුණා. ඔවුන් මේ සිද්ධියට සම්බන්ධ අදාල පුද්ගලයින් නොවන බව, ඊයේ රාත්‍රී තමා දැනගත්තේ. මේ විදියට අපේ සියලුම බලාපොරොත්තු නැතිවුණා. ඊයේ රාත්‍රියේ මට මොහොතක් වත් නින්ද ගියේ නෑ. එතකොටයි මං තීරණය කළේ, උදේ පාන්දරින්ම එන දුම්රියේ ඔබව හමුවෙන්න ලන්ඩනයට එන්න.'

'වැරැදි ආරංචියක් පස්සෙ හොයා බලද්දී පරීක්ෂණයේ වැඩකටයුතු එහෙමම අත්හැර දමන්නැ ඇති?'

'ඔව්. සම්පූර්ණයෙන්ම අත්හැර දැම්මා'

'ඒ කියන්නේ දවස් තුනක් සම්පූර්ණයෙන්ම අපතේ ගියා. මේ පරීක්ෂණය කෙරිලා තිබෙන්නේ ඉතාම අසතුටුදායක විදියට'

'මටත් එහෙම හිතෙනවා හෝම්ස් මහත්මයා. ඒක මං පිළිගන්නවා'

'කොහොම හරි මේ ගැටළුවට විසඳුමක් තිබිය යුතුයි. ඒක හොයන එක මං කැමැත්තෙන් භාරගන්නම්. මේ ළමයාත්, ජර්මන් ගුරුවරයාත් අතරේ තුමක් හෝ සම්බන්ධතාවයක් තිබුණාද?

'එවැනි කිසිම දෙයක් දැනගන්න ලැබුණෙ නෑ'

'ළමයා ඉගෙන ගත්තේ මේ ගුරුවරයාගෙ පංතියේද?'

'නෑ. මං දන්න තරමින් ඔහු මේ ගුරුවරයා එක්ක වචනයක්වත් කතා කරලා නෑ.

Reading Purpose Only Not For Print
...investigations.blogspot.com

'එහෙම නම් හරි පුදුමයි. ළමයාටත් බයිසිකලයක් තිබුණාද?'

'නැහැ'

'තව කාගෙ හරි බයිසිකලයක් නැතිවෙලාද?

'ඒත් නැහැ'

'ඒක හොඳටම විශ්වාසද?'

'ඔව්.'

'එහෙම නම් ඔබ අදහස් කරන්නේ, මේ ජර්මන් ජාතිකයා, ළමයාත් ඔසවාගෙන, ඔහු ගේ බයිසිකලයෙන් පිටවී ගියා කියලද?'

'සත්තකින්ම. නැහැ'

'එහෙම නම් ඔබේ අදහස මොකක්ද?'

'මං හිතන්නේ බයිසිකලය අතුරුදහන් කරලා තියෙන්නේ අපව නොමග යැවීමට. ඒක කොහේ හරි හංගලා ඇති. දෙන්නම පයින්ම ගමන් කරලා කියලයි මට හිතෙන්නෙ.'

'ඔව්. නමුත් ඒක ඒ තරම් නැණවත් නොමග යැවීමක් කියන්න බැහැ නේද? මේ මඩුවේ තවත් බයිසිකල් තිබුණාද?'

'ඔව්. තව හුඟාක් තිබුණා.

'අපව නොමග යවන්න අදහසක් තිබුණා නම් ඔවුන් බයිසිකල් දෙකක්ම සඟවාවී කියල ඔබට හිතෙන්නේ නැද්ද?'

'ඔව්. මට ඒකටත් එකඟවෙන්න පුළුවනි'

'අන්න හරි. මේ නොමග යැවීමේ උපකල්පනයක් මෙතැනට එන්නේ නැහැ. නමුත් ඒක අපේ පරීක්ෂණය ආරම්භ කරන්න සුදුසු කාරණාවක්. ඒ මොකද බයිසිකලයක් කියන එක ලෙහෙසියෙන් හංගලා තියන්න පුළුවන් එකක් නෙමෙයි. මේ

සිද්ධිය වුණු දවසට කලින් දවසෙ මේ ළමයා හමුවෙන්න කවුරුවත් ආවද?'

'නැහැ'

'ඔහුට ලියුම් මොකුත් ලැබුණාද?'

'ඔව්. එක ලියුමක් ලැබුණා.'

'ඒ කාගෙන්ද?'

'ඔහුගේ පියාගෙන්'

'ළමයින්ට ලැබෙන ලියුම් ඔබ විවෘත කර බලනවද?'

'නැහැ'

'එහෙනම් ඔබ කොහොමද දන්නෙ ඒ පියාගෙන් බව?'

'ලියුම් කවරයේ පිටත, එතුමාගේ රාජ්‍ය ලාංඡනය මුද්‍රිතව තිබුණා. අනෙක ඒ ලිපිය ලියා තිබුණේ ආදිපාදතුමාගේ තරමක් අවලක්ෂණ අත් අකුරෙන්. ඇරත් එතුමාට මතකයි මේ ලියුම ලියූ බව'.

'ළමයාට ඊට කලින් ලිපියක් ලැබුණේ කවදාද?'

'සෑහෙන කාලෙකට ලැබුණෙ නෑ'

'ඔහුට ප්‍රංශයෙන් කවද හරි ලිපියක් ලැබුණාද?'

'නැහැ. කවදාවත් නැහැ'

'ඔබට තේරෙනවා නේද මං එහෙම ඇහුවේ ඇයි කියල. මේ ළමයා එක්කෝ බලෙන් පැහැරගෙන ගොහින් තියෙනවා. නැත්නම් ඔහුගේ කැමැත්තෙන් පිටවෙලා ගිහින්. ඔහුගේ කැමැත්තෙන් ගිහින් නම්, ඒක කරන්න පිටතින් කවුරු හරි ඔහුව කැමති කරවාගෙන තියෙනවා. නැත්නම් මේ වයසේ ළමයෙක් එහෙම කරාවි කියල හිතන්න අමාරුයි. ඔහුව හමුවෙන්න කවුරුවත්

Reading Purpose Only.. Not For Print.





මේ ළමයා එක්කෝ බලෙන් පැහැර ගෙන ගොස් තිබෙනවා නැත්නම්......

http://sherlockholmesinvestigations.blogspot.com

ආවෙ නැත්නම්, ඒ යෝජනාව එන්න ඇත්තෙ ලිපියක් මගින්. අන්න ඒකයි ඔහුට ලියුම් ලිව්වෙ කවුද කියල මං ඇහුවෙ'

'මං මීට වඩා ඒ ගැන දන්නෙ නෑ. මං දන්න තරමින් ඔහුට ලිව්වේ ළමයාගේ පියා තමණයි'

'මේ දෙන්නා අතර තිබුණු අන්‍යෝන්‍යය කොහොමද? තාත්තයි පුතයි හොඳ යාළුකමෙන් හිටියද?'

'ආදිපාදතුමා කිසිකෙනෙක් එක්ක යාළුයි කියන්න බෑ. ඔහුගේ සම්පූර්ණ කාලය යෙදවෙන්නෙ මහජනයාගේ ගැටළු නිරාකරණය කිරීමට. පවුලේ පුංචි දේවල් හොයන්න බලන්න ඔහුට වෙලාවක් නෑ. ඔහු ඒක නොපෙන්නුවට තමන්ගෙ ළමයට ආදරයෙන් හිටි බව නම් මම දන්නවා.'

'ඒ වුණත් ළමයාගෙ වැඩි ආදරය තිබුණෙ අම්මාටයි?'

'ඔව්'

'ළමයා ඒ බව ඔබට කිව්වද?'

'නැහැ'

'එහෙනම් ආදිපාදතුමා එහෙම කියන්න ඇති?'

'අපොයි දෙවියනේ, ඔහු එහෙම කිව්වෙ නෑ !'

'එහෙනං ඔබ කොහොමද දැනගත්තේ?'

'ආදිපාදතුමාගේ පුද්ගලික ලේකම් ජේම්ස් වයිල්ඩර් මහත්මයා එක්ක මං කතාබහ කළා. ළමයාගෙ වැඩි ආදරයක් තියෙන්නෙ අම්මාට බව ඔහු මට රහසිගතව කිව්වා'

'හරි. ඔබ කිව්වා නේද ආදිපාදතුමා එව් ලියුමක් ගැන. ළමයා පිටත්වෙලා ගියාට පස්සෙ කාමරයේ තිබිල ඔබට ඒ ලියුම හම්බවුණාද?'

'නැහැ. ඔහු ඒක අරගෙන ගිහිං. හෝම්ස් මහත්මයා, අපට

ආපසු යන දුම්රියට වේලාව ළං වෙමිනි එන්නෙ. අපි එහෙනම් යමුද යූස්ටන් දුම්රිය පොළට?'

'මං ලොකු අශ්ව කරත්තයක් ගෙන්වා ගන්නම්. පැය කාලක් යද්දී අපට දුම්රිය පොළට යාගත හැකි වේවි. හක්ස්ටබල් මහත්මයා, ඔබ ගමට විදුලි පුවතක් යවන්න බලාපොරොත්තු වෙනවද? එහෙම නම් අපේ පරීක්ෂණය තවමත් යොමුවෙලා තියෙන්නේ ලිවර්පූල් දෙසටයි කියල අසල්වාසීන්ට හිතාගන්න සලස්වන්න. මටයි වොට්සන්ටයි ඔබේ පාසල් භූමියේ ඉව අල්ලා බැලුවොත් තවත් මොනවා හරි හොයාගන්න බැරි වෙන එකක් නෑ.'

* * *

එද සවස් වන විට හක්ස්ටබල් මහතාගේ සුප්‍රසිද්ධ පාඨශාලාව පිහිටා තිබූ මිස් කුම් ගම් ප්‍රදේශයට අපි ළඟාවීමු. ඒ වනවිටත් ඇඳිරි වැටෙමින් තිබිණ. විද්‍යාලාධිපති නිවසේ සාලයේ මේසය මත ආගන්තුක කාඩ්පතක් විසා සේවකයා පැමිණ, හක්ස්ටබල් මහතාගේ කනට කෙඳුරූ විට, ඔහු බොහෝ කලබල වූ බව අපි දුටුවෙමු.

'ආදිපාදතුමා මෙහේ ඇවිත් ! ආදිපාදතුමා වයිල්ඩර් මහත්මයා සමග කන්තෝරු කාමරයේ ඇති. යමු, මං ඔබව ඔහුට හඳුන්වා දෙන්නම්.'

මේ සුප්‍රසිද්ධ රාජ්‍ය-තාන්ත්‍රිකයාගේ ඡායාරූප වලින් මම දැක ඇත්තෙමි. එහෙත් ආචාර්ය හක්ස්ටබල්ගේ කාමරය තුළ මට දකින්නට ලැබුණේ ඊට බොහෝ සෙයින් වෙනස් පුද්ගලයෙකි. ඔහු ඉතා අලංකාර ලෙස හැඳ-පැළැඳ සිටියේය. බොහෝ උස තැනැත්තෙකු වූ ආදිපාදවරයාගේ මුහුණ ඉතා කෙට්ටු විය. ඔහුගේ තට්ටය පෑදුණු හිසත්, ඉදිරියට වක් වූ නාසයත්, නිසා, ඒ මළමිනියක් මෙන් සුදුමැලි මුහුණට ලැබුනේ සුවිශේෂ පෙනුමකි. ඒවා වඩාත් කැපී පෙනුනේ තොබාය දක්වා වැටුණු, රතු පැහැති දිග රැවුල නිසයි. ඒ අසලම ඔහුගේ පෞද්ගලික ලේකම් වරයා

http://sherlockholmesinvestigations.blogspot.com

අසුන්ගෙන සිටියේය. ශරීර ප්‍රමාණයෙන් කුඩා ලාබාල තරුණයෙකු වූ ඔහුට තිබුණේ බුද්ධිමත් පෙනුමකි. කතාබහ ඇරඹුවේ ඔහුයි.

'ආචාර්ය හක්ස්ටබල්. මං අද උදේ ආවා. ඔබ හමුවෙන්න. මට ඕනෑ වුණේ ඔබ ලන්ඩන් යන ගමන නවත්වන්න. ඒත් මං එන්න කලින් ඔබ පිටත්වී ගොස් තිබුණා.

අපට දැනගන්න ලැබුණා ඔබ හැල්ඩයර් සාමි සෙවීමේ කටයුත්ත ෂර්ලොක් හෝම්ස් මහත්තයට භාරදෙන්න හදනවා කියල. ආදිපාදතුමාගෙන් අවසර ගත්තෝ නැතුව ඔබ මේ වගේ පියවරක් ගැනීම ගැන එතුමා හරිම පුදුමයට පත්වෙලයි ඉන්නෙ'

'පොලිස් පරීක්ෂණය අසාර්ථක වුණා කියලා දැනගත්තම..............'

'ආදිපාදතුමා කොහොමවත් හිතන්නෙ නෑ පොලිස් පරීක්ෂණය අසාර්ථකයි කියලා'

'ඒ වුණත් වයිල්ඩර් මහත්මයා..............................'

'හක්ස්ටබල් මහත්මයා, ඔබ හොඳාකාරවම දන්නව මේක මහජනයා අතරේ ප්‍රසිද්ධ වෙනවාට ආදිපාදතුමා කැමති නැහැ කියල'

'ඒ ටික පහසුවෙන් විසඳගන්න පුළුවනි. ෂර්ලොක් හෝම්ස් මහත්තයට හෙට උදේ කෝච්චියෙන් ආපහු ලන්ඩනයට යන්න කියමු.'

'නැහැ හක්ස්ටබල් මහත්මයා, ඒකෙ ප්‍රශ්නයක් නැහැ. හෝම්ස් පැවසුවේය.

'මේ උතුරු එංගලන්තයේ සීතල සුළඟ ශරීරය ප්‍රබෝධමත් කරවන සුළුයි. ඒ වගේම හරිම ප්‍රසන්නයි, සුවදායකයි. ඉතින් මං කැමතියි මේ විල්ලුව පැත්තක ඇවිදිමින් ටිකක් කාලය ගත කරන්න. මං නවාතැන් ගන්නේ ඔබේ වහල යටද නැත්නම් ගමේ තානායමේද කියන එක තීරණය කිරීම ඔබට භාරයි.

Reading Purpose Only, Not For Print

විදුහල්පතිතුමා උභතෝකෝටික ප්‍රශ්නයකට මැදි විය. අවසානයේ ආදිපාදවරයා අප ඇමතුවේය.

'වයිල්ඩර් මහත්මයා කිව් දේට මාත් එකඟ වෙනවා. හක්ස්ටබල් මහත්මයා, මේ වගේ තීරණයක් ගන්න කලින් ඔබට මගෙන් අහන්න තිබුණා. නමුත් දැන් ඉතින් හෝම්ස් මහත්තයට ඔබ හැම දෙයක්ම කියල නේ! ඒ නිසා ඔහුගේ දක්ෂතා වලින් අපි ප්‍රයෝජනයක් නොගත්තොත් ඒකත් මෝඩ වැඩක්. හෝම්ස් මහත්මයා, ඔබ තානායමේ නවතිනවා වෙනුවට, මා සමග නැවතීමට හෝල්ඩනස් මන්දිරයට එන්න. ඒක මට සතුටක්'

'ආදිපාදතුමනි, ඔබතුමාට මා ස්තූතිවන්ත වෙනවා ආරාධනය ගැන. මෙම අතුරුදහන්වීම සිදුවූ ස්ථානයේම නවාතැන් ගත්තොත්, ඒක මේ පරීක්ෂණය පැවැත්වීමේදී වඩාත් ප්‍රයෝජනවත් වේවි.'

'ඔබ කැමති හැටියක් හෝම්ස් මහත්මයා. මගෙන් හෝ වයිල්ඩර් මහත්මයාගෙන් ඔබට දැනගන්න අවශ්‍ය යමක් වෙතොත් ඒ ඕනෑම දෙයක් දැනුම් දෙන්න අපි සූදානම්'

'ඔබතුමාව මන්දිරයේදී හමුවීම මට අවශ්‍ය වෙන්න ඉඩ තියෙනවා. මට දැනට, මෙන්න මේ කාරණා දැනගැනීමට උවමනා යි. ඔබගේ පුතා මේ පුදුමාකාර විදියට අතුරුදහන් වීමට හේතුව මොකක් කියලද ඔබ හිතන්නේ?'

'ඒ ගැන කිසිම දෙයක් හිතාගන්න බෑ'

'මේ කාරණය නිසා ඔබේ හිත්වේදනාවක් ඇති වෙනවා නම් මට සමාවෙන්න. නමුත් මා මෙය දැනගත යුතුමයි. ඔබතුමා හිතන්නේ මේ සිද්ධියට ආදිපාදතුමිය සම්බන්ධයි කියලද?'

ආදිපාදවරයා පිළිතුරක් දීමට මඳක් පැකිළුණේය.

'මං හිතන්නේ නෑ'

අපට හිතන්න පුළුවන් තවත් දෙයක් තියෙනවා. එනම් කප්පම් ලබාගැනීමේ අරමුණෙන් ළමයා පැහැරගෙන ගියා කියල.

ඒ විදියට ඔබෙන් කප්පම් ඉල්ලීමක් එහෙම සිදුවුණාද?'

'නැහැ'

'මේ සිද්ධිය වූ දිනයේ ඔබ පුතාට ලියුමක් එවූ බව මට දැනගන්න ලැබුණා.

'නැ. මම ලියුමක් එව්වේ ඊට කලින් දවසේ'

'ඔව් ඒක හරි. නමුත් ඔහුට එය ලැබුණේ අතුරුදහන්වීම සිදුවුණු දවසේ?'

'ඔව්'

'ඔහු කැළැඹීමට පත්වෙන හෝ කලබලයෙන් තීරණයක් ගැනීමට තුඩුදෙන ආකාරයේ යමක්, ඔබේ ලියුමේ අඩංගු වුණාද?'

'නැහැ මහත්මයා. සත්තකින්ම නැහැ'

'ලිපිය තැපැල් කළේ ඔබතුමාමද?'

ආදිපාදතුමාගේ පිළිතුරට බාධාකරමින් මඳක් කෝපයෙන් පිළිතුරු දුන්නේ ඔහුගේ ලේකම් වරයායි.

'ආදිපාදතුමා ලියුම් තැපැල් කරන්න යන සිරිතක් නැ. තැපැල් කරන්න තිබෙන අනෙක් ලියුම් සමග එය කන්තෝරු කාමරයේ මේසය මත තිබුණා. ඒවා ලියුම් මල්ල තුළට දැම්මේ මම'

'මේ ලියුමත් අනෙක් ලියුම් අතර තිබුණු බව ඔබට විශ්වාසද?'

'ඔව් මං දුටුවා එය'

'ආදිපාදතුමා එද ලියුම් කීයක් ලියුවද?

'විස්සක් හෝ තිහක්. මට විශාල වශයෙන් ලියුම් ගනුදෙනු කරන්න සිදුවෙලා තිබෙනවා. නමුත් මේවා, මෙතැන ඇතිවෙලා තිබෙන ප්‍රශ්නයට අදාළ නැහැ නේද?'

Reading Purpose Only, Not For Print
...tions.blogspot.com

'කෙලින්ම නොවෙයි.........................

'මං පොලීසියට උපදෙස් දුන්නා ප්‍රාංශයේ දකුණු දිග කොටස වෙත ඔවුන්ගේ අවධානය යොමු කරන්න කියල...........' ආදිපාදතුමා කථාව ඇරඹීය.

'ආදිපාදතුමිය මේ වගේ දරුණු ක්‍රියාවකට පෙළඹෙයි කියල මා නොහිතන බව, මා සඳහන් කළා. ඒ වුණත් මගේ පුතාගේ ඔලුවේ තිබුණේ පුදුමාකාර අදහස්. සමහරවිට මේ ජර්මන් කාරයාගේ ආධාරයෙන් හා අනුබලයෙන්, ළමයා ආදිපාදවරිය වෙත පැන ගියා වෙන්නත් පුළුවන්. හක්ස්ටබල් මහත්මයා මට කියනවා අපි දැන් ආපහු හෝල්ඩර්නස් මන්දිරය වෙත ගියොත් හොඳයි කියල' ආදිපාදතුමා කථාව අවසන් කළේය.

ඉදිරිපත් කිරීම සඳහා තවත් ප්‍රශ්න රාශියක් හෝම්ස්ගේ මනසේ. සූදානම්ව තිබූ බව මම දැනසිටියෙමි. එහෙත් මෙම සාකච්ඡාව මෙතෙකින් අවසන් කිරීම ව්‍යාපාරපතියා ගේ අභිප්‍රාය විය. තමන්ගේ පවුලේ සැඟවුණු රහස්, නොදන්නා පුද්ගලයින්ට මෙසේ එළිදරව් කිරීමට ඔහු කැමති නැති බැව් පැහැදිලිය. හෝම්ස් අසන සෑම ප්‍රශ්නයක් පාසාම, තමන්ගේ දිවියේ සඟවා ඇති කරුණු රැසක් එළිවේ යයි ආදිපාදතුමාගේ සිතේ බියක් ඇතිවූවා නිසැකය.

ඔහු තම ලේකම්වරයා සමග පිටවී ගිය වහාම, හෝම්ස් තමාට පුරුදු ආකාරයට පරීක්ෂණය පැවැත්වීම ඇරඹුවේය.

ප්‍රථමයෙන් ළමයාගේ කාමරය පරීක්ෂණයට ලක්කරන ලදී. ඔහු පැන යන්නට ඇත්තේ ජනේලයෙන් යන්න හැරෙන්නට වෙනත් කිසිවක් අපට සොයා ගැනීමට නුපුළුවන් විය. ජර්මන් ගුරුතුමාගේ කාමරයෙන්ද අපට කිසිදු හෝඩුවාවක් නොලැබිණි. ඔහුගේ බරට අයිවි පඳුරේ කොටසක් කැඩී බිමට වැටී තිබිණි. එය සහ, ඔහුගේ දෙපා බිම වැදීමෙන් සලකුණු වුණු අඩි සටහන්ද ලන්තෑරුම් එළියෙන් අපි දුටුවෙමු. මහ රෑ කළ පලායාම පිළිබඳ සාක්ෂි තිබුණේ එපමණකි.

http://sherlockholmesinvestigations.blogspot.com

වගුරු බිම් පෙදෙස හා අදාල තැන් පෙන්වන දළ සිතියමක්



Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්පසු හෝම්ස් තනිවම නිවසින් පිටව් ගියේය. ඔහු ආපසු පැමිණෙන විට රෑ එකොළහ පසුවී තිබිණි. පාසල අවට විශාල ප්‍රදේශයක මිනින්දෝරු දෙපාර්තමේන්තු සිතියමක් රැගෙන ආ ඔහු, එය මගේ ඇඳ මත දිග හැර, පයිප්පය දල්වා ගත්තේය.

'මේ සිද්ධියේ සිත් ඇදගන්නා සුළු කාරණා කිහිපයක්ම තියෙනවා වොට්සන්. මං කැමතියි, අපේ පරීක්ෂණයට ප්‍රයෝජනවත් වෙන මේ භූමියේ, පිහිටීම පිළිබඳ වැදගත් කරුණු ඔබ හඳුනාගන්නවා නම්.

මේ සිතියම දිහා බලන්න. මේ හතරැස් කොටුව තමයි ප්‍රාථමික පාසල. මං එතනින් අල්පෙනෙත්තක් සවි කරන්නම්. ඊළඟට මේ තමයි ප්‍රධාන පාර. මේ පාර පාසල පසුකරමින් නැගෙනහිර සිට බටහිරට ඇවිල තියෙන්නේ. බලන්න, කොයි පැත්තට ගියත් හැතැක්මක දුරක් යන තුරු හරස් පාරක් හමුවෙන්නෙ නෑ. මේ මනුස්සයින් දෙන්නා පාරකින් පැන ගියා නම් ඒ මේ පාරෙ විය යුතුයි.

එද රෑ පාර දිගේ මොනවා සිදුවුණාද කියල දැනගන්න අපට අහම්බෙන් සැලැසුණු වාසියක් තියෙනවා.

මගේ මේ පයිප්පයෙන් පෙන්වන තැන, එද රෑ දොළහේ ඉඳල උදේ හය වනතුරු පොලිස් නිලධරයෙක් සේවයේ ඉඳල තියෙනවා. එතැන තමා නැගෙනහිරට ගියාම දකින්න ලැබෙන පළමුවෙනි හරස් පාර. ඔහු විශ්වාස කටයුතු කෙනෙක්. ඒ මනුස්සයා මට සහතික කරලා කිව්වා, ඔහු කොයි වේලාවකවත් එතැනින් ඉවතට නොගිය බව: ඔහුට නොපෙනී මිනිහෙකුට හෝ ළමයෙකුට එතැනින් ගමන් කිරීමට ඉඩක් නොතිබුණු බව. එතකොට ඒ පැත්තෙන් ගියා වෙන්න බෑ.

ඊළඟට බලමු පාරෙ අනික් කෙළවර. ඒකෙ තියෙනවා 'රෙඩ්බුල්' තානායම. ඒකෙ අයිතිකාරිය එද රෑ අසනීප වෙලා. එතැන අය, ඇයට ප්‍රතිකාර ලබාගන්න වෛද්‍යවරයෙකු කැඳවාගෙන එන්න පණිවුඩයක් යවලා තියෙනවා, මැකල්ටන්

http://sherlockholmesinvestigations.blogspot.com

වලට. නමුත් වෛද්‍යවරයා ඒ රෑ වෙනත් රෝගියකු පරීක්ෂා කරන්න ගිහිං ඉඳලා. ඒ නිසා ඔහුට උදේ වන තුරුත් රෝගී කාන්තාව බලන්න එන්න ලැබුණේ නැහැ. රෙඩ්බුල් තානායමේ සිහිප දෙනෙක්ම එද රාත්‍රී, දෙස්තර මහත්මයා එන මග බලාගෙන අවදියෙන් ඉඳලා තියෙන්නෙ. නිතරම කවුරුත් හෝ පාර දිහා බලාගෙන හිටි බවයි කියවෙන්නෙ. නමුත් ඒ පැත්තෙන් කිසිවකු ගමන් කරපු බවක් දැකපු කෙනෙක් නෑ. ඒ ගොල්ලන්ගෙ සාක්ෂියත් විශ්වාසයට ගන්න පුළුවන්. ඒ පාරේ බටහිර කෙළවරත් අවහිරයි කියල අපට විශ්වාසෙට හිතාගන්න පුළුවනි. එහෙම නම් අපට සිතන්න තියෙන්නේ ඔවුන් දෙදෙනා කොහොමටවත් ප්‍රධාන පාරෙන් ගමන් නොකළ බව'

'ඒ වුණත් බයිසිකලේ?'

'හොඳයි අපි ඊළඟට ඒ ගැන හිතමු. මේ පුද්ගලයින් මහ පාරෙන් ගියේ නැත්නම්, ගමන් කරන්න ඇත්තේ පාසල් වත්තෙන් උතුරට හෝ දකුණට. ඒක විශ්වාසයි. ඔබට පෙනෙනවා ඇති දකුණු පැත්තේ තිබෙන්නේ විශාල වශයෙන් වගාව සඳහාම වෙන්කළ භූමි භාගයක්. එහි සෑම තැනක්ම වාගේ කුඩා කුඹුරු හෝ ගොවිබිම් වලට වෙන්කරලා, තැනින් තැන තාප්ප, වැටකඩුලු බැඳලා. මෙවැනි පැත්තක බයිසිකලයෙන් ගමන් කිරීමට නොහැකියි. ඒ නිසා ඒ පැත්තත් අපට අමතක කළ හැකියි. ඊළඟට අපි උතුරු පැත්තට හැරෙමු.'

පාසලේ පිට්ටනියෙන් උතුරු පැත්තට තිබෙන්නේ 'රැගඩ් ෂෝ' නමින් හැඳින්වෙන ගස් කොළත් වැවී ඇති වනලැහැබක්. වන ලැහැබෙන් එහා පැත්තේ තිබෙන්නේ, ඉඳහිට පඳුරු කීපයක් ගස් දෙක තුනක් තිබෙන නමුත්, ප්‍රධාන වශයෙන්ම කුඩා පැළෑටි වලින් පමණක් වැසුණු මිට්ටි, නැත්නම් විල්ලුව කියලත් අපට කිව හැකියි. මේ මුඩුබිම් පෙදෙස සිතියමේ සඳහන් වෙනවා ලෝවගිල් විල්ලුව නමින්. එය සැතපුම් දහයක් පමණ දුරට පැතිරීලා තිබෙනවා. මෙම විල්ලුව තවත් උතුරට යද්දී ක්‍රම ක්‍රමයෙන් උස් බිමක් වෙලා, කැලෑබද පාළු ප්‍රදේශයක් වෙනවා. මේ පාළු කාන්තාරයෙන් එහා පැත්තෙ හෝල්ඩනස් මන්දිරය පිහිටා

Reading Purpose Only, Not For Print

තිබෙන්වා. එයට යැමට මහ පාරෙන් සැතපුම් දහයක් වුණාට, විල්ලුව හරහා ගියොත් සැතපුම් හයයි. මේ පැත්ත ජනශූන්‍ය, බොහොම පාළු පෙදෙසක්. ඉඳහිට තැනක ගොවීන්ට අයත් වගාවන් තිබෙනවා. ඒ තැන්වල ඔවුන් ගවයන් හෝ බැටළුවන් ඇති කරනවා. ඔවුන් හැරුණාම, වෙස්ටර්ෆීල්ඩ් ප්‍රධාන පාරට එනතුරු, මේ හරියේ එකම අධිකාරයින් අඳුරුවල ජීවත්වෙන කුරුල්ලන් පමණයි. මෙන්න මෙතැන පල්ලියක් තිබෙනවා. ඊළඟට කුඩා ගෙවල් කිහිපයක්. ඊට පස්සෙ කන්දායමක්. එතැනිනුත් එහාට කන්ද බොහොම බෑවුම් සහිතයි. නිසැකවම අපේ පරීක්ෂණයට ලක්විය යුත්තේ පාසල් බිමෙන් උතුරු කොටසයි.'

'ඒ වුණත් බයිසිකලේ?' මම නැවතත් මතක් කළෙමි.

'හරි ! හරි ! දක්ෂ බයිසිකල් කරුවෙකුට හොඳට තාර දමපු පාරක්ම ඕනෙ නෑ. විල්ලුවේ තිබෙනවා හැම අතකටම විහිදුණු ගොඩ පාරවල්. එද හොඳට හඳ එළියත් තිබුණා. අහා ! මොකක්ද ඒ සද්දෙ. ?'

බොහෝ කලබලයෙන් කිසිවෙකු අපේ දොරට ගසන හඬක් ඇසිණි. මොහොතකින් අපේ කාමරයට ඇතුළු වූයේ ආචාර්ය හක්ස්ටබල් මහතාය. ඔහුගේ අතේ ක්‍රිකට් ක්‍රීඩකයින් පළඳින තාලේ නිල් පැහැති කැප් තොප්පියක් තිබිණි.

'දෙවියන්ට ස්තුතිවේවා ! මුන්න අන්තිමට අපට හෝඩුවාවකුත් ලැබුණා. මේ අපේ අහිංසක දරුවට අයිති කැප් තොප්පිය' හක්ස්ටබල් කීය.

'කොහේ තිබිලද ඒක හම්බ වුණේ?'

'විල්ලුවේ කඳවුරම් ගහගෙන ඉඳපු අහිකුණ්ඨික මිනිස්සුන්ගේ කරත්තෙක තිබිලා. ඔවුන් එහෙන් පිටවෙලා ගිහින් තියෙන්නේ අඟහරුවාදලු. පොලීසිය ඔවුන් හොයාගෙන ගිහින්. අද ඔවුන්ගේ කරත්තය සෝදිසි කරන කොට මේක ලැබිලා.

'මොනවද ඒ ගොල්ලො මේක ගැන කියන්නෙ?'

http://sherlockholmesinvestigations.blogspot.com

'කිසිදෙයක් හරියට කියාගන්න බැරුව බොරු කියලා. උන් කියනවා අහහරුවාද උදේ විල්ලුවේ තිබිලා උන්ට මේක හමුවුණාලු. මහ තක්කඩි වගයක් උන් දන්නවා දරුවා ඉන්නෙ කොහේද කියලා. හොඳ වෙලාවට උන් ඔක්කොම පොලීසියේ හිරකූඩුවේ. උන් දන්න කාරණා ඔක්කොම ටික එළියට ඒවි: එක්කෙනා දඬුවම් කරාවි කියන හන්ට: එහෙමත් නැත්නං ආදිපාදතුමාගේ සල්ලි වලින්' ඇවසු කොන්ස්ටබල්, කාමරයෙන් පිටවී ගියේය.

'තවමත් අපි යන්නෙ හරි පාරේ. ඒකෙන් ඔප්පු වෙන්නේ ප්‍රතිඵල ඕනෙ නම් අපි හොයා බලන්න ඕනෙ ලෝවගිල් විල්ලුව පැත්ත කියන එකයි.' මේ අභිසුණිසිකයන් හිරභාරයට ගන්නව ඇරෙන්න පොලීසියෙන් මොකුත් කෙරිල නෑ. මේ බලන්න චොට්සන්. විල්ලුව හරහා ගලා යන දියපාරක් තියෙනවා. සිතියමේ ඒක මේ ලකුණු කරලා තියෙන්නෙ. සමහර තැන් වලදී ඒක පුළුල් වෙලා මඩ වගුරු ප්‍රදේශයක් වී ඇති බවයි සඳහන් වෙන්නෙ. හෝල්ඩනස් මන්දිරයත් පාසලත් අතර මුළු භූමි ප්‍රදේශයේම පොළොව, ඔච්චි ස්වභාවයක් ගන්නා බවයි මෙයාල කියන්නෙ. මේ වගේ වියලි කාලගුණයක් තිබෙන කාලෙක, අඩිසටහන් තියෙනවද කියල වෙනිං තැන්වල හොයන එක බොරු වැඩක්. මේ මඩවගුරු සහිත හරියේ නම් නියතවම යම් ආකාරයක අඩි සලකුණු තිබිය යුතුමයි. මං හෙට උදේ පාන්දරින්ම ඔබව අවදි කරන්නම්. මේ අභිරහස හෙළිකර ගන්න මොනවා හරි හොයා ගන්න පුළුවන්ද කියලා අපි උත්සාහ කරල බලමු.'

එළිය වැටීගෙන එද්දී මා අවදිවෙන විට, හෝම්ස් මගේ ඇඳ අසල සිටගෙන සිටියේය. සම්පූර්ණයෙන්ම හැඳ පැළඳ සිටි ඔහු, දැනටමත් නිවසින් පිටත ගොස් ආපසු පැමිණි බවක් දකින්නට ලැබිණි.

'මං පිට්ටනිය යි, බයිසිකල් මඩුවයි පරීක්ෂා කරල බැලුවා. රැගඩ් ෂෝ වනලැහැබකින් හුඟක් තැනකම ඇවිදලා බැලුවා.

චොට්සන් අල්ලපු කාමරයේ, ඔබට බොන්න කොකෝ

කෝප්පයක් පිළියෙල කර තිබෙනවා. ඒක බීල ඉක්මනට සූදානම් වෙන්න. අද දවසේ අපට කරන්න, වැඩකටයුතු විශාල ප්‍රමාණයක් තිබෙනවා.'

හෝම්ස්ගේ දෑස් ප්‍රීතියෙන් බැබලිණි. තම්මුල් රත්පැහැ ගත්තේය. එයින් පිළිබිඹු වූයේ අප ඉදිරියේ ඇති බැරෑරුම් කාර්ය ගැන ඔහුගේ උද්යෝගයයි. මේ බේකර් වීදියේ හාන්සි පුටුවේ සිහින මවන, තැත්පත් පර්ලෝක් හෝම්ස් නොවේ. මේ උද්යෝගිමත්, ක්‍රියාශීලී, ජීවයෙන් පිරිපුන් මිනිසෙකි.

ඇත්තෙන්ම එදා අපට වැඩ රාජකාරි බහුල දිනයක් විය. එහෙත් එය ඇරඹුණේ, බලාපොරොත්තු කඩවීමිද සමගයි. රිගබිශොප් පසුකර යද්දී අපට දක්නට ලැබුණේ, කළු පස් සහිත විල්ලුවයි. ඒ පෙදෙසේ බොහෝ දුරක් අත තුරු, පස් මත සෑම දිශාවකටම වැටී තිබුණේ බැටළුවන්ගේ අඩි සටහන් රාශියකි. අපි ඒවා පසුකොට ඉදිරියටම ගමන් කළෙමු. තවත් සැහෙන දුරක් ගමන් කළ පසු අපට හමුවූයේ ලා කොළ පැහැති වගුරු බිම් පෙදෙසයි. ළමයා මේ පෙදෙස පසුකර, සිය නිවස දෙසට ගමන් කළේ නම් අනිවාර්යයෙන්ම ඔහු වගුරුබිම හරහා යා යුතුය. අඩිසටහන් එහි නොරැඳෙන සේ ඔහුට එයින් එතෙර වියහැකි ක්‍රමයක් නැත. එහෙත් වගුරු බිමේ සැල්ටයර් සාමිගේ හෝ ජර්මන් ගුරුවරයාගේ පා සටහන් කිසිවක් දක්නට නොලැබිණි.

බලාපොරොත්තු කඩවීම නිසා හෝම්ස්ගේ මුහුණ අඳුරු විය. පාසි වැවුණු වගුරු ප්‍රදේශය ඔහු දිගින් දිගටම පරීක්ෂා කළේ අඩි සටහනක් සොයා ගැනීමේ අරමුණෙනි. ඒ ප්‍රදේශයේ ඉතා විශාල වශයෙන් තිබුණේ බැටළුවන්ගේ පා සලකුණුයි. සැතපුම් කිහිපයක් ගිය පසු ගවයන්ගේ කුර පලකුණු ද අපට දැකිය හැකි විය. එහි වෙනත් කිසිදු සලකුණක් නොතිබිණි.

බලාපොරොත්තු කඩවූ මුහුණින් හෝම්ස් බලාසිටියේ යායක් මෙන්, දිගින් දිගටම ඉදිරියට විහිදුණු විල්ලුව දෙසයි.

'අර ඈත තවත් මඩ වගුරු ප්‍රදේශයක්. ඊළඟට ඒ දෙක අතරේ පටු බිම් කඩක්. අපි විසක් ඉදිරියට ගිහිං බලමු.

ඔහෝ ! ඔහෝ ! මේ මොකක්ද මේ?"

අප ළහාවී සිටියේ තුර පීත්ත පටියක් මෙන් විහිදුණු මැටි පාරක් වෙතටයි. එය මැද තෙත් සහිත ප්‍රදෙසෙහි බයිසිකල් ටයරක සලකුණු පැහැදිලිවම දක්නට ලැබිණ.

"ජයවේවා! ඔන්න අපි හොයාගත්තා"

මම සතුටෙන් කෑගැසීමි.

එහෙත් හෝම්ස් ගිය දෙපසට සෙලවූයේ සතුටෙන් නොවේ. ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ ගැටළුවකට මැදිවූ අයුරකි.

"බයිසිකලයක් නම් තමයි. නමුත් අපි හොයන බයිසිකලේ නෙමෙයි. බයිසිකල් ටයර් වල කට්ට පිහිටා ඇති ආකාරය අනුව රටා හතලිස් දෙකක් මට හොඳට හුරු පුරුදුයි. ඔබට පෙනෙනවා ඇති මේක, පැච් එකක් දමාපු 'ඩන්ලොප්' ටයරයක්. හෙයිඩෙගර් ගුරුතුමාගේ බයිසිකලයේ ටයර් 'පාමර්' වර්ගයේ ඒවා. ඒ කියන්නේ දිග අතට සිහින් ඉරි සහිත රටාවක්. ගණිත ගුරුවරයා වන ඇව්ලිංට ඒ බව හොඳට මතකයි. ඒ නිසා මේවා හෙයිඩෙගර් ගේ බයිසිකලයෙන් ඇතිවූ ලකුණු නෙමෙයි.

"එහෙම නම් ළමයා ගිය බයිසිකලයෙන්ද?"

"වෙන්න පුළුවන්. හැබැයි අපට ඔප්පු කළ හැකිනම්, ළමයා සතුවත් බයිසිකලයක් තිබුණා කියල. ඒ කාරණය ඔප්පු කරන්න අපි තවමත් සමර්ථ වෙලා නෑ. තුමී බලන්න වොට්සන්. ඔබ හොඳින් පරීක්ෂා කළොත් තේරුම් ගත හැකියි මේ ටයර් ලකුණේ හැටියට, මේක පාසල් භූමියේ සිට ඉවතට ගමන් කළ බයිසිකලයක ලකුණු"

"එහෙම නැත්නම් පාසල් භූමිය වෙතට ආ එකක් ද?"

"නෑ නෑ මගේ හිතවත් වොට්සන්. බොහොම ගැඹුරට පාර හිටලා තියෙන්නේ, පිටි පස්සේ රෝදයෙන් ඇති වූ සලකුණයි. ඒ මොකද බයිසිකලය පදින පුද්ගලයාගේ බර වැඩියෙන්ම එන්නේ

පිටිපස්සෙ රෝදෙට. ඔබට පෙනේවි ඒ අතුණු කිහිප තැනකදීම ඉදිරි පස රෝදයේ ටයර් පාර කපාගෙන, ඊට උඩින් ගමන් කරලා තිබෙන බව. කිසිම සැකයක් නෑ. බයිසිකලය ගමන් කරලා තිබෙන්නේ පාසලෙන් ඉවතට. මේක අපේ පරීක්ෂණයට ප්‍රයෝජන වෙන්නත් පුළුවන්. නොවෙන්නත් පුළුවන්. නමුත් අපි මේ ටයර් පාර දිගේ ආපහු ගිහිං බලමු.'

ටයර් සලකුණ දිගේ අපි ආපසු ගමන් කළෙමු. යාර සිය ගණනක් ගිය පසු, විශාල පොළොවට පිවිසෙද්දී එම සලකුණු අතුරුදහන් විය. අපි එම දිශාවටම තව දුරටත් ගමන් කළෙමු. විල්ලුව හරහා ගැලූ තවත් සිහින් දියපාරක් අපට හමුවිය. මේ පෙදෙස හරහා යළිත් ටයර් සලකුණු දිස්විය. මෙවර ටයරයේ ලකුණු බොහෝ දුරට මැකී යන ලෙස ගවයන්ගේ කුර සලකුණු රාශියක් ඒ උඩින් වැටී තිබිණ. ටයර් සලකුණු යළිත් නොපෙනී ගියේ රැගඩ් ෂෝ නම් වන ලැහැබ අසලදීය. ඒ පාසලේ පිටුපස මායිමට තුදුරු පෙදෙසයි. බයිසිකලය එලිකට එන්නට ඇත්තේ මේ වන ලැහැබ තුළිනි. ගල් පර්වතයක් මතට වී නිකටේ අත තබා ගත් හෝම්ස් කල්පනා කිරීමට පටන් ගත්තේය.

'ඒකත් එහෙමද දන්නෙ නෑ' හෝම්ස් කථාව ඇරඹීය.

'සමහරවිට මෙහෙම දෙයකුත් වෙන්න පුළුවන් වොට්සන්. කෛරාටික මිනිහෙකුට පුළුවනි ඔහුගේ බයිසිකලයේ ටයර් මාරුකරලාම වැඩ පටන් ගන්න! ඒ මොකද? තමාව හඳුනාගන්න බැරිවෙන විදියේ ටයර් සලකුණු තියන්න. අන්න ඒ තරමට කපටි කෛරාටික අපරාධකාරයෙක් එක්ක ගනුදෙනු කරන්න මමත් බොහොම කැමතියි. මේ නොවිසඳුණු ප්‍රශ්නය එහෙමම තියෙන්න අරිමු. අපි ආයෙමත් යමු අර මඩවගුර පැත්තට. අපට ඒ පැත්තෙ සොයා බලන්න සෑහෙන තරම් දේවල් තව ඉතිරි වෙලා තියනවා'

අපි යළිත් වරක් මඩවගුරු බිමේ අයින දිගේ ක්‍රමානුකූලව පරීක්ෂා කරමින් ඉදිරියට ගියෙමු. එයින් අපට සතුටුදායක ප්‍රතිඵල ලැබිණි. මඩ වගුරු බිමේ පහළම කොටස හරහා එරෙන පුළු මඩ ගොහොරුවක් පිහිටා තිබිණි. එයට ළංවූ හෝම්ස් සතුටින්

කැගැසුවේය. කම්බි කිහිපයක් මඩ සහිත පොළොවක ඇදගෙන ගියාක් මෙන් ඉරි සලකුණු එහි, සටහන්ව තිබිණ. ඒ නිසැකවම පාමර් ටයරයේ සලකුණුයි.

'මේ අපේ හෙයිඩෙගර් මහත්තයාගෙ බයිසිකලේ ටයර් ලකුණු. ඒකෙ කිසිම සැකයක් නෑ'

හෝම්ස් කීවේ මහත් ප්‍රීතියෙනි.

'ඔබේ ජයග්‍රහණය ගැන මගේ සුභ පැතුම්'

මම කීවෙමි.

'ජයග්‍රහණයයි ලං වෙන්න නම් අපට තව බොහොම දුරක් යන්න තියෙනවා. කරුණාකර ඔය ටයර් සලකුණු වලින් අයින් වෙලා අඩිය තියන්න වොට්සන්. අපි ගිහින් බලමු මේ ටයර් ලකුණු පිටුපස. මේක කොයිතරම් දුරේ යයිද කියලා මට සැකයි'

අප ඉදිරියට යද්දී පොළොවේ ස්වභාවය අනුව, තැන් තැන් වලදී ටයර් සලකුණු නොපෙනී ගියේය. නමුත් යළිත් එය සොයා ගෙන ඉදිරියට යාමට අපි සමත්වීමු.

'ඔන්න බයිසිකල් කරුවා බයිසිකලය වේගයෙන් පදින්න පටන් අරගෙන. මේ බලන්න වොට්සන්. රෝද දෙකේම ටයර් ලකුණු එක සමාන ගැඹුරට. බයිසිකලයක් වේගයෙන් පදින්න ඕන වුණාම කෙනෙක් කරන විදියට, දැන් ඔහු ආසනයෙන් මදක් නැගිටලා, ඉදිරියට නැමී, හැඬලියට බර යොදලා පදින්න පටන් අරගෙන. දෙයියෝ සාක්කි ! ඔහු බයිසිකලයෙන් වැටිලා'

මාර්ගයේ පස අක්‍රමවත් ලෙස පැත්තකට හැරී ගිය ලකුණු ද අඩි සටහන් කිහිපයක්ද එහි විය. ඉන්පසු ටයර සටහන් යළිත් ඇරඹිණි.

'ඔහු පැත්තට ලිස්සලා ගිහින් වගෙයි' මම කීවෙමි.

පොඩිවී තිබුණු මල් පඳුරක අත්තක්, හෝම්ස් ඉහළට

http://sherlockholmesinvestigations.blogspot.com

එසෙව්වේය. එහි තිබූ කහ පැහැති මල් මත, රතු පැහැති ද්‍රව්‍යයක් දැක මම භීතියට පත්වීමි. ඒ හරියේ පොළොවේත් මල් පඳුරේත් තැනින් තැන කැටි ගැසී තිබුණේ රුධිරය බව අපට හඳුනාගත හැකිවිය.

'හරක ලකුණක්. ඒ හරිය පාගන්න එපා වොට්සන්. මොකක්ද මේකෙන් මට තේරුම් ගන්න පුළුවන්? ඔහු බයිසිකලයෙන් වැටිල තුවාල වුණා. ඊළඟට නැගිට්ටා, ආයෙමත් බයිසිකලයට නැගිලා ඉදිරියට ගියා. නමුත් එතැනින් එහාට ටයර් ලකුණු නෑ. ඒ පැත්තේ ඔක්කොම හරකුන්ගේ අඩි සටහන්. ඔහුට හරකෙක් ඇන්නා වත්ද? වෙන්න බෑ. නමුත් වෙන කාගෙවත් ලකුණක් මට හොයා ගන්න බෑ. අපි ඉදිරියට යමු. දැන් ඉතින් ටයර් පාරට අමතරව ලේ පැල්ලම් තියෙන්න ඕන. ඒ නිසා ඔහුට අපෙන් බේරෙන්න බෑ'

අපේ සෙවුම එතරම් දීර්ඝ එකක් නොවීය. තෙත් සහිත දිලිසෙන පස මත, ටයර් පාර සලකුණු වී තිබුණේ පුදුමාකාර ලෙස වක්‍රවීම් සමගය. ඉදිරිය බැලූ මගේ දෑසනට එක්වරම දිස්වූයේ කහ මල් සහිත පඳුරු අතරේ, හිරු එළියෙන් දිලිසෙන ලෝහමය කොටසකි. අපි එතැනට ගොස්, පඳුර තුළ තිබුණු බයිසිකලය එළියට ඇද්දෙමු. පාමර් ටයර් සහිත එම බයිසිකලයේ ඉදිරිපස, සිත් සසල කරවන අයුරින් තැවරී තිබුණේ කැටි ගැසුණු ලේ වලිනි. අනෙක් පැත්තෙන්, පිහිටි පඳුරේ කොළ අතරෙන් දිස්වූයේ ඉදිරියට ආ සපත්තුවකි. අපි වහා එතැනට දිව ගියෙමු. එහි තිබී අපට හමුවූයේ අවාසනාවන්ත බයිසිකල් කරුවාගේ මළකඳයි !'

සෑහෙන තරම් උස පුද්ගලයකු වූ ඔහුගේ මුහුණ, රැවුලෙන් වැසී තිබිණ. ඔහුගේ උපැස් යුවලේ එක් වීදුරුවක් ඉවතට විසිවී ගොස්ය. මරණයට හේතුව හිසට එල්ල වූ දරුණු පහරකි. ඒ නිසා හිස්කබලේ කොටසක් බිඳී ඇතුළට තෙරා ගොස් තිබිණි. එවැනි පහරක් හිසට එල්ල වූ අයුරුත්, ඔහු බයිසිකලය ඉදිරියට පැදගෙන යාමට සමත්වී ඇත. එයින් පෙනෙන්නේ ඔහු කොයිතරම් ශක්ති සම්පන්න, ධෛර්යමත් පුද්ගලයෙක්ද යන්නයි. ඔහු මේස්

නොමැතිව පාවහන් පැළැඳ සිටි අතර, විවෘත වූ කබාය තුළින් 1 ඇඳුමේ කමිසය දිස්විය. ඒ ජර්මන් ජාතික ගුරුතුමා බවට කිසිදු සැකයක් නොමැත.

මළසිරුර අනෙක් පසට හැරවූ හෝම්ස්, ඉතා උනන්දුවෙන් එය පරීක්ෂා කර බැලුවේය. ඉන්පසු පසෙකින් වාඩිවූ ඔහු නළල රැලි කරගෙන යළින් කල්පනාවට වැටුණේය. මෙම ශෝකජනක සොයාගැනීම නිසා අපේ පරීක්ෂණය තවත් ඉදිරියට ගෙන යෑමට අපහසු අයුරකි.

'දැන් මොකක්ද අපි කරන්න ඕන?'

'ඒක තීරණය කරන්න එකක් අමාරුයි වොට්සන්. පෞද්ගලිකව මට හිතෙන්නේ අපේ පරීක්ෂණය ප්‍රමාදයකින් තොරව ඉදිරියට ගෙන යා යුතුයි කියන එකයි. ඒ මොකද දැනටමත් අපේ කාලය සෑහෙන තරම් නාස්ති වෙලා තියෙන්නේ. තවත් එක පැයක් වත් නාස්ති කරන්න අපට පුළුවන් කමක් නෑ. අනික් අතට මේ සොයා ගැනීම ගැන වහාම පොලීසියට දැනුම් දෙන එක අපේ වගකීමක්. මේ අහිංසක මනුස්සයාගේ මෘත ශරීරයේ ආරක්ෂාවට එතකොට මොනවා හරි කෙරේවි.'

'ඔබ පරීක්ෂණය කරන අතරේ මට පුළුවනි පණිවුඩයක් ගෙන යන්න'

'නමුත්, ඔබ මා සමඟ සිටීම, ඔබේ සහයෝගය මට අවශ්‍යයි. පොඩ්ඩක් ඉන්න! අන්න අරහෙ ඈත, දිරාපත් ගස් කපන මිනිහෙක් ඉන්නවා. මිනිහව මෙහාට කතාකරගෙන එන්න. අපි ඔහු අතේ පණිවුඩයක් යවමු. ඔහුට පුළුවනි පොලීසියට මෙතැනට එන්න පාර පෙන්වන්න.'

මම ඒ මිනිහා කැඳවාගෙන ආවෙමි. භීතියට පත්ව සිටි ඔහු අතේ හෝම්ස්, හක්ස්ටබල් මහතා වෙත ලියුම් කැබැල්ලක් යැව්වේය.

'උදේ වරුවට අපි හෝඩුවාවල් දෙකක් සොයාගත්තා

http://sherlockholmesinvestigations.blogspot.com

ටොට්සන්. එකක් පාමර් ටයරය සහිත බයිසිකලය. ඒ බයිසිකලයේ ටයර් පාර කෙලවර වුණේ කොතනින්ද කියන එකත් අපට දකින්න ලැබුණා. ඊළඟට අනෙක් බයිසිකලය: පැච් දමාපු ඩන්ලොප් ටයරය සහිත එක. ඒක ගැන තවදුරටත් හොයන්න කලින්, අපි අනාවශ්‍ය, වැදගත් නොවන කාරණා ටික, අහම්බෙන් දකින්න ලැබුණු ඒවායින් වෙන් කරගමු.

මුලින්ම මට කියන්න තියෙන්නේ ළමයා පාසලෙන් පැනල ආවේ ඔහුගේ කැමැත්තෙනම්මයි. ඔහු ජනේලයෙන් එළියට ඇවිත්, අයිවි ගහ දිගේ බැහැල, පාසල් වත්තෙන් පිටවුණා. ඒක මට සහතිකයි"

මම ද ඊට එකඟත්වය පළකළෙමි.)

"ඊළඟට මේ අවාසනාවන්ත ජර්මන් ගුරුතුමා දෙසට අපේ අවධානය යොමු කරමු. පාසලෙන් පැන යද්දී, ළමයා තමන්ගේ සම්පූර්ණ පාසල් ඇඳුමෙන් සැරසිලා හිටියේ. ඒ කියන්නේ තමන් කරන්න හිටි වැඩේට ඔහු හොඳින් සූදානම් වෙලයි ඒක කළේ. නමුත් ගුරුවරයා සපත්තු ඇඳලා හිටියේ මේස් නැතුව. ඔහුට ක්‍රියාත්මක වෙන්න වැඩි වේලාවක් තිබුණේ නැති බව ඒකෙන් පැහැදිලියි"

"ඔව්. ඒක හරි"

"ගුරුතුමා ගියේ ඇයි? ඔහුගේ නිදන කාමරයේ ජනේලයෙන් ගුරුතුමා දැක්කා ආදිපාදවරයාගේ පුතා පැනයන හැටි. ගුරුතුමා බලාපොරොත්තු වුණේ ඉක්මනට ගිහිං ළමයාව අල්ලාගෙන ආපහු අරගෙන එන්න. ඒ නිසා ඔහු තමන්ගේ බයිසිකලයට නැගලා, ළමයා පිටුපස එළවාගෙන ගියා. එහෙම ගිහින් තමා ඔහු මරණයට පත්වුණේ"

"ඒ වගේ තමයි පෙනෙන්නේ"

"දැන් මං එන්නේ මගේ තර්කයේ අමාරුම කොටසට. කුඩා ළමයෙක් පසුපස එළවාගෙන යන්න තදන වැඩිහිටියෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

සාමාන්‍යයෙන් කරන්නෙ ඒ ළමයා පිටුපස දුවලා ගිහින් ඔහුව අල්ලා ගන්නවා. නමුත් හෙයිඩෙගර් මහත්මයා එහෙම කළේ නෑ. ඔහු කළේ බයිසිකලයෙන් ළමයා පිටුපස එළවන්න තීරණය කිරීම. මට දැනගන්න ලැබුණා හෙයිඩෙගර් ගුරුතුමා බයිසිකල් පැදීමේ ශූරයෙක් බව. ඇයි ඔහු බයිසිකලයෙන් ගියේ? ඔහුට පෙනුණා ළමයාට වේගයෙන් පැනයන්න ක්‍රමයක් ඇති බව.'

'මේ අතින් බයිසිකලයද?'

'අපේ කාරණා ටික ආයෙත් පෙළගස්වලා බලමු. ගුරුතුමා මියගියේ පාසලේ ඉඳල හැතැක්ම පහක් දුරින්. හැබැයි වෙඩි උණ්ඩයකින් නෙමෙයි; ළමයෙකුට වුණත් කරන්න පුළුවන් වෙඩි තැබීමකින් නෙමෙයි. එහෙනම්, ඔහු මියගියේ කොහොමද? ශක්තිමත් අතකින් හිසට එල්ල වූ දරුණු ප්‍රහාරයකින්. ඒ කියන්නේ ළමයා පැනයද්දී ඔහු සමග තවත් කෙනෙක් හිටියා ! ඔවුන් පැන ගිහින් තියෙන්නේ බොහොම වේගයෙන්. ඒ මොකද බයිසිකල් ශූරයෙක් වන ගුරුතුමාටත් ඔවුන්ව අල්ලාගන්න හැතැක්ම පහක් දුරට බයිසිකලයේ පදින්න සිද්ධවුණා.

මේ මරණය සිද්ධවුණු හරියේ පොළොව අපි හොඳින් පරීක්ෂා කළා. නමුත් මොනවද අපි දැක්කේ? හරකුන්ගේ කුර වල සලකුණු පමණයි. මං පැහෙන තරමක් දුරට වටේටම පරීක්ෂා කරල බැලුවා. යාර පනහක් ඇතුළත, වෙනත් කිසිම බයිසිකලයකින් පැමිණි කෙනෙක්, මේ මිනීමැරුමට කොහෙත්ම සම්බන්ධ නෑ. ඇයි මිනිස් අඩි සටහනක්වත් එතැන තිබුණේ නැහැ නේ

'ඒක වෙන්න බැහැ නේ හෝම්ස්?'

'බොහොම හොඳයි වොට්සන්. මං මේ විස්තර කළ ආකාරයටම මේක වෙන්න ඉඩක් නෑ. එහෙම නම් මං මේ කිව්ව දේ කොහේ හරි වැරැද්දක් තියෙන්න ඕන. ඒ වුණත් ඔබ හැමදේම දුටුවා. කොතැනද මට වැරදුණේ?'

'ඔහුගේ හිස්කබල පුපුරා ගිය තුවාලය සිද්ධවුණේ බිම වැටීමෙන් වෙන්න බැරිද?'

Reading Purpose Only, Not For Print
investigations.blogspot.com

'මේ වගේ වගුරු බිමක වැටිලා?'

'මට නම් මොකුත් හිතාගන්න අමාරුයි'

'෴ ෴ ෴ ඇයි අපි, ඉස්සර මීට වඩා අමාරු ගැටළු රාශියක් විසඳලා තියෙන්නේ වොට්සන්? අපට දන්න රාශියක්ම තිබෙනවා. ඒවා නිවැරදිව සකසා භාවිතයට ගැනීමයි අවශ්‍ය. පාමර් ටයරය තියෙන බයිසිකලයෙන් වෙන ගන්න ප්‍රයෝජනයක් නෑ. එහෙම නම් අපි බලමු ඩන්ලොප් ටයරය තියෙන බයිසිකලයෙන් ගන්න පුළුවන් ප්‍රයෝජනය මොකක්ද කියලා'

එම ටයර් ලකුණු වැටී තිබුණු මාර්ගය දිගේ අපි සෑහෙන දුරක් ඉදිරියට ගමන් කළෙමු. ඉන්පසු බිල්ලුව ක්‍රම ක්‍රමයෙන් උස්බිමක් බවට හැරෙන්නට පටන් ගත්තේය. කුඩා පඳුරු රාශියකින් වැසුණු මෙහි පොළොවේ, ටයර් ලකුණු බලාපොරොත්තු විය නොහැක. අප අන්තිමට ඩන්ලොප් ටයර් සලකුණු දුටු තැන සිට, බයිසිකලය සැතපුම් කිහිපයක් ඈතින් පිහිටි, හෝල්ඩනස් මන්දිරය වෙත ගමන් කළා විය හැක. එසේත් නැතිනම් එය චෙස්ටර්ෆීල්ඩ් මහා මාර්ගයට මායිමව පිහිටි කුඩා ගම්මානය දෙසට ගමන් කළා විය හැක.

අපි ඉදිරියට ගමන් කළෙමු. මහත් අප්‍රසන්න, අපිරිසිදු පෙනුමක් තිබූ 'ෆයිටිං කොක්' (පොර කුකුළා) තානායම වෙත යෑමට අපි තීරණය කළෙමු. එහි දොරට ඉහළින් පොර කුකුළෙකුගේ රූපය ඇඳ තිබූ බෝඩ් ලෑල්ලක් සවිකොට තිබිණි. එක්වරම තද වේදනාවෙන් කෑගැසූ ශර්ලොක් හෝම්ස්, එක් අතකින් කකුල අල්ලා ගත්තේය. තව මොහොතෙන් ඔහු බිම ඇද වැටීමට ඉඩ තිබිණි. ඔහු නොවැටී බේරුණේ මගේ උරහිසේ එල්ලී, එය තදින් අල්ලා ගැනීම නිසයි. කකුලේ ඇස්වටය අසල උළුක්කු වීම නිසා ඔහු පීඩාවට පත්වූ බව මට වැටහිණි. බොහෝ අපහසුවෙන් ඔහු තානායමේ දොරටුව වෙත ගමන් කළේ හොන්ඩි ගසමිනි. තරබාරු වයස්ගත පුද්ගලයෙක් දුම්පයිප්පයක් උරමින් උළුවස්සට හේත්තු වී සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

'කොහොමද රූබන් හේස් මහත්මයා ඔබේ සැප සනීප?' හෝම්ස් ඇසුවේය.

'තමුසෙ කවුද? ඊළඟට තමුසේ කොහොමද ඔය තරම් හොඳට මගේ නම දැනගත්තේ?'

ගැමියා ඇසුවේ කපටි නෙත් යුවල සුපරීක්ෂාකාරීව අප වෙත යොමු කරමිනි.

'ඔබේ හිසට උඩින් තියෙන 'බෝඩ් ලෑල්ලේ නම සම්පූර්ණයෙන්ම ලියලා තියෙන්නේ. යම් තැනක අයිතිකාරයා කවුද කියල හිතාගන්න එක ඒ තරම් අපහසු දෙයක් නෙමෙයි. ඔබේ ඉස්තාලයේ අශ්ව කරත්තයක් එහෙම නැද්ද?'

'නෑ. මං ළඟ නෑ'

'මගේ කකුල බිම තියන්න බෑ' හෝම්ස් කීය.

'එහෙනං ඉතිං බිම නොතියා ඉන්නවා'

'ඉතින් මට ඇවිදින්න බැහැනේ'

'එහෙනම් ඉතින් පැන පැන යනවා'

රූබන් හේස් මහතා කතා කළේ ඒ තරම් විනීත ආකාරයට නොවේ. එහෙත් හෝම්ස් එය (විහිළුවක්ම භාරගත්තේය.

'මේ බලනවා මනුස්සයෝ. මං ලොකු අමාරුවක වැටිලා ඉන්නේ. කොහොම වුණත් කමක් නෑ, මට කොයි විදියට හරි......................' හෝම්ස් කීවා පමණි.

'කොහොම වුණත් මට කමකුත් නෑ' හේස් පිළිතුරු දුන්නේය.

'කාරණය ඉතාම වැදගත්. මට පාවිච්චි කරන්න බයිසිකලයක් හොයල දෙන්න පුළුවන් නම් මං ඔහේට පවුමක් දෙනවා'

තානායම් හිමිකරුවා සැලකිල්ල යොමු කළේ එවිටයි.

Reading Purpose Only, Not For Print
http://



41. "තමුසේ කවුද?........ තමුසෙ කොහොමද මිය තරම් හොඳට මගේ නම දැනගත්තේ"

http://sherlockholmesinvestigations.blogspot.com

'කොහේට යන්නද ඔහේට ඕන කරන්නෙ?'

'හෝල්ඩනස් මන්දිරයට'

'ආදිපාදතුමාගෙ යාළුවො වෙන්න ඇති?'

තානායම්කරු පැවසුවේ, මඩ ඉහිරුණු අපේ ඇඳුම් දෙස නෙත් හෙළමිනි. හෝම්ස්ගේ මුවේ නැගුණේ ප්‍රීතිමත් සිනහවකි.

'කොයි විදියට හරි අපව දකින්න ආදිපාදතුමා කැමති වේවි'

'ඒ ඇයි?'

'ඒ මොකද ඔහුගේ අතුරුදහන් වුණු පුතා ගැන අපි ආරංචියක් හොයාගත්තා. ඒක කියන්න යන්නයි මේ හදන්නෙ'

තානායම්කරු එක්වරටම තිගැස්සුණු බව අපි දුටුවෙමු.

'මොනවා? තමුසෙල ඒ ළමයා ගැන හොයද ඔය යන්නෙ?'

'ලිවර්පූල් නගරයේ ඔහුව දකින්න ලැබිල තියෙනවා. කොයි මොහොතේ හරි ඔහුව හොයා ගනීවි'

රූබන් හේස්ගේ රැවුල නොකැපූ මුහුණේ යළිත් වෙනසක් ඇතිවිය. ඔහුගේ ස්වභාවය එක්වරම ප්‍රසන්න වූ අයුරු අපට පෙනිණි.

'ඔය වෙන මිනිස්සුන්ට වගේ ආදිපාදවරයාට ශුභ පතන්න මට උවමනාවක් නෑ. කාලයක් ඔහුගේ ප්‍රධාන අශ්ව කරත්ත රියදුරා හැටියට වැඩකළේ මම. ඔහු මට සැලකුවේ බොහොම නපුරු විදියට. බොරුකාර වෙළෙන්දෙකුගේ එක වචනෙට, කිසිදෙයක් හොයන්නෙ බලන්නෙ නැතුව එක පාරටම මාව රස්සාවෙන් අස්කරල දැම්මා. ළමයා හොයාගන්න ලැබුණු එක ගැන නම් මට සන්තෝෂයි. පණිවුඩය අරං යන්න මං ඔහේලට උදව් කරන්නම්'

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

'බොහොම ස්තුතියි. ඉස්සර වෙලා අපි මොනව හරි කාල ඉඳිමු. ඊට පස්සෙ ඔහේට බැරිය බයිසිකලේ අරගෙන එන්න'

'මං ළඟ බයිසිකලයක් නෑ'

හෝම්ස් පවුමේ රන් කාසිය ඉහළට ඔසවා ඔහුට පෙනෙන ලෙස අල්ලාගෙන සිටියේය.

'මං ඔහේට කිව්වෙ මනුස්සයෝ. මා ශාව බයිසිකලයක් නෑ. ඕනෙ නම් ඔහේලට අශ්වයයා දෙන්නෙත් දෙන්නම්. හෝල්ඩනස් මන්දිරයට ගිහිං ආපහු ගෙනැත් දීල යන්න'

'හොඳයි. අපි ඉස්සර වෙලා මොනවා හරි කාල ඉමුකො. ඊට පස්සෙ බැරිය ඒ ගැන කථා කරන්න'

තානායමේ කුස්සියේ අප දෙදෙනා තනිවිය. ඒ වහාම හෝම්ස්ගේ උවක්කු වූ සකුල් හොඳින් සනීප වූ හැටි පුදුම සහගතය. ඒ වනවිට ඇඳිරි වැටීමටත් ආසන්නව තිබිණි. උදේ ආහාරය ගත් පසු අප නැවමත් කිසිම ආහාරයක් ගෙන නොමැත. තරමක් වේලා ගතකරමින් අපි කුස පුරා ආහාර ගත්තෙමු.

කල්පනාවේ වෙලී සිටි හෝම්ස් වරක් දෙවරක් ජනේලය වෙත ගොස්, ඉතා උනන්දුවෙන් ඉවත බලාගෙන සිටියේය. ජනේලයෙන් පිටත තිබුණේ ඉතා අපිරිසිදු මිදුලකි. එහි ඈත කෙළවරක වූයේ කම්මලකි. අපිරිසිදු තරුණයෙක් එහි යම්කිසි වැඩක නිරත වී සිටියේය. මිදුලේ අනෙක් පැත්තේ තිබුණේ ඉස්තාලයකි. ආපසු පැමිණ, පුටුවේ වාඩිවී කල්පනා කරමින් සිටි හෝම්ස් එක්වරම ප්‍රීතියෙන් කෑගසමින් උඩ පැන්නේය.

'දෙවියන්ට ඔස්තු වෙච්චාවෙ ! හරි ! හරි ! වොට්සන්. මං හිතන්නේ මට විසඳුම ලැබුණා. ඔව්, ඔව්. ඔබට අද ගවයන්ගේ අඩි සටහන් කුර ලකුණු දකින්න ලැබුණාද වොට්සන්?'

'ඔව්, මහ ගොඩක් දැක්කා'

'කොහේද?'

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි විල්ලුවේ හැමතැනකම වගේ අපි දැක්ක නේ. මඩ ගොහොරුව ප්‍රදේශයේ, විළහට අර පාරේ: ඇයි අර හෙයිඩෙගර් මියගොස් සිටි හරියෙත් තිබුණා,

"හරියට හරි. කොහුයි මේ විල්ලුවේ එළදෙනුන් හෝ එළහරකුන් කී දෙනෙක් ඔබ දුටුවද?"

මම මදක් කල්පනා කළෙමි.

"එකෙක්වත් දැකපු බවක් මට නං මතක නෑ"

"හරි පුදුමයි නේද වොට්සන්? මුළු විල්ලුවෙම හැමතැනකම ගවයින්ගේ කුර සටහන්. ඒත් අපිට කොහේවත් එක ගවයෙක් වත් දකින්න ලැබුණේ නෑ"

"ඔව්. ඒක නම් පුදුම තමා"

"දැන් අර දැකපු කුර සටහන් ඔයාගේ මතකයට නගා ගන්න. වොට්සන් ඔබට මතකයි නේද අර කුර සටහන් තිබුණු හැටි?"

"ඔව් මට මතකයි"

"ඒ අඩි සටහන් තිබුණේ මෙන්න මේ ආකාරයට හෝම්ස් අතේ තිබුණු පාන්, කුඩා කෑබලි වලට කඩා මේසය මත තැබුවේය.

"එක හරියකදි මේ වගේ : : : :

සමහර වෙලාවට මෙහෙම : . : . : . : .

ඉඳහිටල මේ වගේ . . . .

ඔබට මතක නේද වොට්සන්?"

"ඕක නම් මට හරියටම මතක නෑ.

"ඒ වුණාට මට මතකයි. මට දිවුරන්න පුළුවනි. අපි ඉඩ තියෙන වෙලාවක ගිහිල්ලා ඇවිල්ලාත් ඒක සහතික වශයෙන් බලාගමු. අන්ධයෙක් වගේ මං මේක නොදැක්ක හැටි. ඒකෙන්ම මට අවස්ථාන් නිගමනයකට එන්න තිබුණා!

Reading Purpose Only, Not For Print
http://...blogspot.com

'මොකක්ද අවසාන නිගමනය?'

නැහැ, විටෙක හෙමින් හෙමින් අඩිය තබමින් ඉදිරියට ඇවිදින, තවත් විටෙක වේගයෙන් ලොකු පිම් පනිමින් දුවන සුවිශේෂ ගවයනුත් ඉන්නා බව. දෙයියෝ සාක්කි ! මේ වගේ ඇස්බැන්දුමක්, ගම්බද නැබෑරුම් කාරයෙකුගේ මොලයෙන් කරා කියල හිතන්න බෑ කොහොමටවත්.

වොට්සන්. කිසිකෙනෙක් පෙනෙන තෙක් මානයක නෑ, අර කම්මලේ වැඩකරන කොල්ලව ඇරෙන්න. අපි ටිකක් එළියට බැහැල බලමු මොනවද පෙනෙන්න තියෙන්නෙ කියල

ඉස්තාලය හොඳටම අබලන්වී ගරා වැටුණු එකක් විය. රළු ලෝම සහිත අපිරිසිදු අශ්වයෝ දෙදෙනෙකු එහි ගාල්කර සිටියහ. ඉන් එකෙකුගේ පිටුපස කකුල ඔසවා බැලූ හෝම්ස් හඬනගා සිනාසුණේය.

'පරණ ලාඩම්: ඒත් අලුතෙන් සවිකරල. පරණ ලාඩම්: ඒත් අලුත් ඇණ. මේ පරීක්ෂණය ඉතා හොඳ සම්භාව්‍ය ගණයේ එකක් වෙනවා. ඒ ගැන කිසිම සැකයක් නෑ. බලමු අර කම්හලේ වැඩකරන කොල්ලත් එක්ක කථා කරල'

අප දෙසවත් නොබැලූ කොලුවා දිගටම තමා කරමින් සිටි රාජකාරියේම යෙදුණේය. එතැන සෑම අනකටම විසිරී තිබුණු දැව හා යකඩ කෑබලි දෙස හෝම්ස්ගේ තීක්ෂණ බැල්ම යොමුවන ආකාරය මම දුටුවෙමි.

එසැවරම අප පිටුපසින් අඩි ශබ්දයක් ඇසිණි. ඒ 'ෆයිට්ංකොක්' තානායමේ අයිතිකරුවාය. තලල රැලි කරගෙන, කෝපාවිෂ්ට බැල්මක් අප වෙතට හෙළමින්, ඔහු ඉදිරියට ආවේ වෙව්ලමිනි. කෙළවරට ලෝහ ගුලියක් සවි කළ මුගුරක් ඔහුගේ අතේ තිබිණි. මම සාක්කුව අතගා බැලුවෙමි. එහි රිවෝල්වරය තිබූ බව දැනීම, මට මහත් සැනසීමක් විය.

'හොර තක්කඩි! ඔත්තුකාරයෝ ! උඹල මොනවද මෙහේ කරන්නේ?'

http://sherlockholmesinvestigations.blogspot.com

'රූබන් හේස් මහත්මයා. ඇයි මේ කලබල වෙලා?' හෝම්ස් ඇසුවේ නිවුණු ස්වරයෙනි. 'කාට හරි හිතේවි මහත්තයා මොනවා හරි හංගලා තියාගන්නවා: අපි ඒක හොයා ගනීවි කියල භයෙන් කෑගහනවා කියල..............'

රූබන් හේස් මහත් පරිශ්‍රමයක් දරා, තම කෝපය මැඩ පවත්වා ගත්තේය. ඉන්පසු ඔහු මවා ගත්තේ බොරු සිනහවකි. එය ඔහුගේ රැවුමටත් වඩා දරුණු යයි මට සිතිණි.

'තමුන්මල හොඳට පරීක්ෂා කරල බලන්න, මහේලට නිදහස තියෙනවා. මගේ ළඟ මොනවා හරි සැක කටයුතු දෙයක් තිබෙනවද කියලා බලන්න. ප්‍රශ්නයක් නෑ.

ඒ උණාට මේ බලනවා උන්නැහේ. මගේ තැනට ඇවිල්ලා, මගේ අවසර නැතුව ඒව මේව අවුස්සන මිනිස්සුන්ට මං කැමති නෑ. ඒ හින්ද, කාපු මීටුවට අල්ලී ගෙවිලා, මෙතනිං ඉක්මනට මකබෑ වෙච්ච තරමට මහෙලගෙ ඇඟට ගුණයි'

'හොඳයි හොඳයි හේස් මහත්තයා. අපි මහේට කරදරයක් කරන්න කල්පනා කළේ නෑ. අපි මහේගෙ අශ්වයො කොහොමද කියල පරීක්ෂා කරල බැලුවා විතරයි. මං හිතන්නේ මට ඇවිද ගන්න පුළුවන් වේවි. හෝල්ඩනස් මන්දිරයට ඒ හැටි දුරක් නැතුව ඇති. මගේ හිතේ?'

'ඒකෙ ගේට්ටුව ළඟට ගැනැත්ම දෙකක් වත් නෑ. ඔය වම් පැත්තට තියෙන පාරෙන් යන්න'

අප ඔහුගේ ඉඩමෙන් ඉවත්වී යනතුරු, හේස් බලා සිටියේ සැකමුසු බැල්මෙනි.

අපි ඒ අයුරින් වැඩිදුරක් ගමක් නොකෙළෙමු. හුදුරින්ම නිලු වංගුව පසුකොට, තානායම්කරුවාට නොපෙනෙන මානයට ආ වහාම හෝම්ස් නැවතුණේය.

'මට නම් මේ තානායම දාල යන්න හිතෙන්නෙම නෑ වොට්සන්'

sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

'මට විශ්වාසයි මේ රූබන් හේස් ඔක්කොම දන්නවා. බැලූ බැල්මට ම මේ වගේ මුරවර පෙනුමක් තියෙන එකෙක් මං මීට ඉස්සර දැකල නෑ' මම කීවෙමි.

'ආ........ ඔහුගේ පිළිවෙළ ඔබටත් තේරුණාද? ඔහු ළඟ අශ්වයෝ ඉන්නවා: කම්මලක් තියෙනවා. ඒවුණත් ෆයිටිං කොක් තානායම බොහොම සිත් ඇදගන්නා සුළු තැනක්. ඔහුට නොතේරෙන්න අපි මේ තානායම තව ටිකක් පරීක්ෂා කරල බලන්න ඕන'

අපි කඳු බෑවුමේ ඉහළට සෙමින් සෙමින් ගමන් කළෙමු. පාර දෙපස තැනින් තැන විශාල ගල් පර්වත කැබැලි ගොඩගසා තිබිණි. හෝල්ඩනස් මන්දිරය පැත්තේ සිට කඳු බෑවුම පහළට වේගයෙන් බයිසිකලයක් පැද එන්නෙකු අපි දුටුවෙමු.

'ඉක්මනට එහාට වෙන්න වොට්සන් !'

යයි කෑගැසූ හෝම්ස් මගේ උරහිසට අත තබා පහළට තල්ලු කළේය. අප පාර අයිනේ ගල්කුළකට මුවාවී සැඟවුණා පමණි. ඔහු බයිසිකලයෙන් අප පසුකර ගියේ පියාඹන කුරුල්ලෙකුගේ වේගයෙනි. දූහුවිලි වලාවක් මැදින් පෙනුණු ඒ මුහුණ, මට හඳුනාගත හැකි විය. සුදුමැලි වී, කට බාගෙට ඇරුණු භීතියෙන් විරූපී වූ ඒ පුද්ගලයා, කලින් ද රාත්‍රියේ අප දුටු ජේම්ස් වයිල්ඩර්ය.

'ආදිපාදතුමාගේ පුද්ගලික ලේකම් ! එන්න වොට්සන් අපි බලමු මිනිහ මොනවද කරන්නේ කියල'

අපි ඉක්මනින් තානායම දෙසට ආපසු දිව ගියෙමු. ගල්කුළු වලට මුවාවී, තානායමේ ඉදිරිපස දොර දෙස බලා සිටීමට අපට හැකි විය. වයිල්ඩර්ගේ බයිසිකලය බිත්තියට හේත්තු කොට තිබිණි. නිවස තුළ කිසිවකු එහා මෙහා යන බවක් නොපෙනිණ. හෝල්ඩනස් මන්දිරයේ ඉතා උස් කුළුණු වලට පිටුපසින් ඉර බැස ගියේය. මුළු ප්‍රදේශයම අඳුරෙන් වැසී යාමට පටන්ගත්තේය. තානායමේ ඉස්තාලයේ කුඩා අශ්ව කරත්තයක දෙපස ලාම්පු



"ඉක්මනට පහත් වෙන්න වොට්සන්!" හෝම්ස් මගේ උරහිසට අත තබා තල්ලු කළේය.

gations.blogspot.com

දෙකක් දල්වනු අපට දකින්නට ලැබිණ. මඳ වේලාවක් ගත වෙද්දී අශ්වයන්ගේ කුරගැටෙන හඬත්, කරත්තය මහා මාර්ගය වෙත එන හඬත්, ඇසිණි. මහාමාර්ගයට පැමිණි වහාම එය ඉතා වේගයෙන් වෙස්ටර් ෆීල්ඩ් දෙසට ගමන් කිරීමට පටන් ගත්තේය.

'ඒ මොකක් කියලද ඔබට හිතෙන්නෙ වොට්සන්?'

'මට පෙනෙන්නෙ කවුරු හරි පැන යනවා වගෙයි'

'ඒ කුඩා අශ්ව කරත්තයෙන් ගියේ එකම පුද්ගලයෙක් කියලයි මට හිතෙන්නෙ. ඒත් ඒ ජේම්ස් වයිල්ඩර් නම් නෙමෙයි. ඒ මොකද දැනටමත් ඔහු අර දොර අසල හිටගෙන ඉන්නෙ'

රතු පැහැයට හුරු ආලෝකය හතරැස් කොටුවක් ලෙස අපට අඳුරේ දිස්විය. එය මැද අඳුරු සෙවණැල්ලක් මෙන් පෙනුණේ ජේම්ස් වයිල්ඩර් ගේ රූපයයි. ඔහු හිස එළියට දිගු කරමින් විපරමින් සිටියේ යම් කිසිවකු බලාපොරොත්තුවෙන් බව අපට වැටහිණ.

තරමක් වේලා ගතවූ පසු පාර දිගේ කිසිවකු ඇවිද යන අඩි ශබ්දය අපට අසන්නට ලැබිණ. රතු ආලෝක කොටුව ඉදිරියෙන් එම දෙවැනි පුද්ගලයාගේ ඡායාවක් අපි දුටුවෙමු. ඔහු නිවස තුළට ඇතුළුවූවාත් සමගම දොර වැසිණ. සියල්ල යළිත් අඳුරු විය. මිනිත්තු පහකට පසු උඩුමහලේ කාමරයක පහනක් දල්වන ලදී.

'ෆයිටිං කොක් තානායමේ තියෙන්නේ අමුතුම තාලේ සිරිත් විරිත් වගෙයි' හෝම්ස් කීය.

'මත්පැන් සල තමා තියෙන්නෙ ගෙයි අනික් පැත්තෙ'

'ඒක හරි. මෙන්න මේ අයට තමයි කියන්නෙ, පෞද්ගලික අමුත්තො කියල. අඳුරු වැටුණු මේ වේලාවෙ ආදිපාදතුමාගෙ පෞද්ගලික ලේකම් වයිල්ඩර් මහත්තයට මේ ගුහාවෙ තියෙන රාජකාරිය මොකක්ද? ඊළඟට ඔහු හමුවෙන්න එන ඔහුගේ හවුල්කාරයා කවුද? අපි ගිහින්ම බලමු වොට්සන්. තරමක්

අන්තරාදයක වැඩක් වුණත් අපි මේක පෝදිපි කරල බැලිය යුතුමයි.

ශබ්ද නොනගා පාරේ ඇවිද ගොස් අපි දෙදෙනා නානායමේ දොරටුව අසලටම පැමිණියෙමු. බිත්තියට හේත්තු කළ බයිසිකලය තවමත් එලෙසම තවතා තිබිණි. හෝම්ස් ගිනිකූරක් දල්වා එහි පිටුපස රෝදයේ ටයරය පරීක්ෂා කර බැලුවේය. පැච් දමා තිබූ ඩන්ලොප් ටයරය දුටු ඔහුට සිනා පහළ විය. ආලෝකමත් වූ ජනේලය පිහිටා තිබුණේ අපගේ හිසට ඉහළිනි.

'වොට්සන්, මං කොහොමහරි ඔය ජනේලයෙන් ඇතුළ බලන්න ඕන. ඔබ ටිකක් පහත් වෙලා බිත්තිය හොඳින් අල්ලා ගන්න. හරි. දැන් මම ඔබේ කරට නගින්නම්. දැන් ඔබ ටිකක් එසවුණොත් මට ජනේලයෙන් ඇතුළ බලාගත හැකිවේවි. හරි හරි'

මොහොතකින් තම දෙපය මගේ උරහිස් මත තබාගත් හෝම්ස් ඉහළටම එසවුණේය. එහෙත් වැඩිවෙලා එසේ නොසිට ඔහු ඉක්මනින් පහතට බැස්සේය.

'යමු යමු වොට්සන්. අපට එක දවසකට කරන්න තිබුණු වැඩ ප්‍රමාණය බොහොම විශාලයි. දැය ගණනාවක්ම ඒකෙ යෙදෙන්න සිදුවුණා නේ. මං හිතන්නේ හොයාගන්න අවශ්‍ය කරුණු ඔක්කොම අපි හොයාගෙනයි තියෙන්නේ. හක්ස්ටබල් මහත්තයගෙ පාසලට සැහෙන දුරක් ඇවිදගෙන යන්න තියෙනවා. පුළුවන් ඉක්මනට මෙහෙන් ගිය තරමට හොඳයි'

විල්ලුව හරහා ආපසු ගියේ ගමනේදී හෝම්ස් එක වචනයක්වත් කථා නොකළ තරම්ය. අප පාසල කරා ළඟාවුණත් එහි ගේට්ටුවෙන් ඇතුළු නොවීමට ඔහු තීරණය කළේය.

'මෙහොම ඉන්න වොට්සන්. අපි දැන් පාසලට යන්නෙ නෑ. මට විදුලි පණිවුඩ කිහිපයක් යවන්න උවමනායි. ඊට පස්සෙ යමු පාසලට'

තම ගුරු මණ්ඩලයේ හෙයිඩෙගර් ගුරුතුමාගේ ඛේදජනක

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

මරණය නිසා, හක්ස්ටබල් මහතා බලවත් ශෝකයටත්, කම්පනයටත් පත්ව සිටියේය. මැදියම් රැය එන තෙක් හෝම්ස් කාලය ගත කළේ විදුහල්පතිතුමාගේ ශෝකය තුනී කොට ඔහුට සැනසිලි බස් තෙපළීමටයි. හෝම්ස් කාමරයට පැමිණියේ ඊටත් පසුවයි.

‘හැම දෙයක්ම සාර්ථකව සිදුවෙමින් යනවා, වොට්සන්. හෙට හැන්දෑවෙන්න කලින් මේ අබිරහස සම්පූර්ණයෙන්ම විසඳන බවට මං සහතික වෙනවා’

පසුවද උදේ එකොළහ වෙද්දී අපි හෝල්ඩනස් මන්දිරය බලා පිටත්ව ගියෙමු. දෙපස අලංකාර ලෙසින් ‘යූ’ ගස් වවා තිබූ, ඒ ප්‍රසිද්ධ මාවත දිගේ අපි මන්දිරයට ළඟාවීමු. එලිසබෙත් රාජිනියගේ යුගයේ ගෘහනිර්මාණ ශිල්පය අනුව ඉතා අලංකාරව ඉදිකළ ආරුක්කු සහිත ආලින්දයක් වෙත අපි පිවිසියෙමු. එතැනින් ආදිපාදතුමාගේ කුත්තෝරු කාමරය වෙත අප කැඳවාගෙන යන ලදී. එහිදී අපට හමුවූයේ ජේම්ස් වයිල්ඩර් මහතායි. ඔහුගෙන් ප්‍රකාශ වූයේ මඳක් ලජ්ජාශීලී එහෙත් මහෝත්සාහ විලාසයකි. කලින්ද රාත්‍රියේ අප දුටු භීතිය හා තැතිගැන්ම, ඔහුගේ සටකපට දෑසේ තවමත් සැඟව ඇතැයි මට සිතිණ.

‘ඔබ ආවෙ ආදිපාදතුමා හමුවෙන්නද? කණගාටුයි කියන්න. එතුමා හමුවෙන්න විදියක් නෑ. එතුමා හුඟක් අසනීපෙන් ඉන්නෙ. අර ඛේදජනක මරණය නිසා බලවත් කම්පනයට පත්වෙලා. ඔබ කළ සොයා ගැනීම ගැන දන්වලා හක්ස්ටබල් මහත්මයා ඊයේ අපට විදුලිපුවතක් එවල තිබුණා.’

‘මං කොහොම හරි ආදිපාදතුමා හමුවිය යුතුයි වයිල්ඩර් මහත්මයා’

‘ඒ වුණත් එතුමා කාමරේට වෙලාමයි ඉන්නෙ’

‘එහෙනම් මං කාමරේට යන්නම්?’

‘මං හිතන්නේ එතුමා ඇඳේ සැතපෙනවා.’

http://sherlockholmesinvestigations.blogspot.com

'එහෙනම් සැනසෙද්දිම මට පුළුවන් එතුමා හමුවෙන්න'

'හෝම්ස්ගේ දැඩි, නොනැමෙන ප්‍රතිපත්තිය දුටු ලේකම් වරයා, තවදුරටත් තර්ක කිරීමෙන් පලක් නොමැති බව වටහා ගත්තේය.

'හොඳයි හෝම්ස් මහත්මයා, මං ඔහුට කියන්නම් ඔබ ඇවිත් ඉන්නව කියල'

වංශාධිපතිවරයා අප හමුවීමට පැමිණියේ තවත් පැයකට පසුවයි. ඔහුගේ මුහුණ මළමිනියක් මෙන් සුදුමැලි වී තිබිණ. කලින් දින අප දකිද්දී සිටියාට වඩා අවුරුදු ගණනාවකින් වයස්ගත වී වැහැරුණු බවක් ඔහුගේ මුහුණෙන් දිස්විය. අපට ආචාර කළ ඔහු මේසය අසලින් හිඳගත්තේය.

'ඇයි හෝම්ස් මහත්තයා?'

මගේ මිත්‍රයාගේ දැස් යොමුවී තිබුණේ ආදිපාදතුමා අසලින්ම නැගිට සිටි ඔහුගේ ලේකම් වරයා වෙතයි.

'ගරු ආදිපාදතුමනි, ඔබතුමාගේ ලේකම් වරයාට මෙතැනින් ඉවත්වී යා හැකි නම් මට වඩාත් නිදහසේ කතා කරන්න පුළුවනි'

ජේම්ස් වයිල්ඩර් හෝම්ස් වෙත හෙළුවේ කෝපාවිෂ්ට කුරිරු බැල්මකි.

'ආදිපාදතුමාට ඕනෙ නම්.....................' වයිල්ඩර් කථා කිරීම ඇරඹුවා පමණි.

'ඔව්. ඔව්. ඔහේ එළියට යන එක වඩා හොඳයි. හෝම්ස් මහත්මයා, මොනවද ඔබට කියන්න තියෙන්නෙ?'

ජේම්ස් වයිල්ඩර් පසුබැස යන ආකාරය හෝම්ස් නිහඬව බලා සිටියේය. ඔහු පිටවී ගොස් දොර වැසූ පසු හෝම්ස් කථාව පටන් ගත්තේය.

'ගරු ආදිපාදතුමනි, ආචාර්ය හක්ස්ටබල් මහත්මයා



වයිල්ඩර් හෝම්ස් වෙත හෙළවේ කෝපාවිෂ්ඨ, කුරිරු බැල්මකි.

http://sherlockholmesinvestigations.blogspot.com

මටත්, මගේ මිත්‍ර වොට්සන්ටත් ප්‍රකාශිත කරලා කිව්වා, මේ අභිරහස විසඳුවොත් ත්‍යාගයක් පිරිනමන්න ඔබ පොරොන්දු වෙලා තියෙනවා කියල. ඒක ඇත්තද කියල ඔබේ කටින්ම දැනගන්න අපට අවශ්‍යයි.

'ඒක සත්‍යයක් හෝම්ස් මහත්මයා'

'මට දැනගන්න ලැබුණු හැටියට, ඒය, ඔබේ පුත්‍රයා සිටින තැන ගැන දැනුම් දෙන කෙනෙකුට පවුම් සන්දහසක ත්‍යාගයක්?'

'හරියට හරි'

'ඔබේ පුත්‍රයා සිරකරගෙන ඉන්න තැනැත්තා හෝ තැනැත්තන්ගේ නම් හෙළි කරන පුද්ගලයාට පවුම් දහසක ත්‍යාගයක්?'

'ඒකත් නිවැරදියි'

'එහෙම කිව්වම ඔබ අදහස් කරන්න ඇත්තෙ ඔබේ පුත්‍රයා පැහැරගෙන ගිය පුද්ගලයින් පමණක් නොවෙයි, ඔහුව මේ අවස්ථාවෙ හිරකර තබාගන්න උදව් කරන පුද්ගලයිනුත්. එහෙම නේද ආදිපාදතුමනි?'

'හරි.....හරි.......' ආදිපාදතුමා පැවසුවේ නොඉවසිල්ලෙනි. 'ෂර්ලොක් හෝම්ස් මහත්මයා, ඔබ ඔබේ රාජකාරිය හරි හැටි කරන්න. ඒවට තැගි පිරිනැමීමේදී මං ලෝභ වෙව්, මග හරිව් කියල බයවෙන්න එපා'

මගේ මිත්‍රයා ඉමහත් තෘප්තියෙන් දෑත් පිරිමැද්දේය. ඔහු අනුග්‍රාහකයන් ලවා මුදල් වියදම් කරවූයේ මහත් අර පිරිමැස්මෙන් බව දත් මම, මෙයින් පුදුමයට පත්වීමි.

'ආදිපාදතුමනි. අර මේසය උඩ තියෙන්නේ ඔබතුමාගෙ චෙක්පොත නේද? මං කැමතියි ඔබතුමා ඉස්සර වෙලා පවුම් හයදහක චෙක් පතක් මගේ නමට ලියල, ඒක රේඛිතය කරනවා නම්: මගේ බැංකුව, කැපිටල් ඇන්ඩ් කවුන්ටිස් බැංකුවේ ඔක්ස්ෆර්ඩ් වීදියේ ශාඛාව'

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

පිළිමයක් මෙන් නොසැලී පුටුවේ වාඩිවී සිටි ආදිපාදතුමා මගේ මිත්‍රයා දෙස බලා සිටියේ තුෂ්ණිම්භූතවයි.

'මේක විහිළුවක්ද හෝම්ස් මහත්මයා? මෙතන විහිළු කරමින් සන්තෝෂවෙන්න තරම් දෙයක් නෑ'

'මේ කිසිසේත් විහිළුවක් නොවෙයි ආදිපාදතුමනි. මගේ ජීවිතේට කවදාවත් මේ වගේ අවංකව කථා කරල නෑ'

'මොකක්ද ඔබ කියන්නෙ එහෙනම්?'

'මට කියන්න තියෙන්නේ ඔබේ ත්‍යාගය මං දිනාගත්ත බවයි. ඔබතුමාගේ පුත්‍රයා ඉන්න තැන මං දන්නවා. මේ අවස්ථාවේ ඔහුව රඳවාගෙන ඉන්න අයගෙන් කිහිප දෙනෙකුවත් මං අඳුනනවා.

ආදිපාදතුමාගේ මුහුණ තවත් සුදුමැලි වෙද්දී ඔහුගේ රැවුල වඩාත් රතුවට තැපී පෙනිණ.

'පුතා ඉන්නෙ කොහේද?' ඔහු ඇසුවේ අපහසුවෙන් හුස්මක් අල්ලමිනි.

'ඔබේ පුතා ඉන්නවා, නැත්නම් ඊයෙ රෑ වෙනතුරු සිටියා, හෝල්ඩනස් මැඳුරේ ගේට්ටුව ළඟ ඉඳල සැතපුම් දෙකක් දුරින් තිබෙන පයිටිං කොක් තානායමේ !'

ආදිපාදතුමා පුටුවේ පිටුපසට ඇද වැටුණේය.

'මේ අපරාධය සම්බන්ධයෙන් කාටද ඔබ චෝදනා කරන්නේ' ඔහු ඇසීය.

මෙයට හෝම්ස් දුන් පිළිතුර විස්මයජනකය. අඩියක් ඉදිරියට තැබූ ඔහු, ආදිපාදතුමාගේ උරහිස මත අත තැබුවේය.

'මං චෝදනා කරන්නේ ඔබට. ඉතින් ආදිපාදතුමනි අර චෙක් එක ලියලා හිටිය නං......................'

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ මොහොතේ ආදිපාදවරියාගේ මුහුණෙන් ප්‍රකාශවුණු හැඟීම් මට ජීවිතයේ කිසිදිනෙක අමතක නොවේ. ප්‍රපාතයකට ඇදවැටෙන අයෙක්, එයින් ගැලවීමට, එක්වරම දෑත් වකුටු කරගෙන ඉදිරියට පනින්නාක් මෙන්; ඔහු, අසුනෙන් ඉදිරියට පැන්නේය. මඳ වේලාවකදී දැඩි ආයාසයක් දරා ක්‍රමයෙන් තම හැඟීම් පාලනය කරගැනීමට ඔහු සමත්විය. ඔහු යළිත් කථා කළේ මිනිත්තු කිහිපයකට පසුවයි.

'ඔබ මොන තරමක් දේවල් දන්නවද?'

ආදිපාදවරයා ඇසුවේ බිම බලාගෙනමය.

'මං ඊයේ රාත්‍රී දැක්කා ඔබ දෙදෙනා එකට'

'මේ ඉන්න ඔබේ මිතුයා ඇරෙන්න තවත් කවුරුවත් මේ ගැන දන්නවද?'

'මං කාටවත්

ච නෑ'

'වෙවුලන දෑතින් පෑන අතට ගත් ආදිපාදතුමා චෙක්පොත විවෘත කළේය.

'ඔබ ගෙනා තොරතුරු මොන තරම් මට කණගාටුදායක වුණත්, මං කිව්ව වචනය වෙනස් කරන්නෙ නෑ. මං මේ සූදානම් වෙන්නේ ඔබට චෙක්පතක් ලියන්නයි. තෑග්ගක් දෙන බව ප්‍රකාශ කරද්දී ඒක මේ විධියට පෙරළෙයි කියලා මට කොහොමටවත් හිතුණේ නෑ. නමුත් ඔබත්, ඔබේ මිත්‍රයාත් රහසක් ඒ හැටියටම තබාගන්න පුළුවන් අය නේද?'

'ඔබ අහන දේ මට හරි හැටි තේරෙන්නෙ නෑ ආදිපාදතුමනි?'

'ඒක මං මෙහෙම කිව්වොත්. මේ සිද්ධ වෙලා තියෙන දේවල් දන්නේ ඔබ දෙදෙනා පමණයි. ඒව තවත් දුරදිග යවන්නේ මොකටද? එතකොට මං ඔබට ණය පවුම් දෙලොස් දහසක් කිව්වොත් හරි නේද?'

Reading Purpose Only, Not For Print
crimesinvestigations.blogspot.com

මඳ සිනාවක් පෑ හෝම්ස් හිස සැලීය.

'ආදිපාදතුමනි. කාරණා විසඳලා දමන එක ඒ තරමට පහසු නෑ. ඇයි අර පාසල් ගුරුතුමාගේ මරණය? ඒක වුණේ කොහොමද කියන එක අපට පහදා දෙන්න වෙනවා.'

'ඒ වුණාට ජේම්ස් ඒ ගැන කිසිදෙයක් දැන හිටියේ නෑ. ඔබට පුළුවන් කමක් නෑ ඒක වැරැද්ද ජේම්ස් පිට දමන්න. අවාසනාවට වගේ ඔහු යොදවා ගත්ත මැරවිරයා නිසයි ඒක සිද්ද වුණේ'

'මං ඔබට මතක් කර දෙන්න ඕන ආදිපාදතුමනි: යම් කිසි පුද්ගලයෙක් යම් අපරාධයක යෙදෙනවා නම්, එවිට සිදුවෙන අනික් අපරාධවලටත් වගකීමට ඔහු බැඳී සිටිනවා'

'වගකීමට බැඳී සිටිනවා ! අන්න ඒක හරි හෝම්ස් මහත්තයා. නමුත් ඔහු සහභාගී නොවූ, ඔහු කිසිසේත් කැමැති නොවූ, ඔහු පිළිකුල් කරන, මිනීමැරුමකට, නීතිය ඉදිරියේ ඔහුව වරදකරුවෙක් කරන්න බෑ. මේක දැනගත්ත වෙලාවෙ ජේම්ස් අපමණ කම්පාවටත් භීතියටත් පත්වුණා. ඒ ගැන පසුතැවෙමින් ඔහු තමන්ගේ කැමැත්තෙන්ම මා ඉදිරියේ පාපෝච්චාරණයක යෙදුණා. ඔහු මිනීමරුවා සමග තිබුණු සම්බන්ධකම් එක පැයක් යන්න කලින් අත්හැර දැම්මා. ඔහුව බේරාගත යුතුයි හෝම්ස් මහත්මයා! අයියෝ හෝම්ස් මහත්මයා. ඔහුව කොහොම හරි බේරාගත යුතුයි ! මං ඔබට ආයාචනා කරනවා ඔහුව බේරාදෙන්න'

මෙතෙක් වේලා තම හැඟීම් පාලනය කරගැනීමට සමත්ව සිටි ආදිපාදතුමා වෙතින්, ඒ හැකියාව ගිලිහී ගොස් ඇති අයුරක් දිස්විය. කාමරයේ එහා මෙහා ඇවිදිමින්, අත් ඒ මේ අත දිගු කරමින් ඔහු අඳෝනා කියන්නට පටන් ගත්තේ අතිශය කම්පාවට පත් මුහුණෙනි.

'වෙන කාටවත් කථා නොකර, ඔබ කෙළින්ම මෙහේට ඇවිත් මා හමුවීම, ඔබ අගය කරනවා හෝම්ස් මහත්මයා. අඩු

වශයෙන් මේ අපකීර්තිමත් සිද්ධිය, නැඩි ප්‍රසිද්ධියකට පත්වීමට ඉඩ නොදී බේරාගන්නේ කොහොමද කියලා ඔබගෙන් උපදෙසක් ගන්න පුළුවන්ද?"

"ඔව්. ඒක පුළුවනි. මේක ජීවිතයට විසඳා ගන්න පුළුවන් වෙන්නේ ඔබතුමාත්, මාත් අතරේ අවංකව අදහස් හුවමාරු කරගත්තොත් පමණයි. මට හැකි තරමින් මං ඔබට උදව් කරන්නම්. එහෙම කරන්න නම්, විස්තර හැමදෙයක්ම මං දැනගන්න ඕනෑ, අන්තිම කෙළවරටම. ඔබතුමා කිව් හැටියට මට තේරෙන්නේ මිනීමරුවා ජේම්ස් වයිල්ඩර් නොවන බවයි?"

"නෑනෑ. මිනීමරුවා පැන ගිහින්"

"අපරාධ පරීක්ෂණ වෘත්තියේ දක්වා ඇති දක්ෂකම් ගැන මටත් පොඩි කීර්ති නාමයක් ලැබිල තියෙනවා. මං හිතන්නේ නෑ ඔබතුමාට ඒව අහන්න ලැබිලා ඇති කියල. මගේ දැනුම්දීම උඩ ඊයේ රෑ එකොළහට චෙස්ටර්ෆීල්ඩ්වලදී රූබන් හේස්ව අත්අඩංගුවට ගත්තා. ඒ බව දැනුවත් කරලා පොලීසියෙන් විදුලිපුවතක් ලැබුණා, අද උදේ, මං පාසලෙන් එන්න පිටත් වෙන්න කලින්"

ආදිපාදතුමා මගේ මිත්‍රයා දෙස බලා සිටියේ මහත් සේ විස්මයට පත් දෙනෙතිනි.

"හෝම්ස් මහත්මයා. ඔබ කරන්නේ මනුෂ්‍යයින්ට කිරීමට අපහසු හාස්කම්. එහෙනං රූබන් හේස්ව හිර භාරයට අරං? මට ඒක අහන්නත් සන්තෝෂයි. හැබැයි ඒකෙන් ජේම්ස්ට අවාසනාවන්ත ඉරණමකට මුහුණපාන්න වෙන්නෙ නැතිනම්"

"ඔබේ පෞද්ගලික ලේකම්ට?"

"නෑනෑ මහත්මයා මගේ පුතාට!"

මෙවර විස්මයට පත් දෙනෙතින් ආදිපාදතුමා දෙස බලාසිටීමට සිදුවුයේ මගේ මිත්‍රයාටයි.

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

'මං ඇත්තම කියන්නම්. මේක මට සම්පූර්ණයෙන්ම අලුත් ආරංචියක් ආදිපාදතුමනි. මේකා මට තව ටිකක් තේරුම් කරල දෙන්න කියල, මං ඔබෙන් ඉල්ලා හිටිනවා'

'මං ඔබට කිසි දෙයක් හංගන්නෙ නැ. ජේම්ස්ගේ ඊර්ෂ්‍යාවත්, අනුවණකමත් නිසා අපි මේ වැටිල ඉන්නේ මහා කරදරයක. ඒ නිසා කොයි තරම් හිතට වේදනාවක් වුණත්, මේ වෙලාවේ නිවැරදිම ක්‍රියා මාර්ගය ඔබට සත්‍යය හෙළි කිරීමයි.

මං බොහොම ලාබාල තරුණයෙක් කාලයේ මං තරුණියකට ආදරය කළා. හොඳින් මතක තියා, ඒක අර ජීවිතේට එක සැරයක් විතරක් කරන්න පුළුවන් විදියේ අවංක ආදරයක්. මම ඒ තරුණියට විවාහ යෝජනා කළා. ඇය රදළ පෙළපතක කෙනෙක් නෙමෙයි. ඒ නිසා ඇය සමඟ විවාහ වුණොත් මගේ අනාගතය අඳුරු වේවි යන බියෙන්, මා හා විවාහ වෙන එක ප්‍රතික්ෂේප කළා. ඈ ජීවත්ව සිටියා නම් මං වෙන කිසිම කෙනෙක් එක්ක විවාහ වෙන්නෙ නැ. නමුත් ඇය අකාලයේ මියගියා. ඒ මට මේ දරුවා ඉතුරු කරලා. ඇය වෙනුවෙන් මං ඔහුට සියලූ සැප සම්පත් හා ආරක්ෂාව ලබාදුන්නා. ඔහු වෙත මගේ තිබුණු පීතෘත්වය ලොවට හෙළිකරන්න, මට පුළුවන් කමක් තිබුණේ නැ. එහෙත් මං ඔහුට ඉතාම හොඳ අධ්‍යාපනයක් ලබා දුන්නා. ඔහු වයසෙන් වැඩී තරුණයෙක් වුණාම මං ළඟට ගත්තා.

ජේම්ස් කොහොම හරි මගේ රහස දැනගත්තා. ඊට පස්සේ ඔහු ක්‍රියාකරන්න පටන් ගත්තේ ඉතාම අකාරුණාවන්ත විදියට. මේ රහස එළිකරලා මා මහත් අපකීර්තියට පත්කරාවි යන බිය මගේ හිතේ ඇති කළා. එහෙම කරලා මාව ඔහුගේ පාලනයට නතුකරගත්තා. මගේ විවාහය ඉතා අවාසනාවන්ත ලෙස කෙළවර වුණු එකට පවා, ඔහු වගකිය යුතුයි. ඒ ඔක්කොටම වඩා නීත්‍යානුකූල විවාහයෙන් මට ලැබුණු පුතුයාට, ජේම්ස් මුල සිටම ඊර්ෂ්‍යා කළා. ක්‍රෝධ කළා.

ඔබ අහන්න පුළුවනි, මෙවැනි තත්ත්වයක් යටතේ ජේම්ස් මගේ වහල යට තියාගන්නෙ ඇයි කියල, ඔහුට තිබෙන්නේ

මා ඉතා ආදරය කළා. ඔහුගේ මවගේ මුහුණ. ඒ මුහුණට ඇති ආදරය නිසා තමයි මගේ ප්‍රශ්න වලත් කෙළවරක් නුනෙ. මගේ සිත් ගනිපු ආදරවන්තියගේ ස්වභාවය, පිළිවෙළ ජේම්ස්ගෙත් තිබුණා. ඔහුගේ හැම ක්‍රියාවකින්ම මට සිහිවුණේ ඇයමයි. ඉතින් ඔහුව මගේ නිවසින් පිටකරන්න මට පුළුවන් කමක් තිබුණේ නෑ. නමුත් ඔහු ආතර්ට, ඒ කියන්නේ මගේ පුංචි පුතාට -සැල්වයර් සාමිට මොනවා හරි හිරිහැරයක් කරාවිද කියලත් මගේ හිතේ භයක් තිබුණා. ඒ නිසා ආරක්ෂාව සඳහා තමයි මං පුංචි පුතාව ආචාර්ය හක්ස්ටබල්ගේ පාසලේ නේවාසික ශිෂ්‍යයෙක් හැටියට නැවැත්තුවේ.

මගේ සේවකයෙක්ව හිටි මේ රූබන් හේස්ව හඳුනාගන්න ජේම්ස්ට අවස්ථාව ලැබුණා. හේස් නොම්මර එකේ තක්කඩියෙක්, මැරවරයෙක්. ජේම්ස් ඔහු සමග හිතවත් වුණා. ජේම්ස්ට ඔය වගේ පහත් මිනිස්සු ආශ්‍රය කරන්න තිබුණේ හරි කැමැත්තක්. ආතර්ව බලෙන් පැහැරගෙන එන්න කියල තීරණය කළ ජේම්ස්ට, ඒකට උදව් ලැබුණෙ රූබන් හේස්ගෙන්. ඔබට මතක ඇති මං අර අන්තිම දවසෙ ආතර්ට යැවූ ලියුම. ඒක තැපැලට දන්න කලින් ජේම්ස් ඒක විවෘත කරලා, ඒකට තව ලියුම් කැල්ලක් දමලා. පාසල පිටුපස්සෙ වන ලැහැබ-රැගඩ් ෂෝ එකට ඇවිත් ඔහුව හමුවෙන්න කියලා. මගේ බිරිඳ- ආදිපාදවරිය ගැන සිහිකරලයි ජේම්ස්, පුංචි ආතර්ව රවටාගෙන තියෙන්නෙ.

එදා හැන්දෑවෙ ජේම්ස් බයිසිකලයෙන් පාසල පිටුපස්සෙ නියම කරගත් තැනට ගියා. මං මේ ඔබට කියන්නේ ජේම්ස් පාපෝච්චාරණය කරද්දි කියපු දේවල්. ජේම්ස් කියල තියෙනවා පුංචි ආතර්ට ඔහුගේ මව ආතර්ව බලන්න ඉතා ආශාවෙන් ඉන්න බවත්, ඇය ඒ සඳහා විල්ලුවට පැමිණෙන බවත්. මැදියම් රෑයේ රැගඩ් ෂෝ කැලෑවට අශ්වයෙක් පිටේ මිනිහෙකු එවන බව කියලා, ඔහු සමග ආවොත් ආතර්ට අම්මාව දකින්න පුළුවන් බවත් කියා තිබෙනවා. මේ කිසිදෙයක් නොදන්න ආතර් උගුලේ අහුවුණා.

නියම කරගත් වෙලාවට, සඳහන් කළ තැනට ආතර් ආවා. අම්බර් අශ්වයෙකුත් රැගෙන, හේස් අශ්වයෙකුගෙ පිටේ එතැනට

Reading Purpose Only, Not For Print

ඇවිත් හිටියා. අශ්වයා පිටේ නැඟුණු ආතර් හා හේස් විල්ලුව මැදින් පිටත්වී ආවා. ඔවුන් ලුහුබැඳ තවත් කෙනෙක් ඇවිත් ඇති බවයි, පෙනෙන්නෙ. මේක නම් ජේම්ස් දැනගත්තෙ ඊයෙයි. ලුහුබැඳ ආ පුද්ගලයාට හේස්, තමන් අතේ තිබුණු පොල්ලෙන් පහරදීම නිසා, ඔහු ඒ තුවාල වලින් මිය ගොස් තිබෙනවා. රූබන් හේස්, ආතර්ව අරගෙන ආවේ ෆයිට්ං කොක් තානායමටයි. එහි උඩ තට්ටුවේ කාමරයක ඔවුන් ආතර්ව රඳවා තබාගත්තා. ඔහුව රැකබලාගත්තෙ කරුණාවන්ත කාන්තාවක් වන හේස් මහත්මිය. කොහොම වුණත් ඇය ජීවත්වෙන්නෙත්, මෘගයෙක් වැනි ඇගේ ස්වාමියාගේ අණසකට යටත්වයි.

ඉතින් හෝම්ස් මහත්මයා, දින දෙකකට කලින් ඔබව හමුවෙද්දී මං දැනහිටියෙත් ඔබ එද දැනහිටි ප්‍රමාණයමයි. ඔබ අහවි මේ වගේ වැඩක් කිරීමට ජේම්ස් පෙළඹුණේ මොන අරමුණකින්ද කියලා.

මා සතු සියලුම දේට උරුමකාරයා වන ආතර් ගැන ඊර්ෂ්‍යාවෙන් හා වෛරයෙන් උමතුවෙලා, ජේම්ස් මේ සියල්ල කළ බවයි මට කියන්න පුළුවන්. ජේම්ස් ගේ අදහස වුණේ, මා සතු සියලුම දේපොළ හිමිවිය යුත්තේ ඔහුට කියලයි. රටේ නීතිරීති අනුව, සමාජයේ සම්ප්‍රදායන් අනුව, ඒ කිසිදෙයක් ඔහුට හිමි නොවන බව ජේම්ස්ට තේරුණා. ඔහු එය භාරගත්තේ මහා ද්වේශයකින්. මේ ක්‍රියාව කරද්දී ඔහුගේ තවත් යටි අරමුණක් තිබුණා. ජේම්ස් බලාපොරොත්තු වුණා, ආතර්ව සඟවලා, මාව භය කරලා, මගේ සියලුම දේපොළ තමන්ගේ නමට ලියවා ගන්න. ඔහු බලාපොරොත්තු වෙලා හිටියේ ආතර්ව නිදහස් කිරීමේ කප්පමක් හැටියට මගේ වස්තුව අයිතිකර ගැනීමටයි. ඔහු දැනහිටියා, මං කැමැත්තෙන්ම ඔහුට විරුද්ධව පොලීසියට පැමිණිලි කරන්නේ නැති බව. ඔහු බලාපොරොත්තු වුණු විදියට මගෙන් කප්පම ඉල්ලන්න ඉඩක් ලැබුණේ නෑ. ඒ මොකද බොහොම ඉක්මනට නොහිතූ දේ සිද්ධවුණා.

ඔහුගේ කෲර සැලැස්ම බිඳ වැටුණේ ඔබ අර හෙයිඩෙගර් ගේ මිනිය සොයා ගැනීමත් සමඟයි. මේක ආරංචි වුණාම

ජේම්ස් භයෙන් වෙවුලන්න පටන් ගත්තා. අප ඒක දැනගත්තේ ඊයේ හවස මේ කන්තෝරු කාමරයේ වාඩිවෙලා ඉඳිද්දී. හක්ස්ටබල් මහත්මයා විදුලි පුවතකින් ඒ බව දන්වලා තිබුණා. ඒකෙන් ජේම්ස් කොයිතරම් භීතියටත් කැළඹීමටත් පත්වුණාද කිව්වොත්, ඔහු ගැන මගේ හිතේ තිබූ සැකය හොඳටම තහවුරු වුණා. මේ ක්‍රියාව ගැන මං ඔහුට කෙළින්ම චෝදනා කළා. අන්තිමට ඔහු කැමැත්තෙන්ම පාපොච්චාරණයක් කළා. ඊට පස්සේ ඔහු මට ආයාචනා කළා, තවත් දවස් තුනක් මේක රහසක් හැටියට තියාගන්න කියලා. ඒ මොකද එතකොට ඔහුගේ උදව්කාරයාට මෙහෙන් පැනල ගිහින් ජීවිතය ගලවාගන්න පුළුවනි. ජේම්ස් ගේ ඉල්ලීම් වලට යාච්ඤාවලට හැමදාමත් අවනත වුණා වගේ මං ඔහුගේ මේ ඉල්ලීමටත් අවනත වුණා. ජේම්ස් එවෙලේම ගෙදරින් පිටවෙලා, ෆයිටිං කොක් තානායමට ගියේ, හේස්ට අනතුරු අඟවලා, පැනල යන්න කියලා දැනුම් දෙන්නයි. දවල් කාලයේදී අනෙක් අයගේ කතාබහට ලක් නොවී, මට ඒ තානායමට යන්න පුළුවන් කමක් තිබුණේ නෑ. නමුත් ඇඳිරි වැටුණු වහාම මං මගේ ආදරණීය පුතා බලන්න ගියා. ඔහු කරදරයක් නැතිව, ආරක්ෂිතව, සුවසේ සිටිනා බව දැකීම මට සැනසීමක් වුණා. ඒ වුණත් ඔහුගේ දෑස් ඉදිරිපිට සිදුවුණු අපරාධය ගැන අහලා, මා බලවත් කලකිරීමට පත්වුණා.

මගේ හිතේ කිසි කැමැත්තක් නොතිබුණත් පුංචි ආතර්ව ෆයිටිං කොක් තානායමේ, හේස් මහත්මියගේ ආරක්ෂාව යටතේ තබන එකට මං එකඟවුණා. ඒ මොකද මිනීමරුවා කවුද කියලා ඔවුනට නොකියා, මට පොලීසියට කිසිම දෙයක් දැනුම් දෙන්න විදියක් තිබුණේ නෑ. ඊළඟට මිනීමරුවාට නිසි දඬුවම් ලබා දෙන්න උත්සාහ කළොත්, ඒකෙන් අවාසනාවන්ත විදියට ජේම්ස්ටත් විනාශය ළං වෙනවා. මන්න හෝම්ස් මහත්මයා, ඔබ මගෙන් ඉල්ලා සිටියේ අවංකව සියලුම දේවල් හෙළි කරන්න කියලයි. මං කිසිම දෙයක් හැංගුවේ නෑ. දැන් මං ඔබෙන් ඉල්ලා සිටින්නේ ඔබේ උපදේශය අවංකව මට දෙන්න කියලයි.'

'ඇත්තෙන්ම ඔව් ආදිපාදතුමනි. මුලින්ම මට කියන්න

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

තියෙන්නෙ, නීතිය ඉදිරියේ නම් ඔබතුමා කරලා තියෙන්නේ ලොකු වැරැද්දක්. බරපතල අපරාධයක් සිදුවෙද්දී, ඊට ඉඩදීල නොසලකා ඉඳීමත්, මිනීමරුවෙකුට පැන යන්න ඉඩදීමත් ලොකු වැරැදි දෙකක්. ඊළඟට මිනීමරුවාට පැන යාමට ජේම්ස්ගෙන් සැපයුණු මුදල්, ආදිපාදතුමාගේ පසුම්බියෙන් ආ මුදල් බවට කිසිම සැකයක් නෑ.

එයට එකඟත්වය පළකරමින් ආදිපාදතුමා හිස නැමුවේය.

'මේක බොහොම බරපතල කාරණයක්. ඊටත් වඩා බරපතල වැරැද්දක් හැටියට මට පෙනෙන්නේ, ඔබේ බාලපුතා ගැන ඔබතුමා දක්වා ඇති ආකල්පය. 'මේ හොර ගුහාවේ ඔබ දින තුනක් ඔහුට ජීවත්න ඉඩ හැරියා.'

'ඒ දිවුරා වූ පොරොන්දුවක් මත..........................'

'මේ වගේ මිනිස්සු දිවුරලා වෙන පොරොන්දු මොනවද ආදිපාදතුමනි? ඔබේ බාල පුත්‍රයා ආයෙමත් පැරයක් පැහැරගෙන නොයාවි කියලා ඔබට තියෙන සහතිකය මොකක්ද? වැරැද්දකට පැටළුණු ඔබගේ වැඩිමහල් පුත්‍රයාගේ සිත සතුටු කිරීමට, ඔබ අහිංසක බාල පුත්‍රයාව අන්තරාදායක පරිසරයක අනවශ්‍ය ලෙස රඳවා තැබීමට ඉඩ හැරියා. ඒක ඉතාම අසාධාරණ ක්‍රියාවක්.'

උඩඟු පුද්ගලයකු වූ හෝල්ඩනස් ආදිපාදවරයා, තම නිවසේදීම මෙසේ විවේචනයට ලක්වීම කිසිසේත් ප්‍රිය නොකරන්නට ඇත. ඔහුගේ මුහුණ කෝපයෙන් රතුවිය. එහෙත් තම හෘද සාක්ෂියෙන් දොස් පැවරුණු නිසාදෝ ඔහු නිහඬව සිටියේය.

'මම ඔබතුමාට උදව් කරන්නම්. හැබැයි එක කොන්දේසියක් උඩ. සීනුව නාද කරලා ඔබතුමාගේ සේවකයා කැඳවන්න. එහෙත් අණදීම කරන්නේ මං: මට කැමති විධියට'

වචනයක්වත් කථා නොකළ ආදිපාදතුමා විදුලි සීනුව නාද කළේය. සේවකයා කාමරයට ඇතුළු විය.

'ඔබ අහන්නත් සන්තෝෂ වේවි, ඔබේ පුංචි සැල්ටියර් සාමි

වරයා හමුවුණා. වහාම අශ්ව කරිත්තියක් සූදානම් කරගෙන, ලයිට්ං කොක් තානායමට යන්න. ගිහිං සැල්වයර් සාමි මෙහේ කැඳවා ගෙන එනවා දකින්න ආදිපාදතුමා කැමතියි' ප්‍රීතියෙන් උද්දාම වූ සේවකයා වහා දිව ගියේය.

'අනාගතය ගැන ආරක්ෂාව සලස්වා ගත්තට පස්සේ අපට අතීතය ගැන ටිකක් සුළුවෙන් ක්‍රියාකරන්න පිළිවන්. මා රජයෙන් වැටුප් ලබන, නිලවශයෙන් පත්කෙරුණු, රහස් පරීක්ෂකයෙක් නොමෙයි. සාධාරණත්වය සම්පූර්ණයෙන්ම ඉටු වෙනවා නම්, මට එයින් පැහීමකට පත්වෙන්න පුළුවනි. මං දන්නා හැම දෙයක්ම රටට කියාපාන්න මට අවශ්‍යතාවයක් නෑ. රූබන් හේස් ගැන නම් මට කරන්න කිසිම දෙයක් නෑ. ඔහුට නියම එල්ලුම් ගසයි. ඔහුව එයින් බේරා ගැනීමට මගෙන් නම් කිසි උදව්වක් නෑ. ඔහුට චෝදනා එල්ල වෙද්දී ඔහු මොන මොන දේවල් හෙළිකරාවිද කියන එක, මට කියන්න බෑ. ඔහු යම් දේවල් හෙළිනොකර නිහඬව සිටියොත්, ඒක ඔහුගේ යහපතටම හේතුවේවි කියල, ඔහුට අවබෝධ කරල දෙන එක ආදිපාදතුමාට භාරයි.

පොලීසිය මේක දිහා බලන්නෙ, කප්පම් ඉල්ලීමේ අරමුණෙන්, ඔහු ළමයා පැහැරගෙන ගියා කියලයි. ඊට වඩා දෙයක් ඒ ගොල්ලන්ට හිතාගන්න බැරි නම් මට කරන්න දෙයක් නෑ. මය ගැන තවදුරටත්, වඩාත් පුළුල්ව කල්පනා කර බැලිය යුතුයි කියන්න, මම යන්නෙ නෑ. ඒ වුණත් ආදිපාදතුමනි, ඔබට එක් අනතුරු ඇඟවීමක් කරන්න මම කැමතියි. ජේම්ස් වයිල්ඩර් මහත්මයා, දිගටම මේ නිවසේ දී සිටියොත් එය කෙළවර වෙන්නේ මහා අවාසනාවන්ත ඛේද වාචකයකින් විය හැකියි'

'මට ඒක තේරෙනවා හෝම්ස් මහත්මයා. ඔහුට තමන්ගේ දියුණුව, තමන්ම සලස්වාගන්න කියලා, ඔහුව ඕස්ට්‍රේලියාවට යැවීමට කටයුතු සූදානම් කරලයි තියෙන්නේ'

'එහෙම නම් ආදිපාදතුමනි, ඔබතුමා ගත යුතු තවත් පියවරක් ගැන මං මතක් කරන්නම්. ඔබතුමා කිව්වා, ඔබේ විවාහ ජීවිතේට අසතුට ඉහොකිරීමට එක් හේතුවක් වුණේ වයිල්ඩර් බව.

Reading Purpose Only, Not For Print.



65. "ඔහුට නියම එල්ලුම් ගසයි. ඔහු එයින් බේරා ගැනීමට මගෙන් කිසිම උදව්වක් නෑ."

මං යෝජනා කිරීමට කැමතියි, ගිය දේ අමතක කරලා, ගරු ආදිපාදතුමිය යළිත් හෝල්ඩනස් මන්දිරයට කැඳවා ගැනීමට පියවර ගත යුතුයි කියලා'

'මං එයත් සුදානම් කළා හෝම්ස් මහත්මයා. මං අද උදේ ආදිපාදතුමියට ලිපියක් යැව්වා'

'එහෙම නම්' හෝම්ස් අසුනෙන් නැගී සිටියේය.

'මටත් මගේ මිත්‍රයාටත් බොහොම සන්තෝෂ වෙන්න පුළුවන්, අපි උතුරු එංගලන්තයට ආ ගමනෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගන්නා කියල. මට පැහැදිලි කරගැනීමට අවශ්‍ය තවත් එක් කාරණයක් තිබෙනවා. රූබන් හේස් ඔහුගේ අශ්වයින් ගේ කුරවලට ගහලා තිබෙන්නේ, ගවයින් ගේ කුරවල ලාංඡන පොළොවේ සටහන් වන ලාඩම්. මේ අසාමාන්‍ය උපක්‍රමය ඔහු ඉගෙන ගත්තේ වයිල්ඩර් මහත්මයා ගෙන්ද?'

ආදිපාදතුමා පුදුමයට පත්වී, මොහොතක් කල්පනා කළේය. ඉන්පසු නිවසේ කාමරයක් විවෘත කළ ඔහු, අප එහි කැඳවාගෙන ගියේය. එය කෞතුකාගාරයක් ලෙස සැකසූ විශාල කාමරයකි.

එහි එක් කෙළවරක වූ වීදුරු පෙට්ටියක් අපට පෙන්වූ ආදිපාදතුමා , ඒ තුළ වූ කුඩා පුවරුවක් වෙත අපේ අවධානය යොමු කළේය.

**"මෙම අශ්ව ලාඩම් සොයාගන්නා ලද්දේ හෝල්ඩනස් මන්දිරය වටා තිබෙන දිය අගලෙනි. ඒවා අශ්වයින් සඳහා තැනූ ඒවා වුවත්, එහි යට කොටස නිමකර ඇත්තේ, ගවයන්ගේ කුර වල ලාංඡනයට සමාන වන වන අයුරෙනි. මධ්‍යම යුගයේ විසූ මංකොල්ලකාර හෝල්ඩනස් රදළයින් කිහිප දෙනෙකු විසින් මේවා ප්‍රයෝජනයට ගන්නට ඇතැයි විශ්වාස කෙරේ"**

වීදුරු පෙට්ටිය විවෘත කළ හෝම්ස් තම දබරැඟිල්ල තෙත් කොට, අශ්ව ලාඩම මතුපිට ප්‍රවේශමෙන් පිරිමැද්දේය. ඔහුගේ සම, මත, මෑතකදී ලාඩමට එක්වූ මඩ තට්ටුවක් අපට දකින්නට ලැබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

"බොහොම ස්තූතියි ආදිපාදතුමනි" හෝම්ස් පැවසුවේ වීදුරු පෙට්ටිය වසා දමමිනි. ඒක තමයි මං උතුරු එංගලන්තයට ඇවිත් දැකපු දේවල් වලින් අංක දෙකට මගේ සිත ඇදගත් දේ"

"එහෙනම් අංක එක මොකද්ද?"

"මං හරිම දුප්පත් මිනිහෙක්. මෙන්න මේක තමයි ආදිපාදතුමනි අංක එක" එසේ පැවසූ හෝම්ස් වෙස්පත ආදිපාදතුමාට පෙන්වා, අනතුරුව එය තම සටහන් පොත තුළ ප්‍රවේශමෙන් තැන්පත් කොට ඊට සෙනෙහසින් තට්ටු කළේය.

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# මළගිය ඇත්තෝ සාක්කි දෙති !

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# මළගිය ඇත්තෝ සාක්ෂි දෙති !

පසුගිය අගහරුවාද මට ෂර්ලොක් හෝම්ස් ගෙන් විදුලි පුවතක් ලැබිණි.

'මා පැවැත්වූ වඩාත්ම අද්භූතජනක පරීක්ෂණය, කෝන්වෝල්හි භීෂණය පිළිබඳව ඔබ නොලියන්නේ ඇයි ?'

ඔහුට මෙම සිද්ධිය ගැන යළි සිහිවූයේ ඇයිදැයි මම නොදනිමි. එහෙත් මේ යෝජනාව අවලංගු කරමින් තවත් විදුලි පුවතක් ලැබීමට පෙර, වහාම ක්‍රියාත්මක වීමට මම තීරණය කළෙමි. මගේ පාඨකයන් වෙත තොරතුරු නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා, ඒ පිළිබඳ විස්තර අඩංගු සටහන් පොත් ගැන, මම සොයා බැලුවෙමි. මට ඒවා සොයා ගැනීමට හැකිවිය.

ඒ 1897 වසරේ වසන්ත සෘතුවයි. සෑහෙන කාලයක් තිස්සේ කිසිදු විවේකයකින් තොරව අපරාධ පරීක්ෂණ කටයුතුවල නියැලීම නිසා ෂර්ලොක් හෝම්ස් අඳ රෝගී භාවයකට පත්විය. අයෝමය ශරීරයක් තිබූ ඔහු, මෙවැනි තත්ත්වයකට පත්වූයේ ඔහුගේම නොසැලකිලිමත්කම නිසා යයි මට වරෙක සිතේ. ලන්ඩනයේ වෛද්‍ය විශේෂඥයින් සඳහා සුප්‍රසිද්ධ හාර්ලි වීථියේ කායික වෛද්‍ය විශේෂඥ මුවර් ඒගා මහතා, හෝම්ස් පරීක්ෂා කර බැලුවේය.

'ජීවිතය ගැන ආසාවක් තියෙනව නම් ඔය වැඩ ඔක්කොම පැත්තකට දාල, හොඳ විවේකයක් ගන්න කියල මං අවවාද කරනවා' වෛද්‍යවරයා පැවසීය.

'මං කොහොමද වෙට්සන් විවේක ගන්නෙ? මං භාරගනිපු පරීක්ෂණ කොයිතරම් තියෙනවද? මා හමුවීමට එන අනුග්‍රාහකයින්ට මං කොහොමද බැහැ කියන්නේ ?'

ආපසු එද්දී, කුලී රියේදීම හෝම්ස් තම විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

'අනුග්‍රාහකයෝ ඇවිත් ඔබව හමුවෙන්නෙ අපි බේකර් වීදියේ මේ ගෙදර හිටියොත් නේ. ඉතින් වහල දාල, අපි කොහේ හරි ඈත පළාතකට යමු විවේකයක් ගන්න' මා පැවසුවේ ඉල්ලීමකට වඩා ආඥාවක ස්වරයෙනි.

"ඔහොම යෝජනා කරන එක නං බොහොම පහසුයි. ඒත්.................."

'කතා එපා හෝම්ස් . මෙහෙම රෝගී තත්ත්වයෙන් ඉඳිද්දි ඔබ දිගින් දිගටම මොළය වෙහෙසුවොත් සිදුවෙන්නෙ මොනවද කියල ඔබ දන්නවද? අධික රුධිර පීඩනය නිසා මොළයේ ලේ නහරයක් පුපුරලා ඔබ අංශභාග රෝගියෙක් වේවි. එවිට ඔබට ඇඳෙන් නැගිටින්න ලැබෙන්නේ නෑ. මං ඔබට මේ දේවල් කියන්නේ හිතවත් මිත්‍රයෙක් හැටියට පමණක් නොවෙයි, වෛද්‍යවරයෙක් හැටියටත්'

' හොඳයි මොකද්ද ඔබ මට කරන්න කියන්නේ?'

'කෝන්වෝල් අර්ධද්වීපයේ තියෙනවා විවේකය ගතකිරීම සඳහා සුදුසු තැනක්. පොල්ඩු බොක්කේ වෙරළ අසල කුඩා ගෙයක් කුලියට අරගෙන මාසයක් දෙකක් එහේ ගතකරමු. එතකොට ඔය අසනීප ගතිය මගහැරිලා යාවි.'

දින කිහිපයකට පසු අපි මෙම ස්ථානය වෙත පිටත්ව ආවෙමු. එය ඉතා මනරම් තැනක් විය. මුහුදට මුහුණලාව පිහිටි කඳු ගැටයක් මතයි, අප පදිංචි වූ කුඩා නිවස පිහිටා තිබුණේ.

ඈත අතීතයේ සයුරේ යාත්‍රා කළ රුවල් නැව්, කුණාටු වලට අසුවී, ගසාගෙන විත් විනාශයට පත්වූ මවුන්ට් බොක්ක, නිවසේ ජනේලයක් තුළින් දිස්විය. සියවස් ගණනක් තිස්සේ නාවිකයන් දහස් ගණනක් මේ මර උගුලේ දිවි පුදන්නට ඇතුවා නිසැකය.

ගොඩබිම දෙසින් ද අපට දකින්නට ලැබුණු දර්ශනය එතරම් අලංකාර එකක් නොවිණි. පෙනෙන තෙක් මානයේ දිගින් දිගටම පිහිටියේ අළු පැහැති විල්ලුවයි. ඉඳහිට තැනක දෙකක

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

දේවස්ථාන කුළුණු දිස්විය. ඒ, ගම්මාන පිහිටි තැන් පිළිබඳ සලකුණුය. විල්ලුවේ නොයෙක් තැන් වල ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථාන අපට හඳුනාගැනීමට ලැබිණ. ඔවුන් තම මියගිය ඥාතීන් ආදහනය කළ තැන් වල, ගල්කණු වලින් අපූරු සිහිවටන ඉදිකොට තිබිණි. මේවා මගේ මිත්‍රයාගේ සිත් ඇදගැනීමට සමත් විය. ඔහු මුළු දවස ගතකළේ විල්ලුව ප්‍රදේශයේ ඇවිදිමින් ප්‍රාග් ඓතිහාසික මානවයන් ඉතිරි කොට තිබූ සිහිවටන නරඹමිනි. විටෙක ඔහු උදේ සිට සවස් වනතුරු මේ තැන්වල, තනිවම කාලය ගෙව්වේය. කෝන්වෝල් ප්‍රදේශයේ පෞරාණික භාෂාවක් වූ කෝනිෂ් භාෂාව ගැනද හෝම්ස් තම අවධානය යොමු කළේය. ටින් ලෝහය රැගෙන යාමට රුවල් නැව් වලින් පැමිණි ෆිනීෂියන් වෙළෙඳුන්ගේ භාෂාව, කෝනිෂ් භාෂාව බවට පරිණාමය වී ඇති බව හෝම්ස්ගේ මතය විය. මේ පිළිබඳව ලියැවුණු පොත් රාශියක් කියවීමට හෝම්ස්ට ඉඩ ලැබිණ.

මෙම පර්යේෂණවල යෙදෙමින්, අපි විවේක සුවයෙන් කාලය ගත කළෙමු. එහෙත් මා කිසිසේත් බලාපොරොත්තු නොවූ මොහොතක, පුදුමාකාර ලෙස, ඒ නිසල ශාන්ත භාවය, හෙණයක් පතිත වූවාක් මෙන් බිඳී ගියේය. මගේ මිත්‍රයාගේ විවේක සුවය දෙදරවමින් අපේ ගේ දොරකඩට කඩා වැදුණු භීෂණයෙන් මම මහත් කම්පාවට පත්වීමි. එහෙත් හෝම්ස් නම් එයින් අතිශය සන්තෝෂයට පත්විය.

කෝන්වෝල් ප්‍රාන්තය පමණක් නොව, එංගලන්තයේ බටහිර ප්‍රදේශයම ඉමහත් ආන්දෝලනයකට ලක්කළ මෙම සිද්ධිය, පුවත්පත් වාර්තාකරුවන් හැඳින්වූයේ "කෝන්වෝල්හි භීෂණය" යන නමිනි. කෙසේ වෙතත් මේ පිළිබඳව සම්පූර්ණ සත්‍ය තොරතුරු බ්‍රිතාන්‍ය පුවත්පත් වලට හෙළි නොකෙරුණි. එය සිදුවී අවුරුදු දහතුනකට පසු සිද්ධිය පිළිබඳව සම්පූර්ණ විස්තරයක් මෙසේ ඉදිරිපත් කිරීමට මම තීරණය කළෙමි.

කෝන්වෝල්හි මෙම ප්‍රදෙසේ දේවස්ථාන වටකරගෙන ගම්මාන පිහිටා තිබූ බව මම මුලින් සඳහන් කළෙමි. අප ලැගුම් ගත් නිවසට කිට්ටුම ගම්මානය වූයේ ට්‍රෙඩ්නික් වොලස් නම්

ගම්මානයයි. කුඩා ගෙවල් රාශියක පදිංචිව සිටි ගම්වැසියන් සිය ගණනකින් එය සමන්විත විය. ගමට තිබුණු එකම දේවස්ථානය, පෙද පාසි වලින් වැසුණු බිත්ති සහිත; අබලන් එකකි. එය භාරව සිටියේ රවුන්ඩ්හේ දේවගැතිතුමාය. එතුමාට පුරා විද්‍යාව ගැනද හසල දැනුමක් තිබිණ. ඒ නිසාම ඔහු හා හෝම්ස් අතර ආශ්‍රයක්ද ඇතිවිය. මැදිවියේ තරබාරු පුද්ගලයෙකු වූ රවුන්ඩ්හේ දේවගැතිතුමා ප්‍රදේශයේ ජනප්‍රවාද ගැනද හොඳින් දැන සිටියේය. ප්‍රියමනාප පුද්ගලයකු වූ ඔහු, දේවගැති නිවසේ අප වෙනුවෙන් තේපැන් සංග්‍රහයක්ද පැවැත්වීය.

මෝටිමර් ට්‍රෙගෙනිස් මහතා අපට හඳුනාගන්නට ලැබුණේ එහිදීයි. තනිකඩව විසූ ඔහු, දේවගැති මැදුරේ නේවාසිකව සිටියේය. අවිවාහකයකු වූ දේවගැතිතුමාද පාළුව නිසා, මිතුරෙකුගේ සමාගමය ප්‍රිය කළා විය යුතුය. කෙසේ වෙතත් ගතිගුණ අතින් නම් මේ දෙදෙනා කිසිසේත්, එකිනෙකාට සමාන බවක් දැක්වූයේ නැත. උපැස් යුවළක් පැළැඳි ට්‍රෙගෙනිස් කෙට්ටු පුද්ගලයෙකු විය. ඔහුට තිබුණේ මදක් කුදු ගැසුණු සිරුරකි. අප එහි ගත කළ කෙටි කාලය තුළ, දේවගැතිතුමා දෙඩමළු, ප්‍රියමනාප පුද්ගලයකු බව අපට පැහැදිලි විය. එහෙත් ඔහුගේ නේවාසිකයා නම්, කතාබහ ප්‍රිය නොකළ, තම පෞද්ගලික දේවල් ගැන නිතර කණස්සල්ලෙන් පසුවූ කෙනෙකු බව මම තේරුම් ගතිමි.

මාර්තු 16 වැනි අඟහරුවාදා උදේ ආහාරයෙන් පසු, අපි විල්ලුවේ සංචාරයක යෙදීමට සූදානම්ව සිටියෙමු. හදිසියේම අප නිවසේ විසිත්ත කාමරයට කඩා වැදුණේ, මා ඉහත සඳහන් කළ පුද්ගලයින් දෙදෙනායි.

"දෙයියෝ සාක්කි හෝම්ස් මහත්තයා !"

දේවගැතිතුමා කථා කළේ මහත් කලබලයකට පත් ස්වරයෙනි.

"ඊයේ රෑ මහා ඛේදජනක සිද්ධියක් වෙලා. ඒක අපි ජීවිතේටම අහල නැති තාලේ හරිම අද්භූත දෙයක්. මේ ප්‍රශ්නය

http://sherlockholmesinvestigations.blogspot.com
Readme Purpose Only, Not For Print

විසඳන්න මුළු එංගලන්තයෙන්ම සුදුසුම පුද්ගලයා ඔබතුමා. මේ වෙලාවෙ ඔබතුමා මෙහේ ඉන්න එක දෙයියො බැලුව වගේ වැඩක්

අප අතරට මෙලෙස කඩා වැදුණු පුද්ගලයින් වෙත මගෙන් යොමු වූයේ එතරම් මිත්‍රශීලී බැල්මක් නොවේ. දේවගැතිතුමා මහත් සේ කැළැඹීමට පත්ව හති දමමින් සිටියේය. අනෙකා තම හැඟීම් තරමක් දුරට පාලනය කරගෙන සිටියත්, ඔහුගේ දෑත් වෙවුලන බව මම නිරීක්ෂණය කළෙමි.

'මං කියන්නද කතාව, නැත්නං ඔබතුමා කියනවද?' ට්‍රෙගෙනිස් ඇසීය.

'වෙච්ච සිද්ධියේ මුල මං කොහියෙත් කියන්නම් හෝම්ස් මහත්මයා. ඊට පස්සේ ඔබම තීරණය කරන්න ට්‍රෙගෙනිස් මහත්මයා ගෙන් කතාවෙ ඉතුරු ටික අහනවද, නැත්නම් පරක්කු නොවී සිද්ධිය වෙච්ච තැනට යනවද කියල.

'විල්ලුවේ අර පරණ ගල් කුරුසයක් තියෙන තැන ඔබට මතක ඇති. අපේ මේ මෝටිමර් ට්‍රෙගෙනිස් මහත්තයාගෙ පවුලේ අය ජීවත්වෙන 'ට්‍රෙඩනික් වෝතා' කියන නිවස තියෙන්නේ ඒ කිට්ටුවමයි. ඊයෙ හැන්දෑවේ මෝටිමර් මහත්තයා තමන්ගේ සහෝදරයන් දකින්න ඒ නිවසට ගියා. එහි පදිංචිව ඉන්නේ ඔහුගේ සොහොයුරන් දෙදෙනා ඕවන් සහ ජෝර්ජ්, ඒ සමගම සොහොයුරිය බ්‍රෙන්ඩා. ඊයේ හැන්දෑවරුවම එහේ කාලය ගත කරලා, කාඩ් ක්‍රීඩාවේ යෙදිලා, මෝටිමර් මහත්තයා, රෑ දහයට විතකට පස්සේ ගෙදරින් පිටවෙලා ඇවිත්. ඔහු එද්දී ඒ තුන්දෙනාම බොහොම හොඳ සනීපයෙන් සතුටෙන් හිටියේ. හැමදාම උදේ පාන්දරින්ම අවදිවෙන මෝටිමර් මහත්මයා අද උදේ කෑමටත් කලින් ඒ ගෙදර පැත්තට නිකමට ඇවිදගෙන ගියා. ඒ පැත්තට යමින් තිබූ දෙස්තර රිචඩ්ස් ගෙ අශ්ව කරත්තය ඔහු පසුකරගෙන ගිහිං තැවැත්තුවා.

'මෝටිමර් මහත්තයා. මට එහාම ට්‍රෙඩනික් වෝතාවට එන්න කියල පණිවුඩයක් ලැබුණා. ඉක්මනට කරත්තයට නගින්න' දෙස්තර මහත්තයා ඔහුට කිව්වා.

ගෙදරට ගියාම ඔහුට දකින්න ලැබුණේ මහ පුදුමාකාර දර්ශනයක් . ඔහුගේ සහෝදරයන් දෙදෙනාත් සහෝදරියත් ඊයෙ රෑ පිටත්වෙලා එද්දි වගේම මේසයට වාඩිවෙලා හිටියා. කාඩ්කුට්ටම තවමත් මේසය උඩ. ඉටිපන්දම සම්පූර්ණයෙන්ම දැවී අළුවී ගොස් තිබුණා. බ්‍රෙන්ඩා ට්‍රෙගෙනිස්, ඇය වාඩිවී සිටි පුටුවේ එහෙමම මියගොස් සිටියා. ඇය දෙපැත්තේ වාඩිවෙලා සිටි සහෝදරයන් දෙදෙනා සිටියේ සිනාසෙමින්, ගී ගයමින් හා මහ හඬින් කෑකෝ ගසමින් - සම්පූර්ණයෙන්ම උමතු වෙලා. ඔවුන් දෙදෙනාගේත් මියගිය සොහොයුරියගේත් මුහුණු වල එක් විශේෂත්වයක් දකින්නට ලැබුණා. එනම් ඔවුන් මහා භීතියකට පත්වූ ලකුණු තිබුණා. වයස්ගත පෝටර් මහත්මිය තමා, ඉවුම් පිහුම් කලෙත් ගෙදර අනෙක් කටයුතු බලා කියා ගත්තෙත්. ඊයේ රෑ ට්‍රෙගෙනිස් පවුලේ තුන්දෙනා හා පෝටර් මහත්මිය හැරෙන්න වෙන කිසි කෙනෙකු මේ ගෙදර හිටි බවට කිසිම සලකුණක් නෑ. තමාට තදින්ම නින්ද ගොස් තිබුණු බවත්, කිසිම ශබ්දයක් නොඇසුණු බවත් ඇය කියනවා. ගෙදරින් කිසිදෙයක් හොරකම් කරපු බවට සලකුණක් නැහැ. ගෙදර කිසිවක් අවුල් වෙලත් නැහැ. කාන්තාව මරණයට පත්කරමින් ශක්තිමත් පිරිමින් දෙදෙනෙකු භීතියෙන් උමතු කරවීමට තරම් වූ මේ භීෂණය කුමක්ද කියන එක තේරුම් කරන්න කාටවත් බෑ. කෙටියෙන් කියනවා නම් ඔන්න ඕකයි හෝම්ස් මහත්මයා සිද්ධිය. මේක විසදලා දෙන්න ඔබට පුළුවන් නම් ඔබ කරන්නෙ විශිෂ්ට සේවයක්

අප මෙහි ආවේ රහස් පරීක්ෂණ කටයුතු වල පීඩනයෙන් ඈත්වී, විවේක සුවයෙන් කල්ගත කිරීමටය. නමුත් දැන් සිදුවී ඇත්තේ කුමක්ද? මෙම රාජකාරිය අත්හැර දමා, අප බලාපොරොත්තු වන නිසල පරිසරය තුළ රැඳී සිටීමට පියවර ගත යුතුය. ඒ සඳහා හෝම්ස් පොළඹවා ගත හැකි වේ යැයි මම විශ්වාස කළෙමි. එහෙත් එය නිශ්ඵල උත්සාහයක් බව මට ප්‍රත්‍යක්ෂ විය. දෙබැම ඉහළට නංවාගෙන, නළල රැළි කරගෙන හෝම්ස් ගැඹුරු කල්පනාවකට වැටී ඇත. ඔහු මද වේලාවක් නිහඬව සිටියේය.

'හොඳයි, මං මේ ගැන හොයල බලන්නම්. බැලූ බැල්මට

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

නම් මේක තේරුම් ගන්න බැරි, මහා අද්භූත ගැටළුවක් වගෙයි. දේවගැතිතුමා එහේ ගිහින්ද මේ ආවෙ?'

'නෑ හෝම්ස් මහත්තයා. ට්‍රෙගනිස් මහත්තයා මේ විස්තරය මට ඇවිත් කිව්වා විතරයි. මං එහුත් ඇදගෙන මේ ආවේ ඔබෙන් උපදෙස් ලබාගන්න'

'මේ නිවසට කොයි තරං දුරද?'

'ප්‍රධාන පාරෙන් හැරිලා ගම්මානය තුළට සැතපුමක් පමණ යා යුතුයි'

'එහෙනම් අපි ඔක්කොම පයින්ම යමු. අපි පිටත්වෙන්න කලින් මට කාරණා කිහිපයක් අහල දැනගන්න ඕන, මෝටිමර් ට්‍රෙගෙනිස් මහත්තයා'

ට්‍රෙගෙනිස් මෙපමණ වේලාවක් සිටියේ නිහඬවමයි. එහෙත් ඔහු දේවගැතිතුමාටත් වඩා කැලැඹීමට පත්ව සිටි බව මම දුටුවෙමි. තම පවුලේ අයට මුහුණ පෑමට සිදුවූ මේ බිහිසුණු ඉරණම නිසා ඔහු පත්ව සිටි භීතිය හා කම්පනය දෑසින් පිළිබිඹු විය. සුදුමැලි වී සිටි ඔහුගේ දෑත්, වෙවුලන ආකාරය පැහැදිලිවම පෙනිණි.

'ඔබට ඕනෙ එකක් අහන්න හෝම්ස් මහත්මයා. ඒක කියන්න බොහොම වේදනා සහගත එකක්. ඒත් මං ඔක්කොම කියන්නම්'

'ඊයේ රාත්‍රී සිද්ධ වුණේ මොනවද කියල මට කියන්න.'

'දේවගැතිතුමා කිව්ව විදියට මං රෑ කෑම ගත්තෙ එහේදි. මගේ අයියා ජෝර්ජ් යෝජනා කළා අපි විස්ට් ක්‍රීඩාවෙ යෙදෙමු කියලා. අපි ඒක පටන් ගන්නකොට රෑ නවයට විතර ඇති. කාඩ් ක්‍රීඩාව අවසන් කරල මං රෑ දහයයි කාලට පමණ එන්න පිටත්වුණා. මං පිටවෙලා එනකොට මුවුන් තුන්දෙනා පුරුදු විදියට බොහොම සතුටෙන් හිටියේ.

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔබට යන්න දොර ඇරල දුන්නෙ කවුද?'

'පෝටර් මහත්මිය ඒ වෙනකොට නිදගන්න ගිහිං. ඒ නිසා මම තනියම දොර ඇරගෙනයි පිටවෙලා ආවෙ. යද්දි දොර වහගෙන ගියා. ඒ කෑල්ලෙ ජනේලය සම්පූර්ණයෙන්ම වහලයි තිබුණෙ. නමුත් ඒක ආවරණය කරන තිර රෙද්ද පහත දමලා තිබුණෙ නෑ. අද උදේ බලන කොට වුණත් දොරේ හෝ ජනේලයේ මොකුත් වෙනසක් මට දකින්න ලැබුණෙ නෑ. ඒ වගේම පිටකින් කෙනෙක් ගෙට ඇතුළු වුණා කියල හිතන්න හේතුවක් නෑ. ඒ කොහොම වුණත් මගේ සහෝදරයින් දෙන්නා තීතිය නිසා සම්පූර්ණයෙන්ම සිහි විකල් වෙලා: බ්‍රෙන්ඩා භයෙන් මිය ගිහින්: ඔළුව පැත්තකට කඩා වැටිලා. දෙයියනේ ! සාලයේ තිබුණු දර්ශනය මට ජීවිතේට අමතක වෙන එකක් නෑ'

'ඔබ කියන්න වගේ මේ කරුණු වල තියෙන්නෙ හරිම පුදුමාකාර ස්වභාවයක්. මෙහෙම දෙයක් වුණේ මොන හේතුවක් නිසා කියලද ඔබ හිතන්නේ?' හෝම්ස් ඇසීය.

'මේක යක්ෂයින්ගේ වැඩක් හෝම්ස් මහත්තයා, යක්ෂයින්ගේ වැඩක් ! මෙලෝ මනුස්සයෙකුට මිය පිටියේ වැඩක් කරන්න බෑ. මේ ගෙදරට යක්ෂයෙක්, භූතයෙක් ඇතුළුවෙලා !'

'එහෙම නම්..... හෝම්ස් කථාව ඇරඹුවේය.

භූතයින් විසින් කරපු වැඩක් නම් මේක මට විසඳන්න පුළුවන් එකක් නෙමෙයි. නමුත් මේක යක්ෂ වැඩක් කියල අයින් කරන්න කලින් එහෙම වෙන්න තිබුණ හේතු තියෙනවද කියල හොයා බලන්න ඕන.

ට්‍රෙගෙනිස් මහත්මයා; ඔබ පවුලේ අනික් අයගෙන් වෙන්වෙලා වෙනම ජීවත්වෙන්නෙ මොනව හරි ප්‍රශ්නයක් නිසා වෙන්න ඇති?'

'ඔබ නිවැරදියි ! හෝම්ස් මහත්මයා. ඒව සිද්ධ වුණේ බොහොම කාලෙකට ඉස්සර. දැන් ඒ සියලුම දේ අමතක කරදල ඉවරයි.

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

අපේ පවුල රෙඩ්රුත් ප්‍රදේශයේ ටින් ලෝහයේ ඉල්ලම් හැරූ, පතල් අයිතිව තිබුණු පවුලක්. පස්සෙ, අපේ සියලුම පතල් සම්බන්ධ දේපොළ, පතල් කැණීම් සමාගමකට විකුණුවා. ඒ මුදල් බෙදගනිපු ආකාරය ගැන අපට එකඟතාවයකට එන්න බැරිවුණු බව ඇත්තයි. ඒ වුණත්, ගියදේ ගියාවේ කියල මං ඔක්කොම අමතක කරදලා සමාදන වුණා, අපි ආයෙමත් බොහොම හිතවත් කමෙන් හිටියේ.'

'ට්‍රෙගෙනිස් මහත්මයා. ඊයෙ හැන්දෑව ගෙවුණු හැටි ගැන ආයෙ කල්පනා කරල බලන්න. මේ ඛේදවාචකය සිදුවීමට යම් පමණකින් හරි සම්බන්ධයක් ඇති කරුණක් ගැන ඔබට මතක් කරන්න බැරිද? හොඳට කල්පනා කරල බලන්න. ඉතාම සුළු දෙයක් වුණත් මට ප්‍රයෝජනවත් වේවි.'

'එහෙම කිසි දෙයක් මට නං මතක් කරන්න බෑ මහත්මයා'

'හැමදෙනාම සන්තෝසෙන් හිටියෙ?'

'කිසිදක නැතිතරම්'

'ඔවුන් සුළු දෙයකින් පවා කැළඹීමට පත්වෙන බොහොම සංවේදී අයද? ඉදිරියේ වෙන්න තිබෙන අනතුරක ඡායාවක් හෝ ඒ නිසා ඇතිවූ නොසන්සුන් ගතියක් ඔවුන් වෙතින් ප්‍රකාශ වුණාද?'

'මොකුත්ම නෑ'

'ඒ කියන්නේ ඔබට කියන්න මොකුත්ම නෑ?' මෝටිමර් ට්‍රෙගෙනිස් මඳ වේලාවක් කල්පනා කළේය.

'මට කියන්න පුළුවන් පොඩි දෙයක් නං තියෙනවා. මේසෙ ළඟ වාඩිවෙලා අපි කාඩ් ක්‍රීඩාවෙ යෙදෙද්දි මං හිටියේ ජනේලයට පිටුපස හරවාගෙන. ජෝර්ජ් අයියා හිටියේ ජනේලය පැත්ත බලාගෙන. එක පැරයක් ඔහු පුටුවෙන් මඳක් ඉහළට එසවිලා මගේ උරහිසට උඩින් ජනේලය පැත්ත බලාගෙන හිටියා. ඉතින් මමත් හැරිල බැලුවා. ජනෙල් විදුරුව තුළින් මට යන්තමට

පෙනුණේ පඳුරු අතරේ සෙලවීමක්. මට හරියටම කියන්න බෑ ඒ සතෙක්ද මනුස්සයෙක්ද කියලවත්. නමුත් මොකෙක් හෝ එතැන හිටියා. මං ජෝර්ජ් අයියාගෙන් ඇහුවා

'ඇයි? කවුද එතැන හිටියෙ?' කියලා ඊත් ඔහු දැකලා තිබුණෙත් මං දැකපු තරමමයි. මට කියන්න පුළුවන් එච්චරයි'

'ඔබ එතැනට ගිහිං පරීක්ෂා කරලා බැලුවෙ නැද්ද?'

'නෑ. ඒක තවදුරටත් බලන්න තරම් වැදගත් දෙයක් හැටියට ඒ වෙලාවෙ හිතුණෙ නෑ'

'ඔබ ගෙදරින් පිටත්වෙලා යද්දි මේ වගේ බිහිසුණු දෙයක් සිදුවෙයි කියල නිකම්ටවත් හිතුණෙ නැද්ද?'

'කොහෙත්ම නෑ'

'මේ තරම් උදේ පාන්දරින් මේ සිද්ධිය ගැන ඔබට දැනගන්න ලැබුණෙ කොහොමද ?'

'මං පාන්දරින් අවදිවෙන කෙනෙක්. ඉතින් මම උදේට තේ බොන්නත් කලින් ඇවිදින්න යනවා. අද උදෙත් මං වෙනද වගේ ඇවිදින්න යන්න පිටත්වුණා විතරයි. දොස්තර රිචඩ්ස්ගෙ අශ්ව කරත්තය වේගයෙන් මාව පහුකරගෙන ගියා. ඊත් වැඩිදුර නොගිහිං කරත්තය නැවැත්තුවා. පෝටර් මහත්මිය කොලුවෙක් අතේ ඔහුට පණිවුඩයක් එවා තිබූ බව ඔහු කිව්වා. ඉතින් ඒ කරත්තයටම නැගිලා මමත් ගියා.

අපි එතැනට ගිහිං ගෙට ඇතුළු වුණාම දකින්න ලැබුණේ මහ භයානක දර්ශනයක්. බ්‍රෙන්ඩා මියගිහින් අඩුගණනෙ පැය හයක් වත් ගතවෙලා ඇති කියලයි දොස්තර මහත්තයා කිව්වෙ. මොනම තුවාලයක් වත් සිදුකරපු බවට ලකුණක්වත් නෑ. ඇගේ මුහුණෙන් ප්‍රකාශ වුණේ මහා භයකින් භ්‍රාන්ත වූ හැඟීම්. ජෝර්ජ් සහ ඕවන් දෙදෙනාම සින්දු වල කෑලි කිය කිය වඳුරන් දෙන්නෙක් වගේ කටින් නොයෙකුත් විකාර ශබ්ද කරමින් හිටියා. දෙයියනේ! මං කොහොමද ඒ දර්ශනය බලන්නෙ? ඒක දැකපු දොස්තර

මහත්තයා සුදුමැලි වෙලා පුටුවක් උඩට ඇද වැටුණා. ඔහු ක්ලාන්ත වෙලා වගෙයි මං දුටුවේ. තව ටිකෙන් අපට ඔහු ඔසවාගෙන යන්න වෙනවා ප්‍රතිකාර ලබා දෙන්න.'

'පුදුමාකාරයි - හරිම පුදුමාකාරයි'

පැවසූ හෝම්ස් අසුනෙන් නැගී සිටියේය.

'තවත් පමා නොවී අපි එතනට්ම ගිහිං පරීක්ෂා කරල බලමු. මුල් අවස්ථාවේ ඉඳලම මහා අද්භූත ගැටළුවක් හැටියට පෙනෙන මේ වගේ පරීක්ෂණයකට මං කවදාවත් අතගහල නෑ.'

ට්‍රෙඩනික් වෝතා නිවසට යන මාර්ගය වැටී තිබුණේ ගම්මානය මැදිනි. එය වංගු සහිත ඉතා පටු පාරකි. අප ඉදිරියට පැමිණෙන අශ්ව කරත්තයක මරුද්ද, තොලොවේ ගැවෙන හඬ අපට ළං ළංව ඇසෙන්නට විය. එයට ඉඩදී අපි පාරේ අයිනට වූයෙමු. භීතියෙන් විරූපී වූ මුහුණක් ඇති කිසිවෙකු, වඳුරෙකු මෙන් දත් විරිත්තමින්, අශ්ව කරත්තය තුළ සිට එබී බලන අයුරු අපි දුටුවෙමු.

'දෙයියනේ ! මගේ සහෝදරයෝ ! මවුන්ව හෙල්ස්ටන්හි පිස්සන් කොටුවටයි අරගෙන යන්නේ' මෝටිමර් ට්‍රෙගෙනිස් පැවසුවේ භීතියෙන් සුදුමැලි වූ මුහුණෙනි. අපි ඒ බෙදජනක සිද්ධිය වූ නිවස වෙත පා නැගුවෙමු.

එය, මල් වවා තිබූ උද්‍යානයක් මැද පිහිටි, විශාල මන්දිරයක් විය. විසිත්ත කාමරයේ ජනේල මුහුණ ද තිබුණේ උද්‍යානය දෙසටයි. නිවසේ පෝටිකෝව වෙත යෑමට පෙර හෝම්ස්, බොහෝ කල්පනාකාරීව උද්‍යානයේ මල්පාත්ති අතරින් තිබූ අඩිපාරවල් දිගේ ගමන් කළේය. ඔහු කොතරම් ගැඹුරු ලෙස කල්පනාවට වැටී සිටියේද යත් අඩිපාරක් අසල තිබූ ජල බඳුනක ඔහුගේ දෙපා පැටලිණි. එය පෙරළී ගියේ අප සියල්ලන්ගේම දෙපා සහ අඩි පාරවල් සම්පූර්ණයෙන්ම වැසෙන සේ ජල ප්‍රවාහයක් මුදා හරිමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

අපි නිවසට ඇතුළුවූයෙමු. විශ්වස්ත කාන්තාවක් වූ පෝටර් මහත්මිය අප පිළිගැනීමට ඉදිරියට පැමිණියාය. හෝම්ස් නැගූ සියලුම ප්‍රශ්න වලට ඇය පැකිළීමකින් තොරව පිළිතුරු දුන්නාය.

"මං මේ ගෙදර වැඩ කටයුතු කරන්න වෙලා දැන් බොහොම කල්. ඉඳුම් පිහුම්, ගෘහ පාලනය සහ ස්වාමි වරුන්ගේ ඕනෑ එපාකම් ගැන හොයා බලන්නේ මමයි. මගේ උදව්වට එක ගැහැනු ළමයෙක් ඉන්නවා."

"ඔබට ඊයේ රෑ මොකුත් අමුතු විදියේ ශබ්දයක් එහෙම අහන්න ලැබුණාද?"

"කිසිම ශබ්දයක් ඇහුණේ නෑ මහත්තයා"

"ට්‍රෙගෙනිස් මහත්වරුන් දෙදෙනා හෝ බ්‍රෙන්ඩා මෙනෙවිය මෑත කාලයේදී හිතේ කණගාටුවකින්, එහෙමත් නැත්නම් හිතේ කැළැඹීමකින් ඉන්නා බව ඔබට දකින්න ලැබී තිබුණාද? විශේෂයෙන්ම ඊයේ පෙරේද ?"

"නැහැ මහත්මියා. මෑත කාලයේ ඔවුන් හිටියේ ඉතාම සන්තෝෂයෙන්, විනෝදයෙන්. මං මීට ඉස්සර කවදාවත් දැකල නැහැ ඒ තරම් සන්තෝෂයෙන් ඉන්නවා. ඔවුනට වියදම් කරන්න ඕන තරම් සල්ලි තිබුණා."

"මේ ඛේදජනක සිද්ධිය ඔබට දකින්න ලැබුණේ කොයි වෙලාවේද ?"

"අද උදේ නැගිටලා මං පුරුදු පරිදි සාලයට ආවා. මේසය වටේ මේ බියකරු දර්ශනය දැකලා මං ක්ලාන්ත වුණා. මට සිහිය ආව ගමන්ම මං ජනෙල් සියල්ලම හැර දැම්මා, උදෑසන පිරිසිදු වාතාශ්‍රය ගේ ඇතුළට එන්න. ඊළඟට මං කෙළින්ම දිව්වේ පාරටයි. එතකොට මට දකින්න ලැබුණා ගොවිපොළක වැඩට යන කොලුවෙක්. මං වහාම ඔහු අතේ වෛද්‍යවරයාට පණිවුඩයක් යැව්වා."

"ඒත් ට්‍රෙගෙනිස් මෙනෙවියගේ මළසිරුර ?"

Reading Purpose Only, Not For Print
http://...pot.com



තරුණ වියේදී ඇය ඉතා ශෝභා සම්පන්න කාන්තාවක් වන්නට ඇති බව පැහැදිලිය.

http://sherlockholmesinvestigations.blogspot.com

'උඩ තට්ටුවේ, ඇගේ කාමරයේ. ඔබට ගිහිං බලන්න පුළුවනි.'

'කව්ද එය උඩට ගෙන ගියේ ?'

'ජෝජ් හා මිචන් මහත්වරු හෙල්ස්ටන් උන්මත්තකාගාරයට ගෙනියන්න කරත්තයක් ආවා, ඔවුන් කරත්තයට නංවා ගැනීම ලෙහෙසි පහසු කටයුත්තක් වුණේ නැහැ. ශක්තිමත් පිරිමින් හතර දෙනෙකුගේ මහන්සියෙන් තමා, ඔවුන් කරත්තයට දමලා අගුළු දැම්මේ. බ්‍රෙන්ඩා තෙරිනාගේ මිනිය උඩ තට්ටුවට ගෙනිච්චේ කරත්තයේ ආ මිනිසුන්ගේ උදව්වෙන්.'

පෝටර් මහත්මිය පැවසුවාය.

'බොහොම ස්තූතියි. අපට තවත් කරුණු කිසිවක් දැනගන්න උවමනා නම් පසුව ඔබෙන් අහන්නම්'

'ඔබට කැමති ප්‍රශ්නයක් දැන් අහන්න මහත්මයා. අද රෑට මේ ගෙදර ඉන්න මට නම් කොහොමටවත් බැ. මං අද හවසම පිටත්වෙලා යනවා. මගේ පවුලේ අය ඉන්නෙ සෙන්ට් අයිව්ස් වල. ඔබට අවශ්‍ය නම් මාව එහිදී හමුවිය හැකියි.

අපි තරප්පුව නැග ගොස් බ්‍රෙන්ඩා ට්‍රෙගෙනිස් මෙනෙවියගේ මිනිය පරීක්ෂාකර බැලුවෙමු. දැන් මැදිවියට පැමිණ සිටියත්, තරුණ වියේදී ඇය ඉතාම ශෝභා සම්පන්න කාන්තාවකව සිට ඇති බව පැහැදිලිය. මියගොස් සිටියත් ඇගේ මුහුණේ රූමත් බව කැපී පෙනිණ. කෙසේ වෙතත් ඇය අවසන් මොහොතේ දුටු කිසියම් බිහිසුණු දර්ශනයක් නිසා, මුහුණේ එම හැඟීම් ප්‍රකාශ විය.

අපි තරප්පුව බැස අවුත් ඛේදවාචකය සිදුවූ කාමරයට ඇතුළු වූයෙමු. සීතලට දැල්වූ ගිනි උදුනේ, කලින්ද රාත්‍රියේ යෙදූ දර වල අළු හා අඟුරු ඉතිරිව තිබිණි. සම්පූර්ණයෙන්ම දැවී ගොස් අවසන් වූ ඉටිපන්දම් සතරක සුන්බුන්ද, ක්‍රීඩාව සඳහා යොදගත් කාඩ් කුට්ටමේ කොළ ද මේසය මත විසිරී ඇත. පුටු සියල්ලම

බිත්තිය අසලට ගෙන ගොස් තිබුණින් අනෙක් සියල්ල කලින් රාත්‍රියේ ආකාරයටම තිබිණි.

සැහැල්ලු පියවරින් කාමරය පුරා ඇවිදිමින්, විවිධ අපුත්වල හිඳගෙන කල්පනා කරමින් සිද්ධිය වූ පිළිවෙල ගැන කරුණු ගැළපීමට හෝම්ස් උත්සාහ කළේය. මේසය අසල වාඩිවී සිටිනා විට, උද්‍යානයේ කොතරම් ප්‍රමාණයක් ජනේලයෙන් දිස්වේදැයි මුලින්ම ඔහු පිරික්සා බැලුවේය. ගිනි උදුන, සිවිලිම හා නිවසේ සිමෙන්ති පොළොව ඔහුගේ දැඩි අවධානයට ලක්විය. එහෙත් ඔහුට කිසිදු හෝඩුවාවක් ලැබුණු බවක් මුහුණෙන් නම් ප්‍රකාශ නොවීය.

"ඇයි ගිනි උදුන දැල්වීමට උවමනා වුණේ? වසන්ත කාලෙ හැමදම හැන්දෑවට ඔවුන් මේ පුංචි කාමරේ ගිනි උදුනක් දල්වා ගන්නවද?"

"නෑ හෝම්ස් මහත්මයා. එයෙ ඒ ටිකක් වැහි ගතිය තිබුණා. සීතලත් දැනුණා. ඒ නිසා මං ආවට පස්සෙ තමයි ගිනි උදුන දැල්වුවෙ."

මෝටිමර් ට්‍රෙගෙනිස් පිළිතුරු දුන්නේය.

"ඉතින් දැන් ඔබ මොකක්ද කරන්න හදන්නෙ හෝම්ස් මහත්මයා ?" ඔහු ඇසුවේය.

සිනාවක් පෑ හෝම්ස් මගේ අතින් අල්ලා ගත්තේය.

"මං හිතන්නේ වොට්සන් මේක ඇඟෙන්න පයිප්ප උරන්න වෙන ප්‍රශ්නයක්. එහෙම නම් මහත්වරුනි: අපට අපේ නවාතැනට ආපසු යාමට අවසර දෙන්න. ඒ මොකද අලුත් කරුණු වෙන මොකවත් මට හොයාගන්න බැහැ. මං මේ ගැන හොඳින් කල්පනා කරල බලන්නම්. මොනවා හරි නිගමනයකට මට එන්න හැකිවුණු වහාම මම ට්‍රෙගෙනිස් මහත්මයාටත් දේවගැති තුමාටත් දන්වන්නම්. ඔබට ශුභ දවසක්!"

http://sherlockholmesinvestigations.blogspot.com

අපි නිවහන ලවන ආපසු පැමිණියෙමු. පයිප්පය කටේ ගසාගෙන හාන්සි පුටුවේ එකුටු වුණු හෝම්ස් පැහෙන වෙලාවක් එම ඉරියව්වෙන්ම කල්පනා කරමින් සිටියේය. නළලේ රැලි කරගෙන හිස් බැල්මකින් ඈත ආකාසය දෙස බලාගෙන, කල්පනා සයුරේ ගිලී සිටි ඔහු, බොහෝ වෙලාවකට පසු පයිප්පය ඉවත දමා කථාව ඇරඹුවේය.

'මේ වැඩේ හරියන්නෙ නෑ වොට්සන්. අපි දෙන්න යමු කඳු ගැට අතරෙ, මුහුදු වෙරළෙ ඇවිදින්න.. අපි ගිහින් බලමු ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ ගල්පතුරු වලින් තැනූ ආයුධ අපට හොයාගන්න පුළුවන්ද කියල. මේ පරීක්ෂණය ගැන හෝඩුවාවල් හොයනවට වඩා ඒ වැඩේ පහසු වේවි. ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව මොළය වෙහෙසීමෙන් ප්‍රයෝජනයක් නෑ වොට්සන්. ඒක හරියට ප්‍රමාණවත් තරම් ඉන්ධන නැතුව එන්ජිමක් ක්‍රියාත්මක කරන්න හදනවා වගෙයි. අපට දැන් ඕන කරන්නේ හිරු එළිය, මුහුදු සුළඟ සහ ඉවසීම. එවිට ඕන කරන දේවල් ඉබේම අප ළඟට ඒවි.

සීතල මුහුදු සුළඟේ පහස විඳිමින් අප කඳුගැට අතර ඇවිදිමින් සිටියදී හෝම්ස් යළි කතාව ඇරඹුවේය.

'අපට හැකි සුමඟින් මේ සිද්ධිය ගළපන්න බලමු වොට්සන්. අනිත් කාරණා මතුවෙද්දී ඒවා සුදුසු තැන්වලට අනුයුක්ත කරන්න එතකොට අපට පුළුවනි.

අපට මුලින්ම නිගමනය කරන්න පුළුවනි මේක යක්ෂයින් හෝ භූතයින්ගේ වැඩක් නොවන බව. පුද්ගලයින් තුන් දෙනෙක් ඉන්නවා. ඔවුනට දරුණු විදියේ ප්‍රහාරයක් එල්ල වෙනවා, ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව. ඒ ටික පැහැදිලියි නේද. හොඳයි, කොයි වෙලාවෙද මේක සිද්දවුණේ ? මෝටිමර් ට්‍රෙගෙනිස් ගේ කථාව ඇත්ත හැටියට ගත්තොත් මේක සිදුවෙලා තියෙන්නේ ඔහු නිවසින් පිටත්වෙලා ගිය ගමන්ම වගේ. ඒක හරිම වැදගත් කරුණක්. අපට හිතන්න පුළුවන්, ඔහු පිටවෙලා ගිහින් මිනිත්තු කිහිපයක් ඇතුළත කියලා. ඒ මොකද මේසෙ උඩ කඩදාසි කුට්ටමේ

Reading Purpose Only, Not For Print
http://...blogspot.com

කොළ විසිරිලා තිබුණා. මේ වේලාව වෙන කොට ඔවුන් සාමාන්‍යයෙන් නින්දට යන වෙලාවත් පහුවෙලා. ඒත් ඔවුන් තමන්ගේ ඉරියව් වෙනස් කළේ වත්, පුටු පස්සට කරලවත් නැහැ. ඒ නිසා මං ස්ථිර වශයෙන්ම කියනවා, මේක සිද්ධවුණේ මෝටිමර් එතැනින් පිටවෙලා ගිය ඉක්මනින්ම. ඒ එකොළහට නම් ඉස්සර වෙලා.

ඊළඟට අප ගතයුතු පියවර තමයි, මෙතැනින් පිටවෙලා ගිය මෝටිමර් ට්‍රෙගෙනිස් මොකද කළේ කියන එක, සෝදිසි කිරීම. මගේ පරීක්ෂණ උපක්‍රම ගැන ඔබ දන්නවා නොවැ. අර විශාල ජල බඳුන කකුලෙ පටලැවිලා පෙරළීම මගින් මට හැකිවුණා ඔහුගේ පා සටහනේ පැහැදිලි ලාංඡනයක් ලබාගන්න. ඉතින් ඔබට මතක ඇති ඊයේ රාත්‍රියේ මඳ වැසි ගතියක් තිබුණා. ඔහු නිවසින් පිටවෙලා, මල්පාත්ති අතරින් වැටුණු පාරේ එනකොට පැදුණු පා සටහන් ටික පැහැදිලිව නිරීක්ෂණය කරන්න මට හැකිවුණා. මට පෙනෙන විදියට ඔහු ගෙදරින් පිටවෙලා කෙළින්ම දේවගැති නිවසට ඇවිත් තිබෙනවා.

දැන් එතකොට මේ දර්ශනයෙන් මෝටිමර් ට්‍රෙගෙනිස් ඉවත් වෙනවා. ඒ වුණත් කවුරු හරි බාහිර පුද්ගලයෙක් කාඩ් ක්‍රීඩා කරමින් සිටි පිරිසට බලපෑමක් කරනවා. පෝටර් මහත්මිය ගැන සැකයක් මතුවෙන්නෙ නෑ. අපට ඇයව අයින් කරන්න පුළුවන්. උද්‍යානයට මුහුණලා තිබෙන ජනේලය ළඟට කවුරු හරි රිංගා ආව බවට අපට මොනව හරි සාක්ෂියක් හොයාගන්න පුළුවන්ද? එහෙම නම් කවුරු හරි ඇවිත්, මේ මනුස්සයෙක් බීතියෙන් මැරෙන්නත්, තව දෙන්නෙක් පිස්සු වට්ටන්නත් පුළුවන් විදියේ භය කිරීමක් කළාද ?

මේකට යම්කිසි හෝඩුවාවක් මෝටිමර් ගෙන්ම ඉදිරිපත් වෙනවා. ඔහු කියනවා ඔහුගේ ජෝර්ජ් අයියා දැක්ක කියල උද්‍යානයේ යම්කිසි සෙලවීමක්. නමුත් පුදුමය කියන්නේ, ඊයෙ රෑ වැහි සහිත අඳුරු එකක්. ගේ ඇතුලෙ ඉන්න අය භය කරන්න හදන කෙනෙක් තමන්ගේ මුහුණ ජනෙල් වීදුරුවට වදින පරිදි තැබුවොත් මිස, එය ගේ ඇතුළට පෙනෙන්නෙ නෑ. මේ ජනේලය

තිබෙන බිත්තිය අයින දිගටම අඩි තුනක් පළල මල් පාත්තියක් තිබෙනවා. නමුත් ඒකෙ කිසිම අඩි සටහනක් නෑ. ඒ නිසා අපට හිතාගන්න අමාරුයි ගේ ඇතුළෙ හිටි වැඩිහිටියන් තුන් දෙනෙක් භීතියට පත් කරන්න පුළුවන් තරම් දෙයක්, බාහිර පුද්ගලයෙක් කොහොමද ප්‍රදර්ශනය කළේ කියලා. අනික එහෙම දෙයක් කරන්න කාට හරි උවමනාවක් තිබුණ කියල ඔප්පු වෙන්නෙත් නෑ. අපි මුහුණපාන දුෂ්කරතා දැන් ඔබට පෙනෙනවා නේද වොට්සන්?'

'ඒවා නම් පැහැදිලිවම පෙනෙනවා'

ඒ වුණත් තවත් සාධක කිහිපයක් හරි ලැබෙනවා නම් අපට මේ අභියෝගය ජයගන්න බැරිකමක් නෑ. අපි පසුගිය කාලෙ කරපු පරීක්ෂණ වල වාර්තා කියවලා බැලුවොත්, මුලදී මේ වගේ අපැහැදිලි ඒවා තිබුණු බව ඔබට පෙනේවි වොට්සන්. ඒ නිසා අපට තවත් නිවැරදි දත්ත ලැබෙන තුරු මේ පරීක්ෂණ ටිකකට පැත්තකින් තියමු. නවශිලා යුගයේ මානවයා ගැන විස්තර හොයා බලන්න අපේ ඉතුරු කාලය යොදවමු.

සිත මුළුමනින්ම අවුල් කළ හැකි එක් ගැටළුවක් මොළයේ තිබියදී, එය සම්පූර්ණයෙන්ම අමතක කොට, සිත වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට හෝම්ස්ට තිබුණේ පුදුමාකාර හැකියාවකි. එංගලන්තයේ විසූ නවශිලා යුගයේ මානවයන් ගැනත්, ඔවුන් භාවිතා කළ ආයුධ, මෙවලම්, ඊතල හා හෙල්ලේ තුඩ ලෙස මුවහත් ගල්පතුරු යොදාගත් ආකාරය ගැන මට පහද දෙමින් හෝම්ස් දෙපැයක්ම ගත කළේය. විසඳීම සඳහා ඔහුට භාර වූ අභිරහස් ඛේදවාචකයක් ගැන ඔහුට සිහිවූ බවක් වත් නොපෙනිණි.

ඉර අවරට යද්දී අපි ආපසු නවාතැන වෙත ගියෙමු. ගැටළුව සිහියට නගමින් අප හමුවීමට අමුත්තෙක් පැමිණ සිටියේය. ඔහු කවුරුන්දැයි හඳුන්වාදීමක් අප දෙදෙනාටම අවශ්‍ය වූයේ නැත. අපේ කුඩා නිවසෙහි සිවිලිමේ ගෑවෙන තරම් උස, උසට සරිලන මහතක් තිබූ මේ යෝධ පුද්ගලයා, එංගලන්තයේ

පමණක් නොව අප්‍රිකාවේ ද සුප්‍රසිද්ධ තැනැත්තෙකි. තියුණු නෙත් යුවළකින්ද උකුස්සකුගේ හොටයක් වැනි උල් නාසයකින්ද හෙබි ඔහුගේ මුහුණ, මුළුමනින්ම රන්වන් පැහැති රැවුලකින් වැසී තිබිණ. තැනින් තැන සුදු වූ කොණ්ඩය හා නිතර මුවග රැඳුණු පුරුට්ටුව ආදී විශේෂ ලක්ෂණ තිබූ මේ පුද්ගලයා සුප්‍රසිද්ධ දේශ ගවේෂකයෙකි. එමෙන්ම අප්‍රිකාවේ සිංහයන් දඩයම් කරන්නෙකු ලෙස ප්‍රසිද්ධියට පත්වූ අයෙකි. ඔහු ආචාර්ය ලියොන් ස්ටර්න්ඩේල්ය.

ඔහු මෙම කාලයේ මේ ප්‍රදේශය තුළ වාසය කරන බව අපි දැන සිටියෙමු. වරක් දෙවරක්, විල්ලුව මැදින් වැටුණු අඩිපාරවල් දිගේ මේ දැවැන්ත පුරුෂයා ගමන් කරනු දකින්නට ලැබිණ. අප සමග කතාබහ කිරීමට හෝ අප හඳුනාගැනීමට ඔහු කිසිවිටෙක ඉදිරිපත් නොවීය. අප අසා තිබුණේ ඔහු හුදෙකලාව ජීවත්වීම ප්‍රිය කළ පුද්ගලයෙකු බවයි. ඒ නිසා ඔහු සමග කතාබහක් ඇරඹීමට අපිද උත්සාහ නොකළෙමු.

සිංහයන් දඩයම් කිරීම සඳහාත්, අනෙක් දේශ ගවේෂණ චාරිකා වල යෙදීම සඳහාත්, ඔහු නිතරම විදේශ ගතව සිටියේය. ආපසු එංගලන්තයට පැමිණි විට ඔහු පදිංචිව සිටියේ, සමීප ගම්මානයක් වූ බෝචැම්ප් ඇරියාන්ස් නම් වනාන්තර පෙදෙසේ, හුදෙකලාව පිහිටි කුඩා නිවසකයි. අසල්වාසීන් හෝ ගම්වාසීන් සමග කිසිදු ආශ්‍රයක් නොකළ ඔහු, ඔවුන්ගේ කිසිදු කටයුත්තකට සහභාගි වූයේද නැත. ආචාර්ය ස්ටර්න්ඩේල්, දේශ ගවේෂණ සිතියම් හා පොත්පත් වලට, මැදිවී හුදෙකලාව කාලය ගත කළේය. එහෙයින් ඔහු අප හමුවීමට පැමිණ සිටිනු දැකීමෙන් මම පුදුමයට පත්වුණෙමි.

'ඔබ ෂර්ලොක් හෝම්ස් මහත්මයා වෙන්න ඇති. මම ලියොන් ස්ටර්න්ඩේල්. ට්‍රෙඩනික් වෝතා නිවසේ ඛේදවාචකය පිළිබඳ පරීක්ෂණය පවත්වන්නෙ ඔබ, බව මට අහන්න ලැබුණා. මේ අවාසනාවන්ත සිද්ධිය ඇතිවුණේ කුමන ආකාරයකටද කියන එක ගැන තීරණයකට එන්න ඔබට හැකිවුණාද මහත්මයා?

'නැහැ'

http://sherlockholmesinvestigations.blogspot.com

'මෙහේ ප්‍රාන්ත පොලිස් කණ්ඩායම සම්පූර්ණයෙන්ම වැරැදි මාර්ගයකයි යන්නෙ. ඔබ අපරාධ පරීක්ෂණ ක්ෂෙත්‍රයේ අත්දැකීම් හා පළපුරුද්දන් ලබා තිබෙන කෙනෙක් නෙ. මට හිතුණා මේ පිළිබඳ විසඳීමක් දීමට ඔබට හැකිවේවි කියා. මං මෙහේ ජීවත්වුණු කාල වලදී මේ ට්‍රෙගනිස් පවුල බොහොම හොඳින් දැන හඳුනාගන්න මට ඉඩ ලැබුණා. මගේ අම්මා කෝන්වෝල් ප්‍රදේශයේ කාන්තාවක්. ඇගේ පැත්තෙන් මේ ට්‍රෙගෙනිස් පවුල මගේ නෑදෑයින්. ඔවුන් මගේ ඥාති සොහොයුරන් කිව්ව හැකි. ඔවුනට අත්වුණු ඛේදජනක ඉරණම ගැන මං හරිම කම්පාවට පත්වුණා. ඔබට කියන්න හෝම්ස් මහත්මයා, මං යන්න ගිය ගමන නැවැත්තලා මේ ආපසු හැරිලා ආවේ. අප්‍රිකාව බලා පිටත්වෙන නැවට නගින්නයි මං පිටත්වෙලා ගියේ.

'අද උදේ ප්ලිමත් වලදී මට මේ ගැන ආරංචි වුණා. පරීක්ෂණයට උදව් කිරීමේ අදහසින් මං එවෙලේම ආපහු ආවා.'

'හෝම්ස් පුදුමයෙන් තම දෙබැම එසෙව්වේය.

'ඒකෙන් ඔබට බෝට්ටුවත් වැරදුණා ද?'

'මට ඊළඟ බෝට්ටුවේ යන්න පුළුවන්'

'කොයි තරම් දෙයක්ද. නියම මිත්‍රත්වය කියන්නේ ඔන්න ඕකට' හෝම්ස් කීය.

'මං කීවේ ඔවුන් මගේ ඥාතීන් කියල...............'

'ඔව්, හැබැමයි. ඔබේ මවගේ ඥාතීන්. ඔබේ ගමන් බඩු ඔක්කොම නැවට යවන්න ඇති?'

'ගමන් බඩු වලින් කොටසක් නැවට යවලා ඉවරයි. නමුත් වැඩි කොටස හෝටලේ තිබෙනවා'

'ආ............... ඒක හරි. ඒ වුණාට මේ සිද්ධිය ප්ලිමත් වල පුවත්පත් වල පළවෙන්න තරං වෙලාවක් වුණේ නැහැනේ?'

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

'නැහැ මහත්මයා මට විදුලි පුවතක් ලැබුණා'

'කාගෙන්ද?'

දේශ ගවේෂකයාගේ මුහුණේ ඇතිවූයේ කෝපයක පේයාවකි.

'හෝම්ස් මහත්මයා, ඔබටත් මීට නැති දෙයක් නෑ?'

'ඒක මගේ රස්සාව නේ'

තම සිතට නැගී ආ කෝපය ආචාර්ය ස්ටර්න්ඩේල් මහත් ආයාසයක් දරා පාලනය කරගත්තේය.

'රවුන්ඩිගේ, අපේ දේවගැතිතුමා තමයි මට විදුලි පුවත එව්වේ'

'බොහොම ස්තූතියි' හෝම්ස් කීය.

'ඔබ මුලින් අහපු ප්‍රශ්නයටත් මං උත්තර දෙන්නම්. මේ සිද්ධිය පිළිබඳව මගේ සිතේ තවමත් පැහැදිලි විසඳීමක් ඇතිවුණේ නැහැ. නමුත් ඒකෙ කෙළවරක් ඉක්මනින්ම දකින්න මං බලාපොරොත්තු වෙනවා. මේ වෙලාවෙ ඊට වඩා යමක් කියන්න අමාරුයි.'

'ඔබේ සැකය යොමුවන්නේ කවුරුන් දිහාවටද මට කිව්වට කමක් නෑ'

'ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට මට හැකියාවක් නෑ'

'එහෙම නම් මං ආපු එකෙන් වුණේ මගේ කාලය නාස්ති වුණා විතරයි. මං මොකටද තවත් ඉන්නෙ?' පැවසූ ස්ටර්න්ඩේල් අප නිවසින් පිටවී ගියේ කෝපයෙනි. මිනිත්තු පහක් යාමට පෙර, හෝම්ස් ඔහු පසුපස් ගියේය. එද හැන්දෑවෙන තුරුම මට හෝම්ස් දකින්නට නොලැබිණ. බොහෝ විඩාපත්ව සිටි ඔහු, ආපසු ආවේ බලාපොරොත්තු කඩවූ විලාශයෙනි. ගිය කටයුතු සාර්ථක වී නැති බව එයින් මට සිතාගත හැකි විය. ඔහු නමට ලැබී තිබුණු විදුලි පුවතක් කියැවූ හෝම්ස් එයද ගිනි උදුනට විසි කළේය.

'ඒක ප්ලිමත් හෝටලයෙන් වොට්සන්. දේවගැතිතුමාගෙන් තමයි මට හෝටලේ නම දැනගන්න ලැබුණෙ. ලියොන් ස්ටර්න්ඩේල් අපට කිව්ව කථාව ඇත්තද කියල සැක හැර දැනගන්න මට ඕන වුණා. ඒ නිසා විස්තර අහලා මම විදුලි පුවතක් යැව්වා. ඔහු ඊයේ රාත්‍රිය ඇත්තෙන්ම හෝටලයේ ගතකරලා තිබෙනවා. මේ සිද්ධිය අහල මෙහේ එනකොට, ඔහුගේ බඩු බාහිරාදියෙන් කොටසක් අප්‍රිකාවට යවන්න බෝට්ටුවට පටවලා. ඒකෙන් මොනවද වොට්සන් ඔබට හිතාගන්න පුළුවන්?'

'ඔහු මේ ගැන හරිම උනන්දුයි'

'හරිම උනන්දු. ඔව් නම් ඇත්ත. මේ අවුල් වෙච්ච නූල් බෝලය, ලිහා ගන්න පුළුවන් වෙන, නූලෙ කෙලවර, කොහේ හරි තිබෙනවා වොට්සන්. අපට තවම ඒක අහුවුණේ නෑ. පසුබට වෙන්න හොඳ නෑ. මේ පරීක්ෂණය විසඳන්න උවමනා කරන දත්ත සියල්ලම අපට තවමත් ලැබිලා නැහැ. ඒව ලැබුණු වහාම අපට ඉදිරියට යා හැකියි'

හෝම්ස් කිව් ඒ වචන කොතරම් ඉක්මනින් සත්‍යයක් වේද, අපේ පරීක්ෂණය කුමන ආකාරයක අද්භූත එකක් බවට පෙරළේද යන්න ගැන මට නිකමටවත් නොසිතිණි.

මම පසුවද උදෑසනම ඊවුළ කාමින් සිටියෙමි. අප නිවස ඉදිරියේ කරත්තයක් නවත්වනු හඬ ඇසිණ. මට දකින්නට ලැබුණේ දේවගැතිතුමා අප නිවස වෙත දුවගෙන එන ආකාරයයි. ඔහු කොයිතරම් කැලැඹීමකට පත්ව සිටියේද යත්, කීමට අවශ්‍ය දෑ ඔහුට ගළපාගැනීමට නොහැකිව ගොතගසන්නට පටන් ගත්තේය. අන්තිමේදී ඔහු හති දමමින් කීවේ ඛේදජනක කථාන්තරයකි.

'අපේ වැඩකටයුතු මක්කොම යක්ෂයා පාලනය කරන්න පටන් අරගෙන හෝම්ස් මහත්තයා. මේ මුළු ගමටම යක්ෂයාගේ බැල්ම වැටිලා. මේ මක්කොම සාතන්ගේ වැඩ. අපි උගේ දැලෙන වැටිලා ඉවරයි.

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

දෙවියනේ ! මෝටිමර් ට්‍රෙගෙනිස් මහත්තයත් ඊයේ රෑ මිය ගිහින් ! පවුලේ අනිත් අයට තිබුණු රෝග ලක්ෂණ ඔහුටත් ඒ විදියටම හැදිලා !"

හෝම්ස් එසවරම නැගී සිටියේය.

"අපි දෙන්නටත් පුළුවන්ද ඔබේ කරත්තයට රිංගාගන්න?"

"ඔව්"

"එහෙමනම් අපි යමු වොට්සන්. උදේ කෑම පසුවට කල්දමු. දේවගැතිතුමා, අපි ඔබ වෙනුවෙන් ඕනෑම දෙයක් කිරීමට සූදානම්. ඉක්මන් කරමු. එතැන අවුල් වෙන්න කලින් ඉක්මන් කරමු."

දේවගැති නිවසේ නේවාසිකයා ඔහුගේ ප්‍රයෝජනය සඳහා කාමර දෙකක් වෙන්කරගෙන තිබිණ. පහළ තට්ටුවේ පිහිටි විශාල විසිත්ත කාමරයක්ද, ඒ කෙළින්ම උඩ තට්ටුවේ නිදන කාමරයද, මෝටිමර් ට්‍රෙගෙනිස් භාවිතා කළ ඒවායි. ඒ දෙකම මුහුණ ද තිබුණේ ජනේල සමීපයටම විහිදුණු තණකොළ වැවූ ක්‍රොකේ ක්‍රීඩා පිටියකටයි. පොලීසිය හෝ වෛද්‍යවරයා එහි පැමිණීමට පෙර, අපට නිවස වෙත යාමට හැකි විය. එහෙයින් කිසිම දෙයක් අවුල් නොකොට සිද්ධිය වූ අයුරින්ම තිබිණ. මාර්තු මාසයේ ඒ මීදුම සහිත උදෑසන මා දුටු දර්ශනය, මට කිසි දිනෙක අමතක නොවනු ඇත.

කාමරයේ තිබුණේ, හුස්ම ගැනීමට අපහසු, සතුටුදායක වාතාශ්‍රයක් නොමැති ගතියකි. වාසනාවකට මෙන් කාමරයට මුලින්ම ඇතුළු වූ සේවිකාව විසින් ජනේලය සම්පූර්ණයෙන්ම විවෘත කොට ඇත. එසේ නොවන්නට එහි තත්ත්වය වඩාත් අප්‍රසන්න වීමට ඉඩ තිබිණ. මෙයට හේතු වන්නට ඇත්තේ කාමරයේ මැද මේසය උඩ තවමත් දුම් දමමින්, විශාල දැල්ලක් සහිතව දැල්වුණු ඒමිනි ලාම්පුවයි. ඒ අසලම හාන්සි පුටුවක පිටුපසට දිග ඇදුණු ඉරියව්වෙන්ම ට්‍රෙගෙනිස්ගේ මළසිරුර තිබිණි. ඔහුගේ උපැස් යුවළ, නළල දෙසට තල්ලුකොට තිබුණු අතර මුහුණ ජනේලය දෙසට හැරවී තිබිණ. බ්‍රෙන්ඩා ට්‍රෙගෙනිස්

ගේ මුහුණේ දක්නට ඇඳුණු මහා භියකරු දසුනකින් භයට පත් ලකුණු මෝටිමර්ගේ මුහුණේද දිස්විය. ඔහුගේ අත්, පා, මෙන්ම ඇඟිලි ද බොහෝ විකෘත ලෙස ඇඹරී තිබිණි. එහෙයින් මට සිතාගත හැකි වූයේ, මරණයට පෙර; භය නිසා සෑදුණු සන්නියකින් මුළු සිරුරේම මස් පිඩු විකෘති සංකෝචනයකට පත්ව ඇති බවයි. ඔහු සම්පූර්ණ ඇඳුමෙන් පැළඳුමෙන් සම්පූර්ණව සිටියේය. කෙසේ වෙතත් ඇඳුම් හැඳගැනීම හදිසියේ කළ බවට සලකුණු ද දැකිය හැකි විය. රාත්‍රිය පුරා ඔහු ඇඳේ නිදා සිටි බවට සාක්ෂි තිබුණු අතර මේ ඛේදවාචකය සිදුවී ඇත්තේ උදේ පාන්දර බව අපට සිතාගත හැකිවිය.

මාරයා අරක්ගත් මෙම මන්දිරයට ඇතුළු වූ මොහොතේ සිට, ෂර්ලොක් හෝම්ස්ට ඇති වූ ක්ෂණික උද්‍යෝගය පුදුම සහගතය. ඔහුගේ දෑස් වල තිබුණේ අමුතුම දීප්තියකි: මුහුණෙන් ප්‍රකාශ වූයේ අමුතුම හැඟීමකි: අත්, පා වල අමුතුම ක්‍රියාශීලීත්වයකි. විටෙක ඔහු සිරුරෙන් සිටගෙන කල්පනා කළේය. විටෙක මිදුලට බැස එහි සක්මන් කර, යළිත් ජනේලයෙන් කාමරයට ඇතුළු විය. විසිත්ත කාමරය පුරාම ඇවිද්ද ඔහු, ඊට පසු නිදන කාමරයට ගොස් එයද පරීක්ෂා කළේ අලුත් ඉවක් පසු පස යන සුනඛයකු මෙනි. නිදන කාමරය වෙත ඉක්මන් බැල්මක් හෙළූ ඔහු, එහි ජනේලය විවෘත කළේය. එයින් ඔහු සතුටට පත්වූ ආකාරයක් පෙනිණි. සතුට හඟවන ශබ්දයක් කටින් පිට කරමින් හෝම්ස් ජනේලයෙන් එළියට එබී පහත බැලුවේය. ඊළඟට ඔහු යළිත් වරක් තරප්පුව දිගේ පහළට දිව ගියේය. විසිත්ත කාමරයේ ජනේලයෙන් මිදුලට බැස, එහි බිම මුහුණින් අතට පෙරළී මොහොතක් සිටියේය. යළිත් ඉක්මනින් කාමරයට ආවේ සතෙකු ලුහුබඳින දඩයක්කරුවෙකු මෙනි.

මේසය උඩ තිබුණේ ඔතෑම ගෙදරක දකින්නට ලැබෙන ආකාරයේ චිමිනි ලාම්පුවකි. එය හොඳින් පරීක්ෂා කළ හෝම්ස් එහි භූමිතෙල් දැමීම සඳහා ඇති බෝතලය ටේප් පටියෙන් මැන බැලීය. ඊළඟට තම කාචය අතට ගත් හෝම්ස්, ලාම්පුවේ චිමිනිය හා ඊටත් ඉහළින් ඇති සුදු පැහැති ආරක්ෂක පියන පරීක්ෂා

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only. Not For Print



මහා බියකරු දසුනකින් බියට පත් ලකුණු මනුගේ
මුහුණෙන් දිස්විය

http://sherlockholmesinvestigations.blogspot.com

කළේය. එම පියනේ මතුපිට පිහියෙන් සීරුවේය. ඉන් එකතු වූ කුඩු, ලියුම් කවරයක් තුළට දමා, කවරය ප්‍රවේශමෙන් තම දින පොත තුළ තැන්පත් කළේය. මේ වන විට වෛද්‍යවරයා සහ පොලිස් නිලධරයෝ නිවස වෙත පැමිණියහ. ඔවුනට ඉඩදී අපි තිදෙනා මිදුලට බැස්සෙමු.

'මගේ පරීක්ෂණය මුළුමනින්ම අසාර්ථක නැහැ. ඒක මට සතුටෙන් සඳහන් කරන්න පුළුවනි. ඒ වුණත් පොලිසිය සමග සාකච්ඡා දිගින් දිගටම කිරීම සඳහා, මට මෙහි රැඳී ඉන්න පුළුවන් කමක් නැහැ. කෙසේ වෙතත් දේවගැතිතුමනි, පොලිසියේ අවධානය ලාම්පුව සහ නිදන කාමරයේ ජනේලය වෙත යොමු කරවන්න. ඒ දෙකෙන්ම වැදගත් කාරණා සොයා ගත හැකියි. දෙකේම කාරණා එකට ගොනු කළාම ප්‍රශ්නය බොහොම දුරට විසඳා ගන්නත් පුළුවනි. පොලිසියට මොනව හරි ගැන වැඩිදුර දැනගන්න ඕනෙ නම්, මගේ නිවහනට එන්න කියන්න. ඔවුනට තේරුම් ගැනීමට අපහසු කරුණු මං බොහොම කැමැත්තෙන්ම තේරුම් කරලා දෙන්නම්. එහෙනම් අපට යන්න වෙලාව හරි ජෝද වොට්සන්'

පෞද්ගලික රහස් පරීක්ෂකයකු මෙම අපරාධ පරීක්ෂණයට ඇඟිලි ගැසීම ගැන පොලිසිය සමහර විට නොකැමැති වූවා විය යුතුය. එසේත් නැත්නම් ඔවුන් පරීක්ෂණය මෙහෙය වන ආකාරය සාර්ථක යයි  පොලිස් නිලධරයන් විශ්වාස කළා විය යුතුයි. කෙසේ වෙතත් දින දෙකක් ගතවන තුරුත් ඔවුහු අප හමුවීමට නොපැමිණියහ. මේ දිනවලදී දවසින් කොටසක් හෝම්ස් ගතකළේ, අපේ නිවහනට වී, පයිප්පය උරමින්, ඈත සිහින ලෝකයක පාවී යමිනි. එහෙත් ඔහු දවසේ වැඩි කොටසක් ගම්මානයේ තනියම ඇවිදින්නට යාම පිණිස යෙදවීය. ඔහු ආපසු පැමිණියේ ඇඳිරි වැටී පැය ගණනාවකට පසුවයි. ගියේ කොහේද, හමුවූයේ කවුරුන්ද, යන්න පවා ඔහු මට පැවසුවේ නැත. හෝම්ස්ගේ සැකය යොමුවී ඇත්තේ කුමන දිසාවකටදැයි මට සිතා ගත හැකි වූයේ ඔහු කළ එක් අත්හදා බැලීමකිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

මෝටිමර් ට්‍රෙගෙනිස් මියගිය පාන්දර ඔහුගේ කාමරයේ දල්වා තිබූ ලාම්පුවට, හැම අතකින්ම සමාන ලාම්පුවක් හෝම්ස් මිළදී ගත්තේය. දේවගැතිතුමා නිවසේ පහන් දැල්වීමට පාවිච්චි කල ලාම්පු තෙල්ම යොදා ඔහු ලාම්පුව දල්වා තැබුවේය. තෙල් සියල්ලම දැවී අවසන් වීමට ගතවන කාලය කොපමණ දැයි හෝම්ස් නිරීක්ෂණය කළේය. ඔහු පැවැත්වූ තවත් එක් පරීක්ෂණයක් නම් ඉතා අප්‍රසන්න බියකරු එකකි. එහෙයින් මට එය කිසිදක අමතක නොවේ.

'ඔබට මතක ඇති වොට්සන් , මේම ඛේද වාචකය ගැන අපට අහන්න ලැබුණු, දකින්න තිබුණු, එක්තරා පොදු ලක්ෂණයක් ගැන. ඒ තමයි මරණය සිදුවුණු කාමරයට මුලින්ම ඇතුළුවුණු තැනැත්තා, කාමරය තුළ අත්විඳි හුස්ම ගැනීමේ අපහසුතාවය, අපිරිසිදු වාතාශ්‍රය පිළිබඳ ප්‍රශ්නය. මෝටිමර් ට්‍රෙගෙනිස් අපට කිව්වා, ඔහුගේ සහෝදරයන් සිටි ඒ කාමරයට ඇතුළුවුණු වෙලාවෙ, වෛද්‍යවරයාට සිහි නැතිවෙලා පුටුවක් උඩට ඇද වැටුණා කියලා. ඊළඟට ඔබට මතක ඇති පෝටර් මහත්මිය කියූ දේ. කාමරයට මුලින්ම ඇතුළු වෙද්දි ඇය ක්ලාන්ත වුණු බව අපට කිව්වා. ඊට පස්සේ සිහිය ලැබුණාම ඇය ගිහින් ජනේලය විවෘත කළා. ඇයි මෝටිමර් ට්‍රෙගෙනිස් මියගිය කාමරයට ඇතුළු වෙද්දිත් එහි හුස්ම ගැනීමට අපහසු මහා දුර්ගන්ධයක් තිබුණා. ඒ, අපි එන්න විනාකට කලින් සේවිකාවක් ඒ කාමරයේ ජනේල සම්පූර්ණයෙන්ම හැරදමා තිබිලත්. මං ඒ සේවිකාවගෙන් ප්‍රශ්න කිරීමේ අදහසින් ඇය ගැන හොයා බැලුවා. ඇය අසනීප වෙලා ඇඳේ. දැන් ඔබට තේරෙනවා ඇති වොට්සන් මේ හැම එකක්ම අපව යොමු කරන්නේ යම් නිශ්චිත කරුණක් වෙතයි. ඒකෙන් කියවෙන්නේ ඒ හැම අවස්ථාවේදීම කාමරයේ වාතාශ්‍රය විෂ සහිත වූ බවයි.

අනෙක මේ හැම වෙලාවකම කාමරයේ ගින්දර දැල්වෙමින් තිබුණා. මුල් ඛේදවාචකයේ දැවුනේ ගින්දර දැල්වුණා. දෙවැනි එකේදි භූමිතෙල් ලාම්පුවක් දැල්වුණා. එද රාත්‍රියේ තිබුණු සීතල ගතිය නිසා ගිනි උදුන දැල්වීමේ අවශ්‍යතාවය තිබුණා. නමුත්

http://sherlockholmesinvestigations.blogspot.com

ලාම්පුව? ඒක පසුව දල්වපු එකක්. ඒකෙ ඉතිරි වී තිබුණු තෙල් ප්‍රමාණය මම පරීක්ෂා කළා. එවිට මම සොයාගත්තේ, ලාම්පුව දල්වලා තියෙන්නේ හොඳට එළිය වැටිලා, දවල් වුණාටත් පස්සෙ. ඇයි ඒ? ඒ මොකද කාරණා තුනක් එකට සම්බන්ධ නිසා. දැල්වෙන ගින්නක්: විෂ සහිත වාතාශ්‍රය අඩු කාමරයක්: මරණය හෝ පිස්සු වැටීම. ඒ ටික පැහැදිලියි නේද?'

'ඒ වගේ තමයි පේනෙන්නෙ'

'අඩු ගණනේ කරුණු එකින් එක ගොඩනැගීම සඳහා උපකල්පනයක් හැටියට වත් අපට ඒක පාවිච්චි කරන්න පුළුවන්.

එහෙම නම් අපි මෙහෙම හිතමු. කාමරයේ වාතාශ්‍රය දරුණු විෂක් සහිත මාරාන්තික එකක් කළ හැකි යම් ද්‍රව්‍යයක් මේ අවස්ථාවලදී ගින්නෙහි දැවුණා විය යුතුයි. හොඳයි. පළමුවෙනි සිද්ධියේදී මේ ද්‍රව්‍යය දමලා තිබුණේ උදුනේ ගින්දරට. ගෙයි ජනේලය වහලයි තිබුණේ. ගිනි උදුනෙන් උඩට තිබෙන දුම් කවුළුව දිගේ මේ විෂෙන් කොටසක් ඉවතට ගියා කියල අපට හිතන්න පුළුවන්. ඒ නිසා ඒ වෙලාවේ මෝටිමර් ට්‍රෙගෙනිස්ට බලපෑව තරම් ප්‍රබල ලෙස, ඒ විෂ ධූමය ක්‍රියාකාරී වෙන්නෙ නැහැ. පළමුවෙනි සිද්ධියේ ප්‍රතිඵල වලිනුත් ඒ බව ඔප්පු වෙනවා. බොහොම සංවේදී ඉන්ද්‍රිය පද්ධතියක් තිබුණු කාන්තාව විෂෙන් මියගියා. වඩාත් රළු, කර්කශ ශරීර ස්වභාවයක් තිබුණු පිරිමින් දෙදෙනා උමතු වුණා, නමුත් මරණයෙන් බේරුණා. මේ විෂ කොයි තරම් උග්‍ර එකක්ද කිව්වොත් එහි ප්‍රතිඵලය ඇය මියගියාට පසුවත් මුහුණෙන් ප්‍රකාශ වුණා. ඇය මියගියේ අපට හොඳ සාක්කියක් ඉතුරු කරලා. මං විශ්වාස කරනවා, විෂ ධූමය ආඝ්‍රාණය කිරීමෙන් ඇතිවෙන පළමුවැනි ලක්ෂණය තමා උමතු බව. ඒක සමහර විට තාවකාලික එකක් වෙන්න පුළුවන්. මේ කරුණු වලින් අපේ උපකල්පනය තහවුරු වෙනවා. ඒ මොකක්ද - මෙහිදී ක්‍රියාකාරී වී ඇත්තේ ගින්නේ වාෂ්ප වී ක්‍රියාත්මක වන ප්‍රබල විෂක්.

මෙන්න මේ වීටියට කාරණා ගලා එද්දී, මෝටිමර් ට්‍රෙගෙනිස් ගේ කාමරයේ මෙම විෂ ද්‍රව්‍යයේ ශේෂයක් වත් හොයා

Reading Purpose Only, Not For Print

ගන්න පුළුවන් වෙයිද කියලා. මං හොයල බැලුවා. මගේ පරීක්ෂණය පැහැදිලි ලෙසය පටන්ගත යුතු එක් තැනක් තිබුණා. ඒ තමයි ලාම්පු චිමිනියට උඩින් ආරක්ෂාවට තිබෙන වැල්ක් වලින් සැදූ ආරක්ෂක පියන. ඒ පියන ඇතුළු පැත්තෙ තිබිලා මට හමුවුණා යම් ද්‍රව්‍යයක්. කුමක්ද? අර රසායනික ද්‍රව්‍යයේ කොටසක් වාෂ්ප වෙලා ගිහින්, ඒක නොදැවී වැල්ක් ආවරණයේ දාරය දිගට, දුඹුරු පාටට කුඩක් වගේ තැන්පත් වෙලා තිබුණා. ඒ වගේම පියනේ මැද හරියේ තිබුණා. පතුරු වශයෙන් ගැලවෙන සුදු පැහැති අළු වැනි ද්‍රව්‍යයක්. මෙයින් භාගයක් මං ලියුම් කවරයකට එකතු කර ගතිපු හැටි ඔබ දකින්න ඇති."

"ඇයි හෝම්ස් භාගයක් විතර ගත්තෙ?"

"අපරාධ පරීක්ෂණ කාර්යය නිල වශයෙන් භාර පොලීසියටයි. මං කවදාවත් ඔවුනට අවහිර කරන්නෙ නෑ වොට්සන්. මට හමුවුණු සාක්ෂි හැම එකක්ම, මං නැමවිටම ඔවුනට ඉතුරු කරනවා. ඔවුන් උනන්දු වෙලා හොයා බැලුව නම්, විෂ වර්ගය තවමත් අර වැල්ක් පියනේ ඉතුරු වෙලා ඇති.

වොට්සන් දැන් අපි පොඩි පර්යේෂණයක් කරලා බලමු. කොහොම වුණත් අපි ජනේලය හැරලා තියමු. ඒ මොකද සමාජයට ප්‍රයෝජනවත් සාමාජිකයන් දෙදෙනෙක් අකාලයේ මෙලොවින් සමුගැනීම වළක්වන්න ! මේ පර්යේෂණයට නම් සහභාගී වෙන්න බැහැ කියලා බුද්ධිමත් තීරණයක් අරගෙන ඔබ කාමරයෙන් එළියට යනව වුණත් ඒ ගැන මගේ කිසිම අමනාපයක් නැහැ. එහෙම නැතුව මේ පර්යේෂණයට ඔබ සහභාගි වෙනව නම්, අර විවෘත කරලා තිබෙන ජනේලය ළඟම හාන්සි පුටුවේ වාඩිවෙන්න. මොකවා? මේකට සම්බන්ධ වෙන්න ඔබත් කැමතියි එහෙනම්? මගේ හිතවත් වොට්සන්, මොන වගේ කෙනෙක්ද කියලා මං දැනගෙන හිටියා.

ඔබ වාඩිවෙන පුටුවට මුහුණ දාල මෙන්න මං වාඩිවෙන පුටුව. මැද්දෙන් තියමු ලාම්පුව. එතකොට අපි දෙන්න ඉන්නේ මුහුණට මුහුණ බලාගෙන. ඒ වගේම විෂදුම නිකුත් වෙන තැනට

http://sherlockholmesinvestigations.blogspot.com

සමාන දුර වලින්. අපි දෙර ටිකක් අඩවල් කරල තියමු. දැන් අපේ එක්කෙනෙකුට අනිත් එක්කෙනාගේ මුහුණේ ඇතිවෙන වෙනස්වීම් හොඳට පෙනෙනවා. විෂ ධූමය නිසා භයානක ප්‍රතිඵල ඇතිවෙගෙන එනවා වගේ පෙනෙනවා නම්, අපෙන් කාටහරි පුළුවනි පර්යේෂණය වහාම නවත්වා දමන්න. දැන් ඔක්කොම පැහැදිලිද?' හරි. ඔන්න අනෙකාම් ලියුම් කවරයේ ආරක්ෂා කරගෙන හිටි කුඩු ස්වල්පය මං එළියට ගන්නා. ඔන්න මා එය විමිනි කටට උඩින් හලනවා. ලාම්පුවේ දැල්ලට. හරි ! දැන් බලමු වොට්සන් ඒකෙන් ඇතිවෙන ප්‍රතිඵලය මොකක්ද කියා'

ප්‍රතිඵල ඒමට වැඩි වේලාවක් ගත නොවීය. මා හාන්සි පුටුවේ පිටුපසට හේත්තු වුවා පමණි. ඔක්කාරය පාදන පුළු සියුම් සුවඳක් මගේ නැහැයට දැනිණි. එම දුමේ ස්වල්පයක් ආඝ්‍රාණය කළ වහාම මගේ මොළයේ දැවිල්ලක් හටගත්තේය. ඒ සමගම පහළ වුයේ කිසිදු පාලනයකින් තොර විකාර සිතුවිලි රාශියකි. කළු පැහැති ගනකම් ධූමාරයක් මගේ ඇස් ඉදිරියෙන් පාවී යන්නාක් මෙන් මට දැනිණි. මේ විශ්වයේ ඇති භයානකම, කුරිරුතම දෙවල් රාශියක් ධූමාරයේ පාවී අවුත් මා වෙතට කඩා පනින්නට සූදානම් බව මගේ මොළයෙන් දැනුම් දුන්නේය. විකාර රූපී නොයෙක් හැඩගත් භයානක දේවල් කළු ධූමාරයේ පාවී එන්නාක් මෙන් මට පෙනිණ. මගේ මුළු ශරීරයම භීතියෙන් ගල් ගැසිණ. මගේ ඇඟේ රෝම උද්ගමනය වී ඇස් දෙක ගොබළු ගෙඩි දෙකක් මෙන් එළියට නෙරා ගිය ආකාරය මට තේරිණි. පාලනයකින් තොරව මගේ කට ඇරිණි. බල්ලෙකුගේ මෙන් දිව ඉදිරියට දික්වී පහතට එල්ලෙන්නට පටන් ගත්තේය. මොළය තුළ සිදුවන වේදනාකාරී ප්‍රචණ්ඩ ක්‍රියාවලියක් නිසා මගේ මුළු හිස ම කොයි මොහොතේ හෝ පුපුරා යනු ඇතැයි මට සිතිණි.

මම ශබ්ද නගා කෑගැසීමට උත්සාහ කළෙමි. එහෙත් එසේ කිරීමට නුපුළුවන් විය. මගේ උගුරෙන් ශබ්දයක් පිටවුවත් මට දැනුණේ, එය මගේ කටහඬ නොව ඈතින් ඇසෙන විකෘති ශබ්දයක් ලෙසයි.

ජෙරොල්ඩ් එජෙන්ගේ සහිත ධූමාරය හරහා මට එසවරම

හෝම්ස්ගේ මුහුණ දකින්නට ලැබිණි. දරදඬු ගැසී, සුදුමැලි වී තිබූ ඔහුගේ මුහුණෙන් දිස්වූයේ කුමක්ද? මෝටිමර් ට්‍රෙගෙනිස් හා ඔහුගේ සොහොයුරියගේ මළසිරුරු වල දකින්නට ලැබුණු භීතිය ප්‍රකාශිත හැඟීමය. එම සිතුවිලි මගේ මනසට ආවේ එක් මොහොතකට පමණි. සිහිකල්පනාව මගේ මොළය තුළ එක් තත්පරයකට ඇතිවී, යළිත් නැතිවී ගියේය. ඒ මොහොතේම පුටුවෙන් නැගිට හෝම්ස් සිටි තැනට වේගයෙන් දුව ගියෙමි. මගේ දෑතින්ම ඔහුව බදාගෙන ඔහුව ඇදගෙන, දොරටුව වෙත යාමට හැකි සම්පූර්ණ උත්සාහය යෙදුවෙමි. දොර තල්ලුකර දමා වහාම අපි ගෙයින් එළියට පැන ගත්තෙමු. නිවස ඉදිරිපිටම වූ තණකොළ මිදුලේ වැතිරී, මෙතෙක් වේලා හුස්ම හිරවී සිටියවුන් මෙන් පිරිසිදු වාතයෙන් අපේ පෙණහලු පිරවීමට පටන් ගත්තෙමු.

අප භීතියෙන් ත්‍රස්ත කළ කළු වලාකුළ ක්‍රම ක්‍රමයෙන් ඉවතට පාවී ගියේය. දීප්තිමත් හිරු කිරණින් අප නැහැවෙන බව මඳ වේලාවක් ගතවෙද්දී අපට දැනුණි. මීදුමක් ඉවත් වී යන්නාසේ මෙන් අපේ ආත්මය වසාගත් භීෂණය ඉවත්වී ගියේය. ඩහදියෙන් පෙඟුණු නළල් තල අත ගාමින් අප දෙදෙනා එකිනෙකා දෙස බලාසිටියේ, තවමත් අප ජීවතුන් අතරදැයි අවිශ්වාසයෙනි.

'දෙයියම්පා වොට්සන් ! මං ඔබට ස්තූති කරන ගමන්ම ඔබෙන් සමාවත් ඉල්ලා සිටිනවා. එක කිසිසේත් තමන්ගේ ජීවිතය පරදුවට තබා කළ යුතු පරීක්ෂණයක් නොවෙයි. එහෙම එකේ යහළුවෙකුගේ ජීවිතයත් පරදුවට තැබීම මොන තරම් අසාධාරණද? ඇත්තෙන්ම මට සමාවෙන්න වොට්සන්'.

හෝම්ස් මුළු හිතින්ම මා වෙනුවෙන් එලෙස කම්පාවෙනු මා කිසිදිනෙක දැක නැත.

'ඔබට පිහිට වෙන්න ලැබීම මට ලොකු සතුටක්. ඒ වගේම ගෞරවයක්' මම කීවෙමි.

'අපට හිතාමතාම පිස්සු හදාගන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ වොට්සන්. අපි කරපු වැඩේ බලාගෙන හිටියා නම්, අපක්ෂපාත නිරීක්ෂකයෙක් කියන්න ඉඩ තිබුණා.



මේ වගේ මෝඩ විදියට පර්යේෂණ කළේ ඔහෙල දෙන්නටම මුල ඉඳලම පිස්සු නිසා......

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වගේ මෝඩ විදියට පර්යේෂණ කළේ මගේල දෙන්නට මුල ඉඳලම පිස්සු නිසා කියල. ඇත්තටම මං හිතුවෙ නෑ මේ විෂ, මය තරම් ඉක්මනට ක්‍රියාත්මක වෙනා, මේ තරම් දරුණු එකක් වේවි කියල."

නිවස ඇතුළට ආපසු දිවගිය හෝම්ස්, දැල්වෙන ලාම්පුව එළියට ගෙන ආවේය. ශරීරයට ඈත් කර අල්ලා ගත් ලාම්පුව නිවසට ඈතින් තිබූ කටු පඳුරු ගාල දෙසට හැකිතරම් ශක්තිය යොදා විසිකර දැම්මේය.

"කාමරයේ වාතාශ්‍රය තව ටිකක් පිරිසිදු වෙන්න ඉඩ අරිමු. මේ ඛේදජනක සිද්ධීන් වුණේ කොහොමද කියන එක ගැන දැන් නම් ඔබේ හිතේ සැකයක් නැතුව ඇති?"

"කිසිම සැකයක් නෑ."

"නමුත් එහෙම දෙයක් පටන් ගන්න හේතුව මොකක්ද කියන එක තවමත් පැහැදිලි නෑ. එන්න වොට්සන් මේ ලතා මණ්ඩපය ඇතුළට. ඒ ගැන සාකච්ඡා කරල බලමු. අර ජරා විෂ දුම තවමත් මගේ උගුරේ දැවටෙනවා වගෙයි.

මේ දක්වා මං හොයාගෙන තිබෙන හැම හෝඩුවාවකින්ම, හැම පරීක්ෂණයකින්ම පැහැදිලි එක් දෙයක් තිබෙනවා. ඒ තමයි මුල් ඛේදවාචකය සිදුකළ අපරාධකාරයා මෝටිමර් ට්‍රෙගෙනිස් බව. නමුත් දෙවැන්නේදී මරණයට ගොදුරු වුණෙත් ඔහුයි. අපි මුලින්ම සිහි තබාගන්න ඕන, පවුලේ සාමාජිකයන් අතර ලොකු ආරවුලක් තිබුණු බව. පස්සෙ ඒක සමථයකට පත්වුණු බව අපට අහන්න ලැබුණා. ආරවුල කොයිතරම් ගැඹුරට මුල් බැසගත් ද්වේශයෙන් පිරී තිබුණු එකක්ද කියන එක අපි දන්නේ නෑ. සමථයට පත්වීම කොයිතරම් දුරට සාර්ථකව සිදුකෙරුණිද කියලත් අපි දන්නෙ නෑ. මෝටිමර් ට්‍රෙගෙනිස්ගෙ ....... තිබුණු හිවල් මුහුණත් උපැස් යුගලට පිටුපසින් තිබුණු කපටි ඇස් දෙක ගැනත් ඔබට මතකද? මම නං හිතන්නෙ නෑ ඔහු ලේසියෙන් කාටවත් සමාව දෙන පුද්ගලයෙක් කියල.

vestigations.blogspot.com

ඊළඟට ඔබට මතක ඇති අර ජනේලයෙන් ඔවුනට දකින්න ලැබුණු සෙලවීමක් ගැන ඔහු කිව්වා. ඒකෙන් අපේ අවධානය වෙනත් පැත්තකට යොමු වුණා. ඒ ඔහු හිතාමතාම අපව වැරදි මාර්ගයේ යවන්න කළ උත්සාහයක්. අවසාන වශයෙන් එදා රෑ ඔහු නිවසින් පිටවෙලා ගියේ විෂ ද්‍රව්‍යය ගින්නට දමල. එහෙමත් නැත්තං කවුද ඒක කළේ? ඛේදවාචකය සිදුවුණේ ඔහු පිටවී ගිය වහාම බව ස්ථිරයි. ඔහු පිටවී ගිය වෙලාවේ වෙන කවුරු හරි ගෙදරට ආව නම්, මේසයට වාඩිවෙලා හිටපු තුන්දෙනා අනිවාර්යයෙන්ම පුටු වලින් නැගිටිනවා. අනෙක මේ බොහොම නිශ්ශබ්ද, පිටිසරබද කෝන්වෝල් ප්‍රදේශයේ රෑ දහයෙන් පස්සෙ කොහෙද අමුත්තො එන්නෙ? ඒ නිසා සියලුම සාක්ෂි වලින් අපට නිගමනය කරන්න පුළුවන් අපරාධකාරයා මෝටිමර් ට්‍රෙගෙනිස් බව.'

'එහෙම නම් ඔහුගේ මරණය සිය දිවි නසා ගැනීමක්ද?'

'ඔව් වොට්සන්. මුලු මුල්මටම නම් ඒ අදහස හරි කියලයි කෙනෙකුට හිතෙන්නේ. ඒ මොකද තමන්ගේ පවුලේ සාමාජිකයින් තුන් දෙනෙකුට මේ වගේ අපරාධයක් කළ මිනිහෙකුට තමන්ගේ හෘද සාක්ෂියෙන් ගැලවීමක් නෑ. ඒ නිසා ඔහු සිය දිවි නසාගන්න පෙළඹෙන්න ඉඩ තියෙනවා. නමුත් ඒක එහෙම නොවෙන්න ප්‍රබල හේතු සාධක තියෙනවා. ධාවකයෙකුට වගේ මේ ගැන හොඳින් දන්නා එක මිනිහෙක් වත් එංගලන්තයේ ඉන්නවා. ඒ කරුණු සියල්ලම ඔහුගේ කටින්ම අහගන්න මං කටයුතු සූදානම් කරලයි තියෙන්නෙ. ආ......... ඔහු වෙලාවටත් කලින් එනවා වගෙයි............

.......... ආචාර්ය ලියොන් ස්ටර්න්ඩේල් මහත්මයා. කරුණාකර මේ පැත්තට එන්න. අපි ගේ ඇතුළේ රසායන විද්‍යාත්මක පර්යේෂණයක් කළා. ඔබ වැනි විශේෂ අමුත්තෙක් කැඳවාගෙන යන්න තරම් ගේ ඇතුළෙ පරිසරය කොහොමටවත් සතුටුදායක නෑ.'

මොහොතකින් ඒ සුප්‍රසිද්ධ දේශ ගවේෂකයාගේ දැවැන්ත ශරීරය අප අසලටම ළඟාවෙන අයුරු මට දකින්නට ලැබිණ. ඔහු අප දෙස බලා සිටියේ මහත් පුදුමයෙනි.

Reading Purpose Only, Not For Print
http://....blogspot.com

"හෝම්ස් මහත්තයා. ඔබ මට එන්න කියලා පණිවුඩයක් එවලා තිබුණා. ඔන්න මං ආවා. ඔබ එන්න කිව් පළියට මං ඒකට කීකරු වෙන්නෙ මොන හේතුවකටද? ඒක මට හිතාගන්න අමාරුයි"

"බාග වෙලාවට අපි වෙන්වෙන්න කලින් ඒ හේතුව පැහැදිලි කරගැනීමට හැකිවේවි. මගේ ඉල්ලීමට එකඟවෙලා මෙහි පැමිණීම ගැන මං ඔබට ස්තූතිවන්ත වෙනවා. මේකට පත්තරකාරයො කියන්නෙ 'කෝන්වෝල්හි භීෂණය' කියල නෙ. ඒකට මායි වොට්සනුයි අලුත් පරිච්ඡේදයකුත් එකතු කළා. ඒ නිසා මේ විදියට ඔබව එළිමහනේ පිළිගන්න සිදුවීම ගැන අපට සමාවෙන්න. දැන් අපට සාකච්ඡා කරන්න වෙන කාරණාව, ඔබේ ජීවිතයට සම්බන්ධ ඉතාම පෞද්ගලික, ඒ වගේම රහසිගත එකක්. ඒ නිසා කාටවත් හොරෙන් ඇහුම්කන් දෙන්න බැරි තැනක ඉඳන් මේ කථාව කරන එක වඩාත් හොඳයි."

තම දෙතොලට හිරවී තිබුණු සුරුට්ටුව ඉවතට ගත් ස්ටර්න්ඩේල් හෝම්ස් දෙස කුරිරු බැල්මක් හෙළුවේය.

"මගේ ජීවිතයට සම්බන්ධ ඉතාම පෞද්ගලික ඒ වගේම රහසිගත ඒවා? මට නම් මේ කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ. ඔබ මොනව ගැනද මේ කතා කරන්නේ?"

"මෝටිමර් ට්‍රෙගෙනිස් ඝාතනය කිරීම ගැන !"

මගේ අතේ ආයුධයක් තිබුණා නම් කොතරම් හොඳ දැයි මට එක්වරම සිතිණි. ස්ටර්න්ඩේල්ගේ රෞද්‍ර මුහුණ තද රතු පැහැයට හැරිණි: ඔහුගේ දෑස් කෝපයෙන් දිලිසෙන්නට පටන් ගත්තේය. දැන් මිට මොලවා ගත් ඔහු කෝපාවිෂ්ඨව මගේ මිත්‍රයා දෙසට කඩා පැන්නේය.............. එහෙත් ........ ඔහු එක්වරම නැවතිණි. බලවත් උත්සාහයක් දරා තම කෝපය පාලනය කරගැනීමට ඔහු සමත්විය.

හෝම්ස් මහත්තයා, මං ජීවත්වුණේ කිසිම නීතියකට යටත් නොවුණු ජීවිතයක, වනචාරී මිනිස්සු අතරෙයි. මං පුරුදු වෙලා

ඉන්නෙ මං පනවන නීති මම, ම ක්‍රියාත්මක කරන්නයි. ඒක ඔයේ මතක තියාගන්නොත් හොඳයි. ඒ මොකද ඔහේට බරපතළ තුවාල සිදුකරන්න මම කැමති නෑ."

"ඔහේ බරපතල අමාරුවක දාන්න මමත් කැමති නෑ. ආචාර්ය' ස්ටර්න්ඩේල්. කාරණා ඒත්තෝම දැන හිටියත්, පොලීසියට පණිවුඩයක් නොයැව්වා ඔබට පණිවුඩයක් යැව්වේ ඒ නිසයි."

එක්වරම අමාරුවෙන් හුස්මක් ඇද්දූ ස්ටර්න්ඩේල් පුටුවක් මතට ඇද වැටුණේය. ඔහු මේ ආකාරයට, තවත් කෙනෙකුට ගෞරව සම්ප්‍රයුක්ත භයකින් මෙල්ල වුණේ, ජීවිතයේ පළමුවැනි වතාවට විය යුතුය. වචන ගළපාගැනීමට නොහැකිව අපේ අමුත්තා මඳ වේලාවක් ගොනු ගැසුවේය. අනතුරුව කථාව යළි පටන් ගත්තේය.

"මොකක්ද ඒ කතාවෙ තේරුම? බොරු කතාවක් දාල මගේ කටෙන් මොනව හරි අල්ල ගන්න ද තමුසෙ බලාගෙන ඉන්නෙ? එහෙනම් මට කියන්න තියෙන්නෙ මෙච්චරයි. තමුසෙ මේ සෙල්ලං පටන් අරගෙන තියෙන්නෙ වැරදි මිනිහත් එක්ක ! අනංමනං දොඩවන්නෙ නැතුව කියනවා, මොකක්ද තමුසෙගෙ කතාවෙ තේරුම?"

"හොඳයි මං ඔබට කියන්නම්. ඒ ටික මං ඔබට කියන්න හේතු වෙන්නෙ, අවංක අදහසින් කරන විමසුමට, ඔබ අවංකවම පිළිතුරු දේවි කියන විශ්වාසයයි. මං ඊළඟට ගන්නා පියවර මොකක්ද? ඒක තීරණය වෙන්නෙ ඔබේ නිදහස අතා ඔබ ඉදිරිපත් කරන කරුණු මත."

"මගේ නිදහස අතා?"

"ඔව් මහත්මයා"

"මං මොන වරදක් කළාටද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මෝටිමර් ට්‍රෙගෙනිස් මරා දැමීම නිසා."

ලේන්සුව අතට ගත් ස්ටර්න්ඩේල් නළලේ ඩහදිය පිසදමන්නට පටන් ගත්තේය.

"දෙයියම්පා! ඔහේ කොහොම හරි විකෙන් වික ඉදිරියට යනවා. ඔබෙ සාර්ථකත්වය රඳා පවතින්නේ, මේ විදියට තටෙ බලෙන් බොරුව ගෙන යෑමේ විශිෂ්ට හැකියාව මතද?"

"ආචාර්ය ස්ටර්න්ඩේල්. බොරුව ගෙනියන්නේ මං නෙමෙයි, ඔබයි. මං මේව හොයා ගත්තේ කොහොමද කියන්නද? ඔබේ ගමන් බඩු වලින් කොටසක් අප්‍රිකාවට යද්දි, ඔබ ප්ලිමත් වල ඉඳල ආපහු ආවා. අන්න ඒතකොටයි මං තේරුම් ගත්තේ, මේ කතන්දරයේ ඔබත් එක් චරිතයක් බව......"

"මං ආපහු ආවේ......"

"ඒකට ඔබ දීපු කාරණා මට සෑහෙයක් අහන්න ලැබුණා. ඒවා කොහොමටවත් විශ්වාස කිරීමට බැරි, අසතුටුදායක ඒවා. අපි ඒක අමතක කරමු. මේ සිද්ධිය ගැන මං සැකකරන්නේ කවුද කියල අහන්න ඔබ මෙහාට ආවා. ඒකට පිළිතුරු දීම මා ප්‍රතික්ෂේප කළා. ඊළඟට ඔබ ගියේ දේවගැති මන්දිරයට. ගිහින් වික වෙලාවක් එළියේ රැඳී හිටියා. ඊටපසු ඔබ ආපහු ඔබේ නිවසට ගියා."

"ඔහේ කොහොමද ඒක දැනගත්තේ?".

"මං ඔබේ පිටිපස්සෙන්ම ආවේ"

"මං දැක්කෙ නෑ කවුරුවත්?"

"මං කෙනෙකුගේ පිටිපස්සෙන් යද්දි, ඒ බව අර තැනැත්තාට දැනගන්න ඉඩ තියන්නෙ නෑ. එදා රෑ ඔබට හරිහැටි නින්ද ගියේ නෑ. හිතේ බොහොම කැලැඹුණු ගතියෙන් හිටියේ. එදා රෑ ඔබ යම් කාර්යයක් ගැන හිතෙන් සැලැසුම් කළා. උදේ පාන්දරම ඔබ ඒක ක්‍රියාවට නැංවූවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ ගෙදරින් පිටවුණේ පාන්දර- එළිවෙගෙන එද්දි. ගේට්ටුව ළඟ ගොඩගහල තිබෙන රතු පාට බොරළු කැට ගොඩෙන් අහුරු දෙක තුනකුත් ඔබ සාක්කුවට දමා ගත්තා'

මේ කතාව ඇසූ ස්ටර්න්ඩේල් තිගැස්සුණේය. ඔහු හෝම්ස් දෙස බලාසිටියේ විස්මයෙනි.

'ඊළඟට, ඔබේ නිවසේ ඉඳල දේවගැති නිවසට ඇති සැතපුමක දුර, ඔබ වේගයෙන් ඇවිදගෙන ආවා. ඒ වෙලාවෙ ඔබ පැළැඳ හිටියේ, ඔය දැනුත් ඇඳගෙන ඉන්න, ඉරි ඉරි අඩියක් සහිත ටෙනිස් සපත්තු. දේවගැති නිවසේදී ඔබ පලතුරු වත්ත පහුකරලා ගිහිං, මල් වැටෙනුත් ඔබ්බට ගියා. ඔබ මෝටිමර් ට්‍රෙගෙනිස්ගෙ කාමරේ ජනේලය ළඟටම ආවා. දැන් ඔන්න එළියත් වැටිලා. ඒත් ගෙදර මිනිස්සු හරිහැටි අවදි වෙලා නෑ. ඔබ මොකද කළේ, සාක්කුවෙන් ගල්කැට අරගෙන, මෝටිමර්ගේ කාමරේ ජනේලයට එක එක ගහන්න පටන් ගත්තා'

ස්ටර්න්ඩේල් කෝපයෙන් පිපිරෙමින් නැගිට්ටේය

'මං හිතන්නෙ උඹ නම් යක්ෂයෙක්' ඔහු කඩා පැන්නේය.

'හෝම්ස්ට සිනා පහළ විය.

'ගල්කැට අහුරු දෙකක් නැත්නං තුනක් ගහන්න වෙන්න ඇති, උඩ තට්ටුවේ ජනේලයට, එහෙම කරලයි මෝටිමර්ව කුද්ද ගන්න පුළුවන් වුණේ. ඔහු ජනේලය ළඟට ආවම ඔබට පුළුවන් වුණා, ඔහුව කතාබහක් සඳහා පහළ තට්ටුවට එන්න කැමති කරව ගන්න. ට්‍රෙගෙනිස් ඉක්මනට හැඳ පැළැඳ ගෙන පහළ තට්ටුවේ ඔහුගේ විසිත්ත කාමරයට ආවා. ඔබ ඊකට ඇතුළු වුණේ ජනේලයෙන්.

පොඩි කතාබහක් ඇති වුණා. ඒ වෙලාවේ ඔබ කාමරයේ එහා මෙහා ඇවිද්ද. ඊළඟට ඔබ එළියට ගිහින් ජනේලය වැහැව්වා. ඊට පස්සෙ තණබිමට වෙලා, සුරුට්ටුවක් උරමින්, වෙන්නෙ මොකක්ද කියලා බලාගෙන හිටියා. මෝටිමර් ට්‍රෙගෙනිස්

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com



"මං හිතන්නේ උඹ නම් යක්ෂයෙක්"

Reading Purpose Only, Not For Print
http://

මියගියාට පස්සෙ. මම ආපු විදියටම යන්න ගියා. ඉතින් ආචාර්ය ස්ටර්න්ඩේල් ඔබගේ ඒ හැසිරීම ගැන මම නිදහසට කියන කාරණා මොනවද? ඔබ ඒ වගේ දෙයක් කරන්න පෙළඹුණේ ඇයි? ඔහේ බොරු වැල්වටාරම් කියලා මාව රවටන්න හැදුවොත් නම්...... ඔව් එහෙම වුණොත් මේ කාරණා ටික මගේ කටෙන් පිටවෙලා යාවි. හැබැයි එහෙම ගියොත් ගියා ගියාමයි!"

හෝම්ස්ගේ ප්‍රකාශය අසා සිටි ස්ටර්න්ඩේල් ගේ මුහුණ බලා සිටියදීම කළු විය. ඇගේ මුහුණ සගවා ගත් ඔහු මද වේලාවක් කල්පනා කළේය. එක් වරම නැගී සිටි ඔහු, කබායේ ඇතුළ සාක්කුවකින් ඡායාරූපයක් එළියට ගෙන, එය අප ඉදිරිපිට මේසය මතට විසි කළේය.

"මට ඒ දෙය කිරීමට සිදුවුණේ මෙන්න මෙයා නිසයි"

අපි එය පරීක්ෂා කර බැලුවෙමු. එය ඉතා ශෝභා සම්පන්න කාන්තාවකගේ ඡායාරූපයකි.

"බ්‍රෙන්ඩා ට්‍රෙගෙනිස්" හෝම්ස්ගේ කටින් පිටවිය.

"ඔව්. ඇය බ්‍රෙන්ඩා ට්‍රෙගෙනිස්. අවුරුදු ගණනාවක් තිස්සේ මං ඇයට ආදරය කළා. අවුරුදු ගණනාවක් තිස්සෙ ඇයත් මට ආදරය කළා. මට ඇය හා විවාහ වෙන්න විදියක් තිබුණේ නෑ. ඒ මොකද අවුරුදු ගණනාවකට කලින් මාව අතහැරදාල ගිය බිරිඳක් මට ඉන්නවා. නමුත් එංගලන්තයේ තිබෙන නින්දා සහගත දික්කසාද නීතිය නිසා, මට ඇගෙන් දික්කසාද වෙන්න විදියක් නෑ. මං අවුරුදු ගණනක් බලාගෙන හිටියා. බ්‍රෙන්ඩාත් අවුරුදු ගණනක් බලාගෙන හිටියා. අන්තිමට අපට අත්වුණේ මෙන්න මේ අවාසනාවන්ත ඉරණම"

මේ දැවැන්ත පුරුෂයා ඉකිගසමින් හඬන්නට පටන් ගත්තේය. මද වේලාවකින් තම හැඟීම් පාලනය කරගෙන ඔහු යළිත් කථාව පටන් ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"දේවගැතිතුමා මේ ඔක්කොම දැන හිටියා. එතුමාගේ ආශිර්වාදය අපට ලැබුණා. එතුමාගෙන් අහල බලන්න. ඔහු කියාවි බ්‍රෙන්ඩා කියන්නේ මිහිපිට ජීවත්වූ දෙවඟනක් කියල. ඒ නිසා තමයි ඒ ඛේදවාචකය සිදුවුණු වෙලාවේ ඔහු මට විදුලි පුවතක් යැව්වේ; මං වහාම ආපහු ආවේ. මගේ බඩුබාහිරාදියෙන් කොටසක් ඒ වනවිට අප්‍රිකාවට යැවීම අදහා බෝට්ටුවෙන් ගෙන ගිහිං. ඊත් මගේ ආදරණීයන්ට නම් එහෙම ඛේදජනක ඉරණමක් අත්වුණා කියල දැනගත්තාම බඩුමුට්ටු වලින් ඇති පලේ මොකක්ද? මගේ ක්‍රියාවන් වලින් ඔබට මෙතෙක් දැනගන්න නොලැබුණු සාධකය අන්න ඒකයි හෝම්ස් මහත්මයා."

"කථාව දිගටම කියන්න."

ආචාර්ය ස්ටර්න්ඩේල් තම කබා සාක්කුවෙන් කඩදාසි පැකට්ටුවක් එළියට ගෙන මේසය මත තැබුවේය. "රැඩික්ස් පෙඩිස් ඩයබොලයි" යනුවෙන් ඒකී ලියා තිබූ අතර, ඊට යටින් "විෂ" යනුවෙන් සඳහන් රතු පැහැති ලේබලයක් අලවා තිබිණි. ස්ටර්න්ඩේල් ඒ පැකට්ටුව මා දෙසට තල්ලු කළේය.

"මහත්මයා. මං අහල තියෙනවා ඔබ වෛද්‍යවරයෙක් කියල. ඔබ මේ ඖෂධය ගැන අහල තියෙනවද?"

"රැඩික්ස් පෙඩිස් ඩයබොලයි" කියන ලතින් වාක්‍යයේ තේරුම "යකාගේ අඩියේ මුල" "මං කවදාවත් මෙහෙම දෙයක් ගැන අහල නෑ."

"ඔබ ඒක නොදන්නෙ ඔබේ වෛද්‍ය විද්‍යා දැනුමේ අඩුපාඩුවක් නිසා නෙමෙයි. මං දන්න තරමින් මා ළඟ තිබෙන මේ පැකට්ටුව හැරුණාම, මුළු යුරෝපයේම මේ ඖෂධයෙන් ස්වල්පයක් තියෙන්නෙ හංගේරියාවේ, බුඩාපෙස්ට්වල, පර්යේෂණාගාරයක පමණයි. මේක ගැන තවමත් කිසිම ඖෂධ විද්‍යා කෝෂ ග්‍රන්ථයක සඳහන් වෙන්නෙ නැහැ. ඒ වගේම විෂ වෛද්‍යවේදය පාඨ ග්‍රන්ථවල කොහේවත් ලියැවී නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ ගසේ මුලට තිබෙන්නේ කකුලකට සමාන පෙනුමක්.

නමුත් ඒ කකුලෙ අඩක් මනුෂ්‍යයෙකුගේ, අඩක් එළුවෙකුගේ වගෙයි. ඒ නිසා අප්‍රිකාවේ ආගම් ප්‍රචාරයේ යෙදුණු උද්භිද විද්‍යාඥ මිෂනාරි වරයෙක් මේකට යකාගෙ අඩිය කියන නම දැම්මා. බටහිර අප්‍රිකාවේ උබංගි කියන ගෝත්‍රිකයන්ගේ යකැදුරන් මේක රහස් බෙහෙත් හැටියට පාවිච්චි කරනවා. ඔවුන්ගේ යකැදුරුකම්, යාගහෝම්, ගෝත්‍රික වෙදකම් වලදී යොදගන්නා මේ බෙහෙත, මගේ අතට පත්වුණේ බලාපොරොත්තු නොවූ විදියට'

පැකට්ටුව විවෘත කළ ඔහු, එයින් ස්වල්පයක් එළියට ගෙන පෙන්වීය. එය රතුපාටටද හුරු දුඹුරු කුඩු වර්ගයක් බව අපි දුටුවෙමු.

'ඉතින් මහත්මයා.........?' හෝම්ස් ඇසුවේ නොඉවසිලිමත් අයුරෙනි

'හෝම්ස් මහත්මයා. මං මේ කරන්නෙ සිදුවුණු හැම දෙයක්ම ඔබට කියන්නයි. ඔබ දැනටමත් දන්න කාරණාවල හැටියට, සියලුම දේ දැනගෙන ඉන්න එක වඩාත් හොඳයි. වැඩියත්ම මගේ යහපත පිණිස.

ට්‍රෙගෙනිස් පවුලත් මාත් අතරේ තිබුණේ මොන වගේ සම්බන්ධතාවයක්ද කියන එක මං ඔබට කිව්වා. බ්‍රෙන්ඩා වෙනුවෙන් මං ඇගේ සොහොයුරන්ට හිතවත්ව හිටියා. ට්‍රෙගෙනිස් පවුලේ මුදල් බෙදගැනීම ගැන මහා ආරවුලක් ඇතිවුණා. ඒක නිසා මෝටිමර්, පවුලෙ අනිත් අයගෙන් අයින් වුණා. පස්සෙ මේවා සමථයකට පත්කරගත්ත බවයි අහන්න ලැබුණේ. ඒ නිසා අනෙක් අය වගේම මෝටිමර් එක්ක මං ආශ්‍රය කළා. ඔහු මහ කෛරාටික තක්කඩියෙක් බව මට තේරුණා. ඒත් ඔහුත් එක්ක පණ්ඩුවක් පටන්ගන්න තරම් හේතුවක් මට තිබුණේ නැහැ.

සති කිහිපයකට කලින් එක දවසක් ඔහු මගේ නිවසට ආවා. නිකං කතාබහ කර කර ඉන්න අතරේ අප්‍රිකාවෙන් මං ගෙනාපු නොයෙක් විසිතුරු දේවල් ඔහුට පෙන්නුවා. මේ විෂ බෙහෙතත් එහෙම පෙන්නපු දේවලින් එකක්. මෙය ක්‍රියාකාරන

ආකාරයත් එයින් ඇතිවෙන ප්‍රතිඵලත් මං ඔහුට තේරුම් කරල දුන්නා. මෙම ඖෂධයෙන් මොලයේ භය හා සංත්‍රාසය පාලනය කරන මධ්‍යස්ථාන උත්තේජනය වෙන හැටිත්, අප්‍රිකාවේ උබංගි ගෝත්‍රික යකැදුරන් මේ බෙහෙත යොදගෙන කරන යාග හෝම ගැනත් මං ඔහුට කිව්වා. මේ විෂ වර්ගයේ වාෂ්ප ආඝ්‍රාණය කරන ගෝත්‍රික මිනිසුන් පිස්සු වැටෙන හැටිත්, ඊලඟට මරණයට පත්වෙන අයුරුත් මා විස්තර කරද්දී මෝටිමර් එය අසා සිටියේ බොහොම උනන්දුවෙන්. ඒ අතරේ මං ඔහුට කිව්වා යුරෝපයේ විද්‍යාඥයන් තවමත් මේ විෂ වර්ගය ගැන නොදන්නා බව. කෙනෙක් මේ විෂෙන් මරණයට පත්වුණොත්, එය කොහොම සිදුවුණාද කියලා හඳුනාගන්න අපේ වෛද්‍ය විද්‍යාඥයන්ට නොහැකි වන බව, මම කිව්වා.

මෝටිමර් මේ ඖෂධය මගෙන් කොහොම හොරකම් කරගත්තද කියන එක මං අද වනතුරුත් දන්නේ නෑ. ඒ මොකද මං කොයි වෙලාවකවත් කාමරයෙන් එළියට ගියේ නෑ. මං හිතන්නේ, මං අල්මාරි, කැබිනට්ටු විවෘත කරලා, බෝතල් එළියට ගන්න අතරෙයි ඔහු බෙහෙතෙන් ටිකක් හොරකම් කරගන්න ඇත්තෙ. මට මතකයි පස්සෙ, යකාගේ අඩිය මුල ගැන ඔහු මගෙන් දිගින් දිගටම ප්‍රශ්න කළා. මේ විෂෙන් ප්‍රතිඵලයක් ලැබීමට කොයි තරම් ප්‍රමාණයක් ගින්නට දැමිය යුතුද, එය ක්‍රියාත්මක වෙන්න කොපමණ වෙලාවක් ගතවෙනවද ආදිය. ඔහු ඒවා අසා දැනගත්තෙ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා කියල මං හීනෙකිංවත් හිතුවෙ නෑ.

මට ඒ ගැන වැඩිදුර හිතන්න හේතුවක් තිබුණෙත් නෑ, දේවගැතිතුමාගේ විදුලි පණිවුඩයක් ප්ලිමත් වලට ලැබෙන තුරු. මේ දුෂ්ඨයා හිතුවෙ ඔහුගේ මේ අපරාධය සිදුකරන කොට මං ප්ලිමත් වරායෙන් නැව් නැගල අවසන් වෙලා තියේවි කියල. එහෙම වෙලා මං අප්‍රිකාවට ගියා නම් අවුරුදු ගණනාවක් යනතුරු මට මේ ගැන දැන ගන්න ලැබෙන්නෙ නෑ. නමුත් විදුලි පුවත ලැබුණු ගමන් මං ආපහු ආවා. ඛේද වාචකයේ විස්තර අහනකොට ඒක සිද්ධවුණේ මං ළඟ තිබුණු විෂ වර්ගයෙන් කියන

http://sherlockholmesinvestigations.blogspot.com

ඒක මට පැහැදිලිවම තේරුණා. මං ඔබව හමුවෙන්න ආවෙ වෙනත් මොනව හරි ක්‍රමයකින් මේ අපරාධකාරයාව හඳුනාගන්න ඇතැයි හිතාගෙන. නමුත් එහෙම මොකුත් සිද්ධවුණේ නෑ. අපරාධකාරයා මෝටිමර් ට්‍රෙගෙනිස් බව මම පැහැදිලිවම දන්නවා. ඔහු මේ අපරාධය කළේ වස්තුවට තණ්හාවෙන්. සොහොයුරිය මියගිහින්, සොහොයුරන් දෙදෙනා උන්මත්තකයින් වුණාම, මුළු මුදලේම උරුමකාරයා වෙන්නේ ඔහු. මම මුළු ජීවිතේටම ආදරය කළ එකම කාන්තාව, මට ආදරය කළ කාන්තාව, බ්‍රෙන්ඩා. ඔහු ඇයව මරා දැම්මෙ යකාගෙ අඩියෙන්. ඔහු කළ මේ අපරාධයට දිය යුතු දඬුවම කුමක්ද? මං මොකක්ද කළ යුත්තේ? පොලිසියට දන්වලා නීති මාර්ගයෙන් කටයුතු කරනවද? ඒක ඔප්පු කරන්න ඇති මොන සාක්ෂි? මගේ කාරණා සියල්ලම ඇත්තයි. ඒත් මේ විනිසුරුවරු, නුගත් ජූරි සභිකයන් පිරිසක් මෙවැනි අද්භූත කතාවක් විශ්වාස කරාවිද? ඒක හරියන්නත් පුළුවන්. වැරදින්නත් පුළුවන්. ඒ වුණත් මෝටිමර් ට්‍රෙගෙනිස් කළ අපරාධෙට සමාවක් දෙන්න බෑ. බ්‍රෙන්ඩා වෙනුවෙන්, මගේ ආදරයේ නාමෙන් ඔහුගෙන් පළිගන්න කියලා මගේ ආත්මය මට අණදෙන්න පටන් ගත්තා. මං ඔබට කලින් කිව්වා හෝම්ස් මහත්මයා, මං ජීවත්වුණේ කිසිම නීතියකට යටත් නොවුණු අඩවියක කියලා. දැන් මේ වෙලාවෙ නීතිය මගේ අතට ගන්න මට සිද්ධවුණා. ඔහු අනිත් අයට අත් කරදුන් කෲර ඉරණම, ඔහුටත් ලබාදෙන එක සාධාරණයි කියලා මං තීන්දු කළා. එහෙමත් නැත්නම් ඔහුව මගේ අතින්ම දඬුවම් කළ යුතුයි. මේ මොහොතේ තමන්ගේ ජීවිතය තණ සතයකටවත් අගය නොකරන වෙනත් මිනිහෙක් මුළු එංගලන්තයේම නැතුව ඇති, මං වගේ.

මං ඔබට සියලුම දේ කිව්වා. ඉතිරි හරිය ඔබම ඉදිරිපත් කළා. ඔබ කිව්ව ආකාරයට මට එදා රෑ නින්ද ගියේ නෑ. මං උදේ පාන්දරින්ම ගෙදරින් පිටවුණා. ඔහුව අවදිකරව ගන්න අපහසු වෙන බව මට කලින් මතක්වුණා. ඒ නිසා ඔබ කිව් බොරළු ගොඩෙන් අහුරු දෙකක් මං අරගෙන ගියා. ඒවායින් ජනේලයට ගහලා මං ඔහුව අවදිකරව ගත්තා. ඔහු පහළ තට්ටුවට ඇවිත්

http://sherlockholmesinvestigations.blogspot.com

ජනේලය විවෘත කරල, මාව විසින්ම කාමරයට ඇතුළට ගත්තා.

කාරණා මස්තෙකාම මං ඔහුට පැහැදිලි කර දුන්නා. මං ආවෙ විනිශ්චයකාරයා හැටියට පමණක් නොවෙයි වධකයා හැටියටත් කියලා මං ඔහුට කිව්වා. මගේ රිවෝල්වරය දැක්කාම ඔහු ප්‍රාණ භයෙන් පුටුවක් උඩට ඇද වැටුණා. මං ලාම්පුව දල්වලා, යකාගෙ අඩියෙ කුඩු ටිකක් ගිනිදැල්ලට ඉහළා, ජනේලය වහදමලා එළියෙන් හිටියා. මං සූදානමින් හිටියෙ. ඔහු කාමරයෙන් පිටවෙන්න හැත්කලා නම් මං ඔහුට වෙඩි තියනවා. ඔහු මිනිත්තු පහකදී මිය ගියා. දෙයියනේ ඔහු මැරුණු හැටි ! ඒ වුණාට මගේ හිතට කිසිම වේදනාවක්, කම්පාවක් දැනුණේ නෑ. ඒ මොකද මගේ ආදරවන්තිය බ්‍රෙන්ඩාට ඔහු විඳින්න සැලැස්වූ වේදනාවම පමණයි, ඔහුටත් විඳින්න සිදුවුණේ. ඔන්න ඕකයි හෝම්ස් මහත්මයා මගේ කථාව. ඔබත් කවදහරි ගැහැනියකට ආදරය කරලා තියෙනවා නම් බාගෙද ඔබත් ඒ විදියට කරන්න ඉඩ තිබුණා. කොහොම වුණත් මගේ ජීවිතය දැන් තියෙන්නේ ඔබේ අතේ. ඔබට කැමති පියවරක් ගන්නට මට ප්‍රශ්නයක් නෑ. මං ඔබට කිව්වා මරණයට මං භය නැති බව'

හෝම්ස් මඳ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටියේය. ඉන්පසු ස්ටර්න්ඩේල් ඇමතුවේය.

'මොන වගේ වැඩක යෙදෙන බලාපොරොත්තුවෙන්ද ඔබ ආපහු අප්‍රිකාවට යන්න සූදානම් වුණේ?'

'මා බලාපොරොත්තු වුණේ මධ්‍යම අප්‍රිකාවට ගිහිං මගේ මුළු ජීවිතයම එහි කටයුතු සඳහා කැපකරන්න. මා එහි ආරම්භ කළ වැඩ වලින් තවමත් අවසන් කළේ භාගයක් පමණයි'

'ගිහින් ඉතුරු භාගයත් අවසන් කරන්න මහත්මයා. ඔබව එයින් වළක්වන්න මගේ නම් අදහසක් නෑ'

අසුනෙන් නැගී සිටි ආචාර්ය ස්ටර්න්ඩේල් හිස පහත් කොට, හෝම්ස්ට ආචාර කළේය. ඉන්පසු ඔහු අසුනෙන් නැගිට යන්නට ගියේය.

sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නෙ වොට්සන්, ඔබත් මා සමග එකඟ වෙනවා ඇති. මේකට මැදිහත් වෙන්න කියලා අපට කැඳවීමක් තිබුණෙත් නෑ. අප පරීක්ෂණය කළෙත් ස්වාධීනව. අප ගත්තා ක්‍රියා මාර්ගයත් එලෙසම තබමු. වොට්සන් ඔබ කියන්නේ මේ මිනිහ-ස්ටර්න්ඩේල් අපරාධකාරියෙක් කියලද?"

"ඇත්තෙන්ම නැහැ"

"මං කවදවත් ආදරය කරල නෑ වොට්සන්. මාත් ආදරය කරල තිබුණා නම්, මා ආදරය කළ ගැහැනියට අර වගේ ඉරණමක් අත්වුණා කියල හිතමු. කවුද දන්නෙ? මාත් අපේ සිංහයන් දඩයක්කාරයා වගේ ක්‍රියා කරන්න ඉඩ තිබුණා.

මොර්ටිමර් ට්‍රෙගෙනිස්ගේ කාමරයේ ජනෙල් පඩිය උඩ තිබුණු රතුපාට බොරළු කැට තමයි මගේ පරීක්ෂණය ඇරඹුණු තැන. දේවගැති නිවස තියෙන අඩමේ කොහේවත්, ඒ විදියේ, ඒ පාට ගල් බොරළු මට දකින්න ලැබුණේ නෑ. ආචාර්ය ස්ටර්න්ඩේල් වෙතට මගේ අවධානය යොමු වුණාම මං ඔහුගේ නිවස පරීක්ෂා කරන අදහසින් එහි ගියා. ගේට්ටුව අසලම අර ජාතියේ ගල්බොරළු කැට ගොඩක් මට දකින්න ලැබුණා. එතැනින් එහාට මා කළ හැමදෙයක්ම ඔබේ බුද්ධියෙන් ඔබට තේරුම් ගැනීමට පුළුවන් ඇති.

"එහෙම නම් වොට්සන් යකාගේ අඩිය අපි එතනින් අමතක කරල දමු. පෞරාණික කෝනිෂ් භාෂාවේ සම්භවය ගැන හොයන එක යළි පටන් ගන්න මින්න දැන් කාලය හරි."

**සමාප්තයි.**

http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදහන් වූ සිටුවරිය.

Reading Purpose Only, Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදහන් වූ සිටුවරිය

'නමුත් ඇයි තුර්කි එකක් ම?' මගේ පාවහන් යුවළ දෙස මඳ වේලාවක් බලාසිටි ෂර්ලොක් හෝම්ස් ඇසීය.

මේ මොහොතේ මා අසුන්ගෙන සිටියේ පැපපහසු වේවැල් හාන්සි පුටුවකයි. පාවහන් පැළැඳි මගේ දෙපා ඉදිරියට දිගුවී තිබිණ. ඒ නිසා ඔහුගේ අවධානය ඒ කෙරෙහි යොමුවන්නට ඇත.

'නෑ මේව තුර්කියේ හදපු ඒව නෙමෙයි. එංගලන්තයේ සාදන පාවහන්. මං මේව මිළට ගත්තේ ඔක්ස්ෆඩ් වීථියේ ලැටිමර් පාවහන් වෙළෙඳ සලෙන්'

'නෑ නෑ, මං ඇහුවේ ඔයාගේ ස්නානය ගැන?' හෝම්ස් පැවසුවේ සිනා පහළ කරමිනි.

''සුබෝපභෝගී, වැඩි මුදලක් ගෙවන්න වෙන තුර්කි ස්නානයක් සඳහා ගියේ ඇයි, ගෙදරදීම නාගන්න පුළුවන්කම තියෙද්දී?'

'පසුගිය දවස් විසේෂම මගේ ඇඟට හරිම කෙවෙන්තු, දුර්වල බවක් දැනුණා. හන්දිපත්වල රුදාව දැනෙන රූමැටික් ගතියක් ඇඟට තේරුණා. තුර්කි ස්නානයේදී මුලින් උණු ජලයෙන් හා ජල වාෂ්ප වලින් නාවලා, සම්බාහනය කරලා, ඊට පස්සේ තමා සිසිල් ජලයෙන් නෑවීම කරන්නේ. ඒ මගින් ශරීරය හරියට ප්‍රබෝධමත් වෙනවා. ඒකනේ අපි ඒකට විකල්ප වෙදකමක් කියන්නේ. එය ශරීරයේ පද්ධති පිරිසිදු කොට, ක්‍රියාකාරිත්වය අලුතෙන් පටන් ගැන්වීම සඳහා යොදන ක්‍රමයක්.

ඒ කොහොම වුණත් හෝම්ස්, මගේ පාවහන් බලා ඔබ කොහොමද මං ලබාගනිපු තුර්කි ස්නානය ගැන කිව්වේ?'

'ඒක ඒ තරම්ටම පැටලිලි සහගත නැහැ වොට්සන්. ඔබ සමඟ තවත් කෙනෙක් හවුලේ, කුලී රථයේ ගමන් කළා අද උදේ. ඒ කවුද කියලා මං ඇහුවොත් ? ඒක නිගමනය කළ විධියටම සරලයි, කලින් එකත්

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

'කලින් එක පැහැදිලි කරනවා මහතුනුවට තවත් ප්‍රශ්නයක් මට ඒක හාරගන්න බෑ' මම තරමක් කර්කශ අයුරෙන් කීවෙමි.

'බොහොම නිර්භීතයි වොට්සන් ! ඔබේ විරෝධතාවය සාධාරණයි. කෝ බලමු කරුණු මොනවද කියලා. අන්තිම එක මුලින් ගමු. කුලී රථය - ඔබේ කබායේ කරේ සහ වම් අතේ මඩ ඉහි ඇති සලකුණු තිබෙනවා. ඔබ අශ්ව කරත්තයේ මැදින් වාඩිවෙලා ගමන් කළා නම් කබායේ මඩ පැල්ලම් හිටින්නේ නෑ. හොඳයි එහෙම පැල්ලම් ආවත් දෙපැත්තෙම එක සමානව හිටිනවා. ඔබ තවත් කවුරු හරි එක්ක හවුලේ කුලීරියේ ගිය බව ඉත් පැහැදිලියි.'

'ඒක හරි. නමුත් පාවහන් දිහා බලල ස්නානය ගැන කිව්වේ කොහොමද?'

'ඔබ පාවහන් පැළැඳීමේදී නූල් ගැටගසන්නේ එක් විශේෂ ආකාරයකට. නමුත් මට පෙනෙනවා දැන් ඔබේ පාවහන් වල නූල් ගැට ගසා තිබෙන්නේ ඊට වඩා වෙනස් වඩාත් සංකීර්ණ, 'ඩබල් බෝ' ආකාරයට. එහෙම නම් කවුද පාවහන් ගැටගහලා තිබෙන්නේ? එක්කෝ පාවහන් අලුත් වැඩියා කළ තැනකදී, නැත්නම් තුර්කි ස්නානය සඳහා ගිය වෙලාවේ, එතැන සේවකයා. ඔබේ පාවහන් අලුත් නිසා පළමුවැන්න විය නොහැකියි. එහෙනං නිසැකවම දෙවැන්න විය යුතුයි. බොහොම සරලයි. නැද්ද? කොහොම වුණත් ඒ ස්නානයෙන් ඔබේ අපේක්ෂාව ඉටුවුණා !'

'ඒ කොහොමද?'

'ඔබ කියනවා ඔබ ඒකට ගියේ සැබෑ වෙනසක් උවමනා නිසා කියලා. එහෙම නං එය ලබාගමු. කොහොමද? ස්විට්සර්ලන්තයේ ලුසාන් නගරයට සංචාරයක් යන්න ලැබුණොත් කොහොමද? දුම්රියේ පළමුවෙනි පංතියේ ගමන් කරන්න ටිකට් ලැබෙනවා. ඒ විතරක්ද, කෑම බීම, ඉඳුම් හිටුම්, සියලු සැප පහසුකම් සුඛෝපභෝගී මට්ටමෙන් නොමිලේ ලැබෙනවා'

'ඉතාම අනර්ඝයි ! ඒත් කොහොමද ඒ' මම ඇසුවෙමි.

පුටුවේ පිටුපසට හේත්තු වුණු හෝම්ස් තම සටහන් පොත අතට ගත්තේය.

'ලෝකයේ බොහොම අන්තරායයන්ට ගොදුරු වෙන පුද්ගලයන් තමා, හිත මිතුරන් කිසිවෙක් නැති, තැනින් තැනට සංක්‍රමණය වෙන කාන්තාවෝ. ඔවුන් බොහොම අහිංසකයි. නමුත් ඔවුන් අනික් අය අපරාධයට පොළඹවනවා. කාන්තාව සම්පූර්ණයෙන්ම අසරණයි. මේ වගේ තනියම දිවි ගෙවන කාන්තාවකට හෝටලයකින් හෝටලයකට, රටකින් රටකට සංක්‍රමණය වෙන්න මුදල් හදල් තියෙනවා. නමුත් ඇය හිවලුන්ගෙන් පිරුණු ලෝකයක අතරමං වෙච්ච කුකුළු පැටියෙක් වගෙයි. මොකෙක් හරි ඇයව ගිල දැම්මොත්, එහෙම දෙයක් සිද්ධ වුණාද කියල කාටවත් දැනගන්නවත් ලැබෙන්නේ නෑ. මං හිතන්නේ ප්‍රාන්සස් කාෆැක්ස් ආර්යාවටත් ඒ වගේ විනාශයක් සිදුවෙලා'

ඔහු කෙළින්ම කාරණාවට එළැඹීම ගැන මගේ හිතට පහසුවක් දැනිණි.

'රූෆ්ටන්හි ආදිපාදතුමාගේ පෙළපතෙන් පැවත එන අයගෙන්, දැනට අවිවාහකව ඉතිරි වෙලා ඉන්න එකම එක පුද්ගලයා ඇයයි. ඔබට මතක ඇති පවුලේ ඉඩම් කඩම්, ගෙවල් දොරවල් ඔක්කොම ලැබුණේ ඇගේ සහෝදරයින්ට. ඇයට ලැබුණේ සීමිත වංචල දේපොළක් පමණයි. නමුත් මේ අතරේ තිබුණා ඉතාම වටිනා, ස්පාඤ්ඤයේ තැනූ රිදී ආභරණ විශාල ප්‍රමාණයක් සහ අලංකාර ලෙස කපා ඔප දැමූ දියමන්ති සම්භාරයක්. ඇය ඔම්වාට දැක්වූවේ පුදුම ආශාවක්. ඇ කොයිතරම් ආශාවක් දැක්වූවාද කිව්වොත්, ඒවා පරෙස්සම සඳහා බැංකුවක සුරක්ෂිතාගාරයක තියන්නවත් ඇය කැමති වුණේ නෑ. ඇය ගිය හැම තැනකටම ඒවා අරගෙන ගියා. ප්‍රාන්සස් ආර්යාව යන්තම් මැදි වයසට ළං වුණා විතරයි. ඇය තවමත් ඉතාම ලක්ෂණ කාන්තාවක්

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

'දැන් මොකක්ද ඇයට වෙලා තියෙන්නෙ?'

'මොකක්ද ඇයට වෙලා තියෙන්නෙ? අන්න ඒක තමයි වොට්සන් අපට හොයාගන්න සිදුවෙලා තියෙන්නෙ. ඇය පණ පිටින් ඉන්නවාද? නැත්නම් මියගිහින්ද? ඇය ඉතාම පිළිවෙළකට වැඩකටයුතු කළ තැනැත්තියක්. ප්‍රාන්සස් ආර්යාව තුඩා කාලෙ ඉඳන් බලාගන්න සේවිකාව තමා වයස්ගත ඩොබ්නි මෙනෙවිය. පසුගිය අවුරුදු හතර තිස්සෙම ප්‍රාන්සස් තමන්ගේ හිතවත් සේවිකාවට සතියක් හැර සතියක් ලියුමක්. එවීම කවදාවත් අතපසු කළේ නැහැ. මේ ඩොබ්නි මෙනෙවිය මා හමුවෙන්න ආවා. දැන් සති පහක් ගත වුණාද, ආර්යාව ගැන කිසිම ආරංචියක් නෑ. අවසන් ලියුම ඇ එවල තියෙන්නේ ස්විට්සර්ලන්තයේ ලුසාන් නගරයේ නැෂනල් හෝටලයේ ඉඳලයි. ඇය එතැනින් ඉවත්ව ගොස් ඇති බවයි පෙනෙන්නෙ. නමුත් අලුත් ලිපිනය මොකක්ද කියා කිසිකෙනෙක් දන්නේ නෑ. මේ අතුරුදහන්වීම ගැන ඇගේ ඥාතීන් බොහොම කලබලයට පත්වෙලයි ඉන්නෙ. ඔවුන් විශාල ධනවතුන් නිසා මේ ප්‍රශ්නය විසඳාගන්න ඕනෑම මුදලක් වියදම් කරාවි.'

'තොරතුරු දැනගන්න පුළුවන් වුණේ මේ සේවිකාවගෙන් පමණක්ද? ප්‍රාන්සස් ආර්යාව ලියුම් එවූ තවත් මිතුරියො නැති වෙන්න බැ?'

'ඇය ලියුම් ගනුදෙනු කළ තවත් එකම තැනයි තියෙන්නෙ වොට්සන්. ඒ තමයි ඇගේ බැංකුව. අවිවාහක කාන්තාවන්ට ජීවත්වීම සඳහා වරින්වර ගිණුමෙන් මුදල් ගන්න සිදුවෙනවා. ඒ නිසා ඔවුන්ගේ බැංකු ගිණුම් පොත් හරියට සංක්ෂිප්ත දිනපොත් වගෙයි. ඇගේ ගිණුම තිබෙන්නේ සිල්වෙස්ටර් බැංකුවේ. මං ඇයගේ ගිණුම පරීක්ෂා කරල බැලුවා. ඇ ලියා ඇති චෙක්පත් වලින් අන්තිම එකට ඉස්සර වෙලා එක ලියලා තියෙන්නේ, ලුසාන් වල නැවතී සිටි හෝටලේ බිල ගෙවීම සඳහා. නමුත් ඒක ලියලා තියෙන්නේ විශාල මුදලකට. ඒ නිසා හෝටල් බිල ගෙව්වට පස්සෙත් ඇගේ අතේ සෑහෙන මුදලක් ඉතිරි වෙන්න ඇති. ඊට පස්සෙ ලියල තියෙන්නේ එකම චෙක් පතයි.'

"ඒ කාටද?"

"ඒක ලියලා තියෙන්නේ මාරි දෙවින් මෙනෙවිය කියලා කෙනෙකුට. ඒ ගනුදෙනුව කළේ කොහෙන්ද කියල දැනගන්න ක්‍රමයක් නෑ. නමුත් ඒ චෙක්පත මෙයා බැංකුවට ඉදිරිපත් කරලා තියෙන්නෙ සති තුනකට කලින්. ඒ ප්‍රංශයේ මොන්ට් පෙලිය හි ක්‍රෙඩිට් ලියොනේ බැංකුව මඟින්: චෙක් පත පවුම් පනහකට"

"එතකොට කවුද මේ මාරි දෙවින්?"

"ඒකත් මට හොයාගන්න පුළුවන් වුණා. මාරි දෙවින් කියන්නේ ප්‍රාන්සස් කාෆැක්ස් ආර්යාවගේ සේවිකාව. ඇයට මේ විදියට මුදල් ගෙව්වේ ඇයි කියන එක මට තවම හොයාගන්න බැරි වුණා. මට කිසිම ඇතයත් නෑ. ඔබේ රහස් පරීක්ෂණ මඟින් ළඟදීම ඒව හොයාගන්න පුළුවන් වේවි"

"මගේ රහස් පරීක්ෂණ?"

"අන්න ඒකට තමයි සනීප ගමන පුරවින් දේශ ගවේෂණයක් ඔබට ලැබිල තියෙන්නෙ, ස්විට්සර්ලන්තයට.

ඔබ දන්නව නේ වොට්සන්, මට ලන්ඩනයෙන් පිටවෙන්න විදියක් නෑ. අර නාකි ඒබ්‍රහැම්ස් ජීවත්වෙන්නෙ ප්‍රාණ භයෙන්. ඒ නැතත් ප්‍රතිපත්තියක් හැටියට මම රටෙන් පිටවෙන එක සුදුසු නෑ. ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියටත් මං නැතිවුණොම හරි පාළුයි. ඊළඟට පාතාල ලෝකයේ අපරාධ කාරයින් මං නැතිවුණු ගමන් ලොකු ප්‍රීති ප්‍රමෝදයකට පත්වෙනවා. මගේ හිතවත් වොට්සන්, අන්න ඒ නිසා ඔබ යා යුතුයි. වචනයකට පැන්ස දෙක විතක් ගණං වැඩි වුණත්, මහාද්වීපික විදුලි පණිවුඩ සේවය මඟින් ඔබට රෑ දවල් දෙකේම පණිවුඩ එවිය හැකියි."

දින දෙකක් ගත වෙද්දී මම ස්විට්සර්ලන්තයේ ලුසාන් නගරයට ළඟාවීමි. එහි නැෂනල් හෝටලයේ කළමනාකාර මෝසර් මහතා, මා ආදරයෙන් පිළිගත්තේය.

ප්‍රාන්සස් කාෆැක්ස් ආර්යාව මෙහෙ සති ගණනාවක්ම

Reading Purpose Only, Not For Print

නැවතිලා හිටියා, වොට්සන් මහත්මයා. මේ හෝටලේදී ඇය එක්ක කතා බහ කරපු හැම කෙනෙක්ම ඇයට හරි කැමැත්තෙන් හිටියෙ. ඇය ඉතාම ප්‍රියමනාප කාන්තාවක්'

'ඇගේ වයස කීයක් විතරද?'

'අවුරුදු හතළිහකට වැඩිවෙන්නැ බැහැ. තවමත් ඇය හරිම සුන්දර කාන්තාවක්. තරුණ කාලෙ ඉතාම ශෝභන යුවතියක්ව හිටි බවට කිසිම සැකයක් නෑ'

'ඇය ළඟ වටිනා ආභරණ තොගයක් තිබුණු බව මෝසර් මහත්මයා දැන හිටියද?'

'නෑ මහත්මයා. එහෙම දෙයක් මං දැනහිටියේ නෑ. නමුත් මට මතකයි කාමරය පිරිසිදු කරන්න ගිය සේවකයා කිව්වා, ආයතීවගේ කාමරයේ විශාල, ඒ වගේම බර, ට්‍රන්ක පෙට්ටියක් තිබුණු බව. ඒක කොයි වෙලේත් ඉබියතුරු දමා පුරක්ෂිතව තිබු බවත් ඔහු සඳහන් කළා.'

'ඇගේ සේවිකාව මාරි ඩෙවින් ගැන ඔබ මොනවද දන්නෙ?'

'මාරි ඩෙවිනුත් ඇගේ ස්වාමිදූව වගේම තා අතරත් ජනප්‍රියව හිටියා. මේ හෝටලයේ නැවතී සිටිය කාලෙම ඈ අපේ ප්‍රධාන වේටර්වරයෙක් සමග විවාහ ගිවිස ගත්තා. පසුව ඇය ආර්යාව ළඟ සේවයෙන් ඉවත් වුණා. මං ඇගේ ලිපිනය නොවරදවාම ඔබට ලබා දෙන්නම්'

මාරි ඩෙවින්ගේ ලිපිනය එදිනම මට ලැබිණි. අංක 11 ට්‍රජන් පාර, මොන්ට් පෙලියර්, ප්‍රංශය - මේ සියළුම කරුණු මම පොතක සටහන් කර ගතිමි. ෂර්ලොක් හෝම්ස් මෙහි පැමිණියත් මීට වඩා කිසිවක් සොයාගනීවි දැයි සැක සහිතය.

ගැටළුවේ තවමත් නොවිසැඳිලිව ඇත්තේ එක් කොළවරක් පමණි. එනම් ෆ්‍රාන්සස් ආර්යාව නැෂනල් හෝටලයෙන් හදිසියේම ඉවත්වී ගියේ ඇයි? ඇය ලූසාන්හි ජාලය අත් හැරියට ඇත්තේ

ඉතා සතුටින් බව ඔප්පු වී ඇත. ඇයට ලැබී තිබුණේ හෝටලයේ ඉතාම සුඛෝපභෝගී කාමර කිහිපයකි. හෝටලයට ඇතුළු වීමත් සමඟම ජිනීවා විල මනස්කාන්ත අයුරින් ඇගේ කාමරයට දිස්වෙයි. මෙම සැතුව අවසන් වන තුරු ඇය මේ හෝටලයේම රැඳී සිටීමට අදහස් කරගෙන සිටි බවට සාක්ෂි කීපයක් ඇත. එහෙත් ඇය හෝටලයෙන් ඉවත් වී යන බව දැනුම් දී ඇත්තේ එක් දිනකට කලිනි. මේ හේතුව නිසාම එක් සතියක නේවාසික ගාස්තු නිකරුණේ අමතරව ගෙවීමටද ඇයට සිදුවී ඇත. ඇගේ මේ හදිසි වෙන්වීයාම ගැන අදහස් පළකළ හැකි වූයේ ජුල්ස් විබාට්ට පමණකි. මාරි ඩෙවින් නම් සේවිකාවගේ පෙම්වතා ඔහුය.

'මට කිසිම ඇකයක් නෑ වොට්සන් මහත්මයා. ආර්යාව හදිසියෙන්ම හෝටලයෙන් යන්න තීරණය කළේ අර මිනිහ ඇය හමුවෙන්න ආවට පස්සෙ' විබාට් කීය.

'මොන මිනිහද?'

'ඇය මේ තීරණය ගන්න දවසකට හරි දෙකකට කලින්, උස, මහත, හම කළු පැහැ වෙච්ච, මුහුණ පුරා රැවුලක් වැවුණු මිනිහෙක් ආවා. ඔහුගේ හැටි වනචාරියෙක් වගෙයි වොට්සන් මහත්මයා: නියම වනචාරියෙක්. ඔහු නැවතිලා ඉන්නේ මේ නගරයේම කොහේ හරි තැනක. ජිනීවා විල අසල තිබෙන සක්මන් මළුවේදී ඔහු ප්‍රාන්සස් ආර්යාව සමඟ ඉතාම උනන්දුවෙන් කතා බහ කරනවා කවුරු හරි දැකලා තිබුණා. ඊට පස්සේ තමයි ඔහු හෝටලයට ඇවිත් ආර්යාව හමුවෙන්න උත්සාහ කළේ. ඔහු හමුවීම ඇය ප්‍රතික්ෂේප කළා. ඔහු ඉංග්‍රීසි ජාතිකයෙක් බව අපි දන්නවා. නමුත් නම මොකක්ද කියලා දන්නේ නෑ. ඒ සිද්ධිය වෙලා ඉක්මනින්ම තමයි ආර්යාව හෝටලයෙන් අස්වෙලා ගියේ. මගේ පෙම්වතිය, මාරි ඩෙවින් නම් එකහෙළාම කියන්නේ ආර්යාව මේ නගරයෙන් යෑමට හේතුව ඒ මිනිහ කියල'

'මාරි ඩෙවින් ආර්යාවගේ සේවයෙන් අස් වුණේ ඇයි?'

'ඒක ගැන එක වචනයක්වත් කථා කරන්න මං කැමති නෑ

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

මහත්මයා. ඔබට ඒ ගැන දැනගන්න උවමනා නම් මොන්ට් පෙලිය නගරයට ගිහිං ඇයගෙන්ම ඒ ගැන අහල බලන්න'

මගේ පරීක්ෂණයේ පළමුවැනි පරිච්ඡේදය අවසන් වූයේ එලෙසයි. දෙවැනි පරිච්ඡේදය වෙත් වන්නේ ආර්යාව ලූසාන් නගරය හැරගොස් දැන් පදිංචි වී ඇති තැන කටයුතු සඳහායි. මේ තැන කොතැන වුවත් එහි රහස්‍ය භාවයක් ඇති බව පෙනේ. තමා පසුපස එන කිසිවකු මඟහැරීමට මෙන් ඇගේ මීළඟ නැවතුම රහසක් ලෙස තබාගෙන ඇත. එසේ නැතිනම් ඇගේ ගමන් බඩු කිසිවක ගමනාන්තය බේඩින් නගරය බව සඳහන් ලේබල ඇලවීමට ඇය විරුද්ධ වූයේ ඇයි? ඇය වක්‍ර මාර්ගයකින් ගොස් ඇත්තේ බේඩින් නගරයටයි. මේ බව මට දැනගන්නට ලැබුණේ 'කුක්' සංචාරක සමාගමේ කළමනාකරුගෙනි. මා මෙතෙක් ලබාගත් සියලුම ප්‍රතිඵල සඳහන් කොට හෝම්ස්ට විදුලි පුවතක් යැව්වෙමි. ඊට හෝම්ස්ගෙන් ලැබුණේ හාස්‍යය පිරි පිළිතුරකි.

බේඩින් නගරයට ගිය පසු ආර්යාවගේ ගමන් මඟ සොයාගැනීම මට අපහසු නොවීය. බේඩින් නගරයේදී ඇය දෙසතියක් ඉංග්‍රිසි හෝටලයේ නවාතැන් ගෙන ඇත. දකුණු ඇමරිකාවේ සිට පැමිණි ආගම් ප්‍රචාරක මිෂනාරි වරයෙකු වූ ආචාර්ය ෂ්ලෙසිංගර් දේවගැතිතුමා හා ඔහුගේ බිරිඳ හඳුනාගැනීමට එහිදී ප්‍රාන්සස් ආර්යාවට අවස්ථාව සැලැසී ඇත. ජීවිතය පාළුවෙන් ගෙවන බොහෝ අවිවාහක කාන්තාවෝ ආගමට, ධර්මයට නැඹුරු වෙති. ප්‍රාන්සස් ආර්යාවද සැනසුමක් බලාපොරොත්තුවෙන් ආගම කෙරෙහි නැඹුරු වී ඇති බව මට පෙනී ගියේය. ඇය පිළිබඳ කරුණු තවදුරටත් මට දැනගැනීමට ලැබුණේ හෝටලයේ කළමනාකරුගෙනි.

'ෂ්ලෙසිංගර් දේවගැතිතුමා දකුණු ඇමරිකාවේ ආගම පතුරුවන්න, බොහොම වෙහෙස මහන්සි වී වැඩ කළ කෙනෙක්. ඔහු ආගම වෙනුවෙන් මුළු ජීවිතයම කැපකරපු කෙනෙක් කියලයි හැමෝම කියන්නෙ. එතුමාට බොහොම කැපී පෙනෙන පෞරුෂත්වයක් තිබෙනවා. ආගම වෙනුවෙන් රෝගීන් සුවකිරීමේ

http://sherlockholmesinvestigations.blogspot.com

යෙදී සිටියදී ඔහුට යම්කිසි රෝගයක් වැළැඳිලා. එතුමා දැන් එයින් සුවය ලබමිනුයි ඉන්නෙ. මේ සාන්තුවරයා දුප්පත් අහිංසක මිනිස්සු වෙනුවෙන් දුක් විඳලා අසනීප වීම ගැන ප්‍රාන්සස් ආර්යාව හරිම කම්පාවට පත්වුනාලු. ඔහුට සාත්තු සප්පායම් කිරීමේ වැඩ වලට ඇය දිගටම ඡලෙසිංගර් මහත්මියට උදව් උපකාර කළා. ආචාර්ය ඡලෙසිංගර් දවල් කාලයේ වැඩි කොටසක් ගතකලේ, හෝටලයෙ වැරැන්ඩාවෙ, හාන්සි පුටුවකට වෙලා. කාන්තාවන් දෙදෙනා ඒ වෙලාවට ඔහුගේ දෙපැත්තෙන්මයි හිටියේ

"දේවගැතිතුමා මෙහේ නැවතිලා ඉඳන් මොකද කළේ?"

"එතුමා පසුගිය දිනවල ශුද්ධවූ දේශයේ සිතියමක් පිළියෙල කළා. ඒකෙ මිඩියනයිට් වරුන්ගේ රාජධානිය ගැන පවා සඳහන් වෙනවලු. ඒ රාජධානිය ගැන ඔහු ශාස්ත්‍රීය ග්‍රන්ථයකුත් ලියාගෙන යනවලු."

"මේ මිෂනාරි වරයයි ඔහුගේ බිරිඳයි දැන් කොහේද?"

"අසනීපෙන් හොඳ සුවයක් ලැබුණට පස්සෙ ඔහුත් බිරිඳත් ආපහු ලන්ඩනයට යන්න පිටත් වුණා. ප්‍රාන්සස් ආර්යාවත් ඔවුන් සමගම ගියා"

"ඒ කවදද?"

"ඔවුන් පිටත්වෙලා ගිහින් අදට සති තුනක් වෙනවා. ඊට පස්සේ ඔවුන් ගැන කිසිම තොරතුරක් අපට ලැබුණෙ නෑ"

"ප්‍රාන්සස් ආර්යාවගේ සේවිකාව, මාරි දෙවින් ගැන ඔබ මොනවද දන්නේ? ඇය සේවයෙන් ඉවත් වුණේ ඇයි?

"ප්‍රාන්සස් ආර්යාව මෙහෙන් යන්න දවස් කීපයකට කලින් මාරි දෙවින් හඬා වැළපෙමින් රස්සාවෙන් අස් වුණා. ඒකට හේතුව නම් මොකක්ද කියල මා දන්නේ නෑ. නමුත්, ඇය සදහටම ප්‍රාන්සස් ආර්යාව ළඟ සේවයෙන් ඉවත්වෙන බව බොහොම දුකෙන් අනෙක් සේවිකාවන් එක්ක කියල තිබුණා. මේ සියලු

Reading Purpose Only Not For

දෙතොගේම හෝටල් බිල සම්පූර්ණයෙන්ම ගෙවල දැම්මෙ ආචාර්ය ෂ්ලෙසිංගර්.'

'ප්‍රාන්සස් ආර්යාව ගැන කිව හැකි තොරතුරු එපමණයිද ඔබට තියෙන්නෙ?'

'ඔව් මහත්මයා. ආ...... තව එකක්. ප්‍රාන්සස් ආර්යාව ගැන මගෙන් තොරතුරු අහන්න ආවෙ ඔබ පමණක් නෙමෙයි.'

'ඇයි වෙන කවුද?'

'සතියකට විතර කලින් තවත් කෙනෙක් ඇවිත් ඇය ගැන ඇහැව්වා.'

'ඔහුගේ නම මොකක් කියලද කිව්වෙ?'

'නමක් කිව්වෙ නැ. නමුත් ඔහුත් ඉංග්‍රීසි ජාතිකයෙක්. ඔහු වෙනත් පිළිවෙලක කෙනෙක්'

'නිකං වනචාරියෙක් වගේ මිනිහෙක්ද?'

'අන්න හරි. ඒ වචනයෙන් ඔහුගේ ස්වභාවය හොඳට විස්තර වෙනවා. අව්වට පිළිස්සී කළ පැහැ ගැන්වුණු මුහුණක් තිබෙන, තරබාරු මිනිහෙක්. මුහුණ ඉක්මනාම රැවුලකින් වැහිලා. මේ වගේ වැදගත් හෝටලේකට වඩා, ගොවිරාල කෙනෙකුගේ තවාතැන් පොළක තවාතැන් ගන්නසුළු ජාතියේ කෙනෙක්. බොහොම සැරපරුෂ මිනිහෙක්. තරහ කාරගන්න. හොඳ කෙනෙක් නම් නෙමෙයි.'

මීදුමක් පහව් ගොස් ඒ පිටුපස ඇති දර්ශනය මතුවන්නාක් මෙන් මේ අභිරහසද ක්‍රමයෙන් හෙළිවීමට පටන් ගෙන ඇත. යහපත් ගතිගුණ ඇති මේ භක්තිමත් කාන්තාව ලුහුබඳිමින් කිසියම් කෲර, දුෂ්ට පුද්ගලයකු හඹා එන බව පැහැදිලියි. ඇය බියට පත්වී ඇති බැවි නිසැකයි. ඇය ලූසාන් නගරයෙන් පැන ගියේ එබැවිනි. ඔහු ඇය සොයාගෙන බේඩ්න් නගරයටද පැමිණ ඇත. වැඩි දිනක් යාමට පෙර ඇය ඔහුට හසුවනුවා නියතයි.

දැනටමත් ඇය ඔහුගේ ග්‍රහණයට හසුවීද? ඇයගේ හිතමිතුරන්ව සිටි යහපත් මිණිනාරි යුවළ ගෙන් ඇයට පිහිටක් නොලැබුණාවන්ද? දිගින් දිගටම ප්‍රාන්සස් ආර්යාව ලුහුබඳිමින් අර කෲර පුද්ගලයා එන්නේ ඇයි? ඒ පිටුපස සැඟවුණු රහස කුමක්ද? දැන් මට විසඳීමට සිදුවී ඇති ගැටළුව එයයි.

මා සොයාගත් සියලු කරුණුද, ප්‍රශ්නයේ ගැඹුරටම මා පරීක්ෂා කළ ආකාරයද හෝම්ස්ට දන්වා යැවීමි. ඊට පිළිතුරු වශයෙන් ඔහුගෙන් මට විදුලි පුවතක් ලැබිණි.

**"ආචාර්ය ෂ්ලෙසිංගර්ගේ වම් කනේ හැටි කොහොමද? විස්තර දන්වන්න**

**එස්. එච්."**

හෝම්ස්ගේ විහිළු තහළු වලට කෙළවරක් නැත. මේ විහිළු කරමින් විනෝද වීමට කාලය නොවේ. එය අමතක කර දමා මාරි ඩෙවින් හමුවීමේ අදහසින් ප්‍රංශයේ මොන්ට් පෙලියර බලා පිටත්ව ආවෙමි. ඇය ජීවත්වූ නිවස සොයා ගැනීමට මට අපහසු වූයේ නැත.

"මා බොහොම ආදරයෙන් ගෞරවයෙන් ප්‍රාන්සස් ආර්යාවගේ සේවයට කැපවෙලා හිටියෙ. ඇයට අලුත් හිතවතුන් වගයක් ආශ්‍රයට ලැබුණා. ඇගේ වැඩකටයුතු බලාගන්න තව දුරටත් මගේ සේවය අවශ්‍ය නැති බව ආර්යාව මට කිව්වා. ඉතින් මං සේවයෙන් අස්වුණා."

"ඒ කියන්නේ ඔබ ඇයගෙ ළඟින් අස්වෙන්න බලාපොරොත්තුවක් කලින් තිබුණෙ නෑ?"

"කොහොමටත් මට සේවයෙන් අස්වෙන්න සිද්ධවෙනවා මහත්මයා. ළඟදීම මගේ විවාහය සිද්ධවෙනවා නේ"

"ඒ කියන්නේ ඇය සමඟ ඔබේ අහිතක් තිබුණෙ නැද්ද? සේවයෙන් අස්වීමේ දී හිතේ කණගාටුවක් දැනුණෙ නැද්ද?"

මාරි ඩෙවින්ගේ මුහුණේ දුක්මුසු හැඟීම් මතුවිය.

'ආර්යාව ඊට කලින් කවදාවත්ම මගේ හිත රිදෙන විදියට කතා කරල නෑ. මට ඉතාම ආදරයෙන් සැලකුවා. නමුත් බෙඩ්න් නගරයට ආවට පස්සෙ ඇගේ ස්වභාවය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. නිතරම සෝන්ති යන, මාව නුරුස්සන ස්වභාවයක් දකින්න ලැබුණා. වරක් ඇය මගෙන් ප්‍රශ්න කිරීමක් කළා. ඒ මගේ අවංකකම ගැන ඇගේ හිතට ඇතයක් ඇවිත්. ඒකෙන් පස්සේ ඇගේ ළඟ සේවයෙන් ඉවත් වෙන එක, මට හිතු තරම් අමාරු වුණේ නෑ. මට මංගල තෑග්ගක් හැටියට ඇය පවුම් පනහක් දුන්නා'

'ඇය ලූසාන් වලින් පිටවෙලා ආවෙ මොකක් නිසා කියලද ඔබ හිතන්නෙ?'

'මම නං හිතන්නෙ අර වනචාරියෙක් වගේ මිනිහ නිසා. ඔහු මොන ආකාරයේ කෙනෙක්ද කියල මට හිතාගන්න බෑ. විල කිට්ටුව තිබෙන සක්මන් මළුවේදී ඔහු ප්‍රාන්සස් ආර්යාවගේ අතින් මහ නපුරු විදියට ඇදල ගත්ත හැටි මගේ ඇස් දෙකෙන්ම දැක්කා. ඒ මිනිහ මහා නපුරු පෙනුමක් ඇති, යකෙක් වගේ මිනිහෙක්. ඒ මිනිහට ඇති භය නිසා තමයි ඇය ලන්ඩනයට යන ගමන ක්ලෙසිංගර්ලගෙ ආරක්ෂාව යටතේ කරන්න යොදගත්ත ඇත්තෙ. ආර්යාව ඒ මිනිහ ගැන මොකුත් මා එක්ක නම් කිව්වෙ නෑ. නමුත් ඇය ජීවත්වුණේ හරිම මානසික කැළැඹීමෙන් බව මට තේරුණා..............'

එක්වරම පුටුවෙන් නැගී සිටි ඇ, විවෘතව තිබූ ජනේලය තුළින් පාර දෙස බලා සිටියේ භයෙන් ත්‍රස්තවයි.

'අර......... අර බලන්න.......... ඒ දුෂ්ටයා තවමත් අපේ පස්සෙන් එලවනවා. අර මිනිහ ගැන තමයි මං ඔබට කිව්වෙ............'

මුහුණ කළු රැවුලකින් වැසුණු උස, මහත, කළු මිනිසෙකු පාර මැදින් ඇවිද ගෙන එන හැටි මම දුටුවෙමි. ගෙවල් වල අංක පරීක්ෂා කරමින් ඔහු සෙමෙන් ඉදිරියට ආවේය. මා මෙන්ම ඔහුද

http://sherlockholmesinvestigations.blogspot.com

ආර්යාවගේ සේවිකාව සොයා එන බව පැහැදිලිය. මම වහාම ගෙයින් එළියට බැස්සෙමි.

'ඔබේ ඉංග්‍රීසි ජාතිකයෙක් නේද?' මම ඇසුවෙමි.

'ඔව්. ඉතින් තමුසෙට මොකද?' ඔහු ඇසුවේ තරහෙන් රවා බලමිනි.'

'ඔබේගෙ නම මට දැනගන්න පුළුවන්ද?'

'බැහැ. ඔහේට දැනගන්න බැහැ' ඔහු පිළිතුරු දුන්නේ තීරණාත්මක අයුරෙනි.

මා පත්වූයේ මහත් අසීරු තත්ත්වයකටයි. ඇසීමට ඇති දේ කෙලින්ම ඇසීමෙන් බොහෝ විට හොඳ ප්‍රතිඵල ලැබේ.

'ප්‍රාන්සස් කාෆැක්ස් ආර්යාව කෝ? ඇයට මොකද වුණේ?' මම ඇසීමි.

ඔහු එක්වරම ගල්ගැසී මා දෙස බලා සිටියේ මහත් පුදුමයෙනි.

'තමුසෙ ඇයට මොකද කළේ? මොකද තමුසෙ ඇගේ පස්සෙන් එළවන්නෙ? දෙනුවා මට උත්තරයක්' මම කීවෙමි.

කෝපයෙන් ගෙරවූ ඔහු, කොටියකු මෙන් මා වෙත කඩාපැන්නේය. මම මීට පෙර මේ ආකාරයේ තක්කඩීන් සමග පොරබද ඇත්තෙක්මි. එහෙත් මොහු තිරිසනෙකු මෙන් රෞද්‍ර එකෙකු විය. ඔහුගේ දෑත් වලින් මගේ ගෙල සිර කිරීමට තැත්කළේය. දඬු අඬුවක අසුවූවෙක් මෙන් වූ ඔහුගේ අයෝමය ග්‍රහණයෙන් මිදීමට මම උත්සාහ කළෙමි. එහෙත් එය එතරම් සාර්ථක නොවීය. මා සිහිවිසඥ තත්ත්වයට පත්වීමට ඔන්න මෙන්න කියා තිබියදී නිල් පැහැති ඇඳුමකින් සැරසී සිටි කිසිවකු මා ගලවා ගැනීමට අප දෙසට පනිනු දුටුවෙමි. මුහුණ පුරා රැවුලක් තිබූ ප්‍රංශ ජාතික කම්කරුවෙකු වූ ඔහු පාරෙන් එහා පැත්තේ සිට අප දෙසට පැන, කම් අත තිබූ මුගුරෙන්

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinsinhala.blogspot.com



129. ඔහු අප දෙසට පැන අත තිබූ මගුරෙන් තක්කඩියාට මරු පහරක් එල්ල කළේ ය.

http://sherlockholmesinvestigations.blogspot.com

තක්කඩියාගේ අතට මුරු පහරක් එල්ල කළේය. ඒ පහරෙන් ඇති වූ වේදනාව නිසා ඔහුට මගේ ගෙල අත්හැරිණි. ඔහු කෝපයෙන් වෙව්ලමින් මා දෙස බලා සිටියේ යළිත් වරක් මට පහරදිය යුතුදැයි තීරණය කරගත නොහැකිවයි. ඉන්පසු කෝපයෙන් මට ගෙරවූ ඔහු, මාරි වෙඩින්ගේ ගෙට ඇතුළු විය.

මගේ ජීවිතය ගලවා ගත් පුද්ගලයාට ස්තූති කිරීමට මම ඒ දෙසට හැරුණෙමි.

'මදැයි වොට්සන් ! ඔබ මේක මහ අවුලක් කරගත්තා නොවැ? මං හිතන්නේ ඔබ මාත් එක්ක ඊළඟ කෝච්චියේම ලන්ඩන් යන්න ආවොත් හොඳයි!'

පැයකට පසු ෂර්ලොක් හෝම්ස් ඔහුට පුරුදු ඇඳුමින් සැරසී, හෝටලයේ මගේ කාමරයේ වාඩිවී හුන්නේය.

'මට ඔබ අවශ්‍යම වෙලාවෙ ඔබ කොහොමද හෝම්ස් එතැනින් මතුවුණේ?'

'මට නිශ්ශබ්දවම ලන්ඩනයෙන් පිටවෙලා එන්න අවස්ථාවක් ලැබුණා. මම දැන හිටියා ඔබ මීළඟට යන්නේ මොන්ට පෙලිය වලට බව. එහෙම ගිහින් ඔබ මාරි වෙඩින් හමුවෙන්න යන නිසා මම ඇයගේ ගේ ළඟට ආවෙ කම්කරුවෙකු වගේ වෙස්වලාගෙන. මං ඔබ එනතුරු පදික වේදිකාවේ ලී මඩුවක වාඩිවෙලා බලාගෙන හිටියා.

මගේ හිතවත් වොට්සන් ඔබ මේ පරීක්ෂණය කරල තියෙන්නෙ හරිම සුවිශේෂ ආකාරයකට. ඔබ වරද්දාගෙන නැති එකම තැනක් වත් මට තවමත් හොයාගන්න බැරිවුණා. ඔබ මේ පරීක්ෂණයේ යෙදීමෙන් ඇතිවුණු ප්‍රතිඵලය, හැමතැනම, හැමෝටම අපි රහස් පරීක්ෂණයක යෙදෙන බව ප්‍රචාරය කිරීම පමණයි. අනෙක ඔබ කිසිම දෙයක් අලුතෙන් හොයාගත්තෙත් නෑ.'

'සමහර විට ඔබ මෙහේ ඇවිත් පරීක්ෂණය කළත් මීට වඩා යමක් හොයාගන්න ලැබේවි කියල මං හිතන්නෙ නෑ.'

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

'සමහරවිට කියන කැල්ලක් මිනිහට එන්නේ නෑ වොට්සන්. මං දැනටමත් ඔබට වඩා යමක් හොයාගෙන. මෙන්න ගරු පිලිප් ග්‍රීන් එනවා අපව හමුවෙන්න. ඔහු ඔබත් සමග එකට හෝටලයේ නැවතී ඉන්න කෙනෙක්. වඩාත් සාර්ථක පරීක්ෂණයක් පැවැත්වීම අපි ඔහුගේ සහයෝගයෙන් පටන්ගමු'

බන්දේසියක තබා අප වෙත ආගන්තුක පත්‍රයක් ගෙන එන ලදී. එය හිමිකරුවා ඊට පිටුපසින් ආවේය. ඒ වීදියේදී මට පහර දුන් කළු රැවුලක් ඇති තක්කඩියා ඔව දැක මම පුදුමයට පත්වීමි. මා දුටු විට ඔහු තිගැස්සුණේය.

'මොකක්ද හෝම්ස් මහත්මයා මේ වැඩේ තේරුම? ඔබේ ලියුම ලැබිලයි මං මෙතනට ආවේ. අසේ වැඩේට මේ මිනිහගෙ තියෙන සම්බන්ධය මොකක්ද?' ඔහු ඇසුවේ මා දෙසට ඇඟිල්ල දිගුකරමිනි.

'මේ තමයි මගේ මිත්‍රයා සහ උදව් කාරයා- දොස්තර වොට්සන්. මේ කාර්යයෙදිත් ඔහු අපට උදව් කරනවා'

සමාව අයැදිමින් වචන කිහිපයක් මිමිනු ඔහු, අව්වට පිලිස්සුණු කළු පැහැති පුරුෂ මා වෙතට දිගු කාළේය.

'මං විශ්වාස කරනවා මා අතින් ඔබට තුවාල සිදුවුණේ නැහැ කියල. ඇය විපතට පත්කළා කියල ඔබ මට දෙස් පැවරුවා නේ. මට මොනවා උණාද කියල මං දන්නෙ නැ. මේ දවස් වල මගේ සිහිකල්පනාවත් හොඳ නැ. හැබැයි මට දැනගන්න ඕනෑ හෝම්ස් මහත්මයා මං මෙහේ ජීවත් වෙන බව ඔබ දැනගත්තෙ කොහොමද කියල?'

'ප්‍රාන්සස් ආර්යාවගේ පරණ සේවිකාව - ඩොබ්නි මෙනෙවිය තිරතුරුවම මාව දැනුවත් කරනවා'

'නාකි සුසාන් ඩොබ්නි ! මට ඇයව හොඳට මතකයි'

'ඇයටත් ඔබව හොඳට මතකයි. ඒ ඔබ දකුණු අප්‍රිකාවට යන්න තීරණය කරන්න ඉස්සර කාලෙ'

http://...tions.blogspot.com

"ආ..... ඔබට මං ගැන විස්තර ඔක්කොම අහන්න ලැබිල වගෙයි. මං ඔබෙන් කිසිම දෙයක් හංගන්නෙ නැ හෝම්ස් මහත්මයා. මං ඔබට දිවුරලා කියන්නම්. මේ ලෝකේ කිසිම කෙනෙක් ගැහැනියකට ආදරය කරන්න නැ, මං ප්‍රාන්සස්ට ආදරය කළා වගේ. ඇයත් මට හරි ආදරයෙන් හිටියේ. දන්නෙ නැද්ද හෝම්ස් මහත්තයා දඩබ්බර ඉලන්දරී කාලෙ හැටි. මං කිසි වග විභාගයක් නැතුව ඔය වයසේ අනෙක් කොල්ලො වගේ මගේ පිස්සු නැටුවා. මේව ආරංචි වුණාම ඇගේ හිත හොඳටම තරක් වුණා. මාත් එක්ක තිබුණු සම්බන්ධකම් ඔක්කොම අත් හැරියා. ඒ වුණත් ඇය මට දිගටම ආදරය කළා. ඒක තේ පුදුමය කියන්නෙ! කොයිතරම් ආදරය කළාද කිව්වොත් අද වෙනතුරු කිසිවෙකුට ආදරය කළේ වත් විවාහ වුණේ වත් නැ.

මං දකුණු අප්‍රිකාවට ගියා. අවුරුදු ගණනාවක් ගතවුණා. දකුණු අප්‍රිකාවේ බාබර්ටන් වලදී මං විශාල ධනයක් ඉපැයුවා. මට හිතුණා ඇයව මුණ ගැහුණොත් ඇගේ හිත හරි ගස්සගන්න පුළුවන් වේවි කියලා. හොයා බැලුවාම ඇය තවමත් අවිවාහක බව මට දැනගන්න ලැබුණා. ඉතින් මං ලුසාන් වලට ඇවිත් ඇයව මුණ ගැහුණා. මාව අමතක කරන්න ඇය දැඩි ලෙස අධිෂ්ඨාන කරගෙනයි හිටියේ. නමුත් තරුණු කියලා ඇගේ දැඩි හිත තරමක් නම්ම ගන්න මට පුළුවන් වුණා. ඒ වුණත් ඊළඟට මං ඇයව හමුවෙන්න එද්දි ඇය ලුසාන් වලින් පිටවෙලා ගිහින්. එතැනින් තමයි මං ඇයව හොයාගෙන ලන්ඩන් වලට ආවෙ. ඊට පස්සෙ මට අහන්න ලැබුණා ඇගේ සේවිකාව මෙහේ ඉන්න බව. මං බොහොම සැරපරුෂ මිනිහෙක්. කාලයක් තිස්සෙ පුරුදු වෙලා හිටි, රළු, ප්‍රචණ්ඩකාරී ජීවිතයෙන් ඉවත් වෙලා ආව ගමන්, මේ වොට්සන් දොස්තර මහත්මයා අර වගේ කතා කළාම මටම මාව පාලනය කරගන්න නැතුව ගියා. හෝම්ස් මහත්මයා දෙයියන්ගෙ නාමෙන් කියන්න ප්‍රාන්සස් ආර්යාවට මොකද දැන් වෙලා තියෙන්නේ?"

"ඒක තමයි අපිට හොයාගන්න වෙලා තියෙන්නෙ. ග්‍රීන් මහත්මයා, ලන්ඩන්වල ඔබේ ලිපිනය මොකක්ද? හෝම්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

'ලැංහැම් හෝටලයේ තමයි මං නවතින්නේ'

'එහෙම නම් මං කියන්නද වැඩක්. ඔබ දැන් ආපහු ගිහින් හෝටලයේ නැවතිලා ඉන්න. මං ඔබව අමතන තෙක් එහේ සූදානමින් ඉන්න. මං ඔබට හිස් බලාපොරොත්තු දෙන්න කැමති නෑ. නමුත් ප්‍රාන්සස් ආර්යාවගේ ආරක්ෂාව සඳහා කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරනවා. දැනට මට කියන්න පුළුවන් එච්චරයි. මං මේ ඔබට දෙන කාඩ්පතේ තියෙනවා, අප සමග සම්බන්ධය තියාගන්න පුළුවන් ලිපිනය. එහෙම නම් වොට්සන් ගමනට සූදානම් වෙන්න. හෙට රෑ 7.30 ට පැමිණෙන බඩගිනි කාරයින් දෙදෙනෙකුට හැකි තරම් ඉහළින් කෑම සූදානම් කරන්න කියලා මං හඩ්සන් මහත්මියට විදුලි පුවතක් යවන්නම්'

* * *

අප බේකර් වීදියට ළඟාවන විට හෝම්ස් නමට විදුලි පුවතක් ලැබී තිබිණි. එය කියවූ ඔහු මහත් සේ සතුටට පත්විය. බේඩින් නගරයේ සිට එවන ලද බවට එහි සටහන් කොට තිබිණ.

'**කඩතොලු වී නොගොත් ඉරී ගොස්**' විදුලි පුවතේ සඳහන්ව තිබුණේ එපමණකි.

'මේකෙ තේරුම මොකක්ද හෝම්ස්?'

'ඒකෙ හැම දෙයක්ම තියෙනවා. ඔබට මතකද මං ඔබෙන් අහල එව්ව අර මිෂනාරි වරයාගේ වම් කන කොහොමද කියලා? ඔබ ඒකට පිළිතුරු එව්වෙ නෑ?'

'ඒක ලැබෙන කොට මං බේඩින් වලින් පිටත්වෙලා. ඒ නිසා ඒ ගැන හොයන්න වෙලාවක් ලැබුණේ නෑ'

'හරි. අන්න ඒ නිසා, මං ඒ ප්‍රශ්නයේ පිටපතක් යැව්වා ඉංග්‍රීසි හෝටලයේ කළමනාකරුට. මේ තියෙන්නේ ඔහු එවූ පිළිතුර'

'මොකක්ද ඒකෙන් කියන්නෙ?'

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒකෙන් කියන්නෙ අපි ගනුදෙනු කරන්නේ බොහොම කෛරාටික, ඒ වගේම ඉතාම දරුණු පුද්ගලයකු සමඟ බවයි. දකුණු ඇමරිකාවේ ආගම් ප්‍රචාරය කළා කියන ආචාර්ය ෂ්ලෙසිංගර් දේවගැතිතුමා කියන්නේ වෙන කවුරුවත් නෙමෙයි, ශුද්ධවන්ත පීටර්ස්. ඕස්ට්‍රේලියාව ඒ තරම් දීර්ඝ ඉතිහාසයක් ඇති රටක් නෙමෙයි. ඒ වුණත් අංග සම්පූර්ණ අපරාධකාරයෙක් බිහිකරන්න නම් සමත් වෙලා තියෙනවා. තනිකඩව ජීවත්වෙන කාන්තාවන්ගේ ආගම් භක්තිය, ආගමික හැඟීම් ප්‍රයෝජනයට අරගෙන, ඔවුන්ව මුලාකරන්න, ශුද්ධවන්ත පීටර්ස් හරිම දක්ෂයෙක්. එහෙම මුලාකරගෙන ඔවුන් සතු හැමදේම සුද්ධකරගන්න ඔහු විශේෂඥයෙක්. ඔහුගේ බිරිඳ හැටියට ඉන්නෙ ෆ්රේසර් කියල ඉංග්‍රීසි ජාතික කාන්තාවක්. ඇයත් ඒ වගේම අපරාධකාරියක්. ඔහු මෙහිදී යොදා ගතිපු උපක්‍රමය නිසා අදාළ පුද්ගලයා පීටර්ස් දෝ කියලා මගේ හිතේ සැකයක් ඇතිවුණා. 1889 අවුරුද්දේ ඇඩිලේඩ් නගරයේ තැබෑරුමක ඇතිවුණු කෝලාහලයකදී කවුද කෙනෙක් ඔහුගේ වම් කන දරුණු ලෙස හපාකාලා තියෙනවා. වම් කනේ ස්වභාවය මගේ සැකය තහවුරු කළා.

මේ අහිංසක කාන්තාව කොටුවෙලා ඉන්නේ බොහොම දරුණු අපරාධකාරයින් ජෝඩුවකට. ඔවුන් ඇයව ලේසියෙන් අත හරින්නෙ නෑ වොට්සන්. එක්කෝ ඇය දැනටමත් මැරිල. නැත්නම් ඩොබිනි මෙනෙවියට හෝ අනෙක් මිතුරෙකුට ලිපියක් එවන්න බැරි විදියට අපරාධකාරයින්ගේ ග්‍රහණයේ අන්තිමටම හිරවෙලා. මං හිතන්නේ ෆ්‍රාන්සස් ආර්යාව ලන්ඩනයට ළඟාවුණේ නෑ. එහෙමත් නැත්නම් ඇය ලන්ඩනය හරහා තවත් කොහේට හරි ගියා. කොහොම වුණත් යුරෝපා මහාද්වීපික පොලීසි එක්ක හැංගි මුත්තන් කරන එක විදේශිකයන්ට පහසු නෑ. දැනට ඇය ඉන්නේ කොහේද කියලා අපට කියන්න පුළුවන් කමක් නෑ. දැන් අපට කරන්න තියෙන්නේ රෑ කෑම කාලා ටිකක් ඉවසීමෙන් ඉඳීම පමණයි. තවත් රෑ වෙලා මං ස්කොට්ලන්ඩ්යාඩ් පැත්තට ගිහිං අපේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් හමුවෙලා එන්නම්."

එහෙත් ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිසියට වත්, ෂර්ලොක්

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස්ගේ කුඩා, එහෙත් ප්‍රබල රහස් පරීක්ෂණ සංවිධානයටවත් අභිරහස හෙළිකර ගැනීමට නොහැකි විය. ලන්ඩනයේ ලක්ෂ සංඛ්‍යාත ජනකායක් අතරේ ශුද්ධවන්ත පීටර්ස් හා ඔහුගේ බිරිඳ අතුරුදහන් වූහ. පුවත්පත් වල පළ කළ විමසීම් වලට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. හෝඩුවාවල් ඔස්සේ කළ සොයා බැලීම්ද අසාර්ථක විය. ෂ්ලෙසිංගර් ගැවසීමට ඉඩ ඇති පාතාල ලෝකයේ තිප්පොළ වලද ඔහු නොසිටියේය. ඔහු ඇසුරු කළ අපරාධකරුවන් ගැන සුපරීක්ෂාකාරීව සිටි නමුත්, ඔවුන් ෂ්ලෙසිංගර් හමුවූ බවක් නොපෙනිණ. කිසිදු ආරංචියක් නොමැතිව සතියක් පමණ මෙලෙස ගෙවී ගියේය. හදිසියේම එක් දිනක් යම්කිසි ආලෝකයක සේයාවක් සොඳිසියට හසු විය. වෙස්ට්මිනිස්ටර් පාරේ උගස් බඩු ගන්නන් වූ බෙවිංටන් ආයතනය වෙත ස්පාඤ්ඤ මෝස්තරයේ, රිදීයෙන් තැනූ බෙරලියන්තු ඇල්ලූ පෙන්ඩනයක් උගස්කරනු ලැබිය. ඒ සඳහා පැමිණි පුද්ගලයා, රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකළ, දේවගැති, පෙනුමක් තිබූ උස මහත පුද්ගලයෙකි. ඔහු දී තිබුණේ ව්‍යාජ නමක් හා ලිපිනයකි. ඔහුගේ කනේ ස්වභාවය කිසිවෙකු මතක නොවූ නමුත් විස්තරය අනුව ඒ ෂ්ලෙසිංගර් බව සිතාගත හැකිවිය.

ලැංහැම් හෝටලයේ ලැගුම් ගෙන සිටි අපේ රැවුළ මිත්‍රයා-ග්‍රීන්, මේ වන විට තුන් වරක්ම අප හමුවීමට පැමිණ තිබිණි. බලාපොරොත්තු කඩවී සිටි ඔහු, ක්‍රමයෙන් කෙට්ටු වීමටද පටන් ගෙන ඇත.

'මටත් මේ ගැන කරන්න මොනව හරි වැඩක් භාර දෙන්න හෝම්ස් මහත්මයා' ඔහු නිරතුරුවම අපෙන් ඉල්ලමින් සිටියේය. ඔහු තුන්වන වර අප වෙත පැමිණියේ බඩු උගස් කිරීම ගැන ආරංචිය අප වෙත ලැබී පැයක් ඇතුළතයි'

'ෂ්ලෙසිංගර් ආභරණ උගස්කරන්න පටන් අරගෙන. දැන් ඉතින් ඔහුව අල්ලා ගැනීමට හැකිවිය යුතුයි' හෝම්ස් කීය.

'මොකක්ද මට කළ හැකි දේ?'

http://sherlockholmesinvestigations.blogspot.com

'මේ මිනිස්සු පෙනුමෙන් ඔබව හඳුනනවද?'

'නෑ'

'සමහරවිට ඉදිරි කාලයේදී ඔහු වෙනත් උගස් බඩු කාරයෙක් ළඟට යන්නත් ඉඩ තියෙනවා. එහෙම වුණොත් අපට ආයෙත් මුල ඉඳන් පටන් ගන්න සිද්ධ වෙනවා,

අනික් අතට ඔහු ආපහු බෝව්මන් ළඟටම එන්නත් ඉඩ තියෙනවා. ඒ මොකද ඔහුගෙන් අනාවශ්‍ය ප්‍රශ්න ඇහීමක් සිදුවුණෙත් නෑ: සාධාරණ මුදලකුත් ලැබුණා. ඒ නිසා බොහොම වෙලාවට එතනටම එන්නත් පුළුවනි. මං දෙන්නම් ඔබට ලියුම් කෑල්ලක්. ඒක අරගෙන ගිහිං බෝව්මන් සාප්පුවට පෙන්වන්න. ඔවුන් ඔබට එහි රැඳී හිටින්න ඉඩ දේවි. අර මිනිහ ආවොත්, ඔබට කරන්න තියෙන්නෙ, ඔහු පිටිපස්සෙන් ඔහුගේ නිවස ළඟටම ගමන් කරන්නයි. නමුත් ඔහුට ආධාකරන්න එපා: ප්‍රශ්න මොකුත් අහන්න එපා. ඒ ඔක්කොටම වඩා 'පහරදීමක් හිරිහැරයක් කරන්න එපා. මගේ අවසරය නැතුව කිසිම දෙයක් නොකරන පොරොන්දුව පිටයි මං ඔබව මේ සේවයට යොදවන්නෙ'

ගරු පිලිප් ග්‍රීන් (ක්‍රිමියානු යුද්ධයේදී සටන් වැදුණු, ඊසොප් මුහුදේ නාවික හමුදා අණ දෙන නිලධාරී ධූරය දැරූ, ග්‍රීන් සාමිවරයාගේ පුතා ඔහු බව මා මෙහි සඳහන් කළ යුතුයි) දින දෙකක් යනතුරු අප වෙත කිසිදු තොරතුරක් ගෙන ඊමට සමත් නොවීය. තුන්වැනි දිනයේ හැන්දෑවේ පිලිප් ග්‍රීන් පුදුමැලිව, එහෙත් මහත් කලබලයෙන් අපේ කාමරයට කඩා වැදුණේය.

'ඔහු අහුවුණා ! ඔහු අහුවුණා !'

කලබල වී සිටීම නිසා කිසිදෙයක් පැහැදිලිව කීමට ඔහුට නොහැකි විය. ඔහු සන්සුන් කිරීමට වදන් කීපයක් තෙපළූ හෝම්ස්, ග්‍රීන් හාන්සි පුටුවකට තල්ලු කළේය.

'ඔහොම වාඩිවෙලා, ග්‍රීන් සැරේ අපට කියන්න, වෙච්ච සිදුවීම් අනු පිළිවෙලින්'

http://sherlockholmesinvestigations.blogspot.com

'ඇය ආව දැන් පැයකට විතර කලින්. මේ සැරේ ආවෙ ගැනි. නමුත් පෙන්ඩන්ට් එක, ගිය සැරේ විකුණපු එකේ අනික. ඇය උසයි, සුදුමැලියි. ඇස් දෙක උගුඩුවෙකුගේ වගේ, බොහොම සුපරීක්ෂාකාරියි.'

'හරියට හරි. ඒ ගැනි තමා' හෝම්ස් කීය.

'ඈ සාප්පුවෙන් එළියට බැහැලා යනකොට මං ඇයගෙ පිටි පස්සෙන් ගියා. මුලින්ම ඇය ගියේ කෙනිංටන් වීදියට. මං ගියේ තරමක් දුරින්, පිටිපස්සෙන්. ඇය සාප්පුවකට ඇතුළු වුණා. ඒක අවමංගල්‍ය කටයුතු සම්පාදනය කරන ස්ථානයක් හෝම්ස් මහත්මයා !'

ඒ ඇසූ හෝම්ස් තිගැස්සුණේය.

'මොනවා ?' ඔහු ඇසුවේ වෙවුලන කටහඬිනි.

'කවුන්ටරය පිටිපස්සේ හිටපු සේවිකාවක් එක්ක කතා කරන්න ගන්න කොටමයි මං ඇතුළු වුණේ.

'කෝ හරි පරක්කුයි නෙ?' ඇය ඇහුවා.

'සමාවෙන්න. ඒත් මේ වෙන කොට ඒක එහේට ලැබිල තියෙන්න ඕන. ලැබුණෙ නැද්ද? දැන් මග එනවා ඇති. දැන් කොයි මොහොතේ හරි ලැබේවි. සාමාන්‍ය එකකට වඩා වෙනස් විදියේ එකක් නිසා ඒකට වැඩි වේලාවක් ගත වුණා'

සේවිකාව පිළිතුරු දුන්නා.

ඔවුන් දෙදෙනාම කතාව නවත්තලා ඊළඟට මං දිහා බැලුවා. මං ප්‍රශ්න කීපයක් අහලා සාප්පුවෙන් පිටවුණා'

'ඔබ ක්‍රියා කළ ආකාරය බොහොම හොඳයි, ඊළඟට මොකද වුණේ?'

'මං එළියට ගිහින් ටිකක් ඈත තැනක හැංගිලා හිටියා. ඇය

http://sherlockholmesinvestigations.blogspot.com

මිනිපෙට්ටි කඩෙන් එළියට බැස්සා. මං හිතන්නේ ඇයට සැක හිතිලා වෙන්න ඇති, ඊළඟට හොඳට වටපිට බැලුවා.

ඊට පස්සෙ ඈ කුලී රථයකට කතා කරගෙන ඒකට නැග්ගා. හොඳ වෙලාවට මටත් ඉක්මනින් කුලී රථයක් ලැබුණා. මං ඇයගේ කරත්තය පිටිපස්සෙන් ගියා. බ්‍රික්ස්ටන් වල පෝල්ටනි චතුරශ්‍රයේ අංක 36 දරන ගෙදර ළඟදී ඇය කුලී රථයෙන් බැස්සා. මං ඇයව පහුකරගෙන තවත් ටික දුරක් ගිහිං, කුලී රියෙන් බැහැලා අර ගෙදර දිහා පරීක්ෂාවෙන් බලාහිටියා'

'ඔබ දැක්කද කවුරු හරි?'

'ජනෙල් ඔක්කොම තිබුණෙ අඳුරේ. පහළ තට්ටුවේ එක ජනෙල් වීදුරුවක එළියක් පෙනුණා. ඒත් ඒක ජනෙල් තිරයකින් වහලා තිබුණේ. ඇතුළත කිසිදෙයක් මට පෙනුණේ නෑ. මීළඟට මොකක්ද මම කරන්නෙ කියලා කල්පනා කර කර ඉන්නකොට, සම්පූර්ණයෙන්ම වහපු, බඩු ප්‍රවාහණය කරන වර්ගයේ විශාල අශ්ව කරත්තයක් ආවා. මිනිසුන් දෙදෙනෙක් එයින් බැහැලා, යමක් එළියට අරගෙන, එය ගේ ඇතුළට ගෙන ගියා. හෝම්ස් මහත්මයා, ඒක මිනීපෙට්ටියක් !'

'ආ ?'

'ඔව්. ඒ වෙලාවෙ මට එක්වරම හිතුණෙ කෙළින්ම ගිහිං බලෙන් ඇතුළු වෙන්න. අර මිනිස්සු දෙන්නාට, මිනී පෙට්ටිය ගෙන ඒමට පහසුවෙන්න දොර හොඳට ඇරලයි තිබුණෙ. මං ටිකක් කිට්ටුවට ඇවිත් හිටි නිසා ඇය මාව යන්තමට දැක්කා, මං හිතන්නෙ. ඇය තිගැස්සිලා ඉක්මනට දොර වහල දැම්මා. ඔබට වුණු පොරොන්දුව මතක් වුණු නිසා එතනිං එහාට මොකුත් කළේ නෑ. මෙන්න මං ආපහු ආවා'

'ඔබ ක්‍රියා කරල තියෙන පිළිවෙල බොහොම නිවැරදියි' හෝම්ස් පැවසුවේ කඩදාසියක යමක් සටහන් කරමින්.

'ගේ සෝදිසි කරන බලපත්‍රයක් ලබාගන්නෙ නැතුව, අපට

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

නීත්‍යානුකූලව මොකුත් කරන්න බෑ. ඔබට දැන් කරන්න තියෙන අත්‍යාවශ්‍යම වැඩේ මේ ලියුම අරගෙන ගිහිං බලපත්‍රයක් ලබා ගැනීමයි. ඒක ටිකක් අමාරු වෙන්න පුළුවනි.නමුත් ආභරණ විකුණු එක සැහේවි. ලෙස්ට්‍රේඩ් ඔක්කොම වැඩකටයුතු කරල දේවි'

'ඒ අතරෙ ඔවුන් ඇය්ව මරා දමාවි. මිනීපෙට්ටියක් ගෙනිච්ච එකේ තේරුම ඒක නොවැ. ඒක ඇයට ඇරෙන්න වෙන කාටද?'

'කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරනවා ග්‍රීන් මහත්මයා. අපි එක මොහොතක් වත් අපතේ අරින්නේ නෑ. ඒ ඔක්කොම වැඩ කටයුතු අපට භාරදෙන්න'

හෝම්ස් පැවසූ විට ඔහු වහා පිටත්වී ගියේය.

'නිල ලත් අපරාධ පරීක්ෂකයින් වන පොලීසිය මේ ලියුම දුටු ගමන්ම ක්‍රියාත්මක වේවි. නිල නොලත් අපරාධ පරීක්ෂකයින් වන අපේ වාරයයි දැන් තියෙන්නෙ වොට්සන්. උද්ගතවී ඇති තත්ත්වය අනුව බොහොම දැඩි ක්‍රියා මාර්ගයක් ගන්න සිද්ධ වෙනවා. ඒක මොහොතක් පමා නොවී වහාම යමු පෝල්ට්නි චතුරශ්‍රයට'

කුලී රථයකින් අපි වහාම බ්‍රික්ස්ටන් බලා පිටත්වුණෙමු. පාර්ලිමේන්තුව, වෙස්ට්මින්ස්ටර් පාලම පසු කරමින් රථය වේගයෙන් ගමන් කරද්දී හෝම්ස් යළිත් කථාව ඇරඹීය.

'අපට මේ විදියට හිතන්න පුළුවනි. මේ තක්කඩියො දෙන්නා මුලින්ම ඇගේ හිතවත් සේවිකාව ආර්යාවගෙ ළඟින් ඉවත්කරන්න කටයුතු කළා. ඊට පස්සේ ප්‍රයෝගයෙන් ඇයව ලන්ඩනයට අරගෙන ආවා. ඇය කාට හරි ලියුම් ලියුවා නම්, ඒව ඔක්කොම හංගාගන්න ඇති. කවුරු හරි අතරමැදියෙක් මාර්ගයෙන්, බඩුබාහිරාදියෙන් සම්පූර්ණ නිවසක් ලන්ඩනයෙන් කුලියට ගත්තා. ගෙයි ලැගුම් ගත්තට පස්සෙ දැන් ආර්යාව ඔවුනගේ සිරකාරියක්. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වුණේ ඇගේ

ආභරණ, දියමන්ති වංචා කරගැනීමයි. දැන් ඒක ඉෂ්ට කරගන්න පටන් අරගෙන. ඔවුන් භය නැතුවම ආභරණ එකින් එක විකුණන්න පටන් ගත්තා. ඒ මොකද ඔවුන් දන්නවා ප්‍රාන්සස් ආර්යාවගේ ඉරණම ගැන හොයා බලන්න කෙනෙක් නැහැ කියල. ඇයව නිදහස් කළොත් ඔවුන් පොලීසියට කොටුවෙනවා. ඒ නිසා ඇයව නිදහස් කිරීමට පිළිවෙළක් නෑ. සැමදාම හිරකරගෙන ඉන්නත් බෑ. ඒ නිසා ඔවුන්ගේ එකම පිළිතුර මිනීමැරීමයි'

'ඒක හොඳටම පැහැදිලියි'

'දැන් අපි වෙනත් ආකාරයකට තර්ක ඉදිරිපත් කරමු. අපි පටන්ගමු ප්‍රාන්සස් ආර්යාවගේ සුභ මිනීපෙට්ටියේ ඉඳල පිටු පසට. බොහොම වේලාවට ඇය දැන් මියගිහින් කියල හිතන්න පුළුවනි. ඒකෙන් තේරෙන්නේ ඔවුන් වෛද්‍යවරයෙකුගෙන් මරණ සහතිකයක් එහෙම අරගෙන, නීත්‍යානුකූලව ඇගේ අවසන් කටයුතු කරන්නයි සූදානම. ආර්යාවගේ මරණය පැහැදිලි ලෙසම මිනීමැරුමක් නම් ඔවුන් ඇයව ඔය ගෙදර වත්තේ කොහේ හරි වළ දමාවි. නමුත් මෙතන කටයුතු සිද්ධ වෙන්නෙ විවෘතව, බොහොම ක්‍රමානුකූලව. මොකක්ද අපට ඒකෙන් හිතාගන්න පුළුවන්? කිසිම සැකයක් නෑ. ඔවුන් ඇයව මරන්න ඇත්තෙ මේක ස්වාභාවික මරණයක් ලෙස පෙනෙන විදියට: වෛද්‍යවරයා පවා රැවටෙන ආකාරයට. සමහරවෙලාවට ඒක විෂ වර්ගයකින් සිදුකළා වෙන්නත් පිළිවන්. ඒ වුණත් ඔවුන් කොහොමද වෛද්‍යවරයෙකුට ඇයව පරීක්ෂා කරන්න ඉඩ හරින්නේ? එක්කෝ ඔහු ඔවුන්ගේ හවුල් කරුවෙකු විය යුතුයි. ඒකත් හිතන්න අමාරුයි'

'ඔවුන් වංචා සහගත ලෙස මරණ සහතිකයක් සකස් කරගත්තද දන්නෙ නෑ?'

'ඒක අනතුරුදායකයි වොට්සන්. හරිම අනතුරුදායකයි. මං හිතන්නෙ නෑ ඔවුන් එහෙම කළා කියල. අශ්ව කරත්තය ඔහොම නවත්වන්න ! අපි අර පහු කරල ආවෙ උගස්බඩු සාප්පුව. මේ තියෙන්නේ අවමංගල සේවා ආයතනය. වොට්සන්, ඔබ ගිහින් ඔවුන්ගෙන් අහල බලනවද? ඔබේ පෙනුම නිසා ඔවුන් මොකුත්

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

සැකයක් හිතන එකක් නෑ. අහන්න ‘පෝල්ටිනි චතුරශ්‍රයේ අවමඟුලේ කටයුතු සිදුකරන්නෙ කොහෙට කීයටද කියල’

පසුවදා උදේ අටට එය සිදු කරන බව අවමඟුල් ශාලාවේ සේවිකාව පැකිලීමකින් තොරව මට දැනුම් දුන්නාය.

‘ඔබට පෙනෙනවා නේද වොට්සන්. කිසිම අභිරහසක් නැති විදියට හැම දේම නීත්‍යානුකූලව, චාරිත්‍රානුකූලව ! මොනවා හරි ක්‍රමයකින් ඔවුන් නීතියේ කපොලු වලින් රිංගලා. දැන් හිතාගෙන ඉන්නෙ භයවෙන්න දෙයක් නැහැ කියලා. දැන් ඉතින් මේ ප්‍රශ්නයට කෙළින්ම මුහුණ දීල, සටන් ආරම්භ කරමු. වෙන පිළිවෙළක් නෑ. ඔබ ළඟ ආයුධයක් තියෙනවද?

‘මගේ පිස්තෝලය තියෙනවා’

‘බලමු. අපි හැකෙන පමණ ආයුධ සන්නද්ධයි කියල මට හිතෙන්නෙ. සණ්ඩුවකට සූදානම් වෙන මිනිහා තුන් ගුණයකින් සන්නද්ධ වෙනවා කියල කථාවක් තියෙනවා. පොලීසිය වැඩ කටයුතු භාරගන්න තුරු අපට බලාගෙන ඉන්න කොහොමටවත් බෑ. කරත්තය ඔහොම නවත්වන්න’

අපි අශ්ව රථය ආපසු යැව්වෙමු.

‘දැන් ඉතින් වොට්සන් අපේ වාසනාව උරගා බලමු. මීට ඉස්සරත් අපි කරල තියෙනවා මේ වගේ වැඩ’

පෝල්ටිනි චතුරශ්‍රය මැද පිහිටි ඒ අඳුරු පැහැති නිවසේ දොර සීනුව, හෝම්ස් තදින් නාද කළේය. දොර විවෘත විය. උස කාන්තාවක් දොරටුව වෙත පැමිණියාය.

‘මොනවද ඕහෙලට ඕනෙ?’

‘මට ඕන ආචාර්ය ෂ්ලෙසිංගර්ට කතා කරන්න’

‘එහෙම කෙනෙක් මෙහේ නෑ’ කිව් ඇය වහාම දොර වැසීමට සූදානම් වූවාය. එහෙත් එය කළ නොහැකිවන සේ හෝම්ස් තම කකුලක් උළුවස්සට හා දොරට අතරින් තබාගත්තේය.

'කමක් නෑ. නම මොකක් හරි වෙච්චාවෙ. මේ ගෙදර ජීවත් වෙන මිනිහ කවුරු හරි: මට හම්බවෙන්න ඕන' හෝම්ස් කීවේ තීරණාත්මක අයුරෙනි.

ඇය මදක් පැකිළුණාය. ඉන්පසු දොර හොඳින් විවෘත කළාය.

'හරි ඇතුළට එන්න. මගේ ස්වාමිපුරුෂයා මේ ලෝකෙ· මොන මිනිහෙක් හම්බවෙන්න වුණත් බය නෑ.'

අප ඇතුළු වූ පසු දොර වැසූ ඇය අපට විසිත්ත කාමරය පෙන්වූවාය. ඉන්පසු ගෑස් ලාම්පුව දැල්වූ ඇ ගෙතුළට ගියේ

'පීටර්ස් මහත්මයා මොහොතකින් ඔබ වෙත එවි' කියමිනි. අපට නිවස ඇතුළත හරි හැටි බලාගැනීමට වත් වෙලාවක් නොලැබිණ. රැවුල සම්පූර්ණයෙන්ම මුඩු කළ තරබාරු පුද්ගලයෙක් අප වෙතට ආවේය. විශාල රතු පැහැති මුහුණක් තිබූ ඔහුගේ පිරුණු කම්මුල්, දෙපැත්තෙන් එල්ලා වැටෙන තරම් විශාලය. මතුපිටින් අහිංසක පුද්ගලයකු ලෙස පෙනුණත් දරුණු බව පිළිබිඹු වන මුඛයක් ඔහු සතුවිය.

'ඇත්තටම ඔබට ලොකු වැරැද්දක් වෙලා මහත්වරුනි' ඔහු කථා කළේ ව්‍යාජ නිහතමානී බවක් පෙන්වමිනි.

'මං හිතන්නේ ඔබට වැරැද්ද නිවසයි කවුරු හරි පෙන්වල දීල තියෙන්නෙ. මේ පාරේ තව ටිකක් ඉස්සරහට ගිහිං බැලුව නං.............'

'ඔය බොරු දෙඩෙව්ව ඇති. නාස්ති කරන්න වෙලාවක් අපට නෑ. ඔහේ තමයි ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් වල හෙන්රි පීටර්ස්. කාලයක් දකුණු ඇමරිකාවෙත්, ඊට පස්සෙ බෙඩින්වලත් ආචාර්ය ෂ්ලෙසිංගර් දේවගැතිතුමා. ඒ ගැන මට හොඳටම විශ්වාසයි. මගේ නම ෂර්ලොක් හෝම්ස් බව මට විශ්වාස වගේම'

පීටර්ස් එක්වරම තිගැස්සුණේය. ඔහු තම ප්‍රතිවාදියා දෙස හෙළුවේ නපුරු බැල්මකි.

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

'හෝම්ස් මහත්මයා. ඔබේ නම කියල මාව භය කරන්න බෑ. මනුස්සයකුගේ හෘද සාක්ෂිය පිරිසිදු නම් ඒ මිනිහ ලවා දොඩවන්න දෙයක් නෑ. මගේ ගේ ඇතුළෙ ඔහේට තියෙන රාජකාරිය මොකක්ද?'

'මට දැනගන්න ඕනෑ තමුසෙ බේඩින් වල ඉඳල ලන්ඩන් වලට අරං ආපු, ෆ්‍රාන්සස් කාර්ෆැක්ස් ආර්යාවට මොකද කලේ කියල?'

'අන්න ඒ නෝනා ඉන්නෙ කොහෙද කියල ඔබට කියල දෙන්න පුළුවන් නම් මටත් හරි සන්තෝෂයි. එයා මට පවුම් සීයකට කිට්ටු මුදලක් ණයයි. ඊකට හිලව් වෙන්න දල ගිහින් තියෙන්නේ කබල් පෙන්ඩන් වගයක් විතරයි. උගස්බඩු කඩේ මිනිහ, බාල බඩු කියල ඒ ආභරණ දිහා බලන්න කැමති නෑ.

බේඩින් වලදී මගේ බිරිඳයි මායි එක්ක ඈ බොහොම හිතවත් කමෙන් උන්නා. එහෙදි මං වෙන නමක් පාවිච්චි කරපු බව ඇත්තයි. අපි ලන්ඩන් වලට එනතුරු ඈය අපත් එක්ක හිටියා තමයි. ඇගේ හෝටල් බිල, දුම්රියේ ටිකට් එකට, ඔක්කොම ගෙව්වෙ මම. ලන්ඩනයට ආවට පස්සෙ, මේ වැඩකට නැති ආභරණ වගයක් මෙහේ දල ඈ හෙමින් සැරේ මාරු වුණා. ඔබ ඈයව හොයා දෙන්න හෝම්ස් මහත්මයා. මං ඔබට සදාකාලෙටම ණය ගැතියි'

'මං මෙහේ ආවෙ ඈයව හොයන්න තමයි. ඈය හමුවෙනතුරු මේ ගේ ඇතුළෙ හැමතැනකම මං හොයනවා'

'කෝ ඊකට ඔබේ බලපත්‍රය?'

'හෝම්ස් තම රිවෝල්වරයෙන් අඩක් පෙනෙන සේ සාක්කුවෙන් එළියට ඇද්දේය. වඩා හොඳ බලපත්‍රයක් ලැබෙන තුරු මේක වලංගුයි'

'ඔබත් සාමාන්‍ය ගෙවල් මංකොල්ලකන හොරෙක් වගේ

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔව් මං ගැන එහෙම කිව්වට වරදක් නෑ' හෝම්ස් පැවසුවේ සතුටෙනි.

'මෙතන ඉන්න මගේ මිත්‍රයා වොට්සන්, හොම්මර එකේ හපුරු මැරවරයෙක්. අපි දෙන්නා මේ ගේ පරීක්ෂා කරනවා'

'ඇනී පොලිස් කාරයෙකුට අඩගහන්න !' පීටර්ස් නම බිරිඳ අමතා කීවේ උස් හඬිනි. කාන්තාවගේ දිගු සාය සෙලවෙන ශබ්දයක්, ඉන්පසු දොර ඇරීන හා නැවත වැසීන ශබ්දයක් ඇසිණි.

'අපට තියෙන්නේ සීමාසහිත කාලයයි වොට්සන්. පීටර්ස්, ඔබ අපට අවහිර කරන්න හැදුවොත්,. බරපතල තුවාල සිදුකර ගෙනයි එය නවත්වන්න වෙන්නේ. මේ ගෙදරට අරං ආපු මිනීපෙට්ටිය කෝ?'

'ඔහේට මොකටද මිනීපෙට්ටිය? ඒක ඇතුළෙ තියනවා මිනියක්'

' මට ඒක බලන්න ඕනෙ'

'ඒකට මගෙන් නම් අවසර ලැබෙන්නෙ නෑ'

'එහෙම නම් අවසර නැතුව බලන්න ඕන' පැවසූ හෝම්ස්, පීටර්ස්ව පැත්තකට තල්ලුකර දැම්මේය. අඩක් විවෘතව තිබූ දොරකින් අපි කෑම කන කාමරයට ඇතුළු වූයෙමු. එහි විශාල කෑම මේසය මත වැසූ මිනීපෙට්ටියක් තබා තිබිණ. පහනෙන් නිකුත් වූයේ මඳ ආලෝකයකි. ගෑස් පහනේ ආලෝකය වැඩි කළ හෝම්ස් මිනීපෙට්ටියේ පියන විවෘත කළේය.

පෙට්ටිය ඇතුළේ තිබුණේ, බොහෝ සෙයින් වයස්ගත, රැලි වැටුණු මුහුණක් ඇති කාන්තාවකගේ, කෙට්ටු මළසිරුරකි. කුමන අයුරක අසනීපයකින්, කොපමණ කෲර සැලකීමකින් හෝ දීර්ඝ කාලයක් නිරාහාරව තැබීමෙන් වත් ප්‍රාන්සස් කාෆැක්ස් වැනි සුන්දර කාන්තාවක් මෙම තත්ත්වයට පත්කළ නොහැක. මේ නම් ඇයගේ මළසිරුර විය නොහැකි බව අපට එක්වරම වැටහිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් ගේ මුහුණෙන් පළවූයේ විස්මය යි. ඔහු සැනසුම් සුසුමක් හෙළුවේය.

'දෙවියන්ට ස්තුති වේවා ! මේ නම් වෙනිං කවුරුවත්'

'ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ජීවිතේ පළවෙනි සැරේට ඔබට බොහොම ලොකු වැරැද්දක් සිදුවුණා නේද?' අප පිටු පසින් කාමරයට ආ පීටර්ස් පැවසීය.

'මේ මියගිහින් ඉන්න කාන්තාව කවුද?'

'ඔබට දැනගන්න ඕනෙම නං කියන්නම්. මේ, මගේ බිරිඳ කුඩා කාලයෙදි එයා බලාගත්තු සේවිකාව. නම් -රෝසි ස්පෙන්ඩර්. අපට ඇය හමුවුණේ බ්‍රික්ස්ටන් රෝහලේ ඉඳල. අපි ඇයව මෙහේට අරගෙන ආවා. ඇය අසනීප වෙලා බොහොම අසාධ්‍ය තත්ත්වයෙන් හිටියේ. ඉතින් අපි කැඳවාගෙන ආවා හෝසම් දොස්තර මහත්මයා. ඔහුගේ ලිපිනය අංක 13 ෆෙයා බෑන්ක් විලාස්. ඒ ලිපිනය සටහන් කරගන්න හෝම්ස් මහත්මයා. නියම ක්‍රිස්තියානි මිනිස්සු වගේ අපි රෝස්ව හොඳින් බලාගත්තා. තුන්වැනි දවසේ ඇය මියගියා. වෛද්‍යවරයා ලියූ මරණ සහතිකයේ තියෙන්නේ මරණයට හේතුව 'වයෝවෘද්ධතා ව්‍යසනය' කියලයි. ඒ ඉතින් දොස්තර මහත්තයගේ අදහසයි. ඔහේ ඉතින් ඊටත් වඩා දන්නවනේ.

ඇගේ අවමඟුල් කටයුතු සිදුකිරීම අපි කෙනිංටන් පාරේ ස්ටිම්සන් සමාගමට භාර දුන්නා. හෙට උදේ අටට ඇගේ භූමදාන කටයුතු සිදුකෙරෙනවා. ඒකෙ මොකුත් බොරුවක් වංචාවක් ඔබට හොයාගන්න පුළුවන්ද හෝම්ස් මහත්මයා? ඔබට වුණේ මහ අඥාන තකතිරු විදියේ වැරැද්දක් නේද? ප්‍රාන්සස් කාෆැක්ස් ආර්යාව දකින අදහසින්, ඔබ මිනීපෙට්ටියේ පියන උස්සලා බලන කොට හිටියේ අවුරුදු අනුවක ගැහැනියක්. ඒ වෙලාවෙ ඔහේගෙ කට, මහ මෝඩ පිළිවෙළට ඇරුණු හැටි කවුරු හරි ඡායාරූප ගත කළා නං, මං ඒකට හොඳ ගණනක් ගෙවන්න ලෑස්තියි'

විරුද්ධවාදියාගේ අපහාස උපහාස හමුවේ හෝම්ස්ගේ

මුහුණේ කිසිදු හැඟීමක් ප්‍රකාශ නොවීය. එහෙත් ඔහුගේ සිත තුළ ඇතිවූ කෝපය පිළිබිඹු වූයේ මිට මොළවූ වෙවුලන දෑත්වලිනි.

'මං ඔහේගේ ගේ සෝදිසි කරනවා', හෝම්ස් කීය.

'ත්වත් ඔහේට ඕනද ගේ සෝදිසි කරන්න? හොඳයි බලමු' පීටර්ස් කෝපයෙන් කෑගැසුවේය. ඒ සමගම කාන්තාවකගේ කටහඬ හා බූට්ස් සපත්තු වලින් නැගෙන අඩි ශබ්දයක් ඉස්තෝප්පුව දෙසින් ඇසිණි.

'පොලිස් නිලධාරි මහත්වරුනි. කරුණාකරල මේ පැත්තට එන්න. මේ මිනිස්සු මගේ ගෙට බලෙන් ඇතුළුවෙලා, දැන් එළියට යන්නෙ නෑ. කරුණාකරල ඔවුන් එළියට දාන්න මට උදව් කරන්න' පීටර්ස් කීය.

පොලිස් භටයෙක් හා සාජන්ට් වරයෙක් දොර අසල සිටගත්තෝය. හෝම්ස් තමාගේ හැඳුනුම්පත ඉදිරිපත් කළේය.

'මේ මගේ නමයි ලිපිනයයි. මේ මගේ මිත්‍රයා දෙස්තර වොට්සන්'

ස්තූතියි මහත්මයා, අපි ඔබව හොඳින් හඳුනනවා. ඒ වුණත් බලපත්‍රයක් නොමැතිව ඔබට මේ ගේ ඇතුළේ ඉන්න බැහැ'

'ඒක මං හොඳින් දන්නවා'

'ඔහුව හිරභාරයට ගන්න' පීටර්ස් කෑගැසුවේය.

'මේ මහත්මයා හිරබාරයට ගන්න උවමනා නම් ඒක කළ යුතු පිළිවෙළ අපි හොඳින් දන්නවා. ඒ වුණත් ඔබ මේ ගෙයින් පිටවී යා යුතුයි හෝම්ස් මහත්මයා'

'ඔව් වොට්සන්. අපට යන්න වෙනවා'

අපි යළිත් පාරට බැස්සෙමු. හෝම්ස් මේ සියල්ලට මුහුණ දුන්නේ ඔහුට සුපුරුදු නිවුණු ස්වරූපයෙනි. එහෙත් ඇතිවූ ලැජ්ජාව නිසා මම කෝපයෙන් දැවෙමින් සිටියෙමි.

Reading Purpose Only. Not For Print ...blogspot.com

'සමාවෙන්න මහත්මයා. නමුත් නීතිය ඒකයි' අප පිටුපසින් පාරට බට පොලිස් නිලධාරියා පැවසීය.

'හරි සාජන්ට්. ඔබ ඔබේ රාජකාරිය හරියට කළා'

'මට විශ්වාසයි ඔබ එතැන රැඳෙන්නෙ මොනව හරි වැදගත් කාරණයක් නිසා වෙන්න ඇති, මොනාවද මගෙන් කෙරෙන්න ඕනෑ?'

'කාන්තාවක් අතුරුදහන් වීමක් පිළිබඳවයි අපි මේ හොයන්නෙ. අපි හිතන්නේ ඇය මේ ගේ ඇතුළෙ ඉන්නවා. මේකට බලපත්‍රයක් කොයි මොහොතේ හරි ලැබෙයි කියල අපි බලාගෙන ඉන්නෙ.'

'එහෙම නම් මමත් සෝදිසියෙන් ඉන්නම් මහත්මයා. මොනව හරි සිද්ධ වෙනවා නම් මං ඔබට දැනුම් දෙන්නම්'

වේලාව තවමත් රාත්‍රී නවය වූවා පමණි. ලැබී තිබුණු හෝඩුවාවන් ඔස්සේ තවදුරටත් පරීක්ෂණයේ යෙදීමට අපි පිටත් වූයෙමු. අප පළමුවෙන් ගියේ බ්‍රික්ස්ටන් රෝහල වෙතයි.

'දවස් කිහිපයකට කලින් අසරණයන්ට පිහිට වෙන ජෝඩුවක් මෙහේ ආවා. අපේ වාට්ටුවේ සිටියා බොහොම කාලයක් තිස්සේ මරණාසන්නව ඉඳපු, හුඟක් වයස්ගත, සිහිකල්පනාවක් නැති තත්ත්වයට පත්වූ කාන්තාවක්. ඇය ඔවුන්ගේ පරණ සේවිකාවක් බව කිව්වා. ඇයට දිගටම ප්‍රතිකාර ලබා දෙන්නත්, බලාකියා ගන්නත් ඇයව ගෙනියන්න ඕනෑ කියල ඒකට අපෙන් අවසර ඉල්ලා හිටියා. ඉතින් අපි ඒකට අවසර දුන්නා.

ඇය මිය ගිහින්? ඒකෙ පුදුමයක් නෑ. ඇ කොයි මොහොතේ මියයාවිද කියන්න බැරි තරම් මරණාසන්නව හිටියේ

අපේ මීළඟ ඉලක්කය වූයේ වෛද්‍යවරයායි.

'වයස්ගත කාන්තාවක් අසනීපයෙන් ඉන්න බව කියල මාව

http://sherlockholmesinvestigations.blogspot.com

කැඳවාගෙන ගියා. ඇය ඉතාම වියෝවෘද්ධ තැනැත්තියක්. මං බලාගෙන හිටිද්දිමයි ඇගේ පණ ගියේ. ඉන් පස්සේ මම නියමිත පෝරම පුරවලා. මරණ සහතිකය අත්සන් කරලා දුන්නා. මේක ස්වාභාවිකව සිදුවුණු මරණයක්. මෙතන කිසිම අපරාධයක් සිදුනොවුණු බවට මට හොඳටම විශ්වාසයි.'

'මේ ගෙදර මොනව හරි සැක හිතයුතු දෙයක් ඔබට පෙනුණේ නැද්ද?'

'නැහැ. එහෙම සැක හිතන්න කිසිම කාරණාවක් තිබුණේ නැහැ. ඒත් මට ඒ වෙලාවේ සිතට ආව එක් දෙයක්.'

'ඒ මොකක්ද?'

'මේ තරම් විශාල ගෙදරක ජීවත්වුණු, හොඳට වත් පොහොසත්කම් ඇති මේ අයට, ගෙදර වැඩට කිසිම සේවිකාවක් හෝ සේවකයෙක් හිටියේ නැහැ.'

වෛද්‍යවරයාගෙන් අපට දැනගන්නට ලැබුණේ එපමණකි. ඉන්පසු අපි ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලිස් මූලස්ථානය බලා පිටත්ව ගියෙමු.

'බලපත්‍රය ලබාගන්නා එකට නොයෙක් ප්‍රශ්න මතුවුණා. මේ වගේ දෙයකදී ප්‍රමාදයක් ඇතිවෙන එක වළක්වන්න බෑ. මහේස්ත්‍රාත්තුමාගේ අත්සන ලබාගන්න එක කරන්න වෙන්නෙ හෙට උදේ. හෝම්ස් මහත්මයා හෙට උදේ නවය වෙන කොට මෙහාට එන්න. ඔබට ලෙස්ට්‍රේඩ් සමග ගිහින් ඒ වැඩේ ඉවරයක් කරගන්න පුළුවනි.'

රහස් පොලිස් මූලස්ථානයෙන් අපට දැනගැනීමට ලැබුණේ එයයි. එද දවස ගෙවී ගියේ ඒ අයුරෙනි.

ෂර්ලොක් හෝම්ස් කතාබහක යෙදීමට නොරුස්සනා ස්වභාවයෙන් සිටි බැව් මට පෙනී ගියේය. නිදා ගැනීමට නොහැකි තරමට, ඔහුගේ සිත කැළඹීමට පත්වී ඇත. නළෙ රැළි කරගෙන, හාන්සි පුටුවට වී දිගින් දිගටම පයිප්පයක් ඉරූ හෝම්ස්ට, බාධා

Reading Purpose Only. Not For Print

නොකිරීමට මම තීරණය කළෙමි. මෙම අභිරහස සෑම අතකටම පෙරළමින් එය විසඳීමට ඔහු දරන්නේ දැඩි උත්සාහයකි. රාත්‍රියේ කිහිප වරක්ම නිවස තුළ, ඔහු ඒහා මෙහා සක්මන් කළේය. උදෑසන මා අවදි වූ විගස ඔහු මගේ කාමරයට දුව ආවේය. හෝම්ස් මුළු රාත්‍රියම නිදි වර්ජිතව සිටි ඇති බැව් මුහුණෙන් පැහැදිලිවම දිස්විය.

'අවමඟුල් උත්සවය කීයටද? අටට ඉන්ද? දැන් වෙලාව කීයද 7.20 යි. දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ ! දෙයියො මට දීපු මොළේට මොකද වෙලා තියෙන්නෙ වොට්සන්?

ඉක්මන් කරනවා මනුස්සයෝ ඉක්මන් කරනවා ! මේක ජීවිතයත් මරණයත් අතර සටනක් ! මේ වචන කොටත් ඇගේ පණ බේරී තිබීමට ඇත්තේ සියයට එකක් ඉඩක් විතරයි. සියයට අනූ නවයක්ම ඉඩ ඇත්තේ ඇය මියගිහින් ඉන්න. අපි ප්‍රමාද වුණොත් මගේ ආත්මයට, මගේ හෘද සාක්ෂියෙන් නම් කිසිම සමාවක් නෑ.'

මිනිත්තු පහක් ගතවීමටත් පෙර අශ්ව කරත්තයක නැගී අපි බේකර් වීථියෙන් පිටත් වුණෙමු. පියාඹන්නාක් වැනි වේගයෙන් ගමන් කළත් බිග්බෙන් ඔරලෝසුව පසු කරද්දී වෙලාව හතයි තිස්පහ බව මම දුටුවෙමි. බ්‍රික්ස්ටන් පාරේ ගමන් කරද්දී උදේ අටේ කණිසම නාදවෙනු ඇසිණ. නමුත් අප මෙන්ම අනෙක් අයගේද ප්‍රමාදයක් දක්නට ලැබිණ. අට පසුවී මිනිත්තු දහයක් ගතවී තිබුණත්, අවමංගල්‍ය රථය තවමත් නිවසේ දොරකඩ නවත්වා තිබිණ. අපේ කරත්තයේ අශ්වයෝ කටින් පෙණ දමමින් ගමන අවසන් කළහ.

මිනීපෙට්ටිය ඔසවා ගත් තිදෙනෙක් නිවසෙන් එළියට පැමිණියහ. කරත්තයෙන් බිමට පැනගත් හෝම්ස්, ඉදිරියට දිවගියේ ඔවුනට අවහිර කරමිනි.

'ආපහු ගෙනියන්ඩා, ඕක' ඉදිරියෙන්ම පැමිණි මිනිසාගේ පපුවට අත තබා පිටුපසට තල්ලු කරමින් හෝම්ස් කෑගැසුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

'ආපසු ගෙනියනවා වහාම !'

'මොන යක්ෂ කතාවක්ද ඒ ? කෝ ඔහේගෙ බලපත්‍රය? මට ආයෙමත් අහන්න තියෙන්නෙ ඒකයි' පීටර්ස් කෝපයෙන් කෑගැසීය.

'බලපත්‍රය මග එනවා. ඒක එනතුරු මිනීපෙට්ටිය ගේ ඇතුළෙ තබාගත යුතුයි.' හෝම්ස් ගේ විධානයට පෙට්ටිය ඔසවාගෙන ආ මිනිසුන් කීකරු වූ බවක් පෙනිණ. පීටර්ස් වහාම නිවස තුළට දිව ගියේය. මිනීපෙට්ටිය නිවස ඇතුළට ගෙන යන ලදී.

'ඉක්මන් කරන්න වොට්සන් ඉක්මන් කරන්න ! මෙන්න ඉස්කුරුප්පු නියනක්' මිනීපෙට්ටිය මේසය මත තබද්දී හෝම්ස් කෑගැසුවේය.

'මනුස්සයෝ මේ ඉස්කුරුප්පු නියන තමුසෙට ! ගන්නවා ඒක' හෝම්ස් කීවේ අවමංගල්‍ය ශාලාවේ සේවකයාටය.

'පෙට්ටියේ පියන මිනිත්තුවෙන් ඇරියොත් රත්තරන් පවුමක් දෙනවා ! ප්‍රශ්න අහන්න එපා ! වැඩකරන්න. ඉක්මනට, ඉක්මනට, අන්න හරි ! තව ටිකක් තව ටිකක්. හරි දැං උස්සමු, වටෙන්ම ඔක්කොම, ඔක්කොම. හරි පියන ගැළවෙනවා හරි! හරි! තව ටිකයි. අන්න හරි!'

සියලු දෙනාගේ බලවත් උත්සාහයෙන් පියන ඉක්මනින් ගලවා දැමීමට අපට හැකි විය. එසේ කරද්දී මිනීපෙට්ටිය තුළින් නිකුත්වූයේ සිහි මූර්ඡා කරවන පුළු ප්‍රබල රසායනික ගන්ධයකි. මිනීපෙට්ටිය තුළ තිබූ සිරුරේ, මුහුණ වැසෙනසේ කපු පුළුන් තට්ටු කිහිපයක්ම අසුරා තිබිණි. එය හොඳින් පෙඟී යන සේ ක්ලෝරෆෝම් දියරය වත්කොට ඇති බව පෙනිණි. හෝම්ස් වහ වහා ඒ පුළුන් සියල්ල කඩා ඉවත් කළේය.

ප්‍රතිමාවක් මෙන් සුන්දර, මැදිවියේ කාන්තාවකගේ මුහුණ, එතැනින් මතුවිය. ඇගේ ශරීරයට පිටුපසින් අතයැවූ හෝම්ස්

http://sherlockholmesinvestigations.blogspot.com

කදේ උඩු කොටස කෙලින් කලේ, ඇය වාඩිවී සිටින ඉරියව්වට පත්කරමිනි.

'ඈ මියගිහින්ද වොට්සන්? ප්‍රාණය යන්තමින් හරි රැඳිල තියෙනවද? මොනවා? අපි ප්‍රමාද වැඩිවෙන්න බෑ?'

අපි වහාම ප්‍රථමාධාර දීමට පටන් ගත්තෙමු. පැය භාගයක් යනතුරු අප ප්‍රමාද වැඩි බවක් දිස්විය. ක්ලෝරෆෝම් වල ප්‍රබල රසායනික විෂ වාෂ්පය ආඝ්‍රාණය කොට ඈය මෙලොව හැරගොස් ඇති අයුරක් පෙනිණ. අපි කෘතිම ශ්වසනය ලබා දුන්නෙමු: ඖෂධ වර්ග සිරුරට විද්දෙමු: වෛද්‍ය විද්‍යාවේ දන්නා තරම් සියලු හපන්කම් කළෙමු. සෑහෙන වේලාවකට පසු ඇස් පිහාටු වල සෙලවීමක් දැකිය හැකි විය: ශරීරය තුළ ප්‍රාණය රැ දී ඇති බවට ලකුණු පහල වන්නට විය !

වේගයෙන් ආ අශ්ව කරත්තයක් නිවස ඉදිරිපිට නවත්වන ලදී.

'මෙන්න ලෙස්ට්‍රේඩ් එනවා ඔහුගේ බලපත්‍රයත් අරගෙන. ඊරුල්ලා නම් ඉගිලිලා ගිහින් හමාරයි, කියල ඔහුට පේන්නේ. මේ කාන්තාවට සාත්තු සප්පායම් කරන්න අපට වඩා සුදුස්සෙක් මේ එන්නෙ. ශුභ උදෑසනක් ග්‍රීන් මහත්මයා, මං හිතන්නේ අපි හැකි ඉක්මනින් ප්‍රාන්සස් ආර්යාව රෝහලකට ගෙන ගිය තරමට හොඳයි. දැන් ඔහෙලට අවමගුලේ ඉතිරි වැඩ කටයුතු යොදගත් විදියට කරගෙන යන්න පුළුවනි. ඒ අහිංසක වයසක කාන්තාව සමාදානයේ සැතපෙන්න තනියම ගියාවේ.'

* * *

'වොට්සන්, ඔබේ පරීක්ෂණ වාර්තා පොතට මේකත් ඇතුළු කරනවා ද? එසේ නම් එය කළ යුත්තේ, මොනතරම් දැනුවත්, ප්‍රඥාකුල මනසකට වුණත් තාවකාලික සංක්‍රාන්ති කාලයකට මුහුණ දෙන්න වෙන්න ඉඩ තියෙනවා, කියන කරුණ පෙන්වන්නයි'

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් පැවසුවේ එද සැන්දෑවේ බේකර් වීදියේ අපේ නිවහනේදී කථාව අරඹමිනි.

'මෙලොව ජීවත්වෙන ඕනෑම මනුෂ්‍යයෙකු අතින් එවැනි අතපසුවීම්, ප්‍රමාදවීම් සිදුවෙන්න පුළුවනි. ඒවා නිසිලෙස හඳුනාගෙන, අඩුපාඩු නිවැරදි කරගන්නා පුද්ගලයා තමයි අතිදක්ෂයා.

මුළු රෑ තිස්සෙම එක අදහසක් මගේ හිතේ දිගින් දිගටම හොල්මන් කළා වොට්සන්. ඒ තමයි කොයි වෙලාවක හරි, කොතැනක හරි, වැදගත් කෝඩුවාවක්, සුවිශේෂ වාක්‍යයක්, කුමක් හෝ නිරීක්ෂණයක්, මගේ අවධානයට හසුවෙන්න කලින් ගිලිහී ගියා කියන එක. ඉතින් ඒක මගේ මොළේට යළි ඇදගන්න මං ලොකු උත්සාහයක් දැරුවා. අන්තිමට උදේ ඉර පායාගෙන එද්දී ඒ වචන ටික ආපහු මගේ මොළේට වැටුණා. ඒ අර අවමංගල්‍ය අධ්‍යක්ෂක වරුන්ගේ සාප්පුවේ ගැනියගේ කටින් පිටවුණු වදන, පිලිප් ග්‍රීන් අපට ඇවිත් කිව්වෙ:

**.................. දැන් කොයි මොහොතේ හරි ලැබේවි. සාමාන්‍ය එකකට වඩා වෙනස් විදියේ එකක් නිසා ඒකට වැඩි වේලාවක් ගතවුණා'**

'ඇය ඒ කිව්වෙ මිනීපෙට්ටිය ගැනයි. එහෙම කියන එකෙන් අදහස් වෙන්නෙ, මිනීපෙට්ටිය සාමාන්‍ය එකකට වඩා විශේෂ ප්‍රමාණයකට සැදූ නිසයි, යන්න මං තේරුම් ගත්තා. නමුත් ඇයි ඒ? එතකොට මට මතක් වුණා සැහෙන්න ගැඹුරු මිනීපෙට්ටියේ අඩියේ අර කෙට්ටු දිරාපත් මහලු කාන්තාව හිටිහැටි. මේ තරම් කුඩා මළ සිරුරකට මේ තරම් විශාල මිනී පෙට්ටියක් මොකටද? කුමටද මේ හැටි අමතර ඉඩ? තවත් සිරුරකට ! එක මරණ සහතිකයෙන් දෙන්නෙක් මිහිදන් වෙනවා. ඒ කාරණය කලින් මගේ හිතට හරියට නොවැටුණාට ඒක පැහැදිලිව දැකිය යුතුව තිබුණා. ෆ්‍රාන්සස් කාෆැක්ස් ආර්යාව උදේ අටට භූමදානයට සූදානම් තිබුණා. අපට තිබුණු එකම අවස්ථාව, මිනීපෙට්ටිය ගෙදරින් පිටත් වෙන්න කලින් එයට අවහිර කිරීමයි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇගේ හොඳ වෙලාවක් තිබිල තියෙනවා. ප්‍රාන්සස් ආර්යාව පණපිටින් සිටියදී අපට බේරාගැනීමට හැකිවුණේ ඒ හොඳ වෙලාවට. ඔවුන් ඇයව වළ දැම්මා නම්, මරණය සිදුවුණේ කොහොමද කියල පසුව සොයාගැනීම පවා අපහසු වෙනවා. මිනිය නැවත ගොඩ අරගෙන, මරණ පරීක්ෂණයක් කළත් ඔවුනට ගැලවෙන්න ඉඩක් තිබුණා. ඔවුන් ප්‍රාන්සස් ආර්යාව හංගාගෙන ඉන්න ඇත්තෙ අර ගෙදර උඩතට්ටුවේ. බලෙන් ක්ලෝරපෝම් අල්ලලා ඇයව සිහිනැති කරලා, ඊට පස්සෙ පෙට්ටියේ දමලා, වැඩි ප්‍රවේශමට එම බෙහෙත් වලින් පෙඟවූ පුළුන් මුහුණ උඩින් අතුරලා, පෙට්ටියේ පියන සවිකළා. බොහොම සූක්ෂම උපක්‍රමයක්. අපරාධ පරීක්ෂණ ඉතිහාසයේ මට නං මේක අලුත් දෙයක්. අපේ හිටපු දේවගැතිතුමා, ලෙස්ට්‍රේඩ්ට අහුනොවී පැන ගියොත්, ඉදිරි කාලයේදී ඔහුගේ නොයෙක් වෘත්තීය හපන්කම් අහන්න ලැබේවි කියල මම බලාපොරොත්තු වෙනවා'

**"අතුරුදහන් වූ සිටුවරිය" සමාප්තයි.**

http://sherlockholmesinvestigations.blogspot.com

# රන් උපැස් යුවළ

1894 වසරේදී ෂර්ලොක් හෝම්ස්ට විසඳීමට ලැබුණු පරීක්ෂණ සංඛ්‍යාව ඉතා විශාලය. ඔබට පැවසීමට කථාවක් තෝරා ගැනීමේ අදහසින් මම ඒ විස්තර අඩංගු ලිපි ගොනුව, පෙරළා බැලුවෙමි. එය ඉතා අපහසු කාරියක් බව මට පෙනී ගියේය. පිළිකුල් සහගත රතු කුඩැල්ලා පිළිබඳ පරීක්ෂණය, බැංකු නිලධාරී ක්‍රොස්බිගේ ඛේදජනක මරණය, ඇඩ්ල්ටන් ඛේද වාචකය, ස්මිත්-මෝටිමර් නඩු විභාගය, ඉන් සමහරකි.

'මාවතේ ඝාතකයා' ලෙස හැඳින්වුණු ප්‍රංශයේ හියුරේ නම් අපරාධකරුවා සොයාගෙන, ඔහුව අත් අඩංගුවට ගැනීමට හෝම්ස් සමත් වූයේ මේ කාලයේදීය. ඒ වෙනුවෙන් ප්‍රංශයේ ජනාධිපති ගෞරව ආචාර සම්මානය හෝම්ස්ට හිමි විය. ඔහු කළ විශිෂ්ට සේවය අගයමින් හා ඔහුට තම හෘදයාංගම ස්තූතිය පුදකරමින් ප්‍රංශ ජනාධිපතිතුමා හෝම්ස් වෙත ලිපියක්ද එව්වේය. මේ සියල්ලම රසවත් කථා බව සැබෑය. එහෙත් තරුණ විලෝබි ස්මිත් මරණයට පත්වූ යොක්ස්ලි ඕල්ඩ් මන්දිරයේ අබිරහස පාඨකයන්ගේ සිත් ඇදගැනීමට සමත් වේ යයි මම විශ්වාස කරමි.

ඒ නොවැම්බර් මාසයේ අග භාගයයි. දවස පුරාම පැවැතියේ දරුණු කුණාටු සමග මහ වැහි ඇදහැළුණු අයහපත් කාලගුණයකි. හෝම්ස් තමා වෙතට ලැබුණු, පෞරාණික ද්විත්ව ලේඛිත ලියවිල්ලක් ප්‍රබල කාචයක් ආධාරයෙන් පරීක්ෂා කරමින් සිටියේය. ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ සඟරාවක පළවූ අලුත්ම ලිපියක් කියවමින් මම කාලය ගත කළෙමි. වේගයෙන් හමන සුළිසුළඟ මහ හඬක් නංවමින් බේකර් වීදිය හරහා හමා ගියේය. අසුනෙන් නැගිට, ජනේලය වෙත ගොස් මම මහමඟ දෙස බලා සිටියෙමි.

මහවැසි වලින් ඇදහැළුණු ජලයෙන් පාර සම්පූර්ණයෙන්ම මඩවී ඇත. ඔක්ස්ෆර්ඩ් වීථිය පැත්තේ සිට අශ්ව කරත්තයක් මඩ වතුර දෙපසට විහිදුවමින් ඉදිරියට ඇදේ.

Reading Purpose Only. Not For Print

'අද අපට එළියේ රාජකාරියකට යන්න නොතිබුණේ හොඳ වෙලාවට, ගේද වොට්සන්' හෝම්ස් පැවසුවේ අත තිබූ කාව්‍ය හා ලියවිල්ල පසෙකින් තබමිනි.

'මං දැන් පැහෙන වෙලාවක් මේ වැඩේ කළා. ඇස් දෙකට හරි වෙහෙසක් ගෙන දෙන වැඩක්. මට පේනෙන හැටියට නං මේක පහලොස් වැනි සියවසේ අග භාගයේ ඇබේ අතින් ලියැවුණු ලියැවිල්ලක්...... හා හා ! ...... ඒ මොකක්ද?'

සුළිසුළඟින් නැගෙන ශබ්දය පරයමින් නැගී ආවේ අශ්ව කරත්තයක් අප නිවස ඉදිරියේ නවත්වන හඬයි. එය, මා කලින් දුටු අශ්ව කරත්තය විය යුතුය. කිසිවකු රියෙන් බසිනු ජනෙල් වීදුරුව තුළින් මම දුටුවෙමි.

'මොකක්ද දන්නෙ නෑ උවමනාව?' මම හෝම්ස්ගෙන් ඇසීමි.

'උවමනාව? ඔහුට අපිවයි උවමනා වෙලා තියෙන්නෙ වොට්සන්. අපට සුදනම් කරගන්න වෙනවා වැහිකබා ආදී මේ අයහපත් කාලගුණයෙන් ආරක්ෂාවීමට ඕන උපකරණ සියල්ලක්ම.......ඔහොම් පොඩ්ඩක් ඉන්න බලන්න... ආ .......කුලීරිය පිටත්වෙලා ගියා. අපිව එක්කගෙන යන්න ඕනෙ නම් ඔහු රථය රඳවා ගන්නවා නිසැකයි. හොඳ මනුස්සයා වගේ පහළට දුවලා දොර අරින්න වොට්සන්. ගෙදර මිනිස්සු ඔක්කොම හොඳටම නිදි ඇති'

මැදියම් රැයේ අප හමුවට ආ අමුත්තා හඳුනා ගැනීම මට අපහසු නොවීය. ඒ ස්ටැන්ලි හොප්කින්ස් නම් තරුණ රහස් පරීක්ෂකයායි. ඔහුගේ අපරාධ පරීක්ෂණ වැඩ කටයුතු හෝම්ස්ගේ අවධානයට කිහිප වාරයක්ම ලක්වූ බව මට මතක තිබිණ.

'ඔහු ගෙදර ඉන්නවාද?' හොප්කින්ස් ඇසුවේ නොඉවසිල්ලෙනි.

'උඩට එන්න මහත්මයා....... මේ වගේ රාත්‍රියක අපව එළියට කැඳවාගෙන යන්න ඔබේ බලාපොරොත්තුවක් නැතුව ඇති කියලයි මං හිතන්නේ?'

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් ශබ්ද නගා කීවේ උච්ච හට්ටුවේ සිටයි.

රහස් පරීක්ෂකයා අපේ විසිත්ත කාමරයට පැමිණ, වැහිකබාය ඉවත්කරද්දී හෝම්ස් ගිනි උදුනට තවත් දර කෑබලි කිහිපයක් එකතු කළේය.

'මගේ හිතවත් හොප්කින්ස්. ඔබේ දෙපා ගිනි උදුනට ළං කරලා ටිකක් උණුසුම් කරගන්න. අපේ දොස්තර මහත්තයගේ ළඟ තියෙනවා, මේ වගේ සීතල රාත්‍රී වලට මහාද බෙහෙතක්. උණු වතුර මිශ්‍රකළ දෙහි යුෂ. මේ තරම් දරුණු වැහි කුණාටුවක් හමද්දී ඔබ මා හමුවෙන්න ආවෙ, මොකක්ද හරි ලොකු ගැටළුවක් ඇතිවෙලා වෙන්න ඇති?'

'ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. අද හවස් වරුවම මං ගතකළේ හරිම අවිවේකයෙන්. අර යොක්ස්ලි සිද්ධිය ගැන පත්තරේ පළවුණා ඔබ දැක්කද?'

'අද දවසෙ නම් මම පහළොස්වැනි සියවසෙන් මෙහා පැත්තෙ මොකුත් දැක්කෙ නෑ'

'පත්තරේ ඒක ගැන තිබුණේ කෙටි ඡේදයක් පමණයි. ඒවත් ඔක්කොම වැරදි තොරතුරු. ඒ නිසා ඔබට මොකුත් පාඩුවක් වෙලා නෑ. මමත් කාලය නාස්ති කරමින් හිටියේ නෑ. මේ වැඩේට මං සැහෙන්න මහන්සි වුණා. සිද්ධිය වෙලා තියෙන්නේ කෙන්ට් ප්‍රාන්තයේ. චැතැම් වල ඉඳලත් හැතැම්ම හතක් තියෙනවා හෝම්ස් මහත්තයා. දුම්රිය මාර්ගයෙ ඉඳලා හැතැම්ම තුනයි. විදුලි පුවතකින් මට පණිවුඩය ලැබෙන කොට සවස තුනයි කාලයි. එහෙට ගියා හවස පහ වෙනකොට. මගේ පරීක්ෂණයත් පවත්වලා, අන්තිම කෝච්චියෙන් ඇවිත් චාරිංක්‍රොස් දුම්රිය පොළෙන් බැස්සා. ඒ පාර කෙළින්ම ආවේ ඔබ ළඟට'

'ඒකෙන් අදහස් වෙන්නේ ඔබටත් මේක ඒ හැටි පැහැදිලි නැති බවයි?'

'මට මේකෙ අගක් මුලක් මොකුත් තේරුම් ගන්න බැහැ

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් මහත්තයා. මුලින් බැලූබැල්මට පෙනුණේ, මේක වැරැදීමක් සිදුවිය නොහැකි, සරල සිදුවීමක් වගේ. නමුත් දැන් මට පෙනෙන හැටියට මේක මහා අවුල් ජාලයක්. මේ මිනීමැරුම සිදු කිරීමට ඇයි කාටත් උවමනා වුණේ? අන්න ඒක තමා මට හොයා ගන්න බැරි. මනුස්සයෙක් මැරිලා ඉන්නවා. ඇයි මේ මිනිහව මරා දමන්න කාට හරි අවශ්‍ය වුණේ?'

සුරුට්ටුවක් දල්වා ගත් හෝම්ස්, හ්‍රාන්සි පුටුවේ හරිබරි ගැහී ඉඳගත්තේය.

'කියන්නකෝ බලන්න ඔබේ විස්තරේ'

'මේ සිද්ධිය වෙලා තියෙන්නේ යොක්ස්ලි ඕල්ඩ් කියන පෞරාණික වලව්වේ. අවුරුදු ගණනකට කලින් මහාචාර්ය කොරාම් කියන නැතැත්තා මේ මැදුර මිළට ගත්තා. ඔහු බොහොම වයස්ගත, අබල දුබල කෙනෙක්. දවසෙන් බාගයක්ම ගත කරන්නේ ඇඳේ. අනෙක් වෙලාවට හැරමිටියක් ගහමින් මිදුලේ ටිකක් ඇවිදිනවා. නැත්නම් රෝද පුටුවෙන් එහා මෙහා යනවා. රෝද පුටුව තල්ලු කරන්නේ ගෙවත්ත බලාගන්න ඉන්න සේවකයා. මේ පැත්තේ අසල්වාසීන් කිප දෙනෙක්ම මේ ගෙදරට ඇවිත් තියෙනවා. ඔවුන් කියන්නේ මහාචාර්ය කොරාම් ඔවුන්ගේ සිත් ඇදගැනීමට සමත් වූ පුද්ගලයෙක් බවයි. ඔහු හොඳ උගතෙක් බවත් අහන්න ලැබුණා.

ගෙදර වැඩ කටයුතු බලාකියාගන්න සේවිකාවන් දෙදෙනෙක් ඉන්නවා. ගෘහ පාලිකාව වයස්ගත කාන්තාවක්. ඇය තමා මාකර් මහත්මිය. ඊළඟට ගෘහසේවිකාව, සුසන් ටාල්ටන් මෙනෙවිය. මේ දෙදෙනාම හොඳ චරිත ඇති වැදගත් අය. මහාචාර්යතුමා මේ නිවස මිළයට අරගෙන පදිංචියට ආව කාලේ ඉඳලම ඔවුන් මේ ගෙදර සේවය කරලා තියෙනවා.

මහාචාර්යතුමා ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලියමිනුයි සිටින්නෙ. ඒ නිසා අවුරුද්දකට පමණ කලින් ඔහුට උවමනා වුණා ලේකම් වරයෙක් බඳවාගන්න. මුලින් බඳවා ගනිපු දෙදෙනාම සාර්ථක

http://sherlockholmesinvestigations.blogspot.com

වුණේ නැහැ. නමුත් මේ තුන්වැන්නා, විලෝබි ස්මිත් මහාචාර්යතුමාට උවමනා කාලෙම කෙනෙක්. මෑතක දී විශ්වවිද්‍යාලයෙන් පිටවී ඇති ඔහු, ලාබාල තරුණයෙක්. ඔහු උදේ වරුව සම්පූර්ණයෙන්ම ගතකළේ මහාචාර්යතුමා කියන දේවල් සටහන් කර ගනිමින්. ඊළඟ දවසේ කිරීමට ඇති වැඩකටයුතු වලට අදාල කොටස්, පොත් වලින් විමර්ශනය කිරීමට, ඔහු හවස් වරුව යෙදෙව්වා. මේ විලෝබි ස්මිත් තරුණයාගේ කිසිම වැරැද්දක්, අඩු පාඩුවක් හෝ දුර්වල කමක් මට හොයාගන්න බැරිවුණා. අපි-හැම් ප්‍රදේශයේ පාසල් සිසුවෙක් හැටියටත් කේම්බ්‍රිජ් සරසවියේ, සරසවි සිසුවෙක් හැටියටත්, ඔහු බොහොම හොඳට හැසිරී ඇති තරුණයෙක්. ඒ වගේම බොහොම මහන්සිවී උනන්දුවෙන් ඉගෙනීමේ කටයුතු කරපු කෙනෙක්. නමුත් මෙන්න මේ වැදුගත්, අහිංසක තරුණයා තමයි අද උදේ පාන්දර මහාචාර්යතුමාගේ කන්තෝරු කාමරයේදී මරණයට පත්වෙලා තිබෙන්නේ. දකින්න තිබෙන සාක්ෂි අනුව මේක මිනීමැරීමක් මිස වෙන අමාකස්වක් වෙන්න බෑ.'

වේගයෙන් හමා ආ කුණාටුව මහා හඬක් නංවමින් බේකර් වීදිය දෙදරවමින් හමා ගියේය. අපි ගිනි උදුනට තවත් ළංවී පොලිස් නිලධරයාගේ සුවිශේෂ කථාන්තරයට ඉතා උනන්දුවෙන් සවන් දුන්නෙමු.

'පිටත ලෝකය සමඟ කිසිම සම්බන්ධයක් නැතිව, ගෙදර සියළුම කටයුතු සිද්ධවෙන මේ වගේ ගෙයක්, මුළු එංගලන්තයේම හොයල බැලුවත් ඔබට හම්බවේවි කියල මං හිතන්නෙ නෑ. සති ගණන් ගෙවිල යාවි: ඒත් ගේට්ටුවෙන් එළියට එන්න කිසි කෙනෙකුට උවමනාවක් නෑ. මහාචාර්යතුමා තමන්ගේ ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතු වල ඇලීගැලී ඉන්නා කෙනෙක්. ඔහුට එතනින් එහා ලෝකයක් නෑ. ස්මිත් තරුණයා අසල් වැසියන් කිසිකෙනෙකු සමග හැඳිනීමක් තිබුණේ නැහැ. ඔහු ජීවත් වුණේත් මහාචාර්යතුමා වගේමයි කියල කියන්න පුළුවනි. ගෑනු දෙන්නාටත් ගෙදරින් පිටට යන්න කොහෙත්ම උවමනාවක් නෑ. උද්‍යානයෙ වැඩ කටයුතු භාරව ඉන්නේ මෝටිමර්. ඔහු ක්‍රිමියානු යුද්ධයේදී සටන් වැදී, දැන් යුද්ධ හමුදාවෙන් විශ්‍රාම අරගෙන ඉන්න කෙනෙක්. මෝටිමර්

http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම හොඳ චරිතයක් ඇති කෙනෙක්. ඔහු තමා මහාචාර්ය තුමා රෝද පුටුවේ තියලා, එහේ මෙහේ ගෙනියන්නෙ. ඔහු ජීවත් වෙන්නේ මැදුරේ නොමෙයි. ඔහු ඉන්නේ උද්‍යානය කෙළවරේ තිබෙන කාමර තුනක කුඩා ගෙයක. යොක්ස්ලි ඕල්ඩ් මැදුරේ ඉන්නේ මේ කට්ටිය පමණයි.

තවත් කිවයුතු කරුණක් තිබෙනවා. ගෙදර උද්‍යානය ඉදිරිපිට ගේට්ටුව තිබෙන්නේ, ලන්ඩන් සිට චැතැම් දක්වා යන ප්‍රධාන පාරට මුහුණ දීල, එහි සිට යාර සියයක් පමණ දුරින්. ගේට්ටුව වසා තිබීම සඳහා ඇත්තේ නිකං කොක්කක් පමණයි. ගේට්ටුව තමන්ම ඇරගෙන, ඇතුළුවෙන්න හෝ පිටවෙන්න ඕනෑම කෙනෙකුට පුළුවනි. මේ සිද්ධිය ගැන වැදගත් යමක් කියැවුණේ සුසාන් ටාල්ටන් ගෙන් පමණයි. ඇගේ කට උත්තරය මං ඔබට කියවන්නම්.

'එතකොට වෙලාව දවල් එකොළහමාරත් දොළහටත් අතරේ වෙන්න ඕන. මං උඩ තට්ටුවේ නිදන කාමරයක අලුත් ජනෙල් රෙදි එල්ලමින්නුයි හිටියෙ. මහාචාර්යතුමා ඒ වෙනකොටත් හිටියෙ ඇඳේ. කාලගුණය අයහපත් දවස්වලට, ඔහු හොඳටම දවල් වෙනකං ඇඳෙන් බහින්නෙ නෑ. මාකර් මහත්මිය ගෙයි පිටිපස්සා පැත්තේ මොකක් හෝ වැඩක යෙදිලා හිටියා. විලෝබි ස්මිත් හිටියේ ඔහුගේ නිදන කාමරයෙයි. මේ වෙලාවෙ ඔහු කාමරයෙන් පිටවෙලා, පැසේජ්ය දිගේ ඇවිද ගෙන යන අඩි ශබ්දයත්, ඊළඟට තරප්පුව බැහැලා ගිහින් කන්තෝරු කාමරයට ඇතුළු වෙනවාත් මට ඇහුණා. මං ඔහුව දැක්කේ නෑ. නමුත් ඔහුගේ ඉක්මන්, ඒ වගේම තදින් අඩිය තබලා යන හඬ මට වරදින්න විදියක් නෑ. ඔහු කන්තෝරු කාමරයේ දොර වහන ශබ්දයක් නම් මට ඇහුණෙ නෑ. ඔහු ගිහින් මිනිත්තුවකට වගේ පස්සෙ මහා හඬින් කළ කෑ ගැසීමේ ශබ්දයක් ඇහුණා. ඒක මහා අස්වාභාවික විදියෙ, බිහිසුණු විලාප හඬක්. එය පිටවුණේ, මිනිහෙකුගේ උගුරෙන්ද, ගැහැනියකගේ උගුරෙන්ද කියන්න බැරි විදියේ නොපැහැදිලි හඬක්. කෑගැසීම අවසන් වුණු ගමන්ම, මහහඬින් කිසිවෙකු බිම ඇදවැටෙනවා වගේ ශබ්දයකුත් ඇහුණා. ඒ හඬට මුළු ගේම

http://sherlockholmesinvestigations.blogspot.com

දෙදරලා යන්න ඇති. ඊට පස්සේ ඇතිවුණේ සම්පූර්ණ නිශ්ශබ්දතාවයක්.

මේ ශබ්ද වලින් මාව භීතියෙන් ගල් ගැහුණා. මොහොතක් එහෙම ඉඳපු මම, හිතට ධෛර්යය අරගෙන ඉක්මනට පහළ තට්ටුවට දුවලා ගියා. කන්තෝරු කාමරයේ දොර වසා තිබුණා. මං දොර ඇරියා. විලෝබි ස්මිත් බිම වැටිලා හිටියා. ඔහුට තුවාල සිදුවුණු බවක් මට මුලින් පෙනුණේ නැහැ. ඉතින් මං ඔහුව නැගිට්ටවන්න උත්සාහ කළා. එතකොටයි මම දැක්කෙ, ඔහුගේ බෙල්ලේ යටිපැත්තෙන් ලේ ගලාගෙන යන බව. බොහොම පුංචි තුවාලයක් තිබුණේ. නමුත් හුඟක් ලේ ගැලුවා. ඔහුට තුවාල සිදුවුණු ආයුධය බුමුතුරුණ මත තිබුණා. ඒක මහාචාර්යතුමාගෙ මේසය මත තිබුණු, ලාකඩ මුද්‍රා තැබීමට ගන්නා, ශක්තිමත් තලයක් හා ඇත්දත් මිටක් සහිත පිහියක්.

මට මුලින් හිතුණේ ඔහු මියගිහින් කියලයි. මේසය උඩ තිබුණු වතුර ඩිකැන්ටරයෙන් , වතුර ටිකක් මං ඔහුගේ මුහුණට ඉස්සා. එතකොට දෑස් ඇරල බැලූ ඔහුගේ තොලින්, වචන කිහිපයක් පිටවුණා. ඔහු කිව්වේ 'මහාචාර්යතුමා.......ඒ ඇය' මට දිවුරන්න පිළිවන්. ස්මිත්ගෙ කටින් පිටවුණේ ඒ වචන පමණයි. තවත් මොනවා හරි කියන්න ඔහු ලොකු උත්සාහයක් දැරුවා. නමුත් කටින් ශබ්දය පිටවුණේ නැහැ. ඔහු දකුණු අත ඉහළට එසෙව්වා. ඒ සමගම හිස පැත්තකට කුඩාා වැටුණා. ඒ මොහොතේ ස්මිත් මියගිය බව මට තේරුණා'

සුසාන් ටාල්ටන් දැකපු තුවාලය බොහොම කුඩා එකක් හෝම්ස් මහත්තයා. නමුත් ඒ පිහි පහරින් හිසට ලේ ගෙනයන ශිර්ෂපෝෂී ධමනිය දෙකට වෙන්වී තිබුණා.

මේ වෙනකොට මාකර් මහත්මියත් මෙතැනට දුව ඇවිත් තිබුණා. නමුත් විලෝබි ස්මිත් මියයන මොහොතේ කිව් වචන අහන්න ඇය ප්‍රමාද වුණා වැඩියි. මළසිරුර ළඟ සුසාන් සිටියදී, මාකර් මහත්මිය මහාචාර්යතුමාගේ කාමරයට දිවගියා. එවිට ඔහු ඇඳ උඩ වාඩිවෙලයි හිටියේ. ඇහුණු ශබ්දය නිසා ඔහු

Reading Purpose Only, Not For Print

බොහොම කලබලයට පත්වෙලා හිටියේ. එහි පුදුමයක් නෑ. බිහිසුණු විලාප හඬින් මොනවා හරි දරුණු දෙයක් සිදුවී ඇති බව ඔහුට හිතෙන්න ඇති. මේ වන විටත් මහාචාර්යතුමා ඔහුගේ ඇට අඳින ඇඳුම් පිටින්මයි හිටියේ කියල ගෘහ පාලිකාව දිවුරන්න සූදානම්. ඇත්තෙන්ම මෝටිමර්ගේ උදව් නැතුව, මහාචාර්යතුමාට ඇඳුම් මාරු කරගැනීමට හැකියාවක් නෑ. අනෙක මෝටිමර්ට ඒ සඳහා දවල් දොළහට එන්න කියලයි දැනුම් දීල තිබුණේ.

මහාචාර්යතුමා කියා හිටිනවා ඔහුව කෑගැසීමේ ශබ්දය ඈතින් වගේ ඇහුණු බව. ඒ හැරෙන්න ඔහු මොකුත්ම දන්නෙ නැතිලු. ස්මිත්ගෙ කටින් අවසන් මොහොතේ පිටවුණු වචන: 'මහාචාර්යතුමා......ඒ ඇය' කියන වචනෙන් අදහස් කලේ මොකක්ද කියන එක මහාචාර්යතුමාටත් තේරුම් ගන්න බැරිලු. ඔහු කියන්නේ එය අවසන් මොහොතේ මරුවිකල්ලෙන් කියැවුණු දෙයක් වෙන්න ඇති කියලයි. විලෝබි ස්මිත්ට මෙලොව කිසි හතුරෙක් ඇතියි කියල ඔහුට හිතන්නවත් අමාරුලු. ඔහු වහාම මෝටිමර් අතේ පොලීසියට පණිවුඩයක් එවා තිබුණා. එතැනින් තමා මට දැන්නුවේ. සිද්ධිය වුණු තැනින් කිසිම දෙයක් එහා මෙහා කරන්න එපා කියලත්, ගෙවත්තට ඇතුළු වෙන, පිටවෙන අඩි පාරවල කාටවත් ගමන් කරන්න ඉඩ දෙන්න එපා කියලත් මං විශේෂයෙන් උපදෙස් දුන්නා. ඔබේ අපරාධ පරීක්ෂණ සිද්ධාන්ත ක්‍රියාවට නාගන්න මේක හොඳ අවස්ථාවක් හෝම්ස් මහත්තයා. ඕන කරන හැමදේම තිබෙනවා, කිසිම අඩුපාඩුවක් නැතිව'

'අඩුපාඩුව ෂර්ලොක් හෝම්ස් පමණයි. එහෙම නේද?' මගේ මිත්‍රයා පැවසුවේ බලාපොරොත්තු කඩවූ සිනාවක් මුහුණට නගා ගනිමිනි.

'ඉතින් ඔබ මොකද කලේ? ඒ ටිකත් කියන්න බලන්න'

'මේ සැලැස්ම දිහා බලන්න හෝම්ස් මහත්මයා' ස්ටැන්ලි හොප්කින්ස් කඩදාසියක් දිග හැරියේය. මවිසින් මෙහි පළකොට ඇති සිතියම එයයි.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print




යොක්ස්ලි ඕල්ඩ් මැදුරේ සිද්ධියට අදාල කොටසේ දළ සැලැස්මක්

http://sherlockholmesinvestigations.blogspot.com

'මේ යොක්ස්ලි ඕල්ඩ් මැදුරේ, සිද්ධියට අදාල කොටසේ දළ සැලැස්මක්. මහාචාර්යතුමා ගේ කන්තෝරු කාමරයේ පිහිටීම ගැන මේකෙන් ඔබට හිතාගන්න පුළුවන් වේවි. මං මේකෙ අඩංගු කලේ අපට අත්‍යාවශ්‍යම තැන් විතරයි. ඉතිරි සියල්ල ඔබටම පසුව බලාගන්න පුළුවන් වේවි.

හොඳයි මිනීමරුවා පිටතින් ගෙට ඇතුළු වූ කෙනෙක් නම් කොහොමද ඔහු හෝ ඇය ඇතුලට ආවේ? කිසිම සැකයක් නෑ ඔහු එන්න ඇත්තෙ උද්‍යානය හරහා වැටුණු අඩිපාර දිගේ ඇවිත් පිටුපස දොරෙන් . ඇයි එතැනින් කෙළින්ම කන්තෝරු කාමරයට ඇතුළු වෙන්න පුළුවන්. වෙනිං මාර්ගයක් තෝරා ගනීවි කියල හිතන්න බෑ. ඒ මොකද ඒවා බොහොම සංකීර්ණයි. ඊළඟට කොතනින්ද ඔහු පැනගියේ? නිසැකවම ආපු පාරෙන්. ඒ මොකද කාමරෙන් පිටවෙන්න තිබෙන අනෙක් දොරටු දෙකෙන් එකක් පහළට දුවගෙන ආපු සූසාන් ටාල්ටන් ගෙන් අවහිර වෙලා. අනෙක් මාර්ගය කෙලින්ම යන්නෙ මහාචාර්යතුමාගෙ නිදන කාමරයට. ඉතින් මං මොකද කලේ, උද්‍යානය මැදින් වැටී තිබුණු අඩිපාරට මගේ අවධානය යොමු කළා. වැස්සෙන්, පස බොහොම තෙත බරිත ගතියට පත්වී තිබුණු නිසා, මං බලාපොරොත්තු වුණා අඩි සටහන් දැකීමට.

මේ පරීක්ෂණයේ එක කරුණක් මට හොඳින් පැහැදිලි වුණා. ඒ තමයි, අපට තරඟකරන්න වෙලා තිබෙන්නේ බොහොම ප්‍රවේශමින් වැඩකරන, පළපුරුදු අපරාධකාරයෙක් සමග බව. පස් මත කිසිම අඩි සටහනක් නැහැ. ඒත් තණකොළ මතින් කවුරු හරි ගමන් කරල තියෙනවා. ඒ ගැන කිසිම සැකයක් නෑ. හිතාමතාම එහෙම කරන්න ඇත්තේ අඩි සටහන් සලකුණු වීම වලක්වන්න. වැස්ස පටන්ගත්තෙ රෑ. උයන්පල්ලාවත් වෙන කවුරුවත් උදේ වරුවෙ මේ ගෙදරට ආවෙ නැහැ. ඒ නිසා තණකොළ උඩින් ගමන් කරන්න ඇත්තෙ මිනීමරුවා විය යුතුයි'

'පොඩ්ඩක් ඉන්නූ, මේ අඩිපාර කොහේටද වැටෙන්නෙ?' හෝම්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com



164. "අඩි සටහන් විශාල ඒවාද කුඩා ඒවාද?"

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only. Not For Print

'ප්‍රධාන පාරට'

' එය කොයිතරම් දුරද?'

'යාර සියයක් පමණ'

'හොඳයි මේ අඩි පාර ගේට්ටුව හරහා වැටී ඇති හරියේ ඔබට අඩි සටහන් දකින්න ලැබෙන්න ඇති නේ?'

'අවාසනාවකට වගේ, ඒ හරියේ බිම ඔක්කොම ගඩොල් අල්ලලා'

'එතකොට මහපාර ළඟ?'

'එතන ඔක්කොම මඩ ගොහොරුවක් වෙලා'

'ෂෑ ෂෑ හොඳයි, මේ තණකොළ මත තිබුණු අඩි සටහන් ගේ පැත්තට ගිය ඒවාද ආපසු ආව ඒවාද?'

'ඒක කියන්න අමාරුයි. ඒවා ඒ තරමට නොපැහැදිලියි.'

'අඩි සටහන් විශාල ඒවාද කුඩා ඒවාද?'

'ඒකත් කියන්න බෑ'

නොඉවසිලිමත් භාවය හැඟවෙන ශබ්දයක් හෝම්ස්ගේ මුවෙන් පිටවිය. ඔහු කථා කිරීමට පටන් ගත්තේ බලාපොරොත්තු කඩවූ අයුරෙනි.

'ඊට පස්සේ මහා ධාරානිපාත වැස්සයි කුණාටුවයි නේ. දැන් ඉතින් අඩි සටහන් හඳුනාගන්න එක මගේ අර පෞරාණික ද්විත්ව සටහන් පත කියවනවටත් වඩා අමාරු වේවි. ඒත් මොනවා කරන්නද? ඉතින් හොප්කින්ස්, මොකක්වත් හරිහැටි හොයාගන්න බැරි බව දැනගත්තාම ඔබ මොකද කළේ?'

'මං හිතන්නේ මං පැහැදෙන තරම් දේවල් හරිහැටි හොයා ගත්තා හෝම්ස් මහත්මයා. කවුරු හරි ප්‍රවේශමෙන් ඇවිත් ගෙට ඇතුළුවී ඇති බව මං හොයාගත්තා නේ. ඊළඟට මං පැසේජය

පරීක්ෂා කළා. එහි බිමට පොල් කෝහුවලින් සැදූ ලණු පැදුරක් එළලයි තියෙන්නෙ. ඒකෙ මොකුත්ම අඩි සටහනකන් වදින්නෙ නෑ. ඊට පස්සෙ මං ගියේ කන්තෝරු කාමරයට. ඒකෙ ඒ හැටි ලී බඩු මොකුත් නැහැ. ප්‍රධාන දේ තමයි විශාල ලියන මේසය. ඒකෙ දෙපැත්තේ විශාල ලාච්චු පේළි දෙකක් තිබෙනවා. ඒ දෙකට මැදින් පොඩි අල්මාරි කැල්ලක් තිබෙනවා. ලාච්චු යතුරු දමලා නැහැ. නමුත් අල්මාරිය යතුරු දමලයි තියෙන්නෙ. වටිනා යමක් නොතබන නිසා ලාච්චු යතුරු දමා තියන්නෙ නැති බව දැනගන්න ලැබුණා. අල්මාරිය කොටසේ යම්කිසි වැදගත් කමක් ඇති ලියවිලි තිබුණත් ඒවා කිසිවක් ඇදපු බවට ලකුණක් නෑ. කිසිම දෙයක් සොරා ගෙන නොමැති බවට මහාචාර්යතුමා සහතික කරනවා. මෙතන මොකුත් හොරකමක් වෙලා නැති බව නම් විශ්වාසයි.

ඊළඟට මම කියන්න ඕන තරුණයාගෙ මළසිරුර ගැන. එය තිබුණේ ලියන මේසයට තුඩුරින්, එහි වම් පැත්තට වෙන්න: මේ සැලැස්මේ ලකුණු කරල තිබෙන ආකාරයට. පිහියෙන් ඇනපු තුවාලය තිබුණේ බෙල්ලේ දකුණු පැත්තේ, පිටුපස සිට ඉදිරියට. මේ වගේ තුවාලයක් තමා විසින්ම සිදුකර ගැනීමට ඉතාම අපහසුයි'

'ඔහු පිහිය උඩට ඇද වැටුණේ නැතිනම්' හෝම්ස් කීය.

'අන්න හරි. මගේ හිතටත් ඒ අදහස එක සැරයක් ආවා. නමුත් පිහිය තිබුණේ මළසිරුරට අඩි ගණනක් දුරින්. ඒ නිසා ඒ විදියට සිද්ධ වුණා කියල හිතන්න අමාරුයි. ඊළඟට ඔහු මියයන වෙලාවෙ කිව් වචන ගැනත් අමතක කරන්න බෑ. දැන් මෙන්න බලන්න ඉතාමත් වැදගත් සාක්ෂියක්: මියගිය තරුණයා දකුණු අතේ මිට මොළවාගෙන තිබිලා මට හමුවුණා'

ස්ටැන්ලි හොප්කින්ස් තම සාක්කුවෙන් කුඩා කඩදසි බෑගයක් ඉවතට ගත්තේය. එය විවෘත කළ ඔහු, අපට ඉදිරිපත් කළේ රන්වන් රාමුවක් සහිත උපැස්යුවළකි. එය නිසට තබා තදින් බැඳ තැබීමට යොදගත්, කළු පැහැති සේද නූලක බැඳ තිබුණි.

දෙකක් උපැස් යුවළ දෙකෙලවර රැඳී තිබිණි.

'විලෝබි ස්මිත්ට ඉතාම හොඳ ඇස් පෙනීමක් තිබුණා. ඒ නිසා මේක මිනීමරුවාගේ මුහුණෙන් උදුරාගත් එකක් බවට කිසිම සැකයක් නෑ'

උපැස් යුවළ අතට ගත් හෝම්ස් එය ඉතාම ආශාවෙන් පරීක්ෂා කර බැලීමට පටන් ගත්තේය. ඉන්පසු එය පැළැඳගත් ඔහු, ඒ තුළින් පොතක් කියවීමට උත්සාහ කළේය. මීළඟට එය රැගෙන ජනේලය වෙත ගිය ඔහු, උපැස් යුවළ තුළින් වීථියේ ඈත කෙළවර බැලීමට උත්සාහ කළේය. ආපසු මේසය වෙත පැමිණි හෝම්ස් පහනේ ආලෝකයෙන් උපැස් යුවළ තවදුරටත් හොඳින් පරීක්ෂා කොට, කඩදාසි කැබැල්ලක් අතට ගත්තේය. සිනාමුසු මුහුණින් එහි යමක් ලියූ ඔහු, කඩදාසිය හොප්කින්ස් වෙත තල්ලු කළේය.

'මේකෙන් මට කියන්න පුළුවන් වැඩිම දේ මෙච්චරයි. එයින් සැහෙන ප්‍රයෝජනයක් ලැබෙන්න පුළුවනි'

විස්මයට පත් හොප්කින්ස් හෝම්ස් ලියූ දේ ශබ්ද නගා කියෙව්වේය.

'ඉතා අලංකාර ලෙස හැඳපැළැඳගත් ඉහළ පෙළේ කාන්තාවක මීනෑකර තිබේ. පුළුල් නාසයක් ඇති ඇගේ, ඇස් දෙක, නාසය දෙපසින් එයට ඉතා ළංව පිහිටා ඇත. නළල රැළි ගැසී ඇත. යමක් දෙස බලන්නේ ඉතා අපහසුවෙනි. රවුම් උරහිස් සහිතව තරබාරු පෙනුමක් තිබීමට ඉඩ ඇත. පසුගිය මාස කිහිපය තුළදී අඩු වශයෙන් දෙවරක් වත් ඇස් කණ්ණාඩි සපයන්නන් වෙත ගොස් ඇති බවට සාක්ෂි ඇත. එවැන්නන් ඇත්තේ ඉතා ස්වල්පයක් නිසා ඇය සොයා ගැනීම අපහසු නොවනු ඇත.'

මෙයින් විස්මයට පත්වූ අකුණු මගේ මුහුණෙන්ද ප්‍රකාශයට පත්වන්නට ඇත.

http://sherlockholmesinvestigations.blogspot.com

'මගේ නිගමනයන්ට එළැඹීම බොහොම සරලයි'

හෝම්ස් කථාව ඇරඹීය.

'උපැස් යුවළක් තරම් ඉතාම සූක්ෂ්ම ලෙස එහි හිමිකරුවාට සමීප වෙන තවත් දෙයක් ගැන කියන්නට බැරි තරමයි. මේ උපැස් යුවළ බොහොම සියුම් ලෙස, අලංකාරව නිමකළ එකක්. එම කාරණයත්, මියගිය තැනැත්තාගේ කටින් අන්තිමට පිටවූ වචනත් ප්‍රයෝජනයට ගනිමින් තමා මං කියන්නේ මේ කාන්තාවකට අයිති එකක් කියල. මේ කණ්ණාඩියේ රාමුව සාදා තිබෙන්නේ දඹ රත්තරනින්. මේ තරම් වටිනා, අලංකාර උපැස් යුවළක් පළඳින කෙනෙක්, අලංකාරව හැඳ පැළඳ ගත් කෙනෙක් බව කියන්න අමාරු නැ. ඊළඟට කාච දෙක නාසයට තද්වෙන්න යොදා තිබෙන ක්ලිප් දෙක පිහිටලා තිබෙන්නෙ බොහොම ඈතින්. ඔබ එය පැළැඳ ගත්තත්, ඔබේ නාසයට සෑහෙන තරම් දෙපැත්තෙන්. ඒ කියන්නේ මේ කාන්තාවගේ නාසය බොහොම පුළුල් එකක්. මගේ මුහුණ ස්වභාවයෙන්ම බොහොම පටුයි. ඒ වුණත් උපැස් යුවළ පැළඳුවාම මේ කාච දෙක් මැද හරියට මගේ ඇස් දෙක එන්නේ නැ. කාචය පිහිටලා තිබෙන්නේ ඊට වඩා සැහෙන තරම් නාසය දෙපැත්තට ළං වෙන්න. ඒකෙන් තේරෙන්නෙ ඇය, ඇස් දෙක ඉතා ළංව පිහිටි කාන්තාවක්. ඔබට පෙනෙනවා ඇති වොට්සන් මේවා අවතල, ඒ වගේම අසාමාන්‍ය ලෙස ප්‍රබල කාච දෙකක්. ජීවිත කාලයක් මේ විධියට ඇස් පෙනීම දුර්වලව තිබුණු කෙනෙකුගේ බාහිර රූප ලක්ෂණයේ මං කිව් ආකාරයට නළලේ හා උරහිස් වල වෙනස්කම් දක්නට ලැබෙනවා.'

'ඔව්. ඔබ කිව් හැමදේටම මම එකඟ වෙනවා. ඒත් ඇය් කණ්ණාඩි සාප්පුවට දෙවරක් ගොස් තිබෙන බව ඔබ කිව්වේ කොහොමද?' මම ඇසීමි.

'ඔබට පෙනෙනවා ඇති ක්ලිප් දෙක නාසයට තදවීමේදී වේදනාකාරී නොවෙන්න, ඒ තැන් මෘදු දැවමය ද්‍රව්‍යයකින් ආවරණය කරලා තිබෙන්නේ. එයින් එකක් සැහෙන කාලයක් පාවිච්චි කිරීම නිසා දුර්වර්ණ වී ගෙවී ගොහින්, නමුත් අනෙක

අලුත් එකක්. කලින් එක පාවිච්චියේදී හැලැවී වැටීම නිසා මේක අලුතෙන් දැමූ බව පැහැදිලියි. මෙයින් පරණ එක වුණත් මාස කිහිපයකට වඩා පරණ නැහැ. ඒකෙන් හිතාගන්න පුළුවනි මේ කාන්තාව දෙවැනි වතාවටත් ඒ ආයතනයටම ගොස් තිබෙන බව'

'දෙයියෝ සාක්කි ! ඒක හරිම අලංකාරයි නෙ හෝම්ස් මහත්මයා' හොප්කින්ස් පැවසුවේ හෝම්ස්ගේ දක්ෂතාවය සැබැවින්ම අගය කරමිනි.

'මගේ අතේ ඔය කාරණා ඔක්කොම තියෙද්දිත් මං ඒ කිසිදෙයක් දැනහිටියෙ නැහැනෙ. කොහොම වුණත් මං බලාපොරොත්තුව හිටියේ ලන්ඩනයේ හැම දෘෂ්ටි පරීක්ෂකයෙක් ළඟටම ගිහින් හොයල බලන්න'

'ඇත්තෙන්ම ඒක ඔබ කළ යුතුයි. වෙන මොනවද මේ සිද්ධිය ගැන ඔබට කියන්න තියෙන්නෙ?'

'වෙන මොකුත් නැ හෝම්ස් මහත්මයා. මං හිතන්නේ මං දන්න හැම දෙයක්ම ඔබත් දන්නවා. සමහරවිට ඊටත් වැඩිය දන්නවා ඇති. මේ පැත්තේ අතුරු පාරවල හෝ දුම්රිය පොළේ කල්ත් දැකල නුපුරුදු අමුත්තෙක් එහෙම හිටියද කියල අපි විපරම් කරල බැලුවා. නමුත් ඒ බවක් අහන්න ලැබුණෙ නම් නැ. මට හිතාගන්න බැරි මේ මිනීමැරීමේ අරමුණ කුමක්ද කියලා. කාටවත් කිසිම අදහසක් දෙන්න බැරිවුණා'

'ආ.....ඒක නම් මටත් කියන්න බෑ. ඔබ බලාපොරොත්තු වෙනව ඇති අපි හෙට යොක්ස්ලි ඕල්ඩ් මන්දිරයට යන්න එවි කියල?'

'ඔබට කරදරයක් නැත්නම් කරුණාකරල එසේ ග හෝම්ස් මහත්මයා. චාරිං ක්‍රොස් දුම්රිය පොළෙන් උදේ හයට වැනුම් බලා පිටත්වෙන දුම්රියක් තිබෙනවා. උදේ අට නවය වෙනකොට අපට යොක්ස්ලි මන්දිරයට යා ගත හැකිවේවි'

'හොඳයි, ඔබ අපට පවරන රාජකාරිය බාරගන්නම්. මේකෙ තිබෙනවා සිත් ඇදගන්නා සුළු අපූරු කාරණා. ඒ එසාටත්

සිට්ටුයි. පැය කීපයක් හරි නිදාගන්න පුළුවන් නම් වඩා හොඳයි. ඔය ගිනි උදුන ඉදිරිපිට සෝෆාවේ ඔබට නිදාගන්න බැරි වෙන එකක් නෑ, හොප්කින්ස්. ඊට කලින් මගේ ස්ප්‍රිතු ලාම්පුව දල්වලා ඔබට කෝපි කෝප්පයක් පිළියෙල කර දෙන්නම්'

පසුවද උදෑසන වන විට කුණාටුව අවසන් වී තිබිණ. එහෙත් අප ගමන් ආරම්භ කරද්දී එය අධික ශීතලෙන් යුත් දිනයක් බව පෙනී ගියේය. තේම්ස් ගඟ අසබඩ වගුරු බිම් වලට ඉහළින්, සිසිර සෘතුවේ හිරු උදාව අපට දැකගන්නට ලැබිණ. අපේ අපරාධ පරීක්ෂණ ව්‍යාපෘතියේ මුල් කාලයේ, අන්දමන් දූපත් වැසියා[1] ලුහු බඳිමින් තේම්ස් ගඟේ යාත්‍රා කළ ගමන මට සිහිපත් විය.

දීර්ඝ ගමනකින් පසු, වැනුම් නගරයට සැතපුම් ගණනක් ඈතින් පිහිටි දුම්රිය පොළකින් අපේ චාරිකාව නිමාවිය. අපි බොහෝ සෙයින් වීඩාවට පත්වී සිටියෙමු. කරත්තයකට අශ්වයකු සූදානම් කරන අතරේ ගමේ තානායමෙන් උදේ ආහාරය ගැනීමට අපට හැකිවිය. යොක්ස්ලි ඕල්ඩ් මැනර් වෙත අප පැමිණෙද්දී ගේට්ටුව අසල සිටි පොලිස් භටයෙක් අප පිළිගත්තේය.

'අලුත් ආරංචි මොනවත් එහෙම තිබෙනවාද විල්සන්?'

'නෑ මහත්මයා, මොකුත් නෑ'

'කවුරුවත් අමුත්තෙක් ආපසු ඇවිත් ආරංචියක් වත් නෑ?'

'නෑ මහත්මයා. දුම්රිය පොළෙන් ඊයෙ දවසට අමුත්තෙක් ඇවිල්ලත් නෑ. පිටවෙලා ගිහිල්ලත් නෑ'

'තානායම් වලින්, නවාතැන් පොළවල් වලින් හොයල බැලුවද?'

'ඔව් මහත්මයා. අප නොබලපු එකක් නෑ'

'වැනුම් වලට ඇවිදගෙන යා හැකි දුර නේ. කවුරු හරි එහෙ නැවතිල ඉඳලා, කාටවත් නොපෙනී දුම්රියෙන් ආව ගියා වෙන්න පුළුවනි.

1. සිව්රුහස් පලකුණ

Readtime Purpose Only. Not For Print
sherlockholmesinvestigations.blogspot.com

මෙන්න හෝම්ස් මහත්මයා මං ඔබට කිව් අර, උද්‍යානය හරහා වැටුණු අඩිපාර. මට ආයෙමත් අහතික වෙන්න පුළුවන්: ඊයෙ නම් මේකෙ අඩි සටහන් පේනුන් තිබුණෙ නෑ'

'අර තණකොළ මතින් අඩි සටහන් තිබුණා කිව්වෙ මොන පැත්තෙද?'

'මේ පැත්තෙ මහත්මයා. ඒ අඩි සටහන් තිබුණේ අඩි පාරටත්, අර මල්පාත්තියටත් අතරින් තිබෙන තණබිස්ස උඩින්. දැන් නම් ඒක තිබෙන්නේ යාන්තමටයි. ඊයේ මීට වඩා පැහැදිලිව පෙනුණා'

'ඔව්. ඔව්. කවුරු හරි ගමන් කරලා තිබෙනවා' හෝම්ස් පැවසුවේ තණකොළ තීරුව පරීක්ෂා කරමිනි.

'අපේ නෝනා බොහොම දීරුවෙන් අඩිය තියලා තියෙනවා. ඒ මොකද එක පැත්තකින් මැටි සහිත අඩිපාර, අනෙක් පැත්තෙන් මල් පාත්තිය. මේ කොයි එකේ හරි අඩිය තැබුව නම් හොඳට අඩි සටහන හිටිනවා'

'ඔව් හෝම්ස් මහත්මයා. ඇය හොඳ පුරුදු කාරියක් වෙන්න ඇති.'

'ඔබ කියන්නේ ඇය ආපහු ආවෙත් මේ පැත්තෙන් කියලද?'

'ඔව්. එළියට යන්න වෙන පැත්තක් නෑ'

'මේ තණ තීරුව උඩින්?'

'ඔව් හෝම්ස් මහත්මයා'

'හ්ම්. එහෙම නම් ඒක හොඳ සුවිශේෂ දක්ෂකමක්. බොහොමත්ම දක්ෂයි. තණතීරුවෙ වෙන බලන්න දෙයක් නෑ. මේ ගේට්ටුව සාමාන්‍යයෙන් ඇරලා තියෙනව ඇති මං හිතන්නෙ. එහෙම නම් ආපු නැනැත්තිට ඇතුළට ඇවිදගෙන එන එක පහසු කාරියක්. දැන් අපි යමු ගෙට.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇය මෙහේ එනකොට මිනීමැරීමේ චේතනාවක් ඇගේ හිතේ තියෙන්න නැ. එහෙම තිබුණා නම් ඇය ඒකට සුදුසු මොකක් හරි ආයුධයක් අරගෙන එනවා: මේ ලියන මේසය උඩ තිබෙන පිහිය ගන්න උවමනා වෙන්නෙ නැ. ලණු පැදුර් මත මොකුත් සලකුණක් නොතබා ඇය මේ පැසේජිය දිගේ ඉදිරියට යන්න ඇති. ඊළඟට ඇය කන්තෝරු කාමරයට ඇතුළු වුණා. ඇය කොච්චර වෙලාවක් එහි සිටියා ද? අපට ඒක හොයාගන්න ක්‍රමයක් නැ'

'මිනිත්තු කිහිපයකට වැඩි වෙන්න බැ, හෝම්ස් මහත්මයා. මට ඔබට කියන්න අමතක වුණා. මාකර් මහත්මිය කිව්වා මිනිත්තු පහළොවකට කලින් ඇය කන්තෝරු කාමරය පිරිසිදු කරලා ආ බව'

'හොඳයි, අපට ඒ කාලසීමාවත් මතක තබාගන්න පුළුවනි. එතකොට අපේ මේ හොරනා කන්තෝරු කාමරයට ඇතුළු වෙනවා. ඇය මොකද කරන්නේ? ඇය ලියන මේසය වෙත යනවා. මොකටද? ලාච්චු වල තිබෙන මොකක් හරි ගැනීමට නම් නොමෙයි. එවැනි වටිනා දෙයක් ලාච්චු වල තිබුණා නම් ඒවා යතුරු නොදමා තියන්නෙ නැ. ඇය එන්න ඇත්තේ කුඩා අල්මාරියේ තිබෙන මොනවා හරි ගන්න. අහා ! අල්මාරියේ යතුරු තහඩුව මත තිබෙන මේ සීරීම මොකක්ද? ගිනිකූරක් දල්වලා මේ හරියට අල්ලන්න වොට්සන්. ඔබ මේක ගැන මට කිව්වෙ නැත්තෙ ඇයි හොප්කින්ස්?'

එම සීරීමේ ලකුණ යතුරු කටට දකුණෙන් පිත්තල තහඩුව මත සටහන්වී, අඟල් හතරක් පමණ දුරට ලෑල්ල මත වාර්නිෂ් ද සීරී ගොස් තිබිණි.

'මං ඒක දැක්කා හෝම්ස් මහත්තයා. ඒ වුණාට යතුරු කටක් අවට ඕනෑතරම් සීරීමේ ලකුණු දකින්න ලැබෙනවා නේ. ඒ නිසා මං ඒක ගණනකට ගත්තෙ නැ'

'මේ සීරීම ළඟදී වෙච්ච එකක්. බොහොම ළඟකදී. බලන්න පිත්තල තහඩුව කැපීගිය හරිය දිලිසෙන හැටි. පරණ එකක් නම් ඒක තහඩුවේ අනික් හරියේ පාටටම තිබෙනවා. මගේ කාච්ය අරන්

Reading Purpose Only. Not For Print



"ඔබ ඊයේ උදේ, මේ අල්මාරියේ දූවිලි පිස දැම්මද?"

Reading Purpose Only Not For Print.

පරීක්ෂා කරල බලන්න. හරියට පොළොව මතුපිට කාණුවක් හෑරුවාම දෙපැත්තේ පස් ගොඩ ගැහෙනවා වගේ, සීරීම දෙපැත්තේ වාර්නිෂ් එකතුවෙලා තියෙන හැටි බලන්න. කෝ මාකර් මහත්මිය ඉන්නවද ඔය හරියේ?'

වයස්ගත කාන්තාවක් කාමරයට පැමිණියාය. ඇගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ දුක්මුසු හැඟීමකි.

'ඔබ ඊයේ උදේ මේ අල්මාරියේ දූවිලි පිසදැම්මාද?'

'ඔව් මහත්මයා.'

'මේ සීරීමේ ලකුණු ඔබ දැක්කාද?'

'නැහැ මහත්මයා.'

'ඔබ නුදුටු බව මටත් විශ්වාසයි. ඒ මොකද කලින් ඉඳන් එය තිබුණා නම් දූවිලි පිස දමද්දී මේ වාර්නිෂ් කුඩු ටික ඉවත්වෙනවා. මේකෙ යතුරු තියෙන්නේ කවුරු ළඟද?'

'මහාචාර්යතුමා ළඟ. එතුමාගේ සාක්කු ඔරලෝසු දම්වැලේ යතුර එල්ලාගෙන ඉන්නෙ.'

'නිකං සාමාන්‍ය යතුරක්ද?'

'නැහැ මහත්මයා. චබ් වර්ගයේ යතුරක්'

'බොහොම ස්තුතියි, මාකර් මහත්මිය. ඔබට යන්න පුළුවනි. අපි දැන් පරීක්ෂණයේ ටිකක් ඉදිරියට යනවා නේද? අපේ නෝනා කාමරයට ඇවිත් අල්මාරිය ළඟට එනවා. ඇය එක්කො එය විවෘත කරගන්නවා. නැත්නම් විවෘත කිරීමට උත්සාහ කළා පමණයි. ඇය ඒ වැඩේ යෙදිලා ඉඳිද්දී තරුණ විලෝබි ස්මිත් කාමරයට ඇතුළු වෙනවා. ඇය කලබලේට යතුර ඉවතට ගැනීමේදී තමයි මේ සීරීමේ ලකුණ ඇතිවෙන්නේ. ඒ අතරේ ස්මිත් ඇයව අල්ලාගන්නවා. ඔහුගේ ග්‍රහණයෙන් නිදහස් වෙන්න ඇය මොකද කරන්නේ? ළඟම තිබිලා අතට අහුවෙන ආයුධය

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

ගන්නවා. ඒක තමයි මෙසය උඩ ඇති. ලාකඩ මුද්‍රා තැබීමට යොදාගන්නා මේ පිහිය. ඇය ඒකෙන් ඔහුට අනින්නේ ඔහුගේ ග්‍රහණයෙන් ගැළැවෙන්න. නමුත් ඒ පිහිපාර බෙල්ලට ඇනුණු මාරාන්තික පිහි ඇනුමක් වුණා. ඔහු බිම ඇද වැටෙද්දී ඇය පැන යනවා. ඒ, ඇය මෙහාට ආ කාරිය ඉෂ්ට කරගෙන හෝ කර නොගෙන.

සුසාන් වාල්ටන් ඉන්නව නේද එතන? ඔබට අර බිහිසුණු කෑගැසීම ඇහුණට පස්සේ, අර දොරෙන් තාව හරි එළියට පැනගැනීමට ඉඩක් තිබුණද?

"නැහැ මහත්මයා. ඒක නම් කොහොමට වත් වෙන්න බෑ. කවුරු හරි පැසේජ්ය දිගේ ගියා නම් තරප්පු පෙළ දිගේ පහළට දුවගෙන එද්දී මං ඒක දකිනවා. තැනත් ඒ දොර ඇරුණෙ නෑ. එහෙම ඇරුණා නම් මට ඒ ශබ්දය ඇහෙනවා."

"එතකොට ඒ දොරටුවෙන් පිටවුණා වෙන්න බෑ. එහෙනම් නිසැකවම ඇය පිටවී යන්න ඇත්තේ ආපු විදියටමයි. මේ අනික් පැසේජ්ය අවසන් වෙන්නේ මහාචාර්යතුමාගේ කාමරයෙන්. එහෙම නේද? මේ පැසේජ්ජයෙන් ගෙයින් පිටතට යන්න බැහැ නේද?"

"බැහැ මහත්මයා."

"අපි ඒ පැසේජ්ය දිගේ ගමන් කරලා, මහාචාර්යතුමාගේ කාමරයට ගිහිං එතුමාව හඳුනා ගනිමු. "මේ බලන්න හොප්කින්ස් මේක හරිම ...... වැදගත් දෙයක්. මේ පැසේජ්යෙන් ලණු පැදුරු අතුරලා තිබෙන්නේ"

"ඔව් මහත්මයා. නමුත් ඒක වැදගත් ඇයි?"

"ඔබට පෙනෙන්නේ නැත්ද, මේ ගැටලුව විසඳීමට ඒ කරුණ වැදගත් වෙන ආකාරය? කමක් නෑ. මං ඒ කාරණය ගැන දිගින් දිගටම කියන්න යන්නේ නෑ. සමහරවිට මං වැරදි වෙන්නත් පුළුවනි. අපි යමු මහාචාර්යතුමා හමුවෙන්න. ඇවිත් මාව හඳුන්වල දෙන්න"

http://sherlockholmesinvestigation.blogspot.com

කන්තෝරු කාමරයේ සිට උද්‍යානය වෙත වැටී තිබුණු පැසේජය තරමටම දිග පැසේජයකින් අපි මහාචාර්යතුමාගේ කාමරය දෙසට ගමන් කළෙමු. එය කෙළවර වූයේ කෙටි පියගැට පෙළකිනි. එතැනින් අප ඇතුළුවූයේ මහාචාර්යතුමාගේ කාමරයටයි.

එය ඉතා විශාල කාමරයක් විය. සිවිලිම වැසියන තරමටම වටේට තබා තිබූ පොත් අල්මාරි හා පොත් රාක්ක ගණනාවක් එහි තිබිණි. ඒවා පොත් වලින් පිරී ඉතිරී ගිය නිසාදෝ, පොත් රාශියක් කාමරයේ තැන් තැන්වල ගොඩගසා තිබිණි. ඊට අමතරව පොත් අල්මාරි අසල බිම, ඒකපිට එක තැබූ පොත් රාශියකි. ඇඳ තබා තිබුණේ කාමරය මැදයි. ඇඳේ පිටුපසට කොට්ට කිහිපයක් තබා, ඒ මතට හේත්තු වී සිටියේ යොක්ස්ලි ඕල්ඩ් මැළුරේ අයිතිකරුවායි.

එවැනි සුවිශේෂ පෙනුමක් තිබූ පුද්ගලයකු මට මීට පෙර දකින්නට ලැබී තිබුණේදැයි සැක සහිතය. ඔහුගේ මුහුණ, රාජාලියෙකුගේ හොටයක් වැනි වක් වූ නාසයක් සහිත, ඉතා කෙට්ටු මුහුණකි. ඔහුගේ හිසකෙස් හා රැවුල සම්පූර්ණයෙන්ම සුදු පැහැ ගැන්වී තිබිණි. එහෙත් මුඛය වටේට රැවුල කහ පැහැයට හැරී තිබිණි. රැවුළු ගස් අතරින් දිස්වූයේ දැල්වෙන සිගරැට්ටුවක දීප්තියයි. සිගරට් දුම අධික ලෙස කාමරය තුළම රැඳී තිබීම නිසා එහි වූයේ පිළුණු දුර්ගන්ධයකි. ගිළුණු තළ පැහැති නෙත් යුවළ අප දෙසට හරවා ඔහු හෙළුවේ අප විනිවිද යන බැල්මකි.

ඔහු අතට අත දීම සඳහා හෝම්ස් වෙත සුරත දිගු කළේය. අතේ ඇඟිලිද සිගරට් දුමේ නිකටින් පැල්ලම් වලින් කහ පැහැ ගැන්වී ඇති බව මම දුටුවෙමි. උච්චාරණයේ ඉතාම ස්වල්ප වෙනසක් තිබුණත්, නිවැරදි ඉංග්‍රීසියෙන් ඔහු, අප ඇමතුවේය.

"ඔබත් දුම් බොන්නෙක්ද හෝම්ස් මහත්මයා? එහෙනම් කරුණාකරල බොන්නකො සිගරට්ටුවක්. මහත්මයා ඔබ? කිසිම බයක් සැකක් නැතිව මේ දුම්වැටි වල අනර්ඝත්වය ගැනමට සහතික වෙන්න පුළුවන්. ඒ මොකද ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ අයනයිඩ්ඩ් සිගරට් සමාගම මේවා මා වෙනුවෙන්

http://sherlockholmesinvestigations.blogspot.com

විශේෂයෙන්ම නිෂ්පාදනය කරනවා. එක සැරේකට ඔවුන් මට සිගරට් දහස් එවනවා. කියන්නත් කණගාටුයි. ඒ ටික මට සති දෙකකටත් මදි. ඒ නිසා ඔවුන් සති දෙකකට වරක් සිගරට් එවනවා. මේක ශරීරයට බොහොම නරකයි මහත්මයා. ඉතාමත් නරකයි. ඒ වුණත් මං වගේ වයසක මිනිහෙක් වෙන මොනවා කරන්නද? මට ඉතිරි වෙලා තියෙන්නේ දුම්බීමයි, මගේ ශාස්ත්‍රීය පර්යේෂණයි විතරයි.'

සිගරට්ටුවක් දල්වා ගත් හෝම්ස් කාමරය සිසාරා බැලුම් හෙළන්නට පටන්ගත්තේය.

'අනේ දෙයියනේ ! බලන්න මොන තරම් බෙදජනක මරණයක්ද? මේ වගේ දරුණු අවාසනාවන්ත සිද්ධියක් වෙයි කියල කාටද හිතුණේ? මේ තරම් දක්ෂ තරුණයෙක් ! මං ඔබට සහතික කරලා කියන්නම්. මං ඔහුට දුන්නේ මාස කීපයක පුහුණුවක් පමණයි. ඔහු ඉතාම දක්ෂ පර්යේෂණ සහායකයකු බවට පත්වුණා. මේ මරණය ගැන ඔබේ අදහස මොකක්ද හෝම්ස් මහත්මයා?'

'මම තවම තීරණයකට ආවෙ නෑ'

'මේ සිද්ධිය විසඳලා දෙන්න පුළුවන් නම් මං ඔබට ණයගැතියි. මං ආබාධිත පුද්ගලයෙක් මහත්මයා. ඒ නිසාම මේ හදිසි මරණයෙන් මම හරිම කම්පාවකට පත්වුණා. මට දැන් කිසිම දෙයක් ගැන හිත යොමු කරන්න බැහැ. නමුත් ඔබ මේ වගේ ඒවට මුහුණ දීල පුරුදු, ඒවට සුදුසු පරිදි ක්‍රියාකරල පුරුදු කෙනෙක්. මේ වෙලාවෙ ඔබ අප ළඟ සිටීම ඇත්තෙන්ම අපේ වාසනාවක්'

වයස්ගත මහාචාර්යවරයා නොනවත්වාම කථාකරද්දී ෂර්ලොක් හෝම්ස් කාමරයේ එක් පැත්තක නොනවත්වාම ඉහළ පහළ ඇවිද්දේය. ඔහු වෙනදාට වඩා ඉතා වේගයෙන් සිගරට් ඉරීමට පටන්ගෙන ඇති බව මම නිරීක්ෂණය කළෙමි. මහාචාර්යතුමාගේ විශේෂ ඇලෙක්සැන්ඩ්‍රියානු සිගරට් වර්ගය

http://sherlockholmesinvestigations.blogspot.com

කෙරෙහි ඔහුගේ සිත හදින්ම ඇදී ගොස් ඇති ආකාරයකි.

'ඔව් මහත්මයා. මේක මහා හදබල කම්පනයක්.' වයස්ගත පුද්ගලයා යළිත් කථාව ඇරඹුවේය. මගේ ජීවිත කාලයක් තිස්සේ කළ ශාස්ත්‍රීය පර්යේෂණවල අග්‍රතම ඵලය එළිදක්වන්නයි මං සූදානම් වුණේ. අර මේසයට එහා පැත්තේ ගොඩගහල තිබෙන විශාල කඩදාසි ගොඩ බලන්න. සිරියාවෙත් ඊජිප්තුවෙත් ක්‍රිස්තියානි ආශ්‍රමවල තිබී හමුවූ පෞරාණික ලියවිලි වල අඩංගු දේ විශ්ලේෂණය කිරීමක්. අපි අදහන ආගමේ පදනම පවා හෙළිකරන ආකාරයේ පර්යේෂණයක්. මගේ ශරීර සෞඛ්‍යය තියෙන්නේ බොහෝම අදාතුවුදයක තත්ත්වයකයි. මං දන්නෙ නෑ මට මේ වැඩේ සම්පූර්ණ කරන්න ලැබේවිද කියලවත්. දැන් ඉතින් මගේ උදව්කාරයත් මාව හැරදමා ගියා. දෙයියනේ ! හෝම්ස් මහත්මයා ඔබ මටත් වඩා බොහොම ඉක්මනට සිගරට් බොන කෙනෙක් නෙ'

හෝම්ස් සිනාසුණේය.

'මම දුම්බීමෙන් උපරිම ආශ්වාදයක් ලබන්නෙක්' ඔහු පැවසුවේ කලින් සිගරට්ටුවේ කොටයෙන් හතරවැනි සිගරට්ටුවද දල්වා ගනිමිනි.

'දීර්ඝ විදියට හරස් ප්‍රශ්න අහමින් මං ඔබව වෙහෙසට පත්කරන්න කැමති නෑ මහාචාර්යතුමා. මේ මරණය සිද්ධවෙන වෙලාවෙ ඔබ හිටියෙ ඇඳේ. ඒ නිසා ඒ පිළිබඳ විස්තර ඔබ දැන හිටින්න ක්‍රමයක් නෑ. මට එක දෙයයි ඔබෙන් අහන්න තියෙන්නෙ. මේ ඉලන්දාරියා කිව් අන්තිම වචන වලින් 'මහාචාර්යතුමා ඒ .......ඇය........' කියන එකෙන් ඔහු අදහස් කරන්න ඇත්තේ මොකක්ද?'

මහාචාර්යවරයා හිස සොලොව්වේය.

'සුසාන් ගමේ කෙල්ලෙක්. ඔබ දන්නව නේ මේ ගම්බද කෙල්ලො විශ්වාස කරන්න බැරි තරම් මෝඩයි. මට හිතෙන්නෙ

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only Not For Print

ඒ අහිංසක මනුස්සයා මරුවිකල්ලෙන් මොනවා හරි දෙයක් දොඩවන්න ඇති. ඒක පුසයාත් තේරුම් ගත්තෙ මෙන්න මේ තේරුමක් නැති වචන හැටියට'

'ආ...... එහෙමද? හොඳයි මේ මරණය සිද්ධවුණු ආකාරය ගැන ඔබේ අදහස මොකක්ද?'

'බොහොම වෙලාවට හදිසි අනතුරක් විය යුතුයි. මං වෙන කාටවත් මේක කිව්වෙ නෑ - මං හිතන්නේ මේක සියදිවි නසා ගැනීමක්. දන්නේ නැද්ද හෝම්ස් මහත්තයා. ඉලන්දාරීන් නොයෙකුත් ප්‍රශ්න හංගාගෙන ඉන්නවා නේ. අපට හෙළිකරපු නැති ප්‍රේම සම්බන්ධයක් නිසා ඇතිවුණු එකක්......? මිනීමැරුමකට වඩා විය හැකි දෙය එයයි'

'ඒ වුණත් අර උපැස් පුවළ?'

'ආ...... මම තවමත් ඔය වගේ දේවල් සම්බන්ධයෙන් පිහින ලෝකෙක ජීවත්වෙන ශිෂ්‍යයෙක් පමණයි. ජීවිතේ තියෙන ඔය වගේ ප්‍රායෝගික දේවල් තේරුම් කරන්න මට හැකියාවක් නෑ. ඒ වුණත් මිත්‍රයා මේ ප්‍රේම සම්බන්ධතා කියන ඒවා පුදුම විදියට කෙළවර වෙන ඒවා.

ගන්න, ගන්න, තව සිගරට් එකක් ගන්න. තවත් කෙනෙක් මේ දුම්වැටි අගය කරනවා දැකීමත් සතුටට කරුණක්. ජීවිතේ නැතිකරගන්න සූදානම් වෙන මිනිහෙක්, තමන්ගේ ආදරයේ සිහිවටනයක් හැටියට මොනා වගේ දේවල් අතේ තියාගනීවිද කියල අපි කොහොමද දන්නෙ? අවානක්, අත්වැස්මක්, කණ්ණාඩි කුට්ටමක්. මේ වගේ මොනවා හරි දෙයක් ළඟ තියාගන්න ඉඩ තියෙනවා. අපි ඒ ගැන මොකුත් දන්නෙ නෑ. මේ මහත්මයා කියනවා තණකිස්ස දිගේ අඩි සටහන් වගයක් තිබුණාලු. ඒ වගෙ දේවල් බොහොම පහසුවෙන් වැරැදිය හැකි නිරීක්ෂණ. මේ අවාසනාවන්තයා වැටෙද්දි තමයි පිහිය ඈතට විසිවෙන්න ඇත්තෙ. මං කියන දේවල් බොහොම ළාමක විදියට ඔබට පෙනෙන්න පුළුවනි. ඒත් මට හිතෙන හැටියට නම් විලෝබි

http://sherlockholmesinvestigations.blogspot.com



"............ මෙන්න යතුර ඔබට පරීක්ෂා කරල බලන්න පුළුවන්" මොහොතක් යතුර පරීක්ෂා කළ හෝම්ස් එය ආපසු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ස්මිත්ට අවසානය ළඟාවුණේ ඔහුගේ දෑතින්මයි'

කොරාම් ඉදිරිපත් කළ මෙම උපකල්පනය හෝම්ස්ගේ සිතට තදින්ම කාවැදුණු බව මට පෙනී ගියේය. කෙසේ වෙතත් දිගින් දිගටම සිගරට් උරමින් කාමරයේ ඔබ මොබ ඇවිදීම නම් ඔහු අත්හැරියේ නැත.

'එහෙනම් කියන්න මහාචාර්යතුමා, ඔබේ ලියන මේසයේ අල්මාරියේ, යතුරුදල තියෙන්නේ මොනවාද?'

'හොරෙකුට වැඩක් ඇති දෙයක් නම් නොවෙයි. එතන ඇත්තේ පවුලේ ලියකියවිලි වගයක්. මගේ දුප්පත් බිරිඳගෙන් මට ලැබුණු ලියුම්, විශ්වවිද්‍යාල වලින් මට ලැබුණු ගෞරව උපාධි සහතික......මෙන්න යතුර. ඕනෑ නම් ඔබට ඒව පරීක්ෂා කරල බලන්න පුළුවනි'

හෝම්ස් යතුර අතට ගත්තේය. මොහොතක් එය පරීක්ෂා කළ ඔහු යතුර ආපසු භාරදුන්නේය.

'නෑ. මං හිතන්නෙ නෑ ඒකෙන් මට ප්‍රයෝජනයක් වේවි කියල. ඊට වඩා හොඳයි ඔබේ උද්‍යානයේ මට පොඩි විවේකයක් ගන්න පුළුවන් නම්. එතකොට මේ කාරණාව ගැන තවදුරටත් කල්පනා කර බැලිය හැකියි. මේක සියදිවිනසාගැනීමක් විය යුතුයි කියල ඔබ ඉදිරිපත් කරන මතයෙන් යම්කිසි ගතයුතු දෙයක් තිබෙනවා. ඔබට මේ විධියට හිරිහැර කරන්න සිදුවීම ගැන මං ඔබෙන් සමාව අයැද සිටිනවා මහාචාර්ය කොරාම්. ඔබේ දහවල් ආහාරය ඉවර වෙනතුරු ඔබට බාධාකරන්නෙ නෑ කියල මං පොරොන්දු වෙනවා. හරියට හවස දෙකට අපි ආයෙත් එනවා. මේ කාලය ඇතුළත සිදුවූ දේවල් එවිට මං ඔබට කියන්නම්'

උද්‍යානය තුළදී හෝම්ස්ගේ දැකිය හැකිවූයේ සිහිකල්පනාව අඩු පුද්ගලයකුගේ ගති ලක්ෂණයි. ඔහු කල්පනාකාරීව, උද්‍යානයේ එහා මෙහා ඇවිදිමින් සෑහෙන වේලාවක් ගත කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔබට මොකුත් හෝඩුවාවක් ලැබුණාද?'

අවසානයේදී මම ඇසීමි.

'ඒක තීරණය වෙන්නෙ මං බීල අවසන් කළ සිගරට් මත. සමහරවිට මට ලොකු වැරැද්දක් වුණා වෙන්නත් පිළිවන්. ඒත් සිගරට් වලින් ඒක පෙන්වා දේවි'

'ඒක මහ පුදුමයක් නේ හෝම්ස්.....'

'හරි. හරි. ඒක ඔබටම බලාගන්න පුළුවන් වෙයි. එහෙම හොවුණත් ඒකෙන් වැරැද්දක් සිද්ධ වෙන්නෙ නෑ. කොහොමටත් අපට අර රන් උපැස් යුවළ තිබෙනවා නෙ. ඒක ඇස් කණ්ණාඩි සාප්පුවකට ගෙනිහිං කරුණු සෙවීම අපි තවම ඇරඹුවේ නැහැ නෙ. නමුත් කෙටි මගක් දැක්කොත් මං සාමාන්‍යයෙන් කැමතියි ඒ මාර්ගයේ යන්න. ආ...... මෙන්න එනවා මාකර් මහත්මිය. අපි ඇයත් සමග මිනිත්තු පහක් ප්‍රතුටු සාමීචියේ යෙදිල බලමු.'

කාන්තාවක සමග කතාබහ කොට, ඇයගේ විශ්වාසය ඉක්මනින් දිනා ගැනීමේ පුදුමාකාර දක්ෂතාවයක් හෝම්ස් සතු විය. කතාබහ ඇරඹූ ඉක්මනින් ගෘහපාලිකාවගේ සිත දිනාගත් හෝම්ස් ඇය හා සාකච්ඡාවේ යෙදුණේ අවුරුදු ගණනක් තිස්සේ ඇය හැඳින සිටි අයෙකු මෙනි.

'ඔව් හෝම්ස් මහත්මයා. ඔබේ කතාව සම්පූර්ණ ඇත්ත. ඔහු ඉතාම තදින් දුම්පානය කරනවා. දවස තිස්සේම දුම්බොනවා. සමහර දට රෑටවත් ඒක නවත්වන්නේ නැහැ. පහුවද උදේට ඔහුගේ කාමරේ හැටි දැක්කොත් ඔබට හිතේවි, ඒ සීතල කාලෙට ලන්ඩනයේ දකින්න ලැබෙන සනමීදුමද කියලා. අනේ අහිංසක ස්මිත් මහත්මයා. ඔහුත් දුම්පානය කළා. ඒත් මහාචාර්යතුමා වගේ සැරට නෙමෙයි.'

'මහාචාර්යතුමාගේ සෞඛ්‍ය තත්ත්වයද? දුම්බිව්ව නෑ කියල ඒකෙ වරදක් තිබුණෙ නෑ'

http://sherlockholmesinvestigations.blogspot.com

'ඒ වුණත් සිගරට් බිව්වාම කෑම කන්න බැරි වෙනවා' හෝම්ස් කීය.

'ඒක මං දන්නෙ නෑ මහත්මයා'

'මං හිතන්නේ ඔහු කෑම ටිකක් යන්තමට කවේ තියනවා විතර වෙන්න ඇති.?'

ඒ අදහස හෝම්ස්ගෙන්ය.

'ඒක සමහර වෙලාවට වෙනස් වෙනවා' මාකර් මහත්මිය කීවාය.

'මං ඕන ඔට්ටුවක් අල්ලන්නං ඔහු අද උදේ කෑමට අත තියන්න නෑ. දවාලට කෑම කන්නෙත් නෑ. මං දැක්ක නේ ඔහු බිව් සිගරට් තොගය' හෝම්ස් කීවේ දැඩි විශ්වාසයෙනි.'

'එතනදි නං ඔබ පරාදයි මහත්මයා. ඔහු අද උදේ කෑම මහ ගොඩක් කෑවා. මෙතරම් විශාල ප්‍රමාණයක් ඔහු කෑමට ගත්තු කාලයක් මට මතක් කරන්නත් අමාරුයි. දවාලටත් බැදපු මස් එක්ක හොඳ කෑම වේලක් පිළියෙල කරන්න කියලා ඔහු ඉල්ලුවා. මට හරිම පුදුමයි. ඊයෙ අර ස්මිත් මහත්තයා කාමරේ වැටිල හිටි හැටි දැකපු වෙලාවෙ ඉඳන් මට නං කෑම දිහා බලන්නවත් හිතෙන්නේ නෑ. ලෝකෙ හැටි එහෙම තමයි. නොයෙක් නොයෙක් විදියෙ මනුස්සයො ඉන්නවා නෙ. කොහොම වුණත් මහාචාර්යතුමාට මේ මරණය නිසා කෑම රුචිය නං අඩුවෙලා නෑ'

අපි උද්‍යානයේ එහෙ මෙහෙ ඇවිදිමින් කාලය ගත කළෙමු. කලින් දින උදේ චරුවේ වැනැම් පාරේ තාදුනන කාන්තාවක් පැරිසරනු ගමේ ළමයින්ට දකින්නට ලැබී ඇතැයි දූසමාන ආරංචියක් පැතිර ගොස් තිබිණ. මේ ගැන වැඩිදුර හොයා බැලීමට හොප්කින්ස් ගම්මානය බලා පිටත්ව ගියේය. හෝම්ස්ගෙන් නම් දක්නට ලැබුණේ බලාපොරොත්තු කඩවූ ස්වභාවයකි.

'ගමේ ... තිර ගිය ආරංචිය ඇත්ත. මට ඒ ළමයි හමුවුණා'

http://...

හොප්කින්ස් ආපසු පැමිණ තමා සොයාගත් දේ අපට හෙළි කලේය.

'හෝම්ස් මහත්මයා විස්තර කළ ආකාරයේම ගැනු කෙනෙක් ඊයේ වැතැම් සාර දුවට ගැවසිලා සිටි බව ඇත්ත. නමුත් එතනින් එහාට කවුරුවත් ඇය ගැන දන්නේ නැ'

අප දහවල් ආහාරය අවසන් කරන තුරු බලා සිටි සුසාන් වාල්ටන් අප හමුවට පැමිණියාය.

'ස්මිත් මහත්මයා ඊයෙ උදේ ගෙදරින් එළියට ගිහිං ආවා. මං හිතන්නේ ඔහු යන්න ගැත්තේ ටිකක් ඇවිදින්න වෙන්න ඇති. ඔහු ආපහු ආවෙ මේ සිද්ධිය වෙන්න ඇය භාගයකට විතර කලින්'

මිනීමැරුමට මේ කාරණය කෙසේ සම්බන්ධ වේද යන්න ගැන මට කිසිත් වැටහීමක් නොවීය. එහෙත් තමාගේ උපකල්පනයට එය ගැළපීමට හෝම්ස් උත්සාහ ගන්නා අයුරු මම දුටුවෙමි. එක්වරම ඔහු පුටුවෙන් නැගී සිටියේ තම ඔරලෝසුව දෙස බලමිනි.

'මහත්වරුනි. වෙලාව දෙකයි. අපි ගිහින් අපේ මිත්‍ර මහාචාර්ය තුමා එක්ක කථා කරමු'

මහාචාර්යතුමා තම දහවල් ආහාර වේල අවසන් කළා පමණි. ඔහුගේ පිඟාන හා දීසි සියල්ල හිස්ව තිබිණි. ගෘහ පාලිකාවගේ කථාව සත්‍ය බව එයින්ම ඔප්පු විය. දල්වා ගත් සිගරට්ටුවක් යළිත් ඔහුගේ දෙතොල් අතර තිබිණි. ඔහු ඇත්ත වශයෙන්ම ඉතා දුර්වල පුද්ගලයෙකු බව අපට පෙනී ගියේය.

'කොහොමද හෝම්ස් මහත්මයා. ඔබ තවමත් අභිරහස විසඳුවේ නැද්ද? ' මහාචාර්ය තුමා ඇසීය.

ඇඳ අසල තිබූ ටීපෝවක් මත සිගරට් රාශියක් අසුරා තිබූ ප්‍රමාණයෙන් විශාල ටින් එකක් විය. එයින් දුම්වැටියක් දල්වා ගන්නා මෙන් ඔහු හෝම්ස්ට සංඥා කලේය.

http://sherlockholmesinvestigations.blogspot.com

සිගරට්ටුවක් ගැනීමට අතදිගු කළ හෝම්ස්, එක් ක්ෂණයකින් සිගරට් අඩංගු ටින් එක බිමට පෙරළුවේය ! සිගරට් සියල්ල කාමරය පුරා විසිරී ගියේය. මිනිත්තු කිහිපයක් යනතුරු අපි, කාමරය පුරා, අහුමුළු වලට දණගාමින් සිගරට් එකතු කළෙමු. එය අවසන් කොට යළි නැගිටිද්දී හෝම්ස්ගේ බබළන දෑස් හා රත් පැහැ ගත් කම්මුල්, මගේ අවධානයට ලක්විය. මෙම විශේෂ සංඥාව දක්නට ලැබෙන්නේ ඉමහත් කලබලකාරී මොහොතක පමණක් බව මම දැන සිටියෙමි.

'ඔව් මං ඒක විසඳුවා'

මමත් හොප්කින්සුත් මහත් පුදුමයෙන් හෝම්ස් දෙස බැලීමු. මහාචාර්යතුමාගේ මුහුණේ ඇඳුණේ සාවඥ සිනහ රැල්ලකි.

'හැබෑට? කොහේදීද? උද්‍යානයේදීද?

'නැහැ. මේ කාමරේ ඇතුළේදී'

'මෙහේදී? කොයි වෙලාවේද?'

'මේ දැන් !'

'ඔබ විහිළු කරනවා ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං ඔබට මතක් කිරීමට කැමැතියි. මේක විහිළුවකට ගැනීමට සුදුසු දෙයක් නෙමෙයි. මේක බොහොම බැරෑරුම් කාරණාවක්'

'මගේ නිරීක්ෂණ හා නිගමන දම්වැලේ හැම පුරුකක්ම මං හොඳට පරීක්ෂා කරල බැලුවා මහාචාර්ය කොරාම්. ඒ හැම එකක්ම හොඳට ශක්තිමත්. ඔබේ යටි අරමුණු මොනවාද? මේ පුදුමාකාර සිද්ධියේ ඔබ රඟදක්වන්නේ කුමන කොටසක්ද කියන එක මට තවමත් පැහැදිලි නෑ. ඒක තව මිනිත්තු කිහිපයකින් සමහරවිට ඔබේ කටින්ම මට අහන්නට ලැබේවි. එතෙක් සිද්ධිය වුණු ආකාරය මං යළි ගොඩනගා පෙන්වන්නම්. එතකොට මට තව ඕනෑ කරන තොරතුරු මොනවද කියල ඔබට වැටහේවි.

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

ඊයේ ඔබේ කන්තෝරු කාමරයට ගැහැනු කෙනෙක් ඇතුළු වුණා. ඇය එහි ආවෙ, ඔබ ලියනමේසය යට අල්මාරියේ සඟවා ඇති, යම්කිසි ලියවිල්ලක් ලබා ගැනීමේ අදහසින්. ඇය ළඟ ඒ සඳහා යතුරක් තිබුණා. මං ඔබේ යතුර පරීක්ෂා කළා. නමුත් ඔබේ යතුරේ, තනඩුව සීරු ලකුණු නැහැ. ඔබ ඊට හවුල් කාරයෙක් නොවෙන බවයි ඒකෙන් පෙනෙන්නෙ. ඒනිසා ඇය ආවෙ ඔබට නොදන්වා, ඔබේ දේවල් හොරකම් කරගෙන යන අදහසින්

මහාචාර්යතුමා තම මුවෙන් දුම් වලාවක් පිම්බේය.

'මේක හරි සිත්ගන්නා සුළු කථාවක් මහත්මයා. තවත් මොකුත් තියෙනවද? අර ගැනු කෙනෙක් ගැන ඔබ කිව්ව නේ. ඒ ගැනිට මොකක් වුණාද, හැබෑට?'

'මං ඒකත් කියන්නම්. ඉස්සර වෙලාම ඔබේ ලේකම්, ස්මිත් තරුණයා ඇයව අල්ලා ගත්තා. ගැලවී පැනයන අදහසින් ඇය ඔහුට පිහියෙන් ඇන්නා. මේක බොහොම අවාසනාවන්ත සිදුවීමක් ලෙසයි මං දකින්නේ. ඒ මොකද, ඔහුට දරුණු තුවාලයක් සිදුකරන චේතනාවක් ඇයගේ තිබුණේ නෑ. මිනිමැරීමට එනකෙනෙක් ආයුධ නැතිව එන්නේ නෑ. සිදුවූ අනතුරෙන් භීතියට පත්වුණු ඇ එතැනින් ඉවතට දිවගියා. නමුත් ඇගේ අවාසනාවට, මේ වෙනකොට පොර බැදීමේදී ඇගේ උපැස් යුවළ ඇට අහිමිවෙලයි තිබුණෙ.

ඇය ඇස් පෙනීම ඉතාම දුර්වල තැනැත්තියක්. තමන් ගෙට ඇතුළුවුණු පැසේජය කියලි හිතාගෙන, ඇයට දකින්න ලැබුණු පැසේජය දිගේ ඇ ඉදිරියට දිව්වා. දෙකේම බිමට කොහු ලණු පැදුරු අතුරලයි තිබුණෙ. ඇවිත් තියෙන්නෙ වැරදි පාරක, තමන්ට පැනල යන්න තිබුණු මග වැරදුණා, කියල ඇය තේරුම් ගන්න කොට ප්‍රමාද වැඩියි. ඉතින් ඇය මොකද කරන්නෙ? ඇය ඉදිරියට යා යුතුයි. ඇ ඉදිරියට ගියා. ඇයට ඉදිරියේදී හමුවුණු තරප්පු පෙළේ ඉහළට නැග්ගා. එතකොට ඇයට හමුවුණා දොරක්. ඇය මේ දොර ඇරගෙන ඇතුළට ආවා. කොහේටද? ඔබේ කාමරයට'

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

මහල්ලා කට ඇරගෙන හෝම්ස් දෙස බලා සිටියේ මහත් පුදුමයෙනි. ඔහුගේ මුහුණෙන් පිළිබිඹු වූයේ විස්මය පමණක් නොව භීතියයි. මේ කිසිත් තමාට තේරුම් ගැනීමට නොහැකි බවක් රඟදැක්වූ ඔහු, මහත් උත්සාහයක් දරා සිනාසීමට පටන් ගත්තේය.

'ඔබේ කථාන්තරයේ ඉස්කොලම් බොහොම අලංකාරයි හෝම්ස් මහත්තයා. ඒත් පොඩි අඩුපාඩුවක් තියෙනවා. මං හිටියේ මේ කාමරේ නෙ. මං ඊයෙ දවසටම කාමරෙන් එළියට ගියේ නෑ'

'ඒක මං දන්නවා මහාචාර්ය කොරාම්'

''ඔබ කියන්නේ ගැහැනියක් මගේ කාමරයට ඇතුළුවුණ බවක් දන්නෙත් නැතුව මං ඔහේ ඇඳ උඩට වෙලා හිටිය කියලද?'

'මං එහෙම දෙයක් කිව්වෙ නෑ. ඇය කාමරයට ඇතුළුවුණු බව ඔබ දැක්කා. ඔබ ඇයත් එක්ක කථා කළා. ඔබ ඇයව හඳුනා ගත්තා. ඊළඟට ඇයට පැන යන්නත් උදව් කළා.

යළිත් වරක් මහාචාර්යවරයා මහ හඬින් සිනාසීමට පටන්ගත්තේය. ඔහුගේ දෑස් ගිනිපුළිඟු මෙන් දිලිසිණි.

'තමුසෙට පිස්සු ! තමුසෙ මේ දෙඩවන්නෙ ඔල්මාදෙන් ! මං ඇයට පැන යන්න උදව් කළා? කෝ දැන් ඒ ගෑනි?'

'ඇය ඉන්නවා අන්න අර පොත් අල්මාරිය අස්සේ' කාමරය කෙළවර තිබූ උස පොත් අල්මාරියක් දෙසට හෝම්ස් ඇඟිල්ල දිගු කළේය.

මහාචාර්ය කොරාම්ගේ මුහුණේ මස්පිඩු නටන්නට පටන් ගත්තේ සන්නියක් හැදුණු අයෙකුගේ මෙනි. ඔහු වියරු වූවකු මෙන් දෑත් එක් එක් අතට දිගු කළේය. ඒ මොහොතේම අල්මාරියක එක් කොටසක් කැරකෙන ආකාරය අපට දකින්නට ලැබිණි. එය පිටුපසින් කාන්තාවක් එළියට ආවාය.

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔබ නිවැරදියි. ඔබ නිවැරදියි. මෙන්න මං ආවා' ඇය පැවසුවේ විදේශික උච්චාරණයකිනි.

ඇගේ හිස, දූහුවිල්ලෙන් වැසී යාම නිසා දුඹුරු පැහැ ගැන්වී තිබිණ. මුහුණේද දූහුවිලි හා තවත් අප ද්‍රව්‍ය ගෑවී තිබුණු අතර සැඟවී සිටි තැන තිබූ මකුළු දැල් ඇගේ සිරුර පුරා රැඳී තිබිණි. ඇයට තිබුණේ හෝම්ස් කලින් විස්තර කළ ආකාරයේම ශරීර ස්වභාවයකි. කෙසේ වෙතත් ඇගේ පෙනුම කිසිදිනෙක රූමත් එකක් නොවූ බව නම් පැහැදිලිය; උපැස් යුවළ නොමැති කමින් ඇතිවූ දුර්වල ඇස් පෙනීම නිසාත්, අඳුරු තැනක සිට එළිමහනට පැමිණ ආලෝකයට මුහුණ දීමෙන් ඇතිවූ අපහසුව නිසාත්, දැස් හකුළුවමින් ඇය අප දෙස බැලීමට උත්සාහ කළාය. මුහුණේ අඩුපාඩු තිබුණත් දිගු උල් නිකටක් නිසා ඇයට ලැබී තිබුණේ නිර්භය, නිහුවක්කාර පෙනුමකි.

වහා ඉදිරියට ආ ස්ටැන්ලි හොප්කින්ස්, තමා ඇය හිර භාරයට ගන්නා බව පවසමින් ඇගේ එක අතකින් අල්ලා ගත්තේය. ඇය ආඩම්බරයෙන් ඔහුගේ අත ඉවතට දැමුවාය. මහලු කොරාම් පුටුවකට වී ඇය දෙස බලාසිටියේ භීතියට පත් මුහුණෙනි.

'ඔව් මහත්මයා. මං ඔබේ හිරකාරිය බව ඇත්තයි. මං හිටපු තැනට ඔබ කළ කතාබහ ඔක්කොම ඇහුණා. ඔබ සත්‍යය දැනගෙන තිබෙන බව මට තේරෙනවා.

මං ඔබට ඔක්කොම කියන්නම්. ඒ තරුණයා මැරුවේ මමයි. ඔබ අතරින් කවුද කිව්වා නේද ඒක හදිසියේ සිදුවූ අනතුරක් කියලා? ඒකත් ඇත්තයි. මගේ අතට ආවේ පිහියක් කියලාවත් මං දැන හිටියේ නෑ. මේසය උඩ තිබිලා අතට අහුවුණු දෙය මම ගත්තේ, එයින් ඔහුට පහරදීලා, ගැළවී, පැනයන අදහසින්. මං මේ කියන්නේ ඇත්තයි.

'නෝනා. ඔබ කියන්නේ ඇත්ත බව අපි දන්නවා. නමුත් මට පෙනෙනවා ඔබ ඉන්නේ යම්කිසි අසනීප තත්ත්වයකින් බව' හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

දරුණු රෝගී බවක් පෙන්වමින් ඇගේ මුළු සිරුරම අසාමාන්‍ය ශරීර වර්ණයකට හැරී තිබිණ. ඇදේ එක් කෙළවරක වාඩිවූ ඇය කථා කිරීමට පටන් ගත්තාය.

'මට මේවා කියන්න ඉතුරු වෙලා තියෙන කාලය බොහොම කෙටියි. ඒ වුණත් මං කැමතියි ඔබ සම්පූර්ණ සත්‍යයම දැනගන්නවා නම්. මම මේ 'මිනිහාගේ බිරිඳ. ඔහු ඉංග්‍රීසි ජාතිකයෙක් නෙමෙයි. ඔහු රුසියන් ජාතිකයෙක්. ඔහුගේ නම මං හෙළිකරන්නේ නෑ,'

'අනා. ඔයාට දෙවියන්ගෙම පිහිටයි ! අනා දෙවියන්ගෙම පිහිටයි!' සැහෙන වේලාවකට පසු කටින් වචන කිහිපයක් පිටකළ කොරාමී කීය. ඇය ඔහු වෙත හෙළුවේ අවඥා සහගත බැල්මකි.

'ඔබේ ඔය කාලකණ්ණි ජීවිතේ බේරාගන්න ඔය හැටි උත්සාහ කරන්නෙ ඇයි සර්ජියස්. ඔය ජීවිතෙන් බොහොම දෙනෙකුට ලැබුණේ විපත් පමණයි. එහෙත් කිසි කෙනෙකුට වෙච්ච යහපතක් නෑ. ඒ වුණත් දෙවියන් ඒක ඉවරයක් කරන තුරු ඔය යාන්තමට එල්ලිලා තියෙන අණ කොන්ද මං ඉවර කරන්නෙ නෑ. මේ කාලකණ්ණි ගෙදරට ආව වෙලාවෙ ඉඳල මගේ ආත්මයට මහා පාපයකට කරගහන්න සිද්ධ වුණා. ඒ වුණත් ප්‍රමාද වැඩිවෙන්න කලින් මං ඔක්කොම කියන්න ඕන.

මහත්වරුනි මං ඔබට කිව්වා මම මේ මිනිහගේ බිරිඳ කියල. මං මොහු සමග විවාහ වෙනකොට ඔහුට අවුරුදු පනහයි. මං හිටියේ මෝඩ, අඥාන, අවුරුදු විස්සේ. එය සිදුවුණේ රුසියාවේ විශ්ව විද්‍යාලයක. ඒ තැන මොකක්ද කියල මං හෙළිකරන්නේ නෑ'

'ඔයාට දෙවියන්ගේම පිහිටයි අනා' කොරාමී යළිත් වරක් කෙඳිරි ගෑවේය.

'අපි ප්‍රතිසංස්කරණ වාදියො, විප්ලවවාදියො කල්ලියක්. ඔබට තේරෙනවා නේද. ඔහුත් මමත් තවත් රාශියක් දෙනා ඊට

සම්බන්ධ වෙලා හිටියා. අපේ සංවිධානයට මහා කලබලකාරී කාලයක් උදාවුණා. පොලිස් භටයෙකු අපේ අතින් මැරුම් කැවා. ඒකෙන් අපේ කීපදෙනෙකු අත් අඩංගුවට ගැනුණා. ආණ්ඩුවට ඕනෑ වුණා මේ සිද්ධිය ගැන සාක්ෂි. මේ මිනිහා මොකද කළේ? තමන්ගේ ජීවිතය බේරා ගැනීමටත් , මහා විශාල තෑගි මුදලක් ලබාගැනීමටත් ඔහු අප ඔක්කොම පාවා දුන්නා. තමන්ගේ බිරිඳත් සගයන් සියලු දෙනාත් පාවා දුන්නා. ඔහුගේ පාපෝච්චාරණය මත අප සියලුම දෙනා අත් අඩංගුවට ගත්තා. සමහර දෙනෙකුට මරණීය දඬුවම ලැබුණා. අනෙක් අය සයිබීරියාවේ බන්ධනාගාරයට යැවුණා, මාවත් යැවුණේ එහේටයි. නමුත් මට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් ලැබුණේ නෑ. මේ මිනිහා ඔහුට ලැබුණු විශාල තෑගි මුදලත් අරගෙන එංගලන්තයට පැන ආවා. ඔහු ඉන්නා තැනක් දැනගත්තොත් අපේ සහෝදරත්වයෙන් ඔහුට කිසිම සමාවක් නොලැබෙන බව දන්නා නිසා ඔහු බොහොම අප්‍රසිද්ධියේ මෙහේ ජීවත්වුණා.'

මහාචාර්යවරයා වෙවුලන දෑත් දිගුකොට තවත් සිගරට්ටුවක් දල්වාගෙන

'අනා. මගේ ජීවිතය තියෙන්නේ ඔයාගෙ අතේ අනා. ඔබ හැමවිටම මට ආදරයෙන් හිටියා අනා.' යයි පැවසීය.

'ඔහුගේ අවසන් දුෂ්ට ක්‍රියාව ගැන මං තවම කිව්වේ නෑ. අපේ සංවිධානයේ සහෝදරවරුන් අතර කෙනෙක් හිටියා. ඔහු ආත්මාර්ථකාමීත්වයක් නැති, හැමදෙනාටම ආදරයෙන්, දයාවෙන් හිටි ඉතාම උතුම් පුද්ගලයෙක්. මගේ ස්වාමියාට නොතිබුණු හැම හොඳ ගතිගුණයක්ම ඇලෙක්සිස්ට තිබුණා. මගේ ආදරයත්, ගෞරවයත් හිමිවුණේ ඔහුටයි. ඇලෙක්සිස් හැමදමත් දේශනා කළේ, අපට උපදෙස් දුන්නේ, ලිව්වේ, අවිහිංසාව ගැන. අප ආයුධ සන්නද්ධ, හිංසාකාරී මාවතකට පිවිසෙන එක වලක්වන්න ඔහු ලියවිලි ගණනාවක් ලිව්වා. මගේ දිනපොතත් ඒ ලිපි වගේමයි. අවිහිංසාවාදී මාර්ගය ගැන ඇලෙක්සිස් දක්වපු අදහස් හා ඒ ගැන මගේ අදහස් මං මගේ දිනපොතේ ලිව්වා. බලධාරයන්ට ඒ දිනපොත සහ ලියවිලි ලැබුණා නම් ඇලෙක්සිස්ට හිරදඬුවමෙන්

නිදහස් වෙන්න තිබුණා. ඔහු ගැන මගේ හිතේ ඇතිවුණු හැඟීම් මම ලිව්වෙත් ඒ දිනපොතේ. මගේ ස්වාමියාට මගේ දිනපොත සහ ලිපි අහුවුණා. ඔහු ඒ සියල්ලම හංගාගත්තා. ඒවා හංගාගෙන මේ මිනිහා උත්සාහ කළේ ඇලෙක්සිස්ට මරණ දඬුවම ලබාදෙන්නයි. නමුත් ඔහු හිරකාරයෙක් හැටියට සයිබීරියාවට යැවුණා. අද මේ මොහොතේත් ඔහු සයිබීරියාවේ ඛණිජ ලවණ පතලක කම්කරුවෙක් හැටියට වැඩ කරනවා. තක්කඩියා, දුෂ්ටයා, දුර්ජනයා. උඹ ඒ ගැන හිතාපං - මේ මොහොතෙත් ඇලෙක්සිස් වහලෙක් වගේ ඒ පතලෙ වැඩ කරනවා. ඒ මිනිහගේ නම වත් කියන්න වටින්නෙ නැති උඹ? උඹේ ජීවිතේ තියෙන්නෙ මගේ අතේ. ඒත් උඹට මරණ දඬුවම ලබාදෙන්න මට හිතක් නෑ.'

'අනා, ඔයා හැමදාමත් උතුම් කාන්තාවක් අනා!'

කොරාම් කිව්වේ දුම් ගුලියක් පිටකරමිනි.

ඇය යමක් කීමට ඇදෙන් නැඟිට්ටාය. එහෙත් වේදනාවෙන් කෙඳිරිගාමින් යළි එහි ඇදවැටුණාය.

'මං ඉක්මනට මේ කථාව ඉවර කරන්න ඕන. මගේ හිරදඬුවම අවසන් වුණාම මගේ හිතේ තිබුණේ එකම අරමුණයි. ඒ අර දින පොතයි ඇලෙක්සිස්ගේ ලියවිලි ටිකයි හොයාගැනීම. ඒක රුසියාවෙ රජයට ඉදිරිපත් කළා නම් ඇලෙක්සිස්ට නිදහස ලැබෙනවා. මගේ ස්වාමියා එංගලන්තයට ආ බව මම දැනගෙන හිටියා. මාස ගණනක් තිස්සේ හොයලා ඔහු හැංගිලා හිටි තැන මං හොයා ගත්තා. දිනපොත තවමත් ඔහු ළඟ තියෙන බව මං දැනහිටියා. ඒ මොකද මං සයිබීරියාවෙ හිරගෙදර සිටිද්දී දින පොතේ කොටස් උපුටා දක්වමින් ඔහු මට ලිපියක් එවා තිබුණා. ඒකෙ මට දෝෂාරෝපණය කරල තිබුණා. නමුත් ඔහුගේ පළිගන්නා ස්වභාවය මං හොඳහැටි දන්නවා. ඒ නිසා ඔහුගේ කැමැත්තෙන් මේ ලියකියවිලි කිසි එකක් නොදෙන බව මං දැනහිටියා. ඉතින් මං තීරණය කළා එංගලන්තයට ඇවිත් ඒවා හොයාගන්න මගේ උත්සාහය යොදන්න. ඒ අරමුණෙන් මම පෞද්ගලික රහස් පරීක්ෂක ආයතනයක රහස් පරීක්ෂකයෙක්

යදෙව්වා. ඔහු පෞද්ගලික ලේකම්වරියක් ලෙස මගේ ස්වාමියා යටතේ සේවයට බැඳුණා. සර්ජියස් ඔහු තමයි ඔබගේ සේවයට දෙවැනි ලේකම්වරයා. අර බොහොම කලබලෙන් රැකියාවෙන් අස්වෙලා ගියේ. මට උවමනා කරන ලියවිලි සඟවලා තිබෙන්නේ කන්තෝරු කාමරේ අල්මාරියේ බව ඔහු සොයාගත්තා. ඒකෙ යතුරෙ අච්චුවක් මට ලබාදෙන්නත් ඔහු සමත් වුණා. නිවසේ සැලැස්මක් ඔහු මට සපයලා දුන්නා. උදේ වරුවේ කන්තෝරු කාමරය හිස් බවත්, එහි කිසි කෙනෙක් නොගැවසෙන බවත් ඔහු මට කිව්වා. ඒත් එතනින් එහාට කිසිදෙයක් කරන්න ඔහු කැමැති වුණේ නෑ.

ඉතින් මං තීරණය කළා ලියවිලි ටික ගන්න මගේ සම්පූර්ණ උත්සාහය යොදන්න. රහස්පරීක්ෂකයා මට කිව්වේ ලේකම් වරයා උදේ වරුවේදී මහාචාර්යතුමාගෙ කාමරයේ වැඩ කටයුතු වල නිරතවෙන බවයි. ලියකියවිලි ටික ගැනීමේ වැඩේ සාර්ථක වුණා. ඒත්.....දෙවියනේ මොන තරම් දෙයක් කැපකරලද

මම උවමනා දේවල් අරගෙන අල්මාරිය යතුරු දමනකොට තමයි අර තරුණයා පිටිපස්සෙන් ඇවිත් මාව අල්ලාගත්තේ. එද දවසේ ඊට කලින් මට ඔහුව පාරේදී මුණ ගැහුණා. ඔහු මෙහේ සේවය කළ බව නොදැන, මං ඔහුගෙන් ඇහුවා මහාචාර්ය කොරාම් පදිංචි වෙලා ඉන්නේ කොහේද කියලා

'අන්න හරි!' හෝම්ස් කථාවට බාධා කළේය. 'විලෝබි ස්මිත් ආපහු ඇවිත් මහාචාර්යවරයාට කිව්වා කාන්තාවක් ඔහුගෙන් එසේ විමසූ බව. ඊළඟට ඔහු අවසන් හුස්ම හෙළද්දී අවසන් වචන වලින් ඒ පණිවුඩය තමා දුන්නේ'

'මට කථාකරන්න ඉඩ දෙන්න මහත්මයා'

කාන්තාව අවසද්දී ඇගේ මුහුණෙන් වේදනාත්මක හැඟීම් ප්‍රකාශ විය.

'ඔහු බිම වැටුණාම මං කාමරයෙන් එළියට දිව්වා. වැරදි පැත්තේ දිගේ ගමන්කිරීම නිසා මං නැවතුණේ මේ මිනිහාගේ

Reading Purpose Only. Not For Print

කාමරයේ. ඔහු සූදානම් වුණේ මාව පොලිසියට භාර දීමටයි. ඔහු එසේ කලොත් ඒක ඔහුටත් බලපානවා. ඒ මොකද ඔහුගේ ජීවිතය රඳා පවතින්නේ මගේ අතේ. ඔහු මාව පොලිසියට පාවාදුන්නොත් මං ඔහු අපේ සහෝදරයින්ට භාර දෙනවා. තමන්ගේ ජීවිතයට තිබෙන ආසාව නිසා, අන්තිමට ඔහු මාව සඟවාගන්න කැමැති වුණා. මේ අඳුරු ගුහාවක් වගේ පොත් අල්මාරිය පිටුපස කොටසක මාව හැංගුවා. ඔහු කෑම ගත්තේ කාමරය ඇතුලේදීම නිසා කෑම වලින් කොටසක් මට දෙන්නටත් හැකිවුණා. පොලිසිය මෙහෙන් පිටවෙලා ගියාට පස්සේ , කළුවර වැටුණාම මේ ගෙදරින් යන්නත්, ඊට පස්සෙ කවදවත් මෙහේ නොඑන්නත් මම එකඟ වුණා. නමුත් කොහොම හරි ඔබ මාව සොයා ගැනීමට සමත් වුණා.'

ඇගේ පපුව දෙසට අත දැමූ ඇය ඇඳුමේ සඟවාගෙන සිටි පැකට්ටුවක් එළියට ගත්තාය.

'මේ මගේ අන්තිම වචන. මෙන්න මේ ලියකියවිලි පාර්සලයෙන් ඇලෙක්සිස් බේරා ගන්න පුළුවනි. මං ඒක ඔබට භාරදෙනවා. සාධාරණත්වයත් යුක්තියත් අගය කරන පුද්ගලයින් හැටියට ඔබ ඒක රුසියානු තානාපති කාර්යාලයට භාරදේවි කියල මං විශ්වාස කරනවා. දැන් ඉතින් මගේ යුතුකම ඉටු කරල අවසානයි. මම..........

'ඇයව නවත්වන්න!' කාමරය හරහා ඉදිරියට පිනූ හෝම්ස් ඇගේ අතේ තිබූ කුඩා කුප්පියක් උදුරා ගත්තේය.

'ප්‍රමාද වැඩියි !' ඇඳේ වැතිරෙමින් ඇය කීවාය.

'ඔබ ප්‍රමාද වැඩියි ! මං ඒ විෂ කටට හලා ගත්තේ හැංගිලා හිටිතැනින් එළියට ඒමට පෙර. මගේ හිස කැරකෙනවා. මේ මගේ අවසානය ! මහත්වරුනි අර පැකට්ටුව අමතක කරන්න එපා'

*        *        *

http://sherlockholmesinvestigations.blogspot.com



"ඇයව නවත්වන්න"

http://sherlockholmesinvestigations.blogspot.com

'පහසු පරීක්ෂණයක්. ඒත් එහි යම් උපදේශාත්මක ස්වභාවයක් තිබුණා' හෝම්ස් පැවසුවේ අප ආපසු පැමිණෙද්දීයි.

'මියගිය තැනැත්තාගේ අතේ උපැස් යුවළ තිබීම මතයි මුළු පරීක්ෂණයම රැඳී තිබුණේ. එහෙම නොතිබුණා නම් මේක විසඳන්න මේ තරම් පහසු එකක් වේවි කියලා මම හිතන්නෙ නෑ. උපැස් යුවළේ ප්‍රබලත්වය අනුව ඒ අහිමිවුණාම එහි අයිතිකාරයා බොහොම අසරණ, ඒ කියන්නේ අඩක් අන්ධ තත්ත්වයට පත්වෙනවා. ඒ බව මට එසැවරම පෙනුණා. ඇය අර සිහින් තණ තීරුව දිගේ ගිහින් තියෙනවා කිව්වාම ඒක සුවිශේෂ දක්ෂතාවක් කියලා මං කිව්වා ඔබට මතක ඇති. ඇයට තවත් අමතර උපැස යුවළක් තිබුණා නම් මිස ඒක කෙසේවත් කළ නොහැකි වැඩක් ලෙසයි මං සලකන්නේ. ඒ නිසා මගේ නිගමනය වුණේ ඇය තවමත් ගේ ඇතුළේ රැඳී සිටිනුවා විය යුතුයි කියන එකයි.

පැසේජ් දෙකේ සමානත්වය නිසා ඇය බොහෝ විට මහාචාර්යතුමාගේ කාමරයටම ඇතුළු වෙන්න ඇති කියලා මං නිගමනය කළා. එහි සැඟවෙන්න තැනක් ඇතිද කියලා මං බැලුවා. මං විශේෂයෙන් බැලුවේ එහි එළා ඇති බුමුතුරුණට යටින් රහස් කාමරයකට යන දොරටුවක් ඇතිද කියලා. නමුත් බුමුතුරුණු, ඇණ ගසා බිමට සවිකරලයි තිබුණේ. ඒ නිසා සැඟවීමට තැනක් ඇත්ද කියල පොත් අල්මාරි වෙත මගේ සිත යොමු කළා. ඔබ දන්නවා ඇති පැරණි පුස්තකාල වල පොත් අල්මාරි පිටුපස මෙවැනි ගබඩා කිරීමේ ඉඩ තියෙන බව. සෑම පොත් අල්මාරියක් ඉදිරිපිටම බිම, පොත් ගොඩගසා තිබුණත් මෙතැන සම්පූර්ණයෙන්ම හිස්ව තිබුණා. ඉතින් මං මොකද කළේ. සිගරට් රාශියක් උරලා පැක සහිත අල්මාරිය ඉදිරිපසින් සැඟෙන තරම් සිගරට් අළු විසුරුවා දැම්මා.

මහාචාර්යතුමාගේ ආහාර රුචිය වැඩිවී ඇති ආකාරය ගැන මං හොයා බැලූ හැටි ඔබට මතක ඇති. ඔහු තවත් කෙනෙකුට කෑම සපයන නිසා ඔහුගේ 'කෑම රුචිය' ඉහළ ගිය හැටි අපට තේරුම් ගත හැකියි. අපි දෙවැනිවර කාමරයට ඇතුළු වුණාම, සිගරට් අඩංගු බඳුන පෙරළීමෙන්, සිගරට් අළු මත ඇති

අඩිසටහන් පරීක්ෂා කිරීමට මට හැකිවුණා. අප නැති අතරේ කාන්තාව සැහැවී සිටි තැනින් එළියට ඇවිත් ඇති බව නිගමනය කිරීම අපහසු වුණේ නැහැ.

ඉතින් හොප්කින්ස්, ඔන්න අපි චාරිං ක්‍රොස් වලටම ඇවිත්. ඔබේ පරීක්ෂණය සාර්ථක ලෙස නිමකිරීම ගැන මගේ ශුභපැතුම් පිළිගන්න. ඔබ කෙළින්ම පොලිස් මූලස්ථානය වෙත යනවා වෙන්න ඇති. වොට්සන් අපි දෙන්නා යළි රුසියන් තානාපති කාර්යාලයට ගිහිං එන්න

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# මරු කැඳවූ ලියුම

## හෙවත්

# ග්ලෝරියා ස්කොට් අභිරහස

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

## මරු කැඳවූ ලියුම හෙවත්

## ග්ලෝරියා ස්කොට් අභිරහස

ශීත සෘතුවේ එක් රාත්‍රියක අපි ගිනි උදුන දෙපස වාඩිවී කතාබහ කරමින් සිටියෙමු. මා මිතු ෂර්ලොක් හෝම්ස්, දුර්වර්ණ වූ සිලින්ඩරාකාර ලෝහ බඳුනක් ලාච්චුවෙන් ඉවතට ගත්තේය. එය බැඳ තිබූ ටේප් පටිය ලිහා දැමූ ඔහු, ඒ තුළින් ගත්තේ අළු පැහැති කඩදසියකි.

'වොට්සන්, මගේ පරීක්ෂණ වලින් ඉතාම සුවිශේෂ එකක් වන, ග්ලෝරියා ස්කොට් අභිරහස ගැන මං සඳහන් කරනවා ඔබ අහල ඇති. ඒකට සම්බන්ධ වැදගත්ම ලියවිල්ල තමයි මේ'

ඒ අළු පැහැති කඩදාසි කැබැල්ලේ නොපැහැදිලි අත් අකුරෙන් කෙටි පණිවුඩයක් සටහන් කර තිබිණි.

'ඒක කියවලා වැඩිවෙලා ගියේ නෑ, සාමදාන විනිශ්චයකාර ට්‍රෙවෝ මහත්මයා අප්‍රමාණ භීතියකින් කම්පනයට පත්වුණා. ඔහු ඒකෙන් සිහි නොලබාම මරණයට පත්වුණා'

'දඩයම් සතුන් අපි නොසැලකිලිමත් වීමෙන් විනාශයි. දඩබිම භාරකරු හඩසන් ලී සඳහා ඔක්කොම ලදු හැලැ රැලිකරලා. වලිකුකුලන් වනාන්තරයට පැනගියොත් දඩයම් කිරීමට ජීවිත කාලයට බැරිවේවි බේරාගැනීමට නිලධාරීන්ට දැන්නුවොත් හැකිවේවි.'

මේ පණිවුඩය කියවද්දී මගේ මුහුණෙන් ප්‍රකාශ වුණු හැඟීම දුටු හෝම්ස්ට සිනා පහළ විය.

'ඔබ විකක් අන්දුන් කුන්දුන් වෙලා වගේ වොට්සන්?'

'මේ වගේ පණිවුඩයකින් මිනිහෙක් මරණ භයකට පත්වුණේ කොහොමද කියල මට නම් හිතාගන්න බෑ. මට පේන්නෙ මේක මහ විකාර පණිවුඩයක්'

'බොහොම දුරයි ඔව්. ඒවුණත් මැදිවියේ, එහෙත් ශක්තිමත්

http://sherlockholmessinvestigations.blogspot.com

Reading Purpose Only, Not For Print

නිරෝගී මිනිහෙක් මේක තියෙව්ව ගමන් කපා හෙළූ ගහක් වගේ බිම ඇද වැටුණා.'

'ඔබ මගේ කුතුහලය අවුස්සනවා, හෝම්ස්. ඒ වුණත් මේ පරීක්ෂණය ගැන සියලුම විස්තර දැනගැනීම මට ඉතා වැදගත් වේවි කියල, ඔබ කිව්වෙ ඇයි?'

'මොකද දන්නවද? මේක තමයි, ගැටළුවක් විසඳා දෙන්න කියලා මට භාරවුණු මුල්ම අභිරහස.'

මගේ මිතුරා අපරාධ පරීක්ෂණ ක්ෂේත්‍රයට යොමු වූ හැටි විමසීමට මම බොහෝ වර කල්පනා කළෙමි. එහෙත් ඒ ගැන විවේකීව කතාබහ කළ හැකි මෙවැනි අවස්ථාවක් සොයාගැනීමට මට මෙතෙක් නුපුළුවන් විය. දැන් එම කාලය එළඹ ඇත. හාන්සිපුටුවේ වාඩිවී, පයිප්පය දල්වා ගත් හෝම්ස්, සැහැල්ලු සිතින් කඩදාසිය ඒ මේ අත පෙරළුවේය.

'මං වික්ටර් ට්‍රෙවර් ගැන කතා කරනවා ඔබ අහල තියෙනවද? විශ්ව විද්‍යාලයේ ගත කළ අවුරුදු දෙකක කාලයේදී මං මිතුරු කමක් ඇතිකරගත්තු එකම පුද්ගලයා තමයි වික්ටර්. මං ඒ හැටි සමාජශීලී පුද්ගලයෙක් නෙමෙයි වොට්සන්. මං වඩාත් කැමති වුණේ විවේක කාලයේදී මගේ කාමරය ඇතුළට වෙලා, නිරීක්ෂණ, පරීක්ෂණ ආදී දේ ගැන කල්පනා කරමින් සිටින්න. අපේ වයසේ අනෙක් සිසුන් සමඟ මගේ ඒ හැටි ආශ්‍රයක් තිබුණේ නෑ. මං අධ්‍යාපනය ලැබුවත් වෙනස් විෂයයන්. මලල ක්‍රීඩා, බොක්සිං හා කඩුසරඹ හැරෙන්න වෙනත් ක්‍රීඩා වලටත් මං සහභාගී වුණේ නෑ. ඒ නිසා අනෙක් අය හමුවෙන්න මට ඉඩක් සැලැසුණේත් නෑ. එක දවසක් උදේ, මං පල්ලියට යද්දී ඔහුගේ බලු පැටියා මගේ කකුල හපා කෑවා. ඒකෙන් තමා මං වික්ටර් ට්‍රෙවර්ව හඳුනාගත්තේ.

මං දවස් දහයක් ඇවිදින්න බැරුව එක තැන් වෙලා හිටියා. ඒ දවස් වල මගේ සැප්සනීප බලන්න ඔහු මගේ කාමරයට ආවා. මුලින් අප අතරේ ඇතිවුණු පොඩි කතාබහ ක්‍රමයෙන් වැඩිවෙලා, පස්සෙ අපි දෙදෙනා ඉතාම හිතවත් මිතුරන් බවට



200. "නිවාඩුව ගතකරන්න ඔහුගේ ගමට එන්න කියලා වික්ටර් ට්‍රෙවෝ මට ආරාධනා කළා."

For Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

පත්වුණා. ඔහු මට වඩා බොහොම වෙනස් ගතිගුණ තිබූ ක්‍රියාශීලී කෙනෙක්. ඒත් මං වගේම මිතුරන් නැති කෙනෙක්. ඒක දැනගත්තාම අප දෙදෙනා අතර තිබූ බැඳීම තවත් වැඩිවුණා. ඔය අතරෙදි විශ්ව විද්‍යාලයේ දීර්ඝ නිවාඩුව අපට ලැබුණා. ඒක ඔහුත් සමග ගතකරන්න, ඔහුගේ ගමට එන්න කියලා වික්ටර් ට්‍රෙවෝ මට ආරාධනා කළා. ඔන්න ඔහොමයි මං නෝෆෝක් ප්‍රාන්තයේ, ඩොනිතෝප් ගම්මානයේ ට්‍රෙවෝලාගේ නිවසට ගියේ.

ඔහුගේ තාත්තා - වයස්ගත ට්‍රෙවෝ, ඒ පළාතේ වැදගත්, ධනවත් කෙනෙක්. ඔහු සාමදාන විනිශ්චයකාර ධුරයක් දැරූ ඉඩම්හිමි වැවිලි කරුවෙක්. ඩොනිතෝප් කියන්නේ ලැංමියර් වලට උතුරෙන් තියෙන කුඩා ගමක්. ඔවුන්ගේ නිවස ගඩොලින් තැනූ, විශාල එකක්. නිවස කිට්ටුව වල් තාරාවුන්, වලිකුකුළන් හිතේ හැටියට දඩයම් කරන්න පුළුවන් වන රොදක් තිබුණා. ඒ අවට හොඳ හැටි මසුන් අල්ලන්න පුළුවන් දියපාරවල් තිබුණා. ඉවුම් පිහුම් වලට, ඉතාම දක්ෂ නැති වුණත්, සතුටුදායක තත්ත්වයේ කෝකියෙක් සිටියා. ඉතින් මේ වගේ තැනක්, මාසයක නිවාඩුවක් සතුටින් ගතකරන්න කාටද බැරි?

වික්ටර්ගේ අම්මා මියගිහින්. ඔහු තමයි වැඩිමහලු ට්‍රෙවෝගේ එකම පුතා, එකම දරුවා. වික්ටර්ට සොහොයුරියක් ඉඳලා තියෙනවා. නමුත් ඇය කලකට පෙර ඩිප්තීරියා රෝගයෙන් මියගිහින්.

වැඩිමහලු ට්‍රෙවෝගේ පිළිවෙළ ගැන මගේ හිත හරියට ඇදිල ගියා. ඔහු ඒ තරමට ඉහළ පෙළේ සිරිත්විරිත් වලට හැඩගැහුණු කෙනෙක් නෙමෙයි. ඒ වුණත් බොහොම ශක්තිවන්ත, කායික ශක්තිය පමණක් නෙමෙයි මානසික ශක්තියත් තිබුණු කෙනෙක්. ඒ තරම් දුරට පොතපත කියවපු කෙනෙක් නෙමෙයි: ඒ වුණත් ලෝකේ පුරාම සංචාරය කරල රටරටවල් දැකපු කෙනෙක්. ඒ දැකපු දේවල් හොඳට හිතට ගත්තු, මතක තියාගත්තු කෙනෙක්. ශරීරයේ අනුමානෙන් බැලුවොත් ඒහාද උස මහත පුද්ගලයෙක්. කොණ්ඩේ ටිකක් එහෙන් මෙහෙන් පුදුවෙලා. සිරුර අව්වට පිළිස්සිලා දුඹුරු පාට ගැහිලා. නිල්පාට ඇස්දෙකේ

තිබුණේ තරමක් පැරපරුෂ පෙනුමක්. එහෙත් ඔහු බොහොම කරුණාවන්ත, න්‍යායශීලී කෙනෙක් හැටියට ඩොනිතෝප් ගම්මානයේ ප්‍රසිද්ධව හිටියා. සාමදාන විනිශ්චයකාරයෙක් හැටියට ඔහු වින්තිකරුවනට දුන් දඬුවම් පවා ලිහිල් ඒවා බව ප්‍රකට කරුණක් වී තිබුණා.

මං එහේ නවතින්න ගිහින් දවස් කීපයකට පස්සේ, එක දවසක් රෑ, අපි වයින් වීදුරු මහාලගාමින් සතුටු සාමීචියේ යෙදෙමින් හිටියා. මේ වෙලාවේ වික්ටර්, මං කළ, නිරීක්ෂණ මගින් නිගමනයන්ට එළැඹීම ප්‍රායෝගිකව යෙදවූ හැටි ගැන ඔහුගේ පියාට කියන්න පටන් ගත්තා. මං කළ සොයාගැනීමක් දෙකක් පුතා විස්තර කළාම, මහලු ට්‍රෙවෝ හිතුවෙ ඒක අතිශයෝක්තියක් හැටියටයි.

'හොඳයි බලමු හෝම්ස් මහත්මයා' ඔහු විහිළුවට සූදානම් වෙලා වගේ සිනාසිසී කිව්වෙ බොහොම සැහැල්ලුවෙන්.

'ඔබට ඔය කියන විදියට නිරීක්ෂණ මගින් සොයාගැනීම් කරන්න පුළුවන් නම්, මං දිහා බලල කියන්නකො ඔබට මොනවද හොයාගන්න පුළුවන්?'

'ඒ තරම් හුඟක් කාරණා නම් කියන්න බැහැ මහත්මයා. ඒත් මට මේ ටික කියන්න පුළුවනි. පහුගිය මාස දොළහ ඇතුළත කාගෙන් හරි එල්ල විය හැකි ප්‍රහාරයක් ගැන, හිතේ භයෙනුයි ඔබ ජීවත්වෙන්නෙ'

අර හිනාව ඔහුගේ මුහුණෙන් එක්වරම මැකී ගියා. කටත් බාගෙට ඇරගෙන ඔහු මං දිහා ඇසිපිය නොහෙළා බලා හිටියෙ පුදුමයෙන්.

'ඔව්. ඒක ඇත්තයි. ඇයි වික්ටර්, පුතාට මතක නේ අපි අර හොරු කණ්ඩායම අල්ල ගත්ත එක. උන් අපි ඔක්කොටම පිහියෙන් අනින බවට දිවුරලයි ඉන්නෙ. දැනටමත් සර් එඩ්වඩ් හොලීට පිහියෙන් ඇනලා. එද ඉඳන් මාත් බොහොම ප්‍රවේශම්

http://sherlockholmesinvestigations.blogspot.com

වෙනවා. ඒ වුණත් හෝම්ස් මහත්මයා, ඔබ ඒ බව තේරුම් ගත්තෙ කොහොමද කියලා. මට හිතාගන්න බැහැ.'

'ඔබ ළඟ තියෙනවා ඉතාම අලංකාර සැරයටියක්. මේකෙ කැටයම් කර තිබෙන වගෙන් කියවුණු හැටියට, මේක අවුරුද්දකට වඩා පරණ නෑ. ඒත් ඔබ ඒකෙ හිස කොටස හාරවලා, ඒ කුහරයට උණු කරපු ඊයම් දම්මගෙන තියෙනවා. ඒ මගින් ඒක හොඳ ආයුධයක් බවට හරවාගෙන. ඉතින් ඔබට බය වෙන්න දෙයක් නොමැති නම් ඔබ එවැනි පියවරක් නොගන්නා බව මට තීරණය කරන්න පුළුවන් වුණා.

'වෙන මොනවද?' -ඔහු ඇහුවේ යළිත් සිනාසෙමින්

'ඔබ තරුණ කාලෙ හොඳට බොක්සිං ක්‍රීඩාවෙ යෙදුණු කෙනෙක්?'

'හරියට හරි. කොහොමද ඔබ දැනගත්තේ? මගේ නාසය ටිකක් පැත්තකට ඇද වෙලා වගේ නේද?'

'නැහැ, ඔබේ කන් පෙති වලින්. බොක්සිං ක්‍රීඩකයන්ගේ කන්පෙති එක් විශේෂ ආකාරයකට පැතැලි වෙලා, ඝනකම් වෙනවා'

'වෙන මොනවද?'

'ඔබ බොහොම කාලයක් තිස්සේ දැඩි මහන්සියෙන් පොළොව හෑරීමේ යෙදිලා තියෙනවා.'

'හරි. මං මගේ සල්ලි ඔක්කොම ඉපැයුවේ රන් ආකර වලින්'

'ඔබ නවසීලන්තයට ගිහිං තියෙනවා?'

'ඒකත් හරි'

'ඔබ ජපානයට ගිහිං තියෙනවා?'

'ඒකත් නිවැරදියි'

http://sherlockholmesinvestigations.blogspot.com

‘J.A. කියන මුල් අකුරු නමට ඇති කෙනෙක් සමග ඔබේ බොහොම ළඟ සම්බන්ධයක් තිබිල තියෙනවා. නමුත් පස්සෙ ඔබට ඒ පුද්ගලයාව සම්පූර්ණයෙන්ම අමතක කරන්න උවමනා වෙලා තිබෙනවා’

මං ඒක කිව්ව විතරයි ට්‍රෙවර් මහත්මයා බොහොම හෙමින් නැගිට්ටා. නැගිටලා ඔහුගේ නිල්පාට ඇස් දෙකෙන් ඇසිපිය නොහෙළා මං දිහා බලාගෙන හිටියේ මහා භයකින් වගේ. ඊට පස්සේ ටිකක් ඉදිරියට නැමිලා, එක පාරම ක්ලාන්ත වෙලා බිම ඇදගෙන වැටුණා !

වොට්සන් ඔබට හිතාගන්න පුළුවන් නේද ඔහුගේ පුතත් මමත් මොන තරම් කම්පනයකට පත්වෙන්න ඇතිද කියල. කොහොම වුණත් මහලු ට්‍රෙවර්ගේ ක්ලාන්තය ඒ තරම් වෙලා තිබුණේ නෑ. කමිසය බුරුල් කරලා මුහුණට වතුර ඉස්සාම ටික වේලාවකින් ඔහුට සිහිය ආවා. එක පාරක් දෙපාරක් අමාරුවෙන් හුස්ම අරගෙන ඔහු ආයෙමත් පුටුවේ වාඩිවුණා.

‘ළමයිනේ’ ඔහු කථාව පටන් ගත්තේ සිනාවක් මුහුණට ආරූඪ කරගෙන.

‘මං ඔයගොල්ලන්ව බයට පත් කරන්න නැතුව ඇති කියල හිතනවා. මං කොයිතරම් ශක්තිමත් වගේ පෙනුණත් මගේ හදවතේ එක් දුර්වල තැනක් තියෙනවා. ඒ නිසා මාව වට්ටන්න එච්චර අමාරු නෑ. ඔබ මේව හොයා ගන්නෙ කොයි ලෝකෙන්ද කියල මං දන්නේ නෑ හෝම්ස් මහත්මයා. ඒත් මං එකක් කියන්නම්. කතන්දර පොත්වල ඉන්න රහස් පරීක්ෂකයොයි ඇත්තටම පොලිසියේ ඉන්න අපරාධ පරීක්ෂකයොයි උන් ඔක්කොම ඔබ ඉදිරියේ තිබ්බොත්, උන් පොඩි ළමයි වගේ. ඔබ නම් අති දක්ෂයෙක්. රටේ ලෝකෙ ඇවිදල, බොහොම දේවල් දැකපු කෙනෙක් හැටියට මං කියන දේ ඔබට බය නැතුව විශ්වාසෙට ගන්න පුළුවන් මහත්මයා. ඔබට ජීවිතයේ උරුම වෘත්තිය අපරාධ පරීක්ෂකයෙක් වීමයි !

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු එද අතිශයෝක්තියෙන් කළ ඒ වර්ණනාවෙන් තමයි මගේ හිතට පොඩි අදහසක් ආවේ. මං මෙච්චර කලක් විනෝදාංශයක් හැටියට කළ දේ වෘත්තියක් ලෙසට දියුණු කර ගන්න පුළුවන් නේද කියල මට හිතුණා. ඒ මොහොතේ නම් මගේ ඔලුවට ආවෙ ඔය මොකුත් නොවෙයි. මහලු ට්‍රෙවෝගෙ අසනීප තත්ත්වය ගැන මං හරියට කැලඹීමට පත්වුණා.

'මහත්මයා, මගේ කටින් පිටවුණු දෙයින් ඔබ වේදනාවට පත්වුණේ නැහැ කියලා, මං විශ්වාස කරනවා?'

'මෙහෙමයි. ඔබ මගේ ජීවිතයේ බොහොම සංවේදී තැනකටයි පුංචි තට්ටුවක් දැම්මේ. මට මෙන්න මේ ටික කියන්න පුළුවන්ද හෝම්ස් මහත්මයා? ඔබ කොහොමද මේව දැනගත්තෙ? ඊළඟට කොයිතරම් දේවල්, ඔබ කොයිතරම් දුරට දන්නවාද?'

ඔහු මේ සැරේ කථා කළේ විහිළුවට වගේ පෙන්වාගෙන. නමුත් ඔහුගේ හිතේ ත්‍රාසය තිබුණු බව මට තේරුණා. ඔහුගේ හිතේ තිබුණු භය, දැස් වලින් පිළිබිඹු වුණා. මං ඒ කරුණු නිගමනය කළ ආකාරය ඔහුට පහද දුන්නා.

'ඒක බොහොම සරලයි ට්‍රෙවෝ මහත්මයා. අපි මසුන් අල්ලන බෝට්ටුවේ යද්දී, ඔබ අර මාලුවා බෝට්ටුවට ගන්න කමිස අත ඉහළට නැමුවා. එවිට මං දැක්කා, ඔබේ බාහුවේ ඉහළම කෙලවරේ J.A. අකුරු, පච්ච කොටලා තියෙන හැටි. ඒ අකුරු තවමත් යන්තමට කියවිය හැකියි. නමුත් ඒ වටේටම හම දුර්වර්ණ වෙලා. ඒකෙන් පෙනෙන්නේ ඔබ ඒක මැකීමට ලොකු උත්සාහයක් දරා ඇති බවයි. එයින් අදහස් වෙන්නේ, කාලයක් ඔබට සමීපව සිටි ඒ ම අකුරු සහිත තැනැත්තා, දැන් ඔබට අමතක කර දමන්න උවමනා වෙලා තියෙනවා'

'ඔබට තිබෙන්නෙ පුදුමාකාර නිරීක්ෂණ හැකියාවක් ?' ඔහු කිව්වෙ සැනසුම් සුසුමක් හෙළමින්. 'ඔබේ කථාව සම්පූර්ණ ඇත්ත හෝම්ස් මහත්මයා. නමුත් ඒක ගැන වැඩි විස්තර කියන්න මං අදහස් කරන්නේ නෑ. හිතට එන හොල්මන් වලින් නරකම

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

හොල්මන් පරණ ආදර සම්බන්ධකම් වලි හොල්මන්ද්‍ය. අපි යමු බිලියඩ් කාමරේට. ගිහිං තිව් හැකිහිල්ලේ බොමු පුරුට්ටුවක්

* * *

මං එහේ නැවතී හිටිය කාලේ ට්‍රෙවෝර් මහත්මයා මට හොඳට ආගන්තුක සත්කාර කළා. ඒත් ඔහු මං දිහා බැලුවෙ ටිකක් සැකමුසු අයුරින් බව මට වැටහුණා. වික්ටර් පවා වරක් මට ඔය ගැන කිව්වා.

'හෝම්ස්, ඔබ අපේ තාත්තව සැහෙන්න බය කරලා වගෙයි. තාත්තට සැකයි ඔබ කොයිතරම් ප්‍රමාණයක් ඔහු ගැන දන්නවද, මොනවද දන්නෙ නැත්තෙ කියල'.

ට්‍රෙවෝර් මහත්මයා කරි ඇත්ත කොයි වෙලාවකවත් මට ඒක නොකිව්වට, ඔහුගේ ස්වභාවයෙන් මට ඒක තේරුම් ගියා. මං එහි රැඳී සිටීමෙන් ඔහුට ඇතිවුණු අපහසුතාව කොච්චරද කියලා කිව්වොත්, මං තීරණය කළා එහෙන් ගත කළ නිවාඩුව ඉක්මනින් අවසන් කරල, ආපහු එන්න.

මං එහෙන් පිටත්වෙලා එන්න බලාපොරොත්තු වුණු දවසට කලින් දවසෙ විශේෂ සිදුවීමක් වුණා. පසුව එන සිද්ධිවලට ඒක වැදගත් වෙනවා.

මේ ගේ ඉස්සරහ තිබෙනවා තණකොළ වවපු මිදුලක්. එද අපි තුන්දෙනා එතැන තබපු සැපපහසු ප්‍රාන්සි පුටු වල වාඩිවෙලා බ්‍රෝඩ්ස් ගංගාවේ සුන්දර දර්ශන නරඹමින් හිටියා. මේ වෙලාවේ ගෙදර සේවිකාව අප වෙත ආවා.

'ලොකු මහත්තය හම්බවෙන්න කවුද මිනිහෙක් ඇවිත් ඉන්නවා' ඇය කිව්වා.

'මොකක්ද ඒ මිනිහගෙ නම?'

'ඔහු නම කියන්නෙ නෑ'

http://sherlockholmesinvestigations.blogspot.com

'මොනවද ඒ මිනිහට ඕන කරල තියෙන්නේ?'

Reading Purpose Only. Not For Print

'එයා කියනවා එයා ලොකු මහත්තයව අඳුනනවලු. ඔබට පොඩ්ඩක් කථා කරන්න ඕනෙලු.'

'මෙහාට එන්න කියන්න'

මඳ වෙලාවකින් කකුල් බිම අද්දවමින් මහ අශෝභන විදියට මිනිහෙක් එතැනට ආවා. බොහෝම යටහත් පහත් කම් පෙන්වමින් ආ ඔහු, වැහැරී ගිය සිරුරක් තිබුණු කෙනෙක්. ඇඳගෙන හිටියේ කරයි රතුපාට කොටු සහිත, කර විවෘත කරපු ලිහිල් කමිසයක්. කලිසම, කාරේ පටි වලින් එල්ලුණු තාලේ පරණ දිග කලිසමක්. ඔහු ඇඳගෙන හිටියේ බොහොම බර, ඒත් ගෙවී ගිය බූට්ස් සපත්තු. කුණුවටමක් කහ පැහැති දත් පෙන්වන කොයිවෙලෙත් රැඳුණු සිනාවක් ඔහුගේ මුහුණේ තිබුණා. ඒත් ඒ දුඹුරු පැහැති මුහුණේ කෛරාටික පෙනුමකුත් මා දුටුවා. නාවිකයන්ගේ පමණක් දකින්න ලැබෙන ආකාරයට අත්දෙක ද කුටු වෙලා තිබුණා.

ඔහු තණ පිට්ටනිය හරහා ඇවිද ගෙන එනවා දැක්කා විතරයි ට්‍රෙවෝ මහත්මියාගේ උගුරෙන් ඉක්කාවක් වගේ ශබ්දයක් පිටවුණා. ඔහු ඉක්මනට පුටුවෙන් නැගිටලා, ගේ ඇතුළට දිව්වා. මොහොතකින් ඔහු යළිත් ආවා. මාව පසුකරගෙන යද්දි ට්‍රෙවෝ ළඟින් මට, සැර බ්‍රැන්ඩි සුවඳක් ආවා.

'හොඳයි, මොනවද මගෙන් දැන් කෙරෙන්න ඕනෑ?'

නාවිකයා ට්‍රෙවෝ දිහා බැලුවේ ඇස් දෙක ටිකක් පුංචි කරලා මහත් උනන්දුවෙන්. ඔහුගේ මුහුණේ තවමත් අර සිනහව.

'ඔබ මාව අඳුනන්නෙ නැද්ද?'

'දෙයියෝ සාක්කි ! මේ හඩ්සන් නේ' ට්‍රෙවෝ පැවසුවේ මහත් පුදුමයෙන් වගේ.

'ඔව් මහත්මයා, මං හඩ්සන් තමයි. ඇයි අපි අන්තිමට දැක්කෙ අවුරුදු තිහකටත් ඉස්සර නොවැ? ඔබ මෙහේ ඔබේම

http://sherlockholmesinvestigations.blogspot.com



"ඔබ යැපෙත් ජීවත්වෙනවා. මම ගිහා නොකා ගිහා කනවා"

Reading Purr
http://sherlockholmesinvestigations.blogspot.com

ගෙදරකට වෙලා, සැපෙන් ජීවත්වෙනවා. මං මහ පාරේ ගිහා තොකා ගිහා කනවා'

'එහෙම කියන්න එපා හඩිසන්. ඒ කාලෙ මට අමතක නැති බව ඔහේට තේරේවි.'

එහෙම පිළිතුරු දුන් ට්‍රෙවෝ, නාවිකයා ළඟටම ගිහින් මොනවාදෝ හෙමින් කිව්වා. ඊට පස්සෙ ආයෙත් ශබ්ද නගා මෙහෙම කිව්වා.

'කුස්සිය පැත්තට යන්නකෝ. ඉස්සර වෙලා හොඳට කාල බිල ඉන්න. මට පුළුවන් ඉඩ්වි තමුසෙට රස්සාවක් හොයල දෙන්න. ඒකෙ සැකයක් නෑ.'

'බොහොම ස්තූතියි මහත්මයා' නාවිකයා කිව්වෙ ඔහුට ආචාර කරමින්.

'පුංචි රුවල් නැවක, අවුරුදු දෙකක් තිස්සෙ මහ මුදේ දුක් විඳලා මං ඒකෙන් අයින් වුණා විතරයි. දැන් මට ඕන කරන්නේ පොඩි විවේකයක්. ඒකයි මං හිතුවේ ගිහි හරි බෙඩෝස් මහත්මයා හරි හම්බවෙන්න'.

'ආ.......... ? මොනව? ඔහේ දන්නවද බෙඩෝස් මහත්මයා ඉන්නෙ කොහේද කියලා?'

'විශ්වාස කරන්න මහත්මයා, මං දන්නවා මගේ පරණ යාළුවො නැම දෙනෙක්ම ඉන්න තැන්'.

නාවිකයා කිව්වෙ උජාරුවෙන්. ඒ වගේම දුෂ්ට හිනාවක් පාමින්. එහෙම කිව් ඔහු සේවිකාව පිටුපසින් කුස්සියට ගියා.

'මං රත්තරන් ඉල්ලම් හාරන්න යාත්‍රා කරද්දී, මේ මිනිහ මාත් එක්ක එකට නැවේ ගමන් කළ කෙනෙක්' ට්‍රෙවෝ මහත්මයා ඒක කියා ගත්තෙ බොහොම අමාරුවෙන් තතනමින්. ඊට පස්සේ අපි මිදුලෙ සිටියදීම ඔහු නිවස තුළට ගියා. අපි ගෙට ගියේ පැයකට විතර පස්සෙ. අපි [illegible]

දර්ශණයක්. ට්‍රෙවෝ මහත්මයා කෑම්කෑති කාමරයේ සෝපාවේ වැතිරිලා හිටියා. සිහි කල්පනාවක් නැතිවෙන තරමට අධික ලෙස මත්පැන් බීල, ඔහු වැතිර හිටියේ මළමිනියක් වගේ. මේ සිද්ධිය මගේ හිතට තදින්ම කාවැදුණා. මගේ මිත්‍රයාට, මා සිටි නිසා මේ සිදුවීම් වලින් ලැජ්ජා හිතෙන්නත් ඇති. ඒ නිසා ඊළඟ දවසේ ඩොනිතෝප් වලින් ආපහු ලන්ඩනය බලා එන්න සිදුවීම ගැන මගේ හිතේ කණගාටුවක් ඇතිවුණේ නෑ.

ශීත සෘතුව සඳහා ලැබුණු අපේ දීර්ඝ නිවාඩුවේ පළමුවැනි මාසයේදී තමයි මේ හැම දෙයක්ම සිද්ධවුණේ. මං ආපහු ආවේ ලන්ඩනයේ මං කුලියට අරගෙන තිබුණු කාමරයට. කාබනික රසායන විද්‍යා පරීක්ෂණ කරමින් මං එහි සති හතක්ම ගත කළා. ඔන්න දැන් නිවාඩුවත් අවසාන වෙගෙන එනවා. එක දවසක් හදිසියේම මගේ මිත්‍රයා වික්ටර් ගෙන් මට විදුලි පණිවුඩයක් ලැබුණා.

**'ඔබේ අවවාදය හා උපදෙස් අත්‍යවශ්‍ය වී ඇත. හැකි වහාම පිටත් වෙන්න. නොවරදවාම පැමිණෙන ලෙස් අයැද සිටිමි.**

**වික්ටර් ට්‍රෙවෝ'**

මං කරමින් සිටි රසායන විද්‍යා පරීක්ෂණ පැත්තකට දල වහාම ඩොනිතෝප් බලා යන්න පිටත්වුණා.

තමාම පැදවූ කුඩා අශ්ව කරත්තයකින් වික්ටර් දුම්රිය පොළට ඇවිත් හිටියා. පසුගිය මාස දෙක ඔහුට ඉතාම කරදර සහිත කාලයක් වී තිබුණු බව මට බැලූ බැල්මට පෙනුණා. ඔහු කෙට්ටු වෙලා පමණක් නොවෙයි. ඔහුගේ මුහුණේ හැමවිටම දකින්න ලැබුණු ප්‍රීතිමත් විනෝදකාමී ගතිය සම්පූර්ණයෙන්ම අතුරුදහන් වෙලා.

'තාත්තට අන්තිමයි' මාව දුටු වික්ටර් මුලින්ම කිව්වෙ ඒ වචන.

'ඒක වෙන්න බෑ? ඇයි මොකද වුණේ?'

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

'මොළයේ ලේ නහරයක පිපිරීමක් කියලයි දොස්තර කියන්නෙ. අද උදේ ඉඳලම ඉන්නෙ බොහොම අසාධ්‍ය තත්ත්වයෙන්. සිහියත් නෑ. අපි ආපහු යනකොට ජීවතුන් අතර ඉඳීද කියන එකත් මට සැකයි.

ඔබට හිතාගන්න පුළුවන් නේද වොට්සන් මේ කතාව ඇහුවම මට ඇතිවුණු හැඟීම.'

'කොහොමද එක පාරට මෙහෙම තත්ත්වයක් ඇතිවුණේ?'

'අන්න ඒක තමයි ප්‍රශ්නෙ. කරත්තයට නගින්න. අපි යන ගමං කතා කරමු. ඔබට මතකද හෝම්ස් ඔබ එද යන දවසට කලින් දවසෙ අපේ ගෙදරට ආ මිනිහා?'

'ඔව් මට හොඳට මතකයි'

ඔබට හිතාගන්න පුළුවන්ද එද අපි අපේ ගෙදරට වැද්දගත්තෙ කවුද කියල?'

'මට හිතාගන්න බෑ!'

'හෝම්ස් ඒ තමයි යක්ෂයා'

මං පුදුමයෙන් ඔහු දිහා බලාගෙන හිටියා.

'ඔව්. ඔහු වෙන කවුරුත් නෙවෙයි, යක්ෂයාම තමයි. ඌ ගෙදරට ආව දවසෙ ඉඳල අපි එක පැයක් සැනසිල්ලෙ ජීවත්වුණේ නෑ. අපි විතරක් නෙමෙයි තාත්තත් ඒහෙමයි. එද හැන්දෑවෙන් පස්සෙ තාත්තා එක මොහොතක් සැනසිල්ලේ හිටියේ නෑ: සතුටෙන් හිටියෙ නෑ. මේ කාලකණ්ණි හඩ්සන් නිසා තාත්තගේ ආත්මය විනාශ වෙලා ගියා.'

'ඒ මිනිහට කොහොමද ඒ තරං බලයක් ලැබුණේ?'

'අන්න ඒක තමයි කියන්න වියදම් කරල හරි මටත් දැනගන්න ඕන. මේ වගේ කරුණාවන්ත ත්‍යාගශීලි මනුස්සයෙක් කොහොමද අර විරූප/කෲර තක්කඩියෙකුගේ ග්‍රහණයට හසුවුණේ? කොහොම

Reading Purpose Only, Not For Print

වුණත් ඔබ ආව එක මට ලොකු සැනසීමක්. ඔබ මේව බුද්ධිමත්ව තේරුම් ගන්න හැටිත්, ඒව විසඳන හැටි ගැනත් මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා. මං දන්නවා වඩාත් සුදුසුම දේ කරන්න ඔබෙන් උපදෙස් ලැබෙන බව'

බ්‍රෝඩ්ස් නදිය අයින දිගේ වැටුණු ගුරු පාර දිගේ අපි වේගයෙන් ගමන් කළා. අවරගිරට යන හිරුගේ රත්පැහැ කිරණින් ගහ ආලෝකමත්වී තිබුණා.

'මුලින්ම තාත්තා ඔහුව උද්‍යාන පාලකයා හැටියට පත්කළා. ඒ රස්සාව මිනිහට ඇල්ලුවේ නෑ. ඒ පාර උසස් වීමක් දුන්නා, ප්‍රධාන ගෘහ සේවකයා හැටියට. එතකොට මිනිහා, එයාට ඕන හැටියට ගෙදර ජීවත්වෙන්න පටන් ගත්තා. මත්පැන් බීල, හොඳටම වෙරිවෙලා සේවිකාවන්ව හිරිහැර වෙන විදියට හැසුරුණා. ඔවුන්ට නරක වචනයෙන් බැණ වැදුණා. සේවිකාවෝ රස්සාව අත්හැර ගෙදරින් පිටවෙලා ගිය තත්ත්වයට ආවා. ඔවුන්ට වන්දියක් හැටියට ඔවුන්ගේ පඩි වැඩි කරලා තමයි ගෙදර රඳවාගන්න පුළුවන් වුණේ. හඩ්සන්ට හිතුණු වෙලාවට අපේ බෝට්ටුවත්, තාත්තගේ හොඳම තුවක්කුවත් අරගෙන දඩයමේ ගියා. ඔහු මේවා කළේ අපට මහ අවඥා සහගත, ආඩම්බර බැල්මක් දමින්. ඒ යකා මගේ වයසෙ එක්කෙක් උණා නම් මං ඌට ඔමලහකට විසිපාරක් ගහලා බිම ඇදවැටෙන්න. ඔබට කියන්න හෝම්ස් මං මේවා ඉවසා දරාගෙන හිටියේ බොහොම අමාරුවෙන්. දැන් මට හිතෙනවා මං ඊට වඩා ටිකක් දරදඬු විදියට ක්‍රියා නොකළ එක මොන මෝඩ කමක්ද කියලා.

තත්ත්වය එන්න එන්නම නරක වුණා. මේ හඩ්සන් කියන තිරිසනා තව තවත් දරුණු වෙන්න පටන් ගත්තා. එක් දවසක් මං ඉස්සරහ තාත්තට මහ නරක විදියට බැණ වැදුණා. මං උගේ උරහිසෙන් අල්ලලා කාමරයෙන් එළියට තල්ලුකරල දැම්මා. එතකොට ඌ මං දිහා බලාගෙන හිටියේ මහ නපුරු විදියට. උගේ හිතේ ඇතිවුණු වෛරය දෑසේන් පිටවුණා. කටින් කියන්න බැරි තරම් තර්ජන ඒකෙ ලියවිලා තිබුණා. ඊට පස්සේ තාත්තාත් හඩ්සනුත් අතරේ කතා බහක් ඇතිවුණා. මොනවා කථා කළාද

මං දන්නේ නෑ. තාත්තා ඇවිත් මගෙන් ඇහැව්වා මට පූර්වච්ඡේද කියලා හඩ්සන් ගෙන් සමාව ඉල්ලන්න. මං කෙලින්ම කිව්ව මට බැහැ කියලා. ඒ වගේ කාලකණ්ණියෙකුට මේ මුළු ගෙයිම පාලනයයි ප්‍රධාන තමයි භාරදීල ඉන්නේ කොහොමද කියල මං තාත්තගෙන් ඇහුවා.'

'මගේ පුතේ. උඹට ඔහොම කතාකරන්න පුළුවන්. ඒ වුණත් මං හිරවෙලා ඉන්නෙ මොන වගේ උගුලකද කියලා උඹ දන්නෙ නෑ. ඒ වුණත් මං කාරණා ඔක්කොම උඹට දවසක කියනවා. වෙන දෙයක් වෙච්චාවේ. මේ දුප්පත් තාත්තා එක්ක තුඹ අහිතක් ඇති කරගන්නෙ නෑ නේද මගෙ පුතේ?'

ඔහු හරිම කම්පාවට පත්වෙලා හිටියේ. ඉන්පස්සෙ තාත්තා කාමරේකට වෙලා දෙර වහගෙන දවස තිස්සෙම කරේ මොනවද ලියන එක. මං ජනේලයෙන් දැක්කා ඔහු බොහොම ඉක්මනට මොනවදෝ ලියනවා.

එක දවසක් හැන්දෑවෙ අපේ නිසොල්මෙ දුණුනෙ කියලා නිම කරන්න බැරි සැනසීමක්. ඒ මොකද හඩ්සන් කිව්වා ඔහු අපේ ගෙදරින් පිටවෙලා යන්න තීරණය කළා කියල. රෑ කෑමෙන් පස්සෙ අපි කෑමකන කාමරයට වෙලා ඉන්නකොට, බීල හොඳටම වෙරි වෙලා හිටි හඩ්සන් ඇවිත් කථා කළේ මහ ආඩම්බර විදියට.

'මට මේ නෝර්ෆොක් ප්‍රාන්තයේ ජීවිතය තිත්ත වුණා. මං යනවා බෙඩෝස් මහත්මයා හම්බවෙන්න, හැම්ෂයර් පැත්තට. ඔබ මාව දකින්න කැමතිවුණා වගේ ඔහුත් මාව බොහොම සතුටින් භාර ගනීවි. ඒකෙ සැකයක් නෑ.'

'ඔබ මෙහෙන් යන්නෙ අපිත් එක්ක තරහෙන් නෙමෙයි නේද හඩ්සන්?' තාත්තා එහෙම ඇහුවෙ හරිම යටහත් පහත් විදියට. ඒක අහල මගේ ඇගේ මාලු තටන්න පටන් ගත්තා.

'තෝ කිව් විදියට මගෙන් සමාව ඉල්ලුවද?' හඩ්සන් ඇහුවේ මං දිහා බැල්මක් හෙළමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

'වික්ටර්, උඹ පිළිගනිං මේ වැදගත් මනුස්සයට උඹ සලකපු හැටි ටිකක් සැර පරුෂ වැඩියි කියල' තාත්තා මං දිහාට හැරිලා කිව්වා.

'ඒක නෙමෙයි මට කියන්න තියෙන්නෙ. ඔහු මෙහේ හැසුරුණු පිළිවෙළ අපි ඉවසුවා හොඳටම වැඩියි කියලයි මං කියන්නෙ'

'හොඳයි එහෙමද? යාළුවා, හොඳයි අපි ඒ ගැනත් බලාගනිමු එහෙම නං!'

කියලා මහ අශෝභන විදියට කාමරයෙන් එළියට ගිය ඔහු, පැය භාගයකට විතර පස්සේ ගෙදරිනුත් පිටවෙලා ගියා.

මේකෙන් වුණේ තාත්තා හදබල මානසික කම්පනයකට පත්වීමයි. හැමදම රෑට ඔහුට නින්ද යන්නෙ නැතුව කාමරේ එහා මෙහා ඇවිදින හඬ මට ඇහුණා. අන්තිමට ඔහුගේ හිත හරියාගෙන එනකොට තමයි, බලාපොරොත්තු නොවුණු විදියට මහා විනාසයක් වුණේ.

'ඒ කොහොමද?'

'ඒක වුණේ හරි පුදුමාකාර විදියට. ඊයෙ හවස තැපෑලෙන් තාත්තගෙ නමට ලියුමක් ලැබුණා. මුද්‍රාව තිබුණේ ෆෝඩිං හැම් තැපැල් කන්තෝරුවෙන්. තාත්තා ඒක කියෙව්වා විතරයි දෑතින් ඔලුව තදකරගෙන පිස්සෙක් වගේ කාමරේ ඇතුළෙ රවුමට දුවන්න පටන් ගත්තා. බැරිම තැන මං ඔහුව සෝපාවට ඇදල අරගෙන එහි හාන්සි කරා. එතකොටයි මං දැක්කේ, ඔහුගේ ඇහැකුත් කටත් පැත්තකට ඇද වෙලා ගිහින් බව. ඔහුට අංශභාගය වැළඳුණු බව මට තේරුණා. අපට පුළුවන් වුණා දොස්තර ෆෝඩිහැම් ව ඉක්මනින් ගෙන්වා ගන්න. තාත්තව ඇඳට ගෙනත් ප්‍රතිකාර පටන් ගත්තා. නමුත් දැන් සම්පූර්ණයෙන් අංශයක්ම පණ නැහැ. ආයෙ සිහි එන පාටකුත් නැහැ. මං දන්නෙ නැහැ අපි ආපහු යනකොට ඔහු ජීවතුන් අතර ඉඳීවිද කියල.'

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com



"හොඳයි ඒහෙමද යාළුවා? ඒ ගැනත් අපි බලාගමු....... !"

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔබ මාව භය කරනවා ට්‍රෙවර් !' මට කෑගැහුණා වොට්සන්.

'ඔය තරම් දරුණු දෙයක් සිද්ධ වෙන්න මොනවද ඒ ලියුමේ තිබුණේ?'

'කිසි වැදගැම්මකට නැති දෙයක්. අන්න ඒකයි මට තේරුම් ගන්න අමාරු'

ඔහු ඒ ටික කියනකොට අපි නිවසට හොඳටම ළං වෙලයි හිටියේ. ගෙදර හැම ජනේලයක්ම තිරරෙදි වලින් වසා දමා ඇති බව මට පෙනුණා. අපි දොරකඩ දොරටුව ළඟට යද්දී එළියට ආවෙ කළු ඇඳ ගනිපු මහත්මයෙක්.

'අනේ දෙවියනේ ! මට හිතුණු දේම සිදුවෙලා ! මගේ මිත්‍රයා ඉකිගසමින් අඬන්න පටන් ගත්තා.

'කොයි වෙලාවේද දොස්තර මහත්මයා තාත්තා නැතිවුණේ? වික්ටර් ඇහුවා.

'ඔබ පිටත්වෙලා ගිය ඉක්මනට වගේ'

'තාත්තා මියයන්න කලින් සිහිය ආවද?'

'ඔව්. අන්තිම වෙලාවෙ මොහොතකට වගේ සිහිය ආවා'

'මට කියන්න කියල මොකුත් කිව්වද?'

'ඔව්. ලියවිලි ඔක්කොම ජපන් කැබිනට්ටුවේ පිටිපස්සෙ ලාච්චුවේ කිව්වා. එච්චරයි'

මගේ මිත්‍රයා වෛද්‍යවරයා සමග මිනිය වෙතට ගියා. මං කන්තෝරු කාමරයේ රැඳී සිටියා. මගේ හිතට දැනුණේ හරිම කණස්සලු ගතියක්. මේ සිද්ධිය පිළිබඳ හැමදෙයක්ම ඒ වෙලාවේ මගේ හිතට ආවා. මේ ට්‍රෙවර් මහත්මයාගේ සැඟවුණු අතීතය මොකක්ද? රත්රන් ඉල්ලම් හෑරීමෙන් ධනවතෙකු බවට පත්වුණු නැතහොත්, සංචාරකයා, බොක්සිං ක්‍රීඩකයා: ඔහු කොහොමද මේ

Reading Purpose Only, Not For Print

දුෂ්ට නාවිකයාගේ තර්ජන ගර්ජන වලට යටවුණේ? ඔහුගේ අතේ පච්ච කොටා තිබුණු, බාගෙට මැකී ගිය, නමක මුල් අකුරු ගැන සඳහන් කළ පමණින් ක්ලාන්ත වුණේ ඇයි? ෆෝඩිංහැම් සිට ලැබුණු ලියුමකින් භීතියට පත්වෙලා මියගියේ කොහොමද?

ඔන්න එතකොට මට එක දෙයක් මතක් වුණා. ෆෝඩිංහැම් කියන්නේ හැම්ෂයර් ප්‍රාන්තයේ ගමක්. ට්‍රෙවෝර්ලට තර්ජනය කරලා හඩ්සන් යනවා කිව්වේ හැම්ෂයර් ප්‍රාන්තයේ බෙඩෝස් මහත්මයා හමුවෙන්නයි. මෙතන සඟවාගෙන ඉන්න මොකක් හරි කාරණයක් තියෙනවා. ඒකට කප්පම් ඉල්ලන්න තමා හඩ්සන්, බෙඩෝස් මහත්මයා හමුවෙන්න යන්න ඇත්තෙත්. එහෙම නම් මේ ලියුම එන්න ඇත්තෙත් හඩ්සන් ගෙන් හෝ බෙඩෝස් ගෙන් විය හැකියි. හඩ්සන් ගෙන් නම්, ඔහු හංගාගෙන හිටි රහස එළිකරපු බව දන්වලා. එහෙමත් නැත්නම්, බෙඩෝස් දන්වන්න ඇති අනතුරක් අතළඟ බව. ඒ ටික පැහැදිලියි.

ඒත් වික්ටර් මට කිව්වා ඒක වැදගැම්මකට නැති විකාර ලියුමක් බව. එහෙම වුණේ කොහොමද? සමහරවිට ඔහුට එය නිවැරදිව තේරුම් ගන්න බැරි වෙන්න ඇති. බාගවෙලාවට එය ලියා තිබෙන්නෙ රහස් පණිවුඩ ක්‍රමයකට වෙන්නත් පුළුවන්. මං මේ ලියුම බලන්න ඕන. ඒකෙ මොකුත් අදහසක් හංගිලා තියෙනව නම් මට ඒක හොයාගන්න බැරිවෙන එකක් නෑ.

මං පැයක් විතර ඒ ගැන කල්පනා කරමින් ඔහේ වාඩිවෙලා හිටියා. ශෝකයෙන් වැලපෙන සේවිකාවක් මං හිටපු කාමරයට ලාම්පුවක් අරගෙන ආවා. මගේ මිත්‍රයා වික්ටර් ඒ පිටුපසින් ආවා. සුදුමැලි වී සිටියත් ඔහු තමාගේ ශෝකය බොහොම දුරට පාලනය කරගෙනයි සිටියේ. දැන් මා ළඟ තිබෙන මේ අළු පැහැති ලියුම ඒ වෙලාවෙ ඔහුගෙ අතේ තිබුණා.

**'දඩයම් සතුන් අපි නොසැලකිලිමත් වීමෙන් විනාශයි. දඩයම් භාරකරු හඩ්සන් ලී සඳහා ඔක්කොම ලදු කැලෑ එළිකරලා. වලිකුකුළන් වනාන්තරයට පැනගියොත් දඩයම් තිරීමට ජීවිත කාලයට බැරිවේවි. බේරාගැනීමට නිලධාරීන්ට දැන්නුවොත් හැකිවේවි.'**

http://sherlockholmesinvestigations.blogspot.com

මේක මුලින් කියෙව්වාම, හරියට දැන් ඔබට සිද්ධවුණා වගේ මමත් අන්දුන්කුන්දුන් වුණා. ඊට පස්සෙ මං මේක කීප සැරයක් බොහොම ප්‍රවේශමෙන් කියෙව්වා. මං හිතූ විදියටම මේ වචන අතර හැංගිලා මොනව හරි රහස් පණිවුඩයක් ඇති බව මං ඒත්තු ගත්තා. ඒ පණිවුඩය සඟවලා තියෙන්නේ 'වලිකුකුළන්' 'දඩබිම' 'දඩයම් සතුන්' යන වචන වලද? ඒ වචන වල කලින් එකඟවුණු රහස් තේරුමක් තියෙනවද? එහෙම තේරුමක් තියෙනවා නම් මේක කොහොමටත් විසඳන්න හැකිවෙන්නෙ නෑ. මේකෙ හඩ්සන් කියන වචනය තිබුණු නිසා, ඔහු සම්බන්ධව බෙඩෝස් ගෙන් ආපු ලියුමක් බව හිතාගන්න පුළුවනි.

මං මේ ලියුමේ අන්තිම කෙළවරේ ඉඳල මුලට කියවන්න උත්සාහ කළා. ඒත් හරි ගියේ නෑ. ඊළඟට වචනයක් ඇර වචනයක් යොදාගෙන බැලුවා. ඒකත් අසාර්ථක වුණා. ඊළඟ මොහොතේදි මේ ප්‍රහේලිකාව විසඳිය හැකි ආකාරය මට වැටහුණා. මුල සිට පටන් අරගෙන ගැනී තුන්වැනි වචනයම පමණක් එකට එකතු කළොත් වාක්‍යයක් ලැබෙනවා. ඒ වාක්‍යයෙන් ලැබෙන පණිවුඩය වයසක ට්‍රෙවෝ මහත්මයාගේ සිත බොහොම කලබලයට පත්කරන එකක් වෙන්න ඉඩ තියෙනවා. මං ඒ වාක්‍යය මගේ මිතුරාට ඇහෙන්න කියෙව්වා.

'අපි විනාශයි. හඩ්සන් ඔක්කොම එළිකරලා. පැන ගියොත් ජීවිත බේරාගැනීමට හැකිවේවි.'

ශෝකයෙන් මෙන්ම කම්පාවෙන් වික්ටර් ට්‍රෙවෝ දෑතින් මුහුණ වසා ගත්තා.

'මේක මරණයටත් වඩා බොහොම දරුණුයි. අපි ඔක්කොටම මොනවා හරි ලොකු ලැජ්ජාවකට පත්වෙන්න සිද්ධවෙන කාරණයක් වගෙයි. මොනවද හෝම්ස් 'වලිකුකුළන් දඩයම් සතුන්' කියන වචන වලින් අඟවෙන්නෙ?' වික්ටර් ඇසුවා.

'ඒ වචන වල කිසිම තේරුමක් නෑ. මේක එවපු පුද්ගලයා කවුද කියලා හොයාගන්න නම් මේ වචන ප්‍රයෝජනවත් වේවි.

http://sherlockholmesinvestigations.blogspot.com
Readme Purpose Only. Not For Print

ඔබට පෙනෙනවා නේද? ඔහු මුලින්ම හිස්තැන් ඉතුරු කරලා පණිවුඩය ලිව්වා.

'..................................................අපි.................................................. විනාශයි'

ඒ විදියට. ඊට පස්සේ ඔවුන්ගේ රහස් සංඥා ක්‍රමයේ හැටියට ඔහුගේ හිතට ආපු වචන වලින් දෙක බැගින් යොදලා හිස් තැන් පිරෙව්වා. ඔහුගේ හිතට මුලින්ම එන්න ඇත්තේ ඔහුට හුරුපුරුදු වචන. එක්කෝ හොඳහාම ආශාවෙන් සතුන් දඩයම් කරන්නෙක්. නැත්නම් කැලෑවට සම්බන්ධකම් ඇති කෙනෙක්. වික්ටර් මේ බෙඩොස් මහත්තයා ගැන ඔබ මොනවද දන්නේ?'

'ආ....... ඔබ කිව්වාමයි හෝම්ස් මට මතක් වුණේ. ඔහු හැම සරත් සැතුවේදීම ඔහුට අයිති කැලෑ ප්‍රදේශවල සතුන් දඩයමේ යන්න අපේ තාත්තාට ආරාධනා කළා'

'එහෙම නම් කිසිම සැකයක් නෑ. මේ ලියුම ඔහුගෙන්. මේ ධනවත් වැදගත් මහත්වරු දෙදෙනෙක් භය කරන්න තරම් හඩ්සන් දැන සිටි රහස මොකක්ද? ඒක හොයන එක විතරයි දැන් අපට ඉතුරුවෙලා තියෙන්නේ'

'අනේ දෙවියනේ! මං හිතන්නේ හෝම්ස් ඒක පාපයත්, ලැජ්ජාවත් දෙකම උරුම වුණු රහසක් වෙන්න ඇති. හඩ්සන්ගෙන් බේරෙන්න බැරි තැන ඔහු එක දවසක් කාමරයට වෙලා මොකක්දෝ ලියුමක් ලියුව කියල මම ඔබට කිව්ව නේ. ඒක තමයි අර ජපන් කැබිනෙට්ටුවේ ලාච්චුවේ හංගලා තිබුණේ. මේක අරගෙන මට ඇහෙන්න කියවන්න හෝම්ස්. ඒක කියවන්න තරම් මගේ හිතට ශක්තියක්වත් ධෛර්යයක්වත් නෑ.'

ඉතින් වොට්සන් මේ තියෙන්නේ ඒ ලියවිලි ටික තමයි. එද රෑ මං මගේ මිත්‍ර වික්ටර් ට්‍රෙවෝට මේක කියෙව්ව විදියට අද ඔබට ඇහෙන්න කියවන්නම්. ඔබට පෙනෙනවා ඇති මේකෙ පිට පැත්තෙ සඳහන් කරලා තියෙනවා:

'වර්ෂ 1855 ඔක්තෝබර් මස 8 වැනි දින එංගලන්තයේ

Personal Purpose Only
http://sherlockholmesinvestigations.blogspot.com

ෆැල්මත් වරායෙන් යාත්‍රා කළ 'ග්ලෝරියා ස්කොට්' නම් නෞකාව, උතුරු අක්ෂාංශ 15.20 හා බ. දේශාංශයට 25. 14 දී නොවැම්බර් මස 6 වැනි දින විනාශයට පත්වීම, අතර කාලයේදී වූ සිදුවීම් සමහරක්."

"මගේ ඉතාම ආදරණීය පුත්‍රයාණෙනි,

මගේ ජීවිතයේ සැඳෑ සමයේ අපකීර්තිය මා වෙත ළඟා වෙන බවට දැන් සැකයක් නැ. සියලු දෙයම අවංකව හෙළිදරව් කිරීමට සිදුවීම මගේ හිතට ලොකු වේදනාවක්. ඊට හේතුව නීතියෙන් මට දඬුවම් පමුණුවාවි දෝ යන භය නොවෙයි. මේ ප්‍රාන්තයේ මට හිමිව ඇති වැදගත් ගරු තනතුරකින් පහළට ඇද වැටීම නොවෙයි. මං දැනහැඳින සියලු දෙනා ඉදිරියේ අවමානයට පත්වීමත් නොවෙයි. මගේ හදවතට දැනෙන ලොකුම වේදනාව, මා නිසා නුඹට ලජ්ජාවට පත්වන්නට සිදුවීම ගැනයි. ඉතාම කලාතුරකින් හැර අන් සෑම විටකම මට කීකරු වූ, හැමදම මට ආදරයෙන් සැලකූ, නුඹට මෙවැන්නක් වීම මට ඉවසිය නොහැකියි.

හැමදමත් මගේ හිසට එල්ල වී තිබුණු හෙණ පහර මගේ හිසට වැදුණොත්, නුඹ මේ කාරණා දැනගන්න එක මගේ හිතට සැනසීමක්. ඒ මොකද මා කොයමණ දුරට වැරැදි කාරයෙක්ද යන්න මගේ කටින්ම නුඹට දැනගැනීමට පුළුවන් නිසා. මගේ මේ ප්‍රශ්නය කරදරයක් නැතුව විසඳී ගියොත් (එසේ වීමට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය මට ලැබේවා !) මෙම ලියවිල්ල විනාශකර දමාපන්. මියගිය නුඹේ අම්මාගේ නාමයෙන් අප දෙදෙනා අතර තිබු ආදරයේ නාමයෙන් මෙය ගිනි ගොඩට දමා සියල්ල අමතක කර දමාපන්.

මගේ වැරැදි එළිවී මා නීතියේ රැහැණට අසුවුවහොත් නුඹට කිසිවක් පැවසීමට මට ඉඩක් නොලැබෙන්නට පුළුවනි. නුඹ දන්නවා මගේ හෘදයේ අසනීප තත්ත්වයක් ඇති බව. ඒ නිසා මා හදිසියේ මියයාමට වුණත් පිළිවන්. ඒ දෙකෙන් කෝක වුණත්

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

මේක ප්‍රයෝජනවත් වේවි. මං මේ කියන දේවල් සත්‍යයෙනුත් සත්‍යය බව මං දිවුරා කියනවා.

පුතා, මගේ නම ඇත්තෙන්ම ග්‍රේවෝ නෙමෙයි. තරුණ කාලයේ මගේ නම ජේම්ස් ආම්ටේජ්. පනී කීපයකට පෙර ඔබේ අර මිතුරා - හෝම්ස්, J.A. අකුරු ගැන පැවසුවා ඔබට මතක ඇති. ඔහු රහස දැනගන්නට ඇතැයි සිතා, මගේ සිතට ඇතිවූ කම්පනය ඔබට තේරුම් ගන්නට පුළුවන් නේද?

මං ලන්ඩනයේ බැංකුවක රැකියාවට බැඳුනේ ආම්ටේජ් හැටියටයි. රටේ නීතිය කඩකිරීම නිසා වරදකරුවෙක් වී, මා රටින් පිටුවහල් කිරීමේ දඬුවමට යටත් වුණෙත් ආම්ටේජ් හැටියටයි. පුතා මං මහා දරුණු අපරාධකාරයෙක් යයි සිතන්න එපා. මට ගෙවීමට සිදුවූ ලොකු ණයක් තිබුණා. බැංකුවේ මට භාරවී තිබුණු මුදලකින් මං එය ගෙවා දැම්මා. ඒ නියත වශයෙන් මා අතට පත්වීමට තිබුණු මුදලකින්, එය ඉක්මනින් පියවා දමන බලාපොරොත්තුවෙන්. නමුත් හරිම අවාසනාවන්ත විධියට අතට ලැබෙන්න තිබුණු මුදල ලැබුණේ නැහැ. ගිණුම් පරීක්ෂා කිරීම නියමිත දිනටත් කලින් සිදුවුණා. අඩුපාඩුව හෙළිවුණාම ඔවුන් හිතුවේ, මා මුදල් වංචාකරන්නෙකු ලෙසයි. අවුරුදු තිහකට පෙර නීති අදට වඩා බොහොම තදින් ක්‍රියාත්මක වුණා. මහා අපරාධකාරයින් තිස්හත්දෙනෙකු සමග එකට විලංගු දමා ඕස්ට්‍රේලියාවට පිටුවහල් කිරීමේ දඬුවම මට ලැබුණා. මගේ විසිතුන් වැනි උපන් දිනය දවසේ 'ග්ලෝරියා ස්කොට්' නැවෙන් අපි ඕස්ට්‍රේලියාව බලා පිටත්වුණා.

ඒ 1855 අවුරුද්දයි. ක්‍රිමියානු යුද්ධය ඉතාම උග්‍ර තත්ත්වයට පත්වී තිබුණු අවස්ථාව. එංගලන්තයේ සිට ඕස්ට්‍රේලියාවට සිරකරුවන් ගෙන යෑමට සාමාන්‍යයෙන් යොදගත් නැව්, යුද පෙරමුණට බඩු ප්‍රවාහණය සඳහා කළ මුහුදේ යාත්‍රා කළා. ඒ නිසා සිරකරුවන් ප්‍රවාහණය කෙරුණේ වඩාත් අපහසුදායක, කුඩා නැව් වලයි. ග්ලෝරියා ස්කොට්, චීනයේ සිට එංගලන්තය දක්වා තේ පෙට්ටි ගෙන ඒමට පාවිච්චි කළ ටොන් 500 යේ කුඩා නෞකාවක්. මේ පැරණි සාගරේ නැවේ, සියයක් සිවිට්ටු බේරුගස්



222. "මගේ නම ජැක් ප්‍රෙන්ඩගාස්ට්. මං ගැන දැනගන්නම [illegible] පටන් ගන්නවා සිකුරුයි"

Reading Purpose Only. Not For Print.

ගමන් කළා. කපිතාන්, ඔහුගේ සහායක නිලධරයන් තුන්දෙනා, වෛද්‍යවරයා, පූජකවරයා, මුරභටයන් හතර දෙනෙක්, යුද්ධ භටයින් දහ අට දෙනෙක් සහ සිරකරුවන් තිස්අට දෙනෙක්.

සිරකරුවන් ගෙන යන නැව් වල හිරකුඩු සාමාන්‍යයෙන් වෙන් කර තිබෙන්නේ ඝන ඕක් ලීයෙන්. නමුත් මේ නැවේ එය සාද තිබුණේ තුනී ලී පතුරු වලින්. මා දමා තිබුණු කුඩුවට යාබද කුඩුවක හිටියේ අසාමාන්‍ය ලෙස අඩි හයහමාරක් පමණ උස, ඇවිදින විට හිස බොහොම ඉහළට ඔසවා ගෙන ගමන් කළ, මුහුණේ හරියට රැවුල වත් නොවැවුණු තරුණයෙක්. ඔහු ගැන මට මුල සිටම මතක තිබුණා. හිරකරුවන්ගේ දුකින් කලකිරුණු මුහුණු අතර, ඔහුට තිබුණේ විශ්වාසයෙන් පිරුණු, කිසිවකින් නොතැවුණු මුහුණක්. ඔහු දැකීමෙන්ම මගේ හිතට දැනුණේ ලොකු ධෛර්යයක්. අප දෙදෙනා වෙන් කළ ලෑලි බිත්තියේ, සිදුරක් කපාගෙන, ඔහු එදා රෑ මට කථා කළාම, මගේ හිතට ලොකු සතුටකුත් දැනුණා.

'ආයුබෝවන් යාළුවා, මොකක්ද ඔබේගෙ නම? ඔහේට මෙහේ එන්න සිද්ධ වුණේ මොකද?'

මං ඔහුට මා ගැන විස්තර කිව්වා.

'මගේ නම ජැක් ප්‍රෙන්ඩගාස්ට්, දෙයියම්පා ! මං ගැන විස්තර දැනගත්තාම, නම ඇහුණ කොටම උඹ මට සැලියුට් ගහන්න පටන් ගන්නවා සිකුරුයි'

ඔහුගේ නම කිව්වාම ඔහු පිළිබඳ සියල්ල මට මතක් වුණා. මාව අත්අඩංගුවට ගන්න ටික කාලයකට කලින් ඒක රට පුරා මහා ආන්දෝලනයක් ඇති කළ සිද්ධියක්. කොහොමදෝ කපටි ක්‍රමයකින් ඔහු ලන්ඩනයේ සුප්‍රසිද්ධ වෙළෙඳුන් ගණනාවකගෙන්ම, විශාල මුදල් සම්භාරයක් වංචාකරලා තිබුණා.

'හ හා ! මගේ තුඩුව තවමසෙටත් මතකයි එහෙනම්? ' ඔහු කිව්වෙ ආඩම්බරෙන්. 'බොහොම හොඳයි. මේ සිද්ධියේ මොකුත් අමුතු දෙයක් තමුසෙට තේරුණේ නැද්ද?' ඔහු ඇහුවා.

'නැහැ'

'මං පවුම් දෙලක්ෂ පනස්දාහක් වංචා කළා කියල නේ උන් කියන්නෙ?'

'ඔව්. පත්තරවල පළවුණේ එහෙමයි'

'තමුන් සල්ලි ටික හම්බවුණේ නෑ?'

'නෑ'

'තමුසෙ හිතන්නේ ඒ සල්ලි ටික ඇත්තෙ කොහේ කියලද?'

'මං දන්නෙ නෑ'

'මගේ මේ ඇඟිලි දෙක අතරේ. ප්‍රේයියම්පා ! තමුසෙගෙ ඉසේ තියෙන කෙස් ගස් ගණනට වැඩිය, මට පවුම් වලින් තියෙනවා. සල්ලි තියෙනව නම් පුතෝ මොනවද කරන්න බැරි? ඕන දෙයක් කරන්න පුළුවන්. තමුසෙ හිතනවද ඒ වගෙ මිනිහෙක්, හිරකාරයන්ගේ ජම්පරයක් ඇඳගෙන, සුණු ගඳ ගහන, මීයො පිරිච්ච මිනීපෙට්ටියක් වගේ කසි කබල් නැවක යාත්‍රාකරාවි කියලා? නෑ මහත්මයා. ඒ වගේ කෙනෙක් තමන්ගේ සැප පහසුව සලස්වා ගන්නවා. ඒ විතරක් නෙමෙයි. තමන්ගේ මිත්‍රයන් ගැනත් බලා ගන්නවා. ඒ ටික හොඳට විශ්වාසයට ගණං. ඔහුත් එක්ක හවුල් වුණොත් උඹේ ගැලවීමත් එතනයි'

ඔහු කථා කළේ අන්න ඒ විදියටයි. මුලින් මට ඔය කථාව කිසිදෙයක් තේරුම් ගියේ නැහැ. පස්සේ ඔහු මාව දිවුරලා පොරොන්දු කරගෙන මට ඔක්කොම විස්තරය කිව්වා. මේ නැවට නගින්න කලින් ඉඳලම හිරකාරයො දුසිමක් විතර ප්‍රෙන්ඩගාස්ට් එක්ක කල්ලියක් හැදිලා. ඒ කුමන්ත්‍රණය, ඔහුගේ මුදල් ගෙවන පොරොන්දුව පිට නැවේ බලය අල්ලාගන්නයි. ඒ ගැන ප්‍රෙන්ඩර්ගාස්ට් මට විස්තර කළා.

'මගේ හවුල්කාරයෙක් හිටියා. කලාතුරකින් හම්බවෙන තාලේ, ගනක් ගලක් වාගේ, කොයිවෙලේත් කළගුණ දන්න මිත්‍රයෙක්. දැ

Reading Purpose Only, Not For Print.

ඌ කොහෙ ඇති කියලා ද උඹ හිතන්නේ? ඌ තමයි මේ නැවේ පූජකතුමා ! පොඩ්වෙස් තෙමෙයි. නැවේ පාදිලි උන්නාන්සේ! මිනිහගේ ලියවිලි වල කිසිම වැරැද්දක් නැති විදියට සකස් කරගෙන, බඩු පෙට්ටියේ සල්ලි පුරවගෙනයි ඔය ඉන්නෙ. ඒ සල්ලි වලින් පුළුවන් මේ නැවම මිළට ගන්න. නැවේ කාර්ය මණ්ඩලය ඔක්කොම වගේ උගේ මිනිස්සු. නැවේ දෝවයට බැදෙන්න කලින්, මිනිහ උන් ටික මුදලටම ගත්තා. කපිතාන්ගෙ දෙවෙනියයි, මුර භටයො දෙන්නෙකුයි සල්ලි වලට ගනිපු අය. උවමනා වුණොත් අපි කපිතාන් වත් ගන්නවා.'

'මොනවද අපිට කුරන්න තියෙන්නේ?'

'මොනව කියලද උඹ හිතන්නෙ? මේ යුද්ධ භටයින්ට තිල ඇඳුම් මහන්න රෙදි ඩයි කල මිනිහා ඒවා රතුපාට කළාට වඩා, අපි රතුපාට කරමු.'

'උන් ළඟ ආයුධ තියෙනවා' මං කිව්වා.

'අපටත් ආයුධ ලැබෙනවා කොල්ලෝ. හැම එකාටම සෑහෙන්න ආයුධ අප ළඟ තිබෙනවා. නැවේ සේවක මණ්ඩලය අපට උදව් කරද්දින් මේ නැව යටත් කරගන්න බැරි නං? එහෙනං ඊට වැඩිය හොඳයි අපිව ගැනු ළමයින්ගෙ බෝඩිමකට යවන එක. අද රෑට අල්ලපු කාමරේ එකාට කථා කරල බලපං, උඹ අපට හවුල් කරගන්න පුළුවන් විදියෙ එකෙක්ද කියලා'

එද රෑ මං අල්ලපු හිරකුටුවේ ඉඳපු මිනිහත් එක්ක කථා කළා. ඔහුත් මගේ වයසෙ තරුණයෙක්, ව්‍යාජ කිරීමකට අහුවෙලා හිටි ඔහුගෙ නම එවන්ස්. දැන් නම වෙනස් කරගෙන දකුණු එංගලන්තයේ පදිංචි ලොකු ධනවතෙක්. අපේ කල්ලියට සම්බන්ධ වෙන්න ඔහුත් කැමති වුණා. අපිට ගැළවීමට තිබුණු එකම මාර්ගය ඒකයි. වැඩි දවස් යන්න කලින් අපේ කල්ලිය බොහොම විශාල වුණා. එයට බඳවා ගන්න බැරිව ඉතුරු වුණේ හිරකාරයින් දෙන්නයි. එක්කෙනෙක් බොහොම දුර්වල හිතක් තිබූ, විශ්වාසයක් තබන්න බැරි එකෙක්. අනෙකා සෙංගමාලය හැදිලා අසනීප තත්ත්වයෙන් හිටියේ.

http://sherlockholmesinvestigations.blogspot.com

නැවේ බලය අල්ලා ගැනීමට මුල ඉඳලාම අපට ඒ හැටි අවහිරයක් තිබුණේ නැහැ. සේවක මණ්ඩලය හැටියට බඳවාගෙන තිබුණේ නොම්මර එකේ තක්කඩි ගොඩක්.

අප වෙනුවෙන් යාච්ඤා කිරීම සඳහා පාදිලි උන්නාන්සේ කළු පාට මල්ලක් අරගෙන අපේ හිරමැදිරි වලට ආවා. ධර්මපත්‍රිකා, ගීතිකා කොළ තිබිය යුතු ඒ මල්ලේ, තිබුණේ ආයුධ. තුන් දවසක් යනකොට ඇඳරෙද්ද යට, ලබඩා කරගත්ත බඩු ගොඩක් තිබුණා. මාංචු කපා ගැනීමට පීරක්, පිස්තෝල ජෝඩුවක්, වෙඩි බෙහෙත් රාත්තලක්, සහ මුණිස්සම්. මුරභටයින් දෙදෙනෙක් ප්‍රෙන්ඩගාස්ට්ගේ මිනිස්සු, කපිතාන් ගේ දෙවැනි සහකාර නිලධාරියා, ප්‍රෙන්ඩගාස්ට්ගේ දකුණු අත වගේ මිනිහා. අපට විරුද්ධව හිටියේ ලුතිනන් මාටින්, යුද්ධ භටයින් දහඅට දෙනයි, කපිතාන් , ඔහුගේ සහකාරුවන් දෙදෙනෙක්, මුරභටයින් දෙදෙනෙක් සහ නැවේ වෛද්‍යවරයා පමණයි. එහෙම වුණත් ප්‍රහාරය එල්ල කිරීම බොහොම ප්‍රවේශමින්, මහ රෑක, එක්වරටම එල්ල කිරීමටයි, අපි හිතාගෙන හිටියේ. නමුත් අප බලාපොරොත්තු වුණාට වඩා ඉක්මනින් එය පටන් ගන්න සිද්ධවුණා.

අපි එංගලන්තයෙන් පිටත් වෙලා සති තුනක් පමණයි ගතවෙලා තිබුණේ. එක දවසක් ඒ අසනීප වෙලා හිටි සිරකරුවෙක් පරීක්ෂා කරන්න වෛද්‍යවරයා ආවා. ඇඳ මත හිටි රෝගියා පරීක්ෂා කරන අතරේ, ඇඳේ පහත හරියේ අත තැබූ ඔහුට ඇඳ රෙද්දට යටින් තිබූ පිස්තෝලයක් අහුවුණා. නිශ්ශබ්දවම ඉඳලා ක්‍රියා කළා නම් ඔහුට මුළු කුමන්ත්‍රණයම අසාර්ථක කරන්න හැකියාව තිබුණා. පුංචි දෙයිනුත් කලබලයට පත්වෙන වෛද්‍යවරයාට එක්වරටම කෑගැසුණා. සිද්ධ වෙන්න යන දේ තේරුම් ගත් සිරකාරයා, වෛද්‍යවරයාගේ කට තද කරලා අල්ලා ගත්තා. අනතුරු අඟවන්න බැරි විදියට ඔහුගේ කට බැඳලා, අනෙක් අයත් ඇවිත් වෛද්‍යවරයාව ඇඳට තබා බැන්ද. ඔහු රෝගියා බලන්න එද්දි නැව් තට්ටුවට යන දොර විවෘත කරගෙනයි ඇවිත් තිබුණේ. අපි ඔක්කොම එහි දිව ගියේ එක පොදියට.

http://sherlockholmesinvestigations.blogspot.com

මුලින්ම මුර භටයින් දෙදෙනෙකු වෙත වෙඩි පහර එල්ලවුණා. කලබලය මොකක්ද කියලා බලන්න ආපු කෝප්‍රල්වරයා ඊළඟට වෙඩි කෑවා. කපිතාන්ගේ කුටිය හා ආරක්ෂක ප්‍රදේශය මුරට යුද්ධ භටයින් දෙදෙනෙක් සිටියා. අපට වෙඩි තැබීමට ඔවුනට හැකිවුණේ නැහැ. සමහර විට ඔවුන්ගේ තුවක්කු වල උණ්ඩ පුරවලා සූදානමින් නොතිබුණා ඇති. ඔවුන් බයිනෙත්තු සවිකරන්න සූදානම් වෙද්දිම ඔවුනට වෙඩි පහර එල්ලවුණා. ඊළඟට අපි කපිතාන්ගේ කුටියට කඩා වැදුණා. එහි දොර විවෘත කළා විතරයි, ඇතුළෙන් මහා පිපුරුම් ශබ්දයක් ඇහුණා. මේසය උඩ එළා තිබූ අත්ලාන්තික් සාගරයේ සිතියම මත කපිතාන් ඇදවැටී සිටියේ හිසට සිදුවූ තුවාළ සහිතවයි. දුම් දමන පිස්තෝලයක් අතැතිව ඒ අසල සිටියේ නැවේ පූජකවරයා ! කපිතාන්ගේ සහකරුවන් දෙදෙනා කොල්ලකරුවන්ගේ සිරභාරයට පත්වුණාට පස්සේ මහා කර්තව්‍යය සම්පූර්ණ වී ඇති බව පෙනුණා.

කපිතාන්ගේ කුටියට යාබද ප්‍රධාන කාමරයට අපි ඔක්කොම දිවගියා. හැමෝම හරි සතුටින් කෑගහන්න පටන් ගත්තා. එහි තිබුණු සෝෆා මත වැතිරුණේ අපි ඔක්කොම දැන් නිදහස් කියන හැඟීමෙන්. බොරු පාදිලි උන්නාන්සේගේ නම විල්සන්. අර කාමරයේ තිබුණු ඉබි යතුරු දැමූ අල්මාරි කැඩූ විල්සන් ෂෙරි නම් වයින් බෝතල් දුසිමක් විතර එළියට ගත්තා. බෝතල් කඩා අපි හැවුරුත් ෂෙරි බොන්න පටන් ගත්තා. ඒ සැරම හතරවටින් වෙඩි පුපුරණ හඬක් ඇහුණේ, හෙණ පුපුරනවා වාගෙයි. අපේ මුළු කාමරයම දුමෙන් පිරුණා. කිසිදෙයක් හරි හැටි පෙනුණේ නෑ. දුම් ඉවත්වී ගියාට පස්සේ සිදුවී තිබුණු දේ පෙනුණා. විල්සන් සහ තවත් අට දෙනෙකුට වෙඩි වැදිලා, ඇරුණු ලෙස තුවාල වෙලා, මරු විකල්ලෙන් දඟලනවා. ඒ වෙලාවේ එතැන දුඹුරු පාට ෂෙරි සමඟ රතු පාට ලේ ගලා ගිය හැටි මතක් වෙන කොට දැනුත් මගේ ඇඟ හිරි වැටෙනවා. ඒ දර්ශනයෙන් අපි කොයිතරම් කම්පාවට පත්වුණාද කිව්වොත් කැරැල්ල අපි එතැනින්ම අත්හැර දමන්න ඉඩ තිබුණා. නමුත් ප්‍රෙන්ඩගාස්ට්ගෙන් ඊට ඉඩක් ලැබුණේ නෑ. වියරු වැටුණු වෘෂභයෙක් කෑගහනව වගේ නාද කළ ඔහු, අබ්‍රහම් අයත් සමඟ කාමරයෙන් එළියට ඇදන් ගත්තා.



228. "සිහියමක් උඩ ඇදවැටී සිටියේ නැමේ කපිතාන් වරයා ඒ අසල...... සිටියේ නැමේ පූජකවරයා"

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ කාමරයේ වහලේ එළිය වැටෙන්න තිබූ කපොලු අතරින් අපට වෙඩි තබලා තිබුණේ ලුතිනන් සහ ඔහුගේ හටයින් විසින්. ඔවුන් තවත් වරක් තුවක්කු වලට උණ්ඩ පුරවන්න කලින්, අපට ඔවුන් යටත්කර ගැනීමට හැකිවුණා. මිනිස්සු පහකින් ඔක්කොම ඉවරවුණා. දෙයියෝ සාක්ෂි! එදා රෑ ඒ නැව බැටළුවන් මරණ ඝාතකාගාරයක තත්ත්වයට පත්වුණා. ප්‍රචණ්ඩ කෝන්තියෙන් හිටි ප්‍රෙන්ඩගාස්ට්, තුවාල වී සිටි යුද්ධ හටයින් සහ මළකඳන් දෑතින් ඔසවලා මුහුදට විසිකළා. එක් තුවාල ලැබූ සාජන්ට් වරයෙක් සෑහෙන තරම් වෙලාවක් මුහුදේ පිහිනමින් නැව දෙසට පිහිනාගෙන එන්න උත්සාහ කළා. ඔහු ගැන අනුකම්පාවෙන් කෙනෙක් ඔහුටත් වෙඩි පහරක් එල්ල කළා. සටන අවසානයේ අපේ හතුරන්ගෙන් ඉතුරු වුණේ වෛද්‍යවරයා, කපිතාන්ගේ සහායකයින් දෙදෙනා සහ මුර හටයින් දෙදෙනා පමණයි.

මොවුනට කුමක් කළ යුතුද යන්න ලොකු ප්‍රශ්නයක් වුණා. ඔවුනට අත්විය යුතු ඉරණම ගැන ඇති වූ මතභේදය මහ කෝලාහලයක් බවට පත්වුණා. අපේ නිදහස ලබාගන්නට පස්සෙ තවතවත් අහිංසක මිනිස්සු මරාදමන්න අපට උවමනාවක් තිබුණේ නැහැ. ආයුධ අරගෙන අපට විරුද්ධව සටනට එන යුද්ධ හටයින්ට වෙඩි තැබීම එකක්. නමුත් අපට විරුද්ධව කිසිත් නොකරන මිනිස්සු මරා දැමීම තවත් එකක්. අප අටදෙනෙක් මේ ඝාතනයට විරුද්ධ වුණා.

නමුත් ප්‍රෙන්ඩගාස්ට් ගෙන් ඒකට සහයෝගයක් ලැබුණේ නැ. අපේ ගැළවීම තියෙන්නේ වැඩේ ධෛර්යයක් කළොත් විතරයි, කියල ඔහු කියා සිටියා. අපට විරුද්ධව සාක්ෂි දෙන්න එක කටක් ඉතුරු කළොත් අපි ඔක්කොම ඉවරයි කියල ඔහු නැවත නැවතත් කිව්වා. ඇතිවුණු කෝලාහලය කොයිතරම් උග්‍රවුණාද කිව්වොත් තව ටිකෙන් අපටත් මරණ දඬුවම ලැබෙන්න ඉඩ තිබුණා. නමුත් අන්තිමට ප්‍රෙන්ඩගාස්ට් කිව්වා, අර මිනිස්සු මරා දමනවාට කැමැති නැති අය බෝට්ටුවක නැගලා නැවෙන් පිටවෙලා යන්න කියලා. අපි ඊට එකඟවුණේ බොහොම කැමැත්තෙන්. ඒ මොකද මේ වෙලාව වෙනකොට ලේ පිපාසිතයන්ගේ මිනීමැරුම්, අපට

http://sherlockholmesinvestigations.blogspot.com

ඉවසන්න බැරිතරමට පිළිකුල් වෙලයි තිබුණේ. අපි හැමෝටම නාවික ඇඳුම් කට්ටලය බැගින්, වතුර පීප්පයක්, වයින් පීප්ප දෙකක්, යුණු දැමූ හරක්මස් පීප්පයක්, විස්කෝතු පීප්පයක්, මාලිමා යන්ත්‍රයක් සහ නාවික සිතියමක් ලැබුණා. අපි, ගමන් කළ නැව මුහුදුබත් වෙලා, පණ බේරා ගන්න බෝට්ටුවකට නැගුණු නාවිකයන් බව, යම්කිසිවෙක් අප මුහුදේදී සොයාගත්තොත් දැනුම් දෙන්න කිව්වා. එහෙම කරලා, තමේ කපල බෝට්ටුවට යන්න හැරියා.

මගේ ආදරණීය පුතා, කථාවේ මහා පුදුමාකාර කොටසට මං එන්නේ දැනුයි. උතුරින් හා නැගෙනහිරින් මුහුදු සුළං හමා එද්දී ග්ලෝරියා ස්කොට් නැව අපෙන් ඈතට පාවෙලා යන්න පටන් ගත්තා. අපේ කාණ්ඩායමේ හිටි යම් තරමක උගත්කමක් තිබුණු දෙදෙනා එවන්ස් හා මම. අප සිටි අක්ෂාංශය හා දේශාංශය අනුව යාත්‍රා කළ යුත්තේ කුමන වෙරළකටද යන්න තීරණය කරන්න ගණිත මිනුම් වල යෙදීම අප දෙදෙනාට භාරවුණා. ඒක මහ අභියෝගාත්මක ප්‍රශ්නයක් වුණා. කේප් වර්ඩ් දූපත් තිබුණේ අපට හැතැම්ම පන්සියයක් පමණ උතුරෙන්. අප්‍රිකානු වෙරළ තිබුණේ අපට හැතැම්ම හත්සියයක් පමණ නැගෙනහිරින්. අපට ගොඩබැසීමට සුදුසුම තැන සියරා ලියොනය කියලයි අපි කල්පනා කළේ.

මේ වෙනකොට ග්ලෝරියා ස්කොට් නැව අපේ බෝට්ටුවෙන් පෑහෙන තරමක් ඈතට යාත්‍රා කරලා. ඒත් අපට පෙනෙන තෙක් මානයේ. අපි බලා සිටියදීම එක්වරටම මහ පුදුම දෙයක් සිද්ධවුණා. නැව තිබුණු තැනින් යෝධ වෘක්ෂයක් වගේ යෝධ කළුදුම් රොටුවක් අහසට නැගුණා ! තත්පර කිහිපයකින් අහසේ හෙණ පුපුරණවා වගේ ශබ්දයක් ඒ දෙසින් ඇහුණා. ඊට පස්සේ දුම ටික ටික පුළුහෙට පාවෙලා ගියා. නැවේ ලකුණක් වත් නෑ.

අපි ඉක්මනින්ම බෝට්ටුව ඒ පැත්තට හරවාගෙන යාත්‍රා කළා. ඒ හරියට ළඟාවෙන්න අපට පැයක් වත් ගතවෙන්න ඇති. එතැන ජලවාෂ්ප වලින් පැදුණු මීදුමක් වැනි දෙයකින් වැසී තිබුණා.

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

අපට එතැනට ළඟාවීමට ගතවුණු කාලය නිසා කිසිවෙකු බේරා ගැනීමට ඉඩක් ලැබේවි යයි හිතුණේ නෑ. පිපිරී කඩ වී ගිය නැවේ සුන්බුන් දියමත පාවෙමින් තිබුණා. අපි ආපසු එන්න හැරෙනවිට උදව් ඉල්ලා කිසිවකු කෑගහන හඬ ඇසුණා. ඒ, මුහුදේ පාවෙමින් තිබූ ලී කෑබැල්ලක් මත සිටි මිනිසෙකු බව අපි දුටුවා. බෝට්ටුව එතැනට පදවාගෙන ගොස් ඔහු බේරා ගැනීමට අපට හැකිවුණා. ඔහු හඩ්සන් නම් තරුණ නාවිකයෙක්. ඔහු ගින්නෙන් පිළිස්සී ඉතාම අසාධ්‍ය තත්ත්වයෙන් හිටියේ. නැවේ සිද්ධ වුණේ කුමක්ද යන්න විස්තර කරන්න තරම් වත් සිහිකල්පනාවක් ඔහුට ඒ වෙලාවේ තිබුණේ නෑ. පසුවදා උදෙයි ඔහුට කතාකරගැනීමට පුළුවන්කම ලැබුණේ.

අප බෝට්ටුවේ දමා පාකර ඇවා, ප්‍රෙන්ඩගාස්ට් හා ඔහුගේ කල්ලිය, අර මිනිසුන් පස්දෙනා මරා දැමීමට සූදානම් වී තිබෙනවා. එයින් හතර දෙනෙකුට වෙඩි තැබුවත්, කපිතාන්ගේ එක් සහායකයෙක් ඒ වෙලාවේ මවුන්ගෙන් බේරී තිබෙනවා. බොහොම නිර්භීත ක්‍රියාශීලී මිනිහෙක් වූ ඔහු, බැඳ තිබූ බැමි ලිහාගෙන , මැර කල්ලිය ඔහු පසු පස හඹා එද්දී, වෙඩි බෙහෙත් කාමරයට රිංගාගෙන තිබෙනවා. එහි වෙඩි බෙහෙත් පීප්ප සියයක් පමණ ගබඩා කොට තිබුණා. ඔහු එයින් එකක් විවෘත කොට, ගිනිපෙට්ටියක් අතේ තබාගෙන තමාට හිරිහැරයක් කළොත් මුළු නැවම පුපුරවා දමන බවට තර්ජනය කළාලු. ඊට මොහොතකට පසු නැවේ පිපිරීම සිදුවුණාලු. හඩ්සන්ගේ අදහස වුණේ පිපිරීමට හේතුව අර පුද්ගලයා විසින් ගිනිකූරක් දැල්වීම නොව, වැරදුණු වෙඩිල්ලකින් ගිය උණ්ඩයක් වෙඩි බෙහෙත් පීප්පයකට වැදීමෙන් හටගත් ගින්නක් ලෙසයි. ඒ කොහොම වුවත් ග්ලෝරියා ස්කොට් නැවෙත් එහි බලය උදුරාගත් කල්ලියෙත් අවසානය එයයි.

අපේ බෝට්ටුව මුහුදේ පාවෙමින් තිබියදී ඊළඟ දවසේ ඕස්ට්‍රේලියාව බලා යාත්‍රා කරමින් තිබූ 'හොට්ස්පර්' නම් රුවල් නැවෙන් බේරාගනු ලැබුවා. ගිනිගෙන පුපුරා ගිය නැවකින් දිවිගලවාගත් නාවිකයන් පිරිසක් හැටියට අප කළ විස්තරය විශ්වාස කිරීමට 'හොට්ස්පර්' නැවේ කපිතාන්ට අපහසු වුණේ

http://sherlockholmesinvestigations.blogspot.com

නැහැ. ග්ලෝරියා ස්කොට් නම් බඩු ප්‍රවාහණ නෞකාව මුහුදේදී අතුරුදහන් වී ඇති බවට නාවික හමුදාවට වාර්තා වුණා. එයට අත්වූ සත්‍ය ඉරණම පිළිබඳ කිසිම දෙයක් එළියට ආවේ නෑ.

සුවපහසු මුහුදු ගමනකින් පසු 'හොට්ස්පර්' නැව සිඩ්නි වරායට සේන්දු වුණා. මෙහිදී එවන්ස් සහ මම, නම් මාරු කරගෙන, රත්රන් ඉල්ලම් හාරු ප්‍රදේශ වලට සංක්‍රමණය වුණා. නොයෙක් රටවල් වලින් එහි ආ විශාල ජනකායක් අතරේ අපේ සත්‍ය අනන්‍යතාවය දියකර හැරීමට අපහසු වුණේ නැහැ.

අපි විශාල ධනයක් උපයාගෙන රටරටවල සංචාරය කළා. යටත් විජිතවලින් මුදල් උපයාගෙන ආපසු එංගලන්තයට එන ඉංග්‍රීසි ජාතිකයන් වගේ අපි ආපහු ආවා. ඉඩකඩම් මිලයට ගෙන මෙහේ පදිංචි වුණා. දැන් අවුරුදු විස්සක් තිස්සේ සාමකාමීව අනෙක් අයට ප්‍රයෝජනවත් ලෙස අපේ ජීවිත අපි ගතකළා. අපි විශ්වාස කළේ අපේ අතීතය සදාකාලිකවම වැළලී ගියා කියලයි. ඉතින් එද හදිසියේම, මුහුදේ පාවෙච්චි සිට බේරාගත් හඩ්සන් දුටුවාම මට ඇතිවුණු කම්පනය ඔබට හිතාගත හැකි නේද? ඔහු කොහොම හරි අප පදිංචි තැන් ගැන විස්තර හොයාගෙන , අප සඟවා ගත් රහසෙන් ප්‍රයෝජන ගැනීමට අප පසුපස ඇවිත්. ඔහු සමග සාමකාමීව ජීවත්වීමට මං උත්සාහ දැරුවේ ඇයි කියල දැන් ඔබට තේරෙනවා ඇති. එවිට යම්තරමකින් හෝ මට අනුකම්පා කිරීමට ඔබට හැකිවේවි. දැන් සියල්ල හෙළිකරන බවට මට තර්ජනය කොට, හඩ්සන් මගේ මිත්‍රයා හොයාගෙන ගිහින් හමාරයි'

ඊට පහළින් වෙව්ලන අතකින් ලියූ අත් අකුරෙන් මෙසේ ද සඳහන් කර තිබෙනවා.

'හඩ්සන් සියල්ල හෙළිකර ඇති බැවි, රහස් ලේඛන ක්‍රමයෙන් බෙඩෝස් දන්වා එවා තිබෙනවා. සර්වබලධාරී දෙවියන් වහන්ස. අපේ ආත්මයන්ට සමාව දෙනු මැනවි'

එද ඩී විත්ටර් ට්‍රෙවෝට මං කිව්ව කථාන්තරය ඕකයි.

http://sherlockholmesinvestigations.blogspot.com

හැමදෙයක් ගැනම විස්තර හරියට කල්පිතණා, ඔහු ඒංගලන්තයෙන් පිටවෙලා වෙරායි වලට ගියේ නේ වැවිලි කරුවෙක් හැටියට, ජීවිතය පටන් ගන්න. නාවිකයා හඩ්සන් ගැනවත් බෙඩෝස් ගැනවත් අපට කිසිම දෙයක් ඊට පස්සෙ අහන්න ලැබුණේ නෑ. ඔවුන් දෙදෙනා සම්පූර්ණයෙන්ම අතුරුදහන් වුණා. පොලිසියට කිසිවෙක් පැමිණිල්ලක් කරලත් නෑ. හඩ්සන් තර්ජනය කරමින් දෙඩව්වා. ඒක බෙඩෝස් වැඩිදි විටියට තේරුම් අරගෙන ඇති බවයි පෙනෙන්නේ. පොලිසියේ අදහස වුණේ හඩ්සන්, බෙඩෝස්ව මරාදමා පැනයන්නට ඇති බව. නමුත් මගේ අදහස ඒකෙ සම්පූර්ණ අනික් පැත්ත. තමා පාවාදෙවි යයි බියට පත්වුණු බෙඩෝස්, හඩ්සන් ගෙන් පලිගන්න හැකිතරම් ධනය එකතු කරගෙන රටෙන් පැන ගියා කියලයි මං විශ්වාස කරන්නෙ

## මරු කැඳවූ ලියුම සමාප්තයි

Reading Purpose Only...Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# පාපැදියේ රැමතිය

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# පාපැදියේ රූමතිය

වයලට් ස්මිත් මෙනෙවිය ගැන අපට මුලින්ම අහන්නට ලැබුණේ 1895 අප්‍රේල් 23 වැනිද බව මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. ඒ දිනවල හෝම්ස්, දුම්කොළ සමාගම් හිමිකරුවකු වූ ජෝන් වින්සන්ට් හාර්ඩින් නම් කෝටිපති ව්‍යාපාරිකයා පිළිබඳ ඉතා සංකීර්ණ ගැටළුවක් විසඳීමට උත්සාහ කරමින් සිටියේය. තමාගේ අවධානය බිඳ හෙළමින්, දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කිරීමට තරුණියක පැමිණීම හෝම්ස්ගේ තුටුවට හේතු නොවීය. උස, ඉතාමත් රූමත් යෞවනියක වූ ඇය, බේකර් වීථියේ අපේ නිවහනට ගොඩ වැදුණේ හැන්දෑ යාමයකයි.

'මම මේ දින්වල ඉතාම සංකීර්ණ, ඒ වගේම බරපතල අපරාධයක් විසඳීමට මැදිහත් වෙලා ඉන්නේ ස්මිත් නෝනා. ඔබේ ප්‍රශ්නය ගැන හිත යොමු කරන්න මට කිසිම විවේකයක් නෑ'

හෝම්ස් පැවසුවේ නොසන්සුන් ස්වරයෙනි.

'මේකත් ඉතාම බරපතල ගැටළුවක් ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මම නම් අද ආවෙ මේක ඔබට කියල, විසඳීමක් ලබාගෙන මිසක් ආපහු යන්නෙ නැහැ' කියන අධිෂ්ඨානයෙන්

ඈ පිළිතුරු දුන්නාය.

ඇය බලෙන්ම එළියට ඇදදැමුවොත් මිස, අප හැර යන බවක් නම් නොපෙනිණ.

'හොඳයි. එහෙනම් ඔහොම වාඩිවෙලා, ඔබට තිබෙන ගැටළුව මොකක්ද කියලා මට ඉක්මනින් කියන්න. ඒක ඔබේ සෞඛ්‍යය ගැන නම් වෙන්න බෑ. ඒ මොකද ඔබ නිතර බයිසිකල් පදින කෙනෙක් නිසා' හෝම්ස් පැවසුවේ මේ තරුණිය දෙස සුපරීක්ෂාකාරීව බලමිනි.

පුදුමයට පත්වූ ඇය තම දෙපා දෙස බැලුවාය. ඇගේ යටි පතුල්වල පිටත දර දිගටම, සම ඉතාම ඝනකම් වී ඇති බව මම දුටුවෙමි. ඒ බයිසිකලයේ පෙඩලය මත ගැටීමෙන් විය යුතුය.



"ඔබ පියානෝව වාදනය කරන්නියක් බව පැහැදිලියි"

http://sherlockholmesinvestigations.blogspot.com

'ඔව්. මට සැහෙන්න බයිසිකල් පදින්න සිදුවෙලා තිබෙනවා. මං අද මෙහේ ආවෙත් ඒ සම්බන්ධ ගැටළුවකට තමයි.'

අත් වැසුම් ඉවත් කර සිටි තරුණියගේ අතක් තම අතින් ගත් හෝම්ස්, එය පරීක්ෂා කළේ කම්මැලිවෙන ලැබුණු දුර්ලභ ජීවියකු පරීක්ෂා කරන ජීව විද්‍යාඥයෙකු මෙනි.

'මට සමාවෙන්න, මං මේ විදිහට ඔබව පරීක්ෂාවට ලක්කරනවට. නමුත් මේක මගේ වෘත්තිය නේ. තව පොඩ්ඩෙන් මට වැරදෙනවා ඔබ යතුරු ලියන්නියක් කියලා. නමුත් ඔබ සංගීතය- පියානෝ වාදනය කරන්නියක් බව හොඳටම පැහැදිලියි. ඔබට පෙණෙනවාද වොට්සන් මේ ඇඟිලිතුඩු වල තිබෙන සවල් කෙළවරක් වැනි සුවිශේෂ හැඩය? ඒක යතුරු ලියනය කරන හා පියානෝ වාදනයේ යෙදෙන වෘත්තීන් දෙකේම අයට පොදුයි' හෝම්ස් ඇයගේ අත අත්හැරියේය.

'නමුත් ඔබේ මුහුණෙන් භාවාත්මක හැඟීම් ප්‍රකාශ වෙනවා. ඒක යතුරු ලියනය නිසා මතුවෙන්නේ නැ. ඒ කියන්නෙ ඔබ පැහැදිලිවම සංගීතවේදිනියක්'

'ඔව් හෝම්ස් මහත්මයා. මං සංගීතය උගන්වනවා'

'ඔබේ සමේ වර්ණය අනුව ඒ, ගම්බද ප්‍රදේශයකදී බව කිව හැකිය'

'ඔව් මහත්මයා. ෆාන්හැම්වලට උතුරේ ප්‍රාන්තය කෙළවරේ'

'හරිම සුන්දර අලාතයක්. ඒ වගේම සිත් ගන්නා සුළු සිදුවීම් වලින් පිරුණු තැනක්. ඔබට මතකද වොට්සන් අර වංචනික ලෙස හොර නෝට්ටු අච්චු ගහපු ආචි ස්ටැම්ෆඩ්ව අප අල්ලගත්තෙ ඔය කිට්ටුව ඉඳල අත්. ඉතිං ෆාන්හැම් එලින් ආපු වයලට් නෝනා. මොකක්ද ඔබේ ප්‍රශ්නය?'

'මගේ තාත්තා මියගිහින්. ඔහු තමා ඉම්පීරියල් නාට්‍ය ශාලාවේ සංගීත කණ්ඩායම මෙහෙයවපු සංගීතඥයා. තාත්තා මියගියාම අම්මාත් මමත් මේ ලෝකෙේ තනිවුණා. තාත්තාට එක

සහෝදරයෙක් හිටියා රැල්ෆ් ස්මිත් කියල. අවුරුදු විසිපහකට කලින් ඔහු අප්‍රිකාවට ගියාලු. ගියා ගියාමයි, ඔහු ගැන ආරංචියක් නෑ. තාත්තාගෙ මරණයෙන් පස්සෙ අපට ආදායම් මාර්ගයක් නැතිකම නිසා අපි අන්තිම දුප්පත් තත්ත්වයට ඇද වැටුණා. මය අතරේ ,එක දවසක්, අප ගැන විමසමින් 'ටයිම්ස්' පත්තරේ දැන්වීමක් පළකරලා තිබෙන බව අපට අහන්න ලැබුණා. අපි කොයිතරම් සතුටට පත්වෙන්න ඇතිද කියලා ඔබට හිතාගන්න පුළුවන් නේද හෝම්ස් මහත්මයා. අපි හිතුවේ කවුරු හරි විශාල ධනයක් අපට ඉතුරු කරලා මියගිහින් කියලා. ඒ දැන්වීමේ තිබුණු විදියට, අදාල නීතිඥයින් හමුවෙන්න අපි වහාම පිටත් වෙලා ගියා.

එහෙදි අපට මහත්වරු දෙදෙනෙක් අඳුනාගන්න ලැබුණා. එක්කෙනෙක් කැරුතර්ස් මහත්මයා. අනෙක් තැනැත්තා වුඩ්ලි මහත්මයා. ඔවුන් දකුණු අප්‍රිකාවෙ ජීවත්ව ඉඳලා, ආපහු එංගලන්තයට ආවු. අය. මගේ බාප්පා - රැල්ෆ් ස්මිත්, ජොහැන්නස්බර්ග් නගරයේ අන්ත දුගියෙකු ලෙස ජීවත්ව ඉඳලා මාස කිහිපයකට පෙර මියගිහිල්ලා තියෙනවා. ඔහු මේ මහත්වරුන්ගෙන් ඉල්ලා සිටියාලු, එංගලන්තයට ගියාම අප ගැන හොයලා බලලා පුළුවන් උපකාරයක් කරන්න කියලා. ජීවත්ව ඉන්න තුරු අප ගැන හොයාල නොබලපු බාප්පා, ඔහුගේ මරණයෙන් පස්සේ අපි ගැන හොයා බලන්න කිව්ව එකට අපට පුදුමත් හිතුණා. ඒත් කැරුතර්ස් මහත්මයා ඒකට හේතුව කිව්වා. තාත්තාගේ මරණය ගැන බාප්පාට දැනගන්න ලැබිලා තියෙන්නේ දින කීපයකට කලින්. අපේ අනාගතය ගැන බලාගැනීම ඔහුගේ වගකීමක් කියලා බාප්පාට හිතුණාලු.'

'සමාවෙන්න' හෝම්ස් කථාවට බාධා කළේය.

'මේ මහත්වරු ඔබට හමුවුණේ කවදාද?'

'ගිය දෙසැම්බර් මාසයේ, ඒ කියන්නේ මීට මාස හතරකට කලින්'

'හරි, කථාව- දිගටම කියන්න'

http://sherlockholmesinvestigations.blogspot.com

‘මෙතැන හිටි වුඩ්ලි කියන මහත්මයා, මහ නින්ද සහගත මිනිහෙක් බව මට ඒ වෙලාවෙම හිතුණා. රතු පැහැති උඩු රැවුලක් සහ පිම්බුණු මුහුණක් ඇති ඔහු, බොහොම සැර පරුෂ කෙනෙක්. කොයි වෙලෙත් මහ ඔහේ නැති විධියට මං දිහා බල බලයි සිටියේ. මට පෙනුණේ ඔහු මහ අප්‍රසන්න පුද්ගලයකු ලෙසයි. මං දන්නවා මං මේ වගේ මිනිහෙක් දැන අඳුනගන්න එකට සිරිල් කැමති වෙන එකක් නෑ.’

‘අහා ! එයාගෙ නම සිරිල්ද?’

හෝම්ස් සිනාසෙමින් ඇසුවේය. ලැජ්ජාවෙන් රතු වූ ඈ අනතුරුව සිනාසුණාය.

‘ඔව් හෝම්ස් මහත්මයා. ඔහු සිරිල් මෝටන්. ඔහු විදුලි ඉංජිනේරුවරයෙක්. ලබන ගිම්හාන සෘතුවේ අන්තිම හරියේ අපි විවාහ වෙන්න බලාපොරොත්තු වෙනවා. අනේ, මං කොහොමද මේ කතාවට එයාවත් ඈඳගත්තේ?

ආ...... මට කියන්න ඕන වුණේ මේ වුඩ්ලි කියන මනුස්සයා පිළිකුල් සහගත කෙනෙක් කියන එකයි. ඒ වුණත් කැරුතර්ස් මහත්මයා මැදිවියේ, හොඳ කෙනෙක් වගෙයි පෙනුණේ. ඔහු බොහොම නිහඬ, ආචාරශීලී, කෙනෙක්. ප්‍රිය උපදවන සිනහ රැල්ලක් නිතරම ඔහුගේ මුහුණේ රැඳී තිබුණා. මාත් අම්මාත් ජීවත්වෙන්න කොහොමද කියල මේ කැරුතර්ස් මහත්මයා ඇහුවා. අපි බොහොම දුප්පත් කියල දැනගත්තාම ඔහු මට රැකියාවක් දෙන්න කැමැත්ත පළකළා. ඔහුගේ අවුරුදු දහයක් වයසැති දියණියට සංගීතය උගන්වන්න මට එන්න කිව්වා.

‘ඔබ බොහොම කරුණාවන්තයි කැරුතර්ස් මහත්මයා. ඒ වුණත් මට මගේ අම්මාව තනියෙන් දාල එන්න හැටියක් නෑ. රැකියාවක් සඳහා වුණත්, ඇය තනිකරලා මං කොහොමද පිට තැනක ගිහිං ඉන්නේ?’ මං කිව්වා.

‘ඔබ සතියේ දවස්වල අපේ ගෙදර නැවතිලා, මගේ දුවට උගන්වන්න. සති අන්තයේ අම්මාව බලන්න ඔබට ගෙදර යන්න

පුළුවනි. මං කැමතියි ඔබට අවුරුද්දට පවුම් සියයක වැටුපක් ගෙවන්න' ඔහු කිව්වා.

ඒක ඉතාම හොඳ වැටුපක් හෝම්ස් මහත්තයා. ඒ නිසා අන්තිමට මම ඒ රැකියාව භාරගන්න කැමැති වුණා. ඉතින් මම කැරුතර්ස් මහත්මයාගේ නිවස වූ චිල්ටන් ග්‍රේන්ජ් නම් නිවසේ නවතින්න ගියා. මෙය පිහිටා තිබුණේ ෆාන්හැම් වලටත් තවත් සැතපුම් හයක් දුරින්. කැරුතර්ස් මහත්මයාගේ බිරිඳ මියගිහින්. ඒ නිසා ගෙදර වැඩ කටයුතු ඔක්කොම බලාකියා ගත්තේ, ඩික්සන් මහත්මිය. ඇය තරමක් වයස්ගත, ඒ වගේම වැදගත් කාන්තාවක්. කැරුතර්ස් මහත්මයාගේ දියණිය, හරිම හුරතල් කීකරු දරුවෙක්. හැම පැත්තකින්ම පෙනුණේ මේ රැකියාව මට කිසි කරදරයක් නැතිව හොඳින් කරගෙන යාමට හැකි බවයි. කැරුතර්ස් මහත්මයාත් හරිම කරුණාවන්ත, සංගීතයට ලැදි කෙනෙක්. බොහොම දවස්වල අපේ සංගීත පාඩමට ඔහුත් එකතුවුණා. ඉතින් සවස් වරුව හරිම ප්‍රීතිමත් අයුරෙන් ගෙවිල ගියා. ලන්ඩනයේ ජීවත්වුණු මගේ අම්මාව බලන්න මම හැම සති අන්තයකම ගෙදර ආවා.

මං එහෙත් සතුටෙන් ගතකළ ජීවිතයට මුල්ම කරදරය ඇතිවුණේ අර රතු රැවුල්කාරයා වුඩ්ලි මහත්තයාගේ පැමිණීමත් සමගයි. ඔහු චිල්ටන් ග්‍රේන්ජ් නිවසේ සතියක කාලයක් නවතින්න ආවා අයියෝ ! මට ඒක දැනුණේ මාස තුනක් වගේ. ඔහු මහා භයානක මිනිහෙක්. ඔහු සැරපරුෂ විධියට කතා කරමින් කවුරුත්වත් භය කරගෙනයි සිටියේ. මට සැලකුවේ ඒ ඔක්කොටම වඩා නරක විධියට. ඔහු මට ආදරයක් පෙන්වන්න ආවා. නමුත් මගේ හිතේ ඔහු ගැන ඇතිවුණේ මහා පිළිකුලක්. තමා මහ ධනවතෙක් බව කියමින් ඔහු නිතර පුරාජේරු කතා දෙඩෙව්වා. ඔහු සමග විවාහ වුණොත් ලන්ඩනයේ තිබෙන ඉතාම වටිනාම දියමන්තිය මට තෑගි කරන බව කියලා, මට විවාහ යෝජනා කළා. ඔහුගෙ ඒ කිසිම කතාවකට මං කැමැත්තක් වත් හොඳ මූණක් වත් පෙන්නුවේ නෑ. එක දවසක් රෑ කෑමෙන් පස්සේ මං කාමරයට යන්න හදනකොට ඔහු ඇවිත් දැතින් මාව අල්ලා

Reading Purpose Only
http://sherlockholmesinvestigations.blogspot.com

ගත්තා. ඔහු හරකෙක් වගේ ශරීර ශක්තියක් තිබෙන කෙනෙක්. ඉතින් කැරුතර්ස් මහත්මයා ඇවිල්ලා, බොහොම අමාරුවෙන් වුඩ්ලිගේ ග්‍රහණයෙන් මාව ගළවාගත්තා. ඒකට කෝප වුණු වුඩ්ලි, කැරුතර්ස් මහත්මයාට බිම වැටෙන්න පහර දුන්නා. ඒ පහරකට කැරුතර්ස් මහත්මයාගෙ මුහුණ තුවාල වෙලා ලේ ගලන්න පටන් ගත්තා. වුඩ්ලි එදාම ඒ ගෙදරින් පිටවෙලා ගියා. මට මුහුණ දෙන්නට සිදුවූ මේ සිද්ධිය ගැන පසුවද කැරුතර්ස් මහත්මයා මගෙන් සමාව ඉල්ලා සිටියා. මේ වගේ ලැජ්ජා සහගත දෙයකට, මින් ඉදිරියට, මට මුහුණ දීමට ඉඩ නොතබන බවට ඔහු මට සහතික වුණා. ඊට පස්සේ මට තවමත් වුඩ්ලිව දකින්න ලැබුණේ නෑ.

දැන් හෝම්ස් මහත්මයා, මං එන්නේ මගේ කථාවේ අවසාන කොටසට. ඔබේ අවවාදය මට උවමනා වෙලා තියෙන්නේ, මෙන්න මේ කාරණය සම්බන්ධයෙන්.

හැම සෙනසුරාදාවකම දවල් එකොළහමාරට විතර මං විල්ටන් ශ්‍රේන්ජ් නිවසින් පිටවෙලා, බයිසිකලය පැදගෙන දුම්රිය පොළට එනවා. දුම්රිය තියෙන්නේ දවල් 12 යි 22 ට. මට එන්න තියෙන මේ පාර තරමක් පාළුයි. මේ පාරෙ එක හරියක්, ඒ කියන්නෙ හැතැක්මක් පමණ දුරක් පැහැන්න පාළුයි. ඒ හරියේ පාරෙන් එක පැත්තක චාලිංටන් විලබිව නම් පැරණි මන්දිරය පිහිටි, වනරොදක් සහිත ඉඩම. අනෙක් පැත්තේ චාලිංටන් මුඩුබිම. මේ තරං පාළු හරියක් ඔය පාරෙ කොහේවත් හම්බවෙන්නෙ නැහැ. කෲක්ස්බරි කුන්ද හරියට එනතුරු, පාරේ අශ්වකරත්තයක් හරි, පයින් එන ගැමියෙක් හරි, දකින්න ලැබෙන්නෙ වත් නෑ.

සුමාන දෙකකට ඉස්සර වෙලා මං තනියෙන් බයිසිකලය පැදගෙන එනකොට, මේ හරියේදි මං නිකමට ආපහු හැරීලා බැලුවා. යාර දෙසීයක් පමණ ඈතින් බයිසිකලයක් පැදගෙන මා පිටිපස්සෙන් එන මිනිහෙක් මං දැක්කා. මට පෙනුණු හැටියට ඔහු මැදි වයසේ කෙනෙක්. මුහුණේ කෙටි, කළු පැහැති යටි රැවුලක් තිබුණා. මං ෆාන්හැම් වලට එන්න කලින් ආපහු හැරීලා බැලුවා.

නමුත් ඔහු පේන්න හිටියේ නැහැ. ඉතින් මට ඒ ගැන වැඩිදුර කල්පනා කරන්න දෙයක් තිබුණේ නැහැ.

ඊට පස්සෙ සඳුදා දුම්රිය පොළේ ඉඳලා ආපහු බයිසිකලය පැදගෙන ආවා. පාරේ ඒ හරියේදීම අර කලින් දැකපු මිනිහා මට දකින්න ලැබුණා. ඔබට හිතාගන්න පුළුවන් නේද හෝම්ස් මහත්මයා, මගේ හිතේ ඇතිවුණු පුදුමය. ඊට පස්සේ ඒ සතියම කැරුතර්ස් මහත්මයාගේ නිවසේ ගතකරලා සෙනසුරාද මං බයිසිකලයෙන් දුම්රියපොළට ආවා. දින දෙකකට පසු සඳුදා දුම්රියපොළේ සිට බයිසිකලයෙන් ගියා. ඒ යන එන ගමන් දෙකේදිත් අර පුද්ගලයා, අර හරියෙදිම දකින්න ලැබුණාම, මං පුදුමයෙන් පුදුමයට පත්වුණා. ඔහු ආවෙ මට පෑහෙන තරම් දුරින්. ඒ වගේම ඔහුගෙන් මට කිසිම හිංසාවක් හෝ කරදරයක් සිද්ධවුණේ නෑ. ඒ වුණත් මේක මහ අරුම පුදුම සිද්ධිමක්. මං මේ ගැන කැරුතර්ස් මහත්මයාට කිව්වා. ඔහු එය උනන්දුවෙන් අහගෙන හිටියා. මේ පාර සාරේ මං තනිවම යැවීම සුදුසු නැහැ කියන එකයි ඔහුගේ අදහස වුණේ. මට යන්න එන්න අශ්ව කරත්තයක් සූදානම් කර දෙන බව කැරුතර්ස් මහත්මයා කිව්වා.

ඒ අශ්ව කරත්තය එන්න නියමිතව තිබුණේ මේ සති අන්තයේ. නමුත් මොකක් හරි හේතුවක් නිසා අශ්ව කරත්තය නියම කරගත් වෙලාවට ආවේ නැහැ. ඒ නිසා මට බයිසිකලයෙන්ම එන්න සිද්ධවුණා. ඒ අද උදේ. මං දුම්රියපොළට එන ගමන් චාලිංටන් මුඩුබිම හරියේදි ආපහු හැරිලා බැලුවා. මෙන්න ආයෙමත් අර මිනිහා සති දෙකකට කලින් ඉඳගෙන සෙනසුරාද, සඳුද දිනවල දැක්ක වගේම අදත්. ඔහු තරමක් ඈතින් හිටියේ. ඒ නිසාද ඔහුගෙ මුහුණ මට පැහැදිලිව බලාගන්න බැරිවුණා. කොහොම වුණත් ඒ මං අඳුනන කෙනෙක් නම් නොවෙයි. ඔහු ඇඳගෙන හිටියේ කළු පැහැති ඇඳුම් කට්ටලයක්. රෙදිවලින් මැසූ කැප් තොප්පියක් හිසේ පැළැඳගෙන හිටියා. ඔහුගේ මුහුණේ මට පැහැදිලිව බලාගන්න පුළුවන් වුණු එකම දේ, කළු පැහැති යටි රැවුල පමණයි. අද නම් මගේ හිතට කිසි භයක් දැනුණේ නෑ. මගේ හිතේ ඇතිවුණේ කුතුහලයක්.

http://sherlockholmesinvestigations.blogspot.com



"ඔහු තරමක් ඈතින් හිටියේ. ඒ හින්ද ඔහුගේ මුහුණ පැහැදිලිව බලාගන්න බැරි වුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු කවුද? මොනවද ඔහුට වෙලා තියෙන්නෙ? මේ ප්‍රශ්න මගේ හිතට ආවා. මට හිතුණා මේ ප්‍රශ්නවලට පිළිතුරු හොයාගන්න. ඉතින් මං බයිසිකලයේ වේගය හුඟක් අඩුකළා. එතකොට ඔහුත් ඔහුගේ වේගය අඩු කළා. මම බයිසිකලය නැවැත්තුවාම ඔහුත් බයිසිකලය නැවැත්තුවා. ඊට පස්සේ මං ඔහුට හොඳ උගුලක් ඇටෙව්වා. මේ පාරේ ලොකු වංගුවක් සහිත තැනක් තියෙනවා. එතන අනෙක් හරියට පේන්නෙ නෑ. ඉතින් මං ඉක්මනටම බයිසිකලය පැදගෙන ගිහින්, පාරෙ අයිනෙ නැවතිලා බලාගෙන හිටියා. මං හිතුවා ඔහුත් වේගයෙන් එයි කියලා. නමුත් ඔහු ආවෙ නැහැ. ඊට පස්සෙ මං ආපහු ගිහින් බැලුවත් ඔහු පෙනෙන්න හිටියෙ නැහැ. හැතැක්මක් තරම් දුරට පාර පැහැදිලිව පෙනුණා. නමුත් ඔහුගෙ ඡායාවක්වත් දුටුවේ නැහැ. මේකෙ පුදුමය කියන්නෙ හෝම්ස් මහත්මයා ඔහුට යන්න හරස් පාරක් මොකක්වත් මේ හරියේ නැහැ'

'ඔබ අර වංගුව පහුකරලා ගිහිං ටික වෙලාවක් ඔහු එනතුරු බලාගෙන හිටියා නෙ. කොයිතරම් වෙලාවකට පස්සෙද ඔබ ආපහු ගියේ?'

'මිනිත්තු දෙකකින් හෝ තුනකින්'

'එහෙම නම් ඔහු ආපහු ගියා වෙන්න බෑ. ඔබ කියන්නේ ඔය හරියේ අතුරු පාරවල් මොකුත් නැහැ කියලයි?'

'මොකුත්ම නැහැ'

'එහෙනම් ඔහු පාර අයිනේ තිබුණු අඩිපාරක ගියා වෙන්න පුළුවනි'

'ඒ පාර තිබෙන්න ඇත්තේ මුඩුබිම පැත්තේ නම් වෙන්න බෑ. එහෙම ගියා නම් මට පෙනෙනවා'

'එහෙනම් ඔහු චාලිංටන් වලව්ව වෙත ගියා වෙන්න පුළුවනි. තවත් මොනවද ඔබට කියන්න තියෙන්නෙ?

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

'වෙන මොකුත්ම නෑ හෝම්ස් මහත්මයා මේ ගැන ඔබෙන් උපදෙස් ලබාගන්න තුරු මගේ හිතට හරි නෑ'

හෝම්ස් නිශ්ශබ්දවම ටික වෙලාවක් කල්පනා කරමින් සිටියේය.

'ඔබ දැන් විවාහ ගිවිසගෙන ඉන්න මහත්තයා කෝ?'

'ඔහු කොවෙන්ට්‍රි නගරයේ මිඩ්ලන්ඩ් විදුලි බල සමාගමේ සේවය කරනවා'

'කලින් නොදන්වා ඔහු හදිසියේ ආවා වෙන්න බැරිද?'

'අනේ හෝම්ස් මහත්මයා, මං දන්නෙ නැද්ද ඔහුගෙ පිළිවෙළ'

'ඔබ හා මිතුරු වීමට උත්සාහ කළ හෝ ආශ්‍රය කළ තරුණයෙක් වෙන කවුරුවත් හිටියද?'

'ඔව් තරුණයින් හුඟ දෙනෙක් හිටියා. ඒත් ඒ සිරිල් දැන හැඳිනගන්න කලින්'

'ඊට පස්සෙ වෙන කවුරුවත් ?'

'ඇයි මේ නපුරු මිනිහ වුඩ්ලි?'

'වෙන කවුරුවත් නෑ?'

කිසිවක් තීරණය කරගැනීමට අපහසුව, සියල්ල පැටලී ඇති ස්වභාවයක් ඇගේ මුහුණෙන් ප්‍රකාශ විය.

'කවුද ඒ, කියල කියන්න බලන්න' හෝම්ස් කීය.

'මේක මගේ හිතට වැටහෙන හැටිද මං දන්නෙ නෑ හෝම්ස් මහත්තයා. ඒ වුණත් මට වෙලාවකට හිතෙනවා කැරුතර්ස් මහත්මයා මං ගැන ලොකු උනන්දුවක් දක්වනවද කියලා. අපි දෙන්නට හුඟ වෙලාවට කාලය ගත කරන්න වෙන්නෙ එකටමයි. හැන්දෑ වෙලාවට ඔහු නැමැති වාදන ශිල්පයක් මං ප්‍රියාතෝෂයෙන්

වාදනය කරනවා. ඔහු එහෙම දෙයක් කිව්වත් මට වචනයකින් වත් අඟවලා නැහැ. ඔහු නියම මහත්ම ගතිගුණ ඇති පුද්ගලයෙක්. නමුත් ගෑනු අපට මේ වගේ දේවල් ඉවෙන් වාගේ තේරෙනවා.'

'අහා ! කැරුතර්ස් මහත්මයා මොකක්ද කරන රක්ෂාව?'

'ඔහු ලොකු ධනවතෙක්.'

'ඒ වුණත් ඔහුට අශ්වයො හෝ අශ්ව කරත්තයක් නැ?'

'ඒක මං දන්නෙ නැ. කොහොම වුණත් ඔහුට සෑහෙන දේපොළක් තියෙනවා. දකුණු අප්‍රිකාවේ රත්තරන් නිෂ්පාදනය කරන සමාගම්වල මුදල් ආයෝජනය ගැන ඔහු ලොකු උනන්දුවක් දක්වනවා.'

'ස්මිත් මෙනෙවිය, ඔබට තවත් මොනවා හරි දැනගන්න ලැබුණොත් වහාම මට දන්වන්න. මේ දවස්වල මට වැඩ කටයුතු හුඟාක් අධිකයි. ඒ වුණත් ඔබේ ප්‍රශ්නය ගැන අපි කොහොම හරි හොයා බලනවා. ඊළඟට, මට කලින් දැනුම් නොදී මොකුත්ම පියවරක් ගන්න එපා. මට විශ්වාසයි ඔබට සතුටුදායක ආරංචියක් ලබාදෙන්න අපට හැකිවේවි කියල. ඔබට සුභ දවසක්'

වයලට් ස්මිත් මෙනෙවිය අපෙන් සමුගෙන පිටත්ව ගියාය.

'මේ වගේ පෙනුමක් තියෙන ගෑනු ළමයෙක් ගැන උනන්දුවක් දක්වන අය ඉන්න එකත් ස්වාභාවිකයි. ඒ වුණත් පාළු පාරක බයිසිකලයක නැගිලා, හැංගි හැංගී පිටිපස්සෙන් යන අය නම් නොවෙයි. කවුරු හරි ඇය ගැන අදහසක් ඇතිකරගත්තු කෙනෙක් වෙන්න ඇති. ඒකෙ සැකයක් නැ. නමුත් මෙතන හරි පුදුමාකාර වෙනස්කම් කීපයකුත් තියෙනවා වොට්සන්' හෝම්ස් කථාව පටන් ගත්තේ ඔහුගේ මුවේ තිබුණු පයිප්පය අතට ගනිමිනි.

'පාරේ එකම තැනකදී ඔහු දකින්න ලැබෙන එකද?'

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

'හරියට හරි. අපි මුලින්ම හොයා බලන්න ඕන මේ වාලිංටන් වලව්වෙ පදිංචි කාරයො කවුද කියලා. ඊළඟට මේ කැරුතර්ස්ගෙයි වුඩ්ලිගෙයි සම්බන්ධය ගැන ඔබට මොනවද හිතෙන්නෙ? අදහස් අතින් කිසිම ගැළපීමක් නැති දෙන්නෙක්. ඊල්ලන් ස්මිත්ගෙ ඥාතීන් ගැන හොයා බලන්න, ඒ දෙන්නට ලොකු උනන්දුවක් ඇතිවුණේ කොහොමද? ළමයාට සංගීත පාඩම් උගන්වන ගුරුවරියට, සාමාන්‍ය ගාස්තුව වගේ දෙගුණයක් ගෙවන්නෙ මොන අවුලෙන්ද? ඔහු ඉන්නේ දුම්රියපොළට හැතැක්ම හයක් ඈතින්. ඒත් ඔහුට අශ්ව කරත්තයක් හෝ අශ්වයෙක්වත් නැහැ. හරිම පුදුමයි වොට්සන්'

'ඔබ ෆාන්හැම් වලට යනවද මේ ගැන පරීක්ෂා කරන්න?'

'නෑ මගේ හිතවත් මිනිසා. එහේ යන්නේ මං නෙමෙයි ඔබ. මේක මේ පොඩි පට්ලැවිල්ලක් වෙන්න ඇති. මේ කාරණාව නිසා මගේ ඉතාම වැදගත් පරීක්ෂණයක් අතර මඟ නතර කරල දාන්න බෑ.

වොට්සන්, සඳුදා උදේ පාන්දරම ෆාන්හැම්වලට යන්න. ඊළඟට ඔබ අර පාර දිගේ ගිහිං, වාලිංටන් මුඩුබිම හරියේ හැංගිලා බලාගෙන ඉන්න ඕන. සිදුවෙන හැම දෙයක්ම හොඳින් බලාගෙන ඉඳල, ඒ අවස්ථාවට සුදුසු පියවරක් ඔබට ගන්න පුළුවනි. ඊළඟට වාලිංටන් මන්දිරයේ වාසය කරන්නේ කවුද කියලා තොරතුරු හොයල බලලා, ඔක්කොම මට ඇවිත් දැනුම් දෙන්න. තීරණයකට එළැඹිය හැකි වැදගත් තොරතුරු මොනවා හරි හොයාගන්න තුරු, අපි මේ ගැන මොනවත් කථා නොකර ඉමු'

වයලට් ස්මිත් අපට පැවසුවේ, වෝටලූ දුම්රිය පොළෙන් 9.50 ට පිටත්වෙන දුම්රියෙන් ඇය ෆාන්හැම් බලා යන බවයි. එහෙයින් මම ඊට කලින් පිටත්වෙන දුම්රියේ යෑමට තීරණය කළෙමි. ඒ අනුව 9.13 දුම්රියෙන් මම ෆාන්හැම් වෙත ආවෙමි. එතැන් සිට වාලිංටන් මුඩුබිම් පෙදෙස සොයා ගැනීමට මට අපහසු නොවීය. වයලට් ස්මිත් පසුපසු ආ යන බයිසිකල් කරුවකු

පැමිණෙන පාළු අඩවිය, පහසුවෙන් වැරදින තැනක් නොවේ. තැනින් තැන පඳුරු පමණක් පිහිටා තිබූ, විශාල පාළු මුඩුබිම පාරේ එක් පසෙකින්ය. අනෙක් පැත්තේ එක දිගටම ඝනව අතු විහිදුණු පැරණි යූ ගස් පේළියකි. හාත්පස අන්ධකාර කළ එම යූ ගස් පෙළට ඇතුළතින් පිහිටියේ චාලි-ටන් වලව්වට අයත් වනෝද්‍යානයයි. එහි සෑම තැනකම රුක්ස ගස් වලින් පිරී තිබිණි. පෙඳ පාසි වලින් වැසී, කළු පැහැ ගැන්වුණු විශාල ගේට්ටු කුළුණු දෙක අතරින් වැටී තිබුණේ, වලව්ව දක්වා දිවෙන පාරයි. පාර අයින දිගට තිබුණු යූ ගස් අතරින්, අම්හර තැන්වල කපොලු පිහිටා තිබුණු සැටියක්. ඒ තැන්වල සිට වනරොද වෙත වැටුණු අඩිපාර කිහිපයක්ද මගේ නිරීක්ෂණයට හසුවිය. චාලි-ටන් වලව්ව මහමඟට දිස්වූයේ නැත. එහෙත් අවට පරිසරය නියා පැවේ ගරා වැටුණු වලව්වක් වටා පැතිරගත් අඳුරු මුසල භාවයයි.

---

මුඩුබිම් පෙදෙසේ තැනින් තැන කහ පැහැති මල් පිපුණු මල් පඳුරු රාශියක් තිබිණි. වලව්වට ඇතුළුවෙන ගේට්ටුව සහ ප්‍රධාන පාරේ දෙපැත්තටම පැහෙන දුරක් දැකගත හැකිවන අයුරින්, මල් පඳුරක් පිටුපස සැඟවී සිටීමට මම තීරණය කළෙමි. මා මෙහි පැමිණෙද්දී පාර සම්පූර්ණයෙන්ම හිස්ව තිබිණි. දැන් මහා මාර්ගයේ ඈත කෙළවරේ බයිසිකලයක් පැද එන්නකු මට දැකිය හැකි විය. ඔහු පැමිණියේ කැරුතර්ස් මහතාගේ නිවස පැත්තේ සිටයි. සියලුම සිදුවීම් හෝම්ස්ට වාර්තා කළ අයුරින්ම මෙතැන් සිට ඔබට ඉදිරිපත් කරමි.

'ඔහු ඇඳගෙන සිටියේ අඳුරු පැහැති ඇඳුම් කට්ටලයක්. ඔහුට කළු පැහැති යටි රැවුලක් තිබෙන බවත් මා දුටුවා. හෙමින් බයිසිකලය පැදගෙන ආ ඔහු, චාලි-ටන් වත්තට අයත් හරියේදී බයිසිකලයෙන් බැස්සා. ඊළඟට ඔහු යූ ගස් අතරින් වැටුණු කපොල්ලකින් බයිසිකලය තල්ලු කරගෙන වනරොද අතරට නොපෙනී ගියා.

තවත් පැය කාලක් විතර බලාගෙන ඉන්නකොට මං දැක්කා ෆාන්හැම් පැත්තේ ඉඳල බයිසිකල්කරුවෙක් එනවා. තව විනාඩි ළංවෙද්දී මං දැක්කා ඒ තරුණ සාජන්ට්වරයා බව. ඇය ඒ

හරිය පසුකරලා ගියා විතරයි, අර කුඩු රොදේ හැංගිලා හිටි මිනිහා එතැනින් එළියට ඇවිත්, බයිසිකලයේ නැගිල ඈ පසුපස ගියා. මුළු පාරෙම ගමන් ගත්තේ මේ දෙන්නා විතරයි.

ටික දුරක් යද්දී ස්මිත් මෙනෙවිය ආපහු හැරිලා බලලා, වේගය අඩු කරන හැටි මම දැක්කා. අර මිනිහා මොකද කළේ, ඔහුත් වේගය අඩුකළා. ඈ බයිසිකලය නැවැත්තුවා. ඔහුත් බයිසිකලය නැවැත්තුවා. ඒ ඇයට යාර දෙසීයක් පමණ පිටිපස්සෙන්. ඊට පස්සේ ඇය කළ දේ මං කොහොමටවත් නොහිතපු දෙයක්. එක පාරටම බයිසිකලය ආපහු හරවා ගනිපු ඈ, බොහොම වේගයෙන් අර මිනිහ දිහාවට බයිසිකලය පදින්න, පටන්ගත්තා. අර මිනිහා බොහොම කලබල වුණා. ඔහුත් බයිසිකලය හරවාගෙන වේගයෙන් පැනගියා. ටික දුරක් එද්දිම ඔහු නොපෙනී ගිය බව දුටු ඈ, යළිත් ආපහු හැරිල යන්න ආ ගමන ගියා. මඳ වෙලාවකට පස්සේ ඔහුත් සැහෙන තරම් පිටුපසින් ඇය ගිය දිහාවටම යන හැටි මං දුටුවා.

මම තවත් ටික වෙලාවක් හැංගිලා හිටි තැන එහෙමම හිටියා. එහෙම ඉඳපු එක හොඳට ගියා. මෙන්න අර මිනිහා ආයෙමත් බයිසිකලයෙන් ආවා. ඒ ඇවිත් චාලිංටන් වලව්වේ ගේට්ටුව ඉදිරිපිටදී බයිසිකලයෙන් බැහැලා, ඔහුගේ ටයිපටිය, කොලරය එහෙම සකස්කරගෙන, වලව්වට වැටෙන පාර දිගේ බයිසිකලය පැදගෙන ගියා. මං පාර අයිනට දුවගෙන ඇවිත් බැලුවත් මට යන්තමට දැකගත හැකිවුණේ අළු පැහැති පරණ ගොඩනැගිල්ලක දුම් කවුළු පමණයි.

උදේ වරුවේම මං සැහෙන වැඩ කොටසක් අවසන්කර තිබුණු නිසා, මීළඟට මං පයින්ම ආපහු ෆාන්හැම් වලට ආවා. එහි නිවාස බදු දීම් කරන ආයතනය චාලිංටන් වලව්ව ගැන කිසි දෙයක් දැනගිටියේ නෑ. ඔවුන් කිව්වා ලන්ඩන් වල තවත් ආයතනයකින් අහල බලන්න කියල. මං එතැනටත් ගියා. මං ඇහුවා මේ ගිම්හාන ඍතුවට චාලිංටන් වලව්ව මට බද්දට ගන්න පුළුවන්ද කියලා. -

http://sherlockholmesinvestigations.blogspot.com

'බොහොම කණගාටුයි මහත්මයා. මම ප්‍රමාද වැඩියි. අපි මාසෙකට කලින් ඒක බද්දු දුන්නා.'

'කාටද?'

'විලියම්සන් කියල වයස්ගත වැදගත් මහත්මයෙකුට.'

මා කියූ විස්තරය සාවධානව අසා සිටි හෝම්ස්ගෙන්, මා බලාපොරොත්තු වූයේ ප්‍රශංසාත්මක ස්තුතියකි. එහෙත් ඔහුගෙන් මට එල්ල වූයේ තදබල විවේචනයකි.

'වොට්සන් ඔබ හැංගුණු තැන සම්පූර්ණයෙන්ම වැරදියි. ඔබට හැංගෙන්න තිබුණේ අර යු ගස් පේළිය පැත්තේ වැට පිටිපස්සෙ තැනක. එහෙම සිටියා නම් රැවුල් කාරයාගේ පෙනුමත් හරිහැටි බලාගන්න තිබුණා. ඔබ ඉඳල තියෙන්නෙ යාර සිය ගණනක් ඈතින්. දැන් බලනකොට ඔබට ස්මිත් මෙනෙවිය කියූ තරම් දේවල්වත් කියන්න පුළුවන් කමක් නැහැ නේ. ඇය කිව්වේ මේ මිනිහ අඳුනන්නෙ නැහැ කියලා. නමුත් මට විශ්වාසයි මේ ඇය හඳුනන කෙනෙක් බව. එහෙනම් ඇයි, ඇය කිට්ටුවට එනකොට ඔහු පලායන්නේ? ඔහුව හඳුනා ගැනීමට ඉඩ තිබෙන නිසා. ඔබ වැඩේ හරියට කරල නෑ වොට්සන්. ඒ මිනිහ වලව්වට ගියා. ඔහු කවුද කියලා දැනගන්න ඔබට උවමනායි. ඔබ මොකද කරන්නේ? ඔබ ලන්ඩනයට එනවා ගෙවල් කුලියට දෙන ආයතනයකින් ඔහු කවුද කියලා හොයන්න.'

'එහෙනං වෙන මොකක්ද මට කරන්න කියන්නෙ?' මම තරමක් කෝපයෙන් කෑගැසුවෙමි.

'ඔබට තිබුණා කිට්ටුවම තිබෙන පොදු අවන්හලට යන්න. මත්පැන් තොල ගාමින් පළාතෙම තියෙන ඕපදූප දොඩවන්නෙ එතනයි. එතැනදී ඔබට අහගන්න තිබුණා, වලව්වේ ඉහළම රදළයගෙ ඉඳන් කුස්සියේ වැඩකාර කෙල්ල දක්වා හැමදෙනෙක් ගැනම තොරතුරු. අර නම විලියම්සන් කිව්වා නේද? ඒකෙන් මට මොකුත්ම හිතාගන්න බෑ. ඔහු වයස්ගත මිනිහෙක්ද? එහෙම නම් අපේ ස්මිත් මෙනෙවිය එක්ක බයිසිකල් රේස් පදින්නෙ ඔහු වෙන්න බෑ.

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතින් මොනවද වොට්සන් මගේ ගවේෂණ චාරිකාවෙන් අපට දැනගන්න ලැබුණේ? මයලට් ස්මිත් මෙනෙවිය කිව්ව දේවල් ඇත්ත බව. ඒවා ඇත්ත බවට මගේ කිසිම සැකයක් තිබුණේ නැහැ. බයිසිකල්කරුවාත් චාලිංටන් වලව්වත් අතරේ සම්බන්ධ කමක් ඇති බව. ඒ ගැනත් මගේ කිසිම සැකයක් තිබුණෙ නෑ. වලව්වේ පදිංචි විලියම්සන් කියන කෙනෙක් බව. ඒකෙන් අපට ඇති ප්‍රයෝජනේ මොකක්ද? හරි, හරි, ඕකට බය තරම් මූණ තරක් කරගන්න ඕනෙ නෑ. ඊළඟ සෙනසුරාද වෙනතුරු අපට ඒ හැටි කරන්න දෙයකුත් නෑ. ඒ අතරෙ කාරණා එකක් දෙකක් ගැන මං හොයාල බලන්නම්කෝ.

පසුවද අපට ස්මිත් මෙනෙවියගෙන් ලිපියක් ලැබිණි. මා දුටු සිදුවීම් සියල්ල එහි විස්තර කොට තිබිණි. එහෙත් ලිපියේ වැදගත්ම කොටස අවංගු වූයේ අන්තිමට ලියා තිබූ ඡේදයේයි.

......**හෝම්ස් මහත්මයා, මේ කරුණ රහසක්ව තබාගනු ඇතැයි මං විශ්වාස කරනවා. තවදුරටත් මගේ රැකියාව කරගෙන සිටීමට අපහසු තත්ත්වයකට මම මුහුණපාලා. කැරුතර්ස් මහත්මයා මට විවාහ යෝජනා කළා. ඔහු එය කළේ මා කෙරෙහි ඇතිවූ ආදරයෙන් මෙන්ම අවංක හැඟීමෙන් බව මට විශ්වාසයි. ඒ වුණත් මං දැනටමත් මගේ පොරොන්දුව දීල අවසන් නෙ. විවාහ යෝජනාව මං ප්‍රතික්ෂේප කළාම ඒක ඔහුට තදින්ම වැදුණා. ඒත් ඔහු එය නියම මහත්මයෙකු ලෙස භාරගත්තා. ඒ වුණත් අප අතර ඇති හිතවත් කමේ යම් තරමක පළුදුවීමක් වෙන්න ඇති බව ඔබට තේරෙනවා ඇති.**

'අපේ ගැනු ළමයා ගැටළු සහිත තත්ත්වයකට මැදිවෙගන යි එන්නෙ' හෝම්ස් පැවසුවේ ලිපිය කියවා අවසන් කරමිනි.

'මං මුලින් හිතුවාට වඩා සිත්ගන්නා සුළු කාරණා රැසක් මේකෙ හැංගිලා තියෙනවා. මේ ගම්මානයට ගිහිං නිවිසැනසිල්ලේ දවසක් ගතකළොත් පාඩු නෑ. මගේ හිතේ ඇතිවුණු උපකල්පන එකක් හෝ දෙකක් කොයිතරම් නිවැරදිද කියලා පරීක්ෂා කරල බලන්නත් පුළුවනි'

http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රාන්හැම් බලා පිටත්ව ගිය හෝම්ස් ආපසු එනවිට සැන්දෑවී තිබිණ. ඔහු නිවිසැනසිල්ලේ ගතකරනවා යයි කිවූ දවස ඉතාම සුවිශේෂ ආකාරයට අවසන් වී ඇති බව පෙනෙන්ට තිබේ. නළලට වැදුණු පහරකින් හෝම්ස්ගේ නළල ගෙඩි ගැසී, නිල් පැහැ ගැන්වී තිබිණ. මුහුණට එල්ල වූ පහරකින් තොල පුපුරා යාමෙන් ලේ ගලා ගොස් ඇත. අසෙයේ වෙනත් සතුටෙන් පොපියමින් සිටි ඔහු, දවසේ සිදුවීම් විස්තර කළේ සිනහ මුහුණෙනි.

'ශාරීරික ව්‍යායාමවල ක්‍රීඩාවල්, යෙදෙන්න දැන් මට ඉඩකඩ ලැබෙන්නෙ බොහොම කලාතුරකින් නේ වොට්සන්. ඉතින් එහෙම අවස්ථාවක් ලැබීමත් වාසනාවක්. ඔබ දන්නව නේ බොක්සිං ක්‍රීඩාව ගැන මගේ ලොකු උනන්දුවකුත් යම් තරමක දක්ෂතාවයකුත් තිබෙන බව. ඉඳහිටල ඒකෙන් ප්‍රයෝජනයකුත් තිබෙනවා. නිදසුනක් වශයෙන් මගේ බොක්සිං නොතිබුණා නම් මං අද ලොකු අමාරුවක වැටෙනවා.'

'ඉතිං කියන්න මොකක්ද සිද්ධ වුණේ කියල'

'ඔබට මතක නේ මං ඔබට රෙකමදරු කළ ගමේ පොදු අවන්හල? මං ඊකෙ තැබෑරුමට වෙලා, ඒකෙ අයිතිකාරයගෙන් වලව්ව ගැන තොරතුරු විපරම් කළා. තැබෑරුම අයිතිකාරයත් කිසිම අඩුවක් පාඩුවක් නැතුව මට ඕන කරන විස්තර ඔක්කොම කියන්න පටන්ගත්තා.

විලියම්සන් කියන්නෙ සුදු රැවුලක් තිබෙන ටිකක් වයස්ගත කෙනෙක්. ඔහු වලව්වෙ ජීවත්වෙන්නෙ තනියමයි. ගෙදර වැඩ කටයුතු සඳහා සේවකයන් කිහිප දෙනෙක් ඉන්නවා. එක්කෝ ඔහු දේවගැතිවරයෙක් නැත්නම් දේවගැතිවරයෙක් හැටියට ඉඳලා අයින්වුණු කෙනෙක් බවට කට කථාවක් තිබෙනවා. කොහොම වුණත් ගතවුණු කෙටි කාලය තුළ වලව්වේ වුණු සිදුවීමක් දෙකක් මට අහන්න ලැබුණා. ඒවා යාජක වරුන්ට නුසුදුසු ඒවා ලෙසයි මට නම් පෙනෙන්නේ.

http://sherlockholmesinvestigations.blogspot.com

මං පුජක පරිපාලන ආයතනයකින් හොයලා බැලුවා. විලියම්සන් යන නමින් දේවගැති වරම් ලැබූ කෙනෙක් සිටින බවත් ඔහුගෙ කල්ක්‍රියාව ඉතාම අයහපත් නිසා, දේවගැති තත්ත්වයෙන් පහකර ඇති බවත් ඔවුන් මට කිව්වා.

අර තැබෑරම් අයිතිකාරයා මට තවත් තොරතුරු කිව්වා. සාමාන්‍යයෙන් සති අන්තවල මේ වලව්වට අමුත්තන් පැමිණෙනවලු.

'ඔවුන් බොහොම ක්‍රියාශීලි පුද්ගලයින් මහත්මයා. ඔනන නිතරම ඉන්නවා රතු උඩුරැවුලක් තියෙන මහත්තයෙක්, වුඩ්ලි කියලා........'

මේ වෙලාවේ තැබෑරුම්කාරයාගෙ කථාවට බාධාකරමින් කෙනෙක් එතැනට ආවා. ආවේ කවුරු කියලද වොට්සන් හිතන්නෙ? වෙන කවුද වුඩ්ලි මියක් ! එල්ලපු කාමරේ මත්පැන් බිබී, ඔහු අපේ කතා බහ සම්පූර්ණයෙන්ම අහගෙන ඉදලා! ඔහු ආව ගමන් මට තර්ජනය කරමින් ඇහුවේ නැද්ද?

'තමුසෙ කවුද? මොනවද තමුසෙට ඕනාවෙලා තියෙන්නෙ? මොනවටද මේ ප්‍රශ්න අහ අහ තොරතුරු හොයන්නෙ? තමුසෙ ඔය මොකාටද එන්න ලෑස්ති වෙන්නෙ?'

ඔහුට තිබුණා හොඳ වාග් නිපුණත්වයක්. මට බැණ වදින එක ඔහු අවසන් කලේ වම් අතින් මිට මොලවලා මට එල්ල කළ දරුණු පහරකින්. මට එක්වරටම ඒක වලක්වගන්න බැරිවුණා.

ඊට පස්සෙ ඇතිවුණු ජවනිකා බොහොම විනෝදජනකයි. රස්තියාදුකාර තක්කඩියෙකුගේ අප්‍රමාණවත් මුෂ්ටි ප්‍රහාර වලට එරෙහිව මගේ ක්‍රමානුකූල තොක්සි. මගේ තලලෙයි තොලෙයි හැටි ඔබට පෙනෙනවා නේද?

ඒ වුණත් වුඩ්ලි මහත්මයා ගෙදර ගෙනයෑමට කරත්තයකට පටවන්න සිද්දවුණා. නැබැයි මං පිළිගන්නවා, සරේ ප්‍රාන්තයට ඔබ ගිහිං ලබාගතිපු ප්‍රයෝජනයට වඩා වැඩි යමක්, මගේ ගමනෙනුත් ලැබුණෙ නැහැ කියල

http://sherlockholmesinvestigations.blogspot.com

බ්‍රහස්පතින්දා අපට ජේම්ස් මෝටිමර්ගෙන් නවත් ලිපියක් ලැබිණි.

මං හැරුතර්ස් මහත්මය ළඟ රැකියාවෙන් අස්වෙන්න තීරණය කළ බව අහලා ඔබ පුදුමයට පත්වෙන එකක් නැහැ. වැටුප ඉතා හොඳ එකක්. ඒ වුණත් මෙහි ඇති අපහසුතාම තව දුරටත් විඳ දරා ගැනීමට නොහැකියි. ඒ නිසා මට රැකියාවේ තවදුරටත් රැඳී ඉන්න අපහසුයි. මේ සෙනසුරාදා මං ආපසු ලන්ඩනයට එනවා. යළිත් රැකියාවට යාමට මගේ බලාපොරොත්තුවක් නැහැ. හැරුතර්ස් මහත්මයා අශ්ව කරත්තයක් සූදානම්කර තිබෙනවා. ඒ නිසා පාළු පාරේ යම් කිසි අවදානමක් තිබුණා නම්, ඒකත් දැන් අවසන්.

මං මේ රැකියාවෙන් ඉවත්වීමට හේතුව ඔබට කියන්නම්. ඊට හේතු වුණේ හැරුතර්ස් මහත්මයා සමඟ ඇතිවූ හිතවත් කම පළුදුවීම නෙමෙයි. අර නින්දිත ජනගත මිනිහා වුඩ්ලි යළිත් මේ පැත්තට සම්ප්‍රාප්ත වෙලා. ඔහු කොහොමටත් හරි අප්‍රසන්න කෙනෙක්. නමුත් ළඟදී ඔහු හදිසි අනතුරකට මුහුණ පාලා වගෙයි දැන් මුහුණ දිහා බලන්න බැරි තරමට විරූපීවෙලා. දැන් වඩාත් අප්‍රසන්නයි. මං ජනේලයෙන් ඔහුව දුටුවා. නමුත් ඔහුව මුහුණට මුහුණ හමුනොවුණු බව කියන්නේ ඉතාමත් සතුටින්. ඔහු හැරුතර්ස් මහත්මයා සමඟ දීර්ඝ කතාබහක යෙදුණා. එයින් පස්සේ හැරුතර්ස් මහත්මයා සිටින්නේ බොහොම කැළඹුණු ස්වභාවයෙන්. වුඩ්ලි පදිංචිව ඉන්නේ මේ කිට්ටුව කොහේ හරි වෙන්න ඇති. ඒ මොකද ඔහු ඊයේ රාත්‍රිය ගතකළේ මෙහේ නෙමෙයි. නමුත් ඔහු අද උදේම මිදුලේ ගස් අතර ඇවිදිමින් සිටිනු හැටි මං දුටුවා. මං දන්නවා වැඩි කල් නොගිහිං මේ අවට රුදුරු වනමෘගයෙකු ගැවසේවි. වචනයෙන් විස්තර කිරීමට බැරි තරම් මං ඔහුට බයයි. ඒ වගේම මට ඔහු පිළිකුල්. හැරුතර්ස් මහතා, මේ වගේ තුච්ඡ මිනිහෙක් ආශ්‍රය කරන්නේ කොහොමද? කොහොම වුණත් කමක් නෑ. මගේ ප්‍රශ්න ඔක්කොම, සෙනසුරාදා අවසන් වෙනවා.

'මාත් හිතනවා වොට්සන්, මාත් හිතනවා එහෙම වේවි කියලා' හෝම්ස් කීවේ මහත්සේ කැළඹුණු අයුරෙනි.

'මේ තරුණ කෙල්ල වටේ මොකක්දෝ සටකපට කුමන්ත්‍රණයක් ගොඩනැගෙමිනුයි තියෙන්නේ. අන්තිම සැරේට



255. රස්තියාදුකාර තක්කඩියෙකුට එරෙහිව මගේ ක්‍රමානුකූල බොක්සිං.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇය එහෙත් එද්දී තමාගේවත් හිරිහැරයකට ලක්වන්නට ඉඩ නොතබා ඇයව බේරා ගැනීම අපේ වගකීමක්. මං හිතන්නේ වොට්සන් සෙනසුරාද උදේ අපි පාන්හැම් වලට ගියොත් හොඳයි.

මේ පුදුමාකාර පරීක්ෂණයේ අවසානය ඛේදජනක එකක් නොවීමටා වග බලාගනිමු'

පිරිමියකු සුරූපී කාන්තාවක එක්තුරා මගරැක සිට, ඇය පසුපස යෑම අප නොඇසූ දෙයක් නොවේ. එහෙත් මේ වුඩ්ලි නම් අශිෂ්ඨයා අමුතුම තාලේ පුද්ගලයෙකි. මේ දක්වාත් ඔහු වයලට් ස්මිත් මෙනෙවියට හිරිහැර කිරීමට තැත්කර ඇත්තේ එක් වතාවක් පමණක් බව සැබැය. ඇය කැරුතර්ස් මහතාගේ නිවසේ සිටිනා බව ගණනකට නොගෙන, වුඩ්ලි යළිත් අම නිවසට පැමිණීමට පටන්ගෙන ඇත. බයිසිකලයෙන් ලුහුබඳින පුද්ගලයා, චාලිංටන් වලව්වේ පවත්වන සති අන්ත සාදවලට සහභාගි වන්නෙකු විය යුතුය. ඔහු කවුද, ඔහුට උවමනා වී ඇත්තේ කුමක්ද යන්න තවමත් පැහැදිලි නැත. හෝම්ස් මේ ගැන විමසීමෙන් යුතුව කථා කළ ආකාරයත් ඔහු පිටත්වීමට පෙර රිවෝල්වරය සාක්කුවට දමාගැනීමත් මගේ සිතේ අනතුරු ඇඟවීමේ රතු එළිය දැල්විය. මේ සිද්ධීන් මාලාව පිටුපස යම් භීෂණයක් සැඟවී ඇතැයි මට සිතිණි.

කලින් ද රාත්‍රියේ පැවැති තද වර්ෂාව අවසන් වී, උදෑසන හිරු දීප්තිමත්ව බැබැළිණි. හේමන්තයේ මදනල පහස විඳිමින් හෝම්ස් හා මම පාන්හැම් දුම්රිය පොළේ සිට වැටී තිබුණු පාර දිගේ ඇවිද ආවෙමු. කෲක්ස්බරි කන්ද නැග එද්දී චාලිංටන් වලව්වේ මුදුන ඕක් ගස් අතරින් අපේ දෑස් වලට හසුවිය.

එක් පසෙකින් වනලැහැබත්, අනෙක් පසින් දුඹුරු පැහැති මුඩු බිමත් මැදින්, පීත්ත පටියක් මෙන් වැටී තිබුණු මාර්ගය , හෝම්ස්ගේ දැඩි අවධානයට ලක්වෙමින් තිබිණි. පාරේ ඈතම කෙළවරින් චලනය වන කළු තිතක් අප්ට දකින්නට ලැබිණි. එය අශ්ව කරත්තයක් බවු මද වේලාවකදී අපි හඳුනාගත්තෙමු. නොඉවසිලිමත් බව පළකරන හඬක් හෝම්ස්ගේ මුවෙන් නිකුත් විය.

Personal Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

'ඇය දුම්රියට ඇය භාගයකට කලින් පිටත් වේවි කියලයි මං හිතුවෙ. නමුත් ඔය එන්නෙ ඇය එන අශ්ව කරත්තය නම්, ඇය එනවා ඇත්තෙ, කලින් පිටත්වෙන දුම්රිය අල්ලන්න වෙන්න ඇති. ඒකෙන් වෙන්නෙ අපි එතැනට ළඟාවෙන්න කලින් ඇය වාලිංටන් පහුකර ඒවි'

කන්ද බැස තවත් ඉදිරියට යද්දී ඉදිරියට එන අශ්ව කරත්තය අපි දුටුවෙමු. අපි ගමන ඉක්මන් කළෙමු. හෝම්ස් ඉතා වේගයෙන් ඉදිරියට දිවයෑමට පටන් ගත්තේය. ඔහු තරම් වේගයෙන් යාමට මට හැකියාවක් නොතිබිණ. මට යාර සියයක් පමණ ඉදිරියෙන් ගිය ඔහු දෑතවරම ප්‍රාණේ නැවතිණි. බලාපොරොත්තු කඩවීම හා කණස්සල්ල පළකරමින් ඔහු දෑත් ඔසවන සැටි, මම දුටුවෙමි. අශ්වයකු බැඳ තිබූ කුඩා බක්කි කරත්තය ඒ මොහොතේම වංගුවෙන් මතුවිය. අශ්වයා ඌට පහසු ආකාරයෙන් ඇවිදිමින් මෙන් සෙමින් ඉදිරියට ආවේය.

'අපි ප්‍රමාද වුණා වැඩියි වොට්සන්. හොඳටම ප්‍රමාදයි. ඇය කලින් දුම්රිය අල්ලන්න එයි කියල මං නොහිතපු හැටි මෝඩයෙක් වගේ ! ඔවුන් ඇයව පැහැරගෙන ගිහිං වොට්සන් ! මේව මහ අපරාධ ! දෙයියො තමයි දන්නෙ මොනව වෙලාද කියල. පාර අවහිර කරලා අශ්වයව අල්ල ගන්න. අන්න හරි. දැන් කරත්තෙට නැගල ආපහු හරවගමු. බලමු මගේ අතපසු වීමෙන් සිදුවෙච්ච වරද හදගන්න පුළුවන්ද කියලා'

කරත්තයට නැග ගත් විගස අවේගයෙන් අශ්වයා මෙහෙයවූ හෝම්ස්, අපේ ගමන කඩිනම් කිළේය. අශ්වයා ගමන් කළේ ඉගිලෙන්නාක් මෙන් වේගයෙනි. වංගුව පසුකොට මුඩුබිමත්, වලව්වේ වනලැහැබත් අතර පාර අඩවිය පසු කළා පමණි. හිස ඉදිරියට නැඹුරු කරගෙන ඉතා වේගයෙන් අප ඉදිරියට බයිසිකලයක් පැද එන්නෙකි.

'අන්න මිනිහා !', මට කෑගැසිණ.

හිස ඔසවා බැලූ ඔහු, අප කරත්තයෙන් ඉදිරියට එමින් සිටි අයුරු දුටුවේය. කරත්තය දෙස හොඳින් බැලූ ඔහු, එක්වරම



258. "අපි ප්‍රමාද වුණා වැඩියි වොට්සන්! හොඳටම ප්‍රමාදයි!"

http://sherlockholmesinvestigations.blogspot.com

බයිසිකලය නවත්වා බිමට බැස්සේය. අඳුරු මෙන් කළු රැවුල නිසා ඔහුගේ සුදුමැලිව තිබූ මුහුණ වඩාත් කැපී පෙනිණ. ඔහුගේ මුහුණෙන් මතුවූයේ විස්මයට පත් ලකුණුයි.

'ඒයි ඒයි නවත්වනවා' යයි කෑගැසූ ඔහු, බයිසිකලය පාර හරහා දමා, පාර අවහිර කළේය.

'කොහෙන්ද ඔහේලට මිය කරත්තෙ ලැබුණේ? නවත්තනවා මිනිහෝ ! ඔහු කෑගැසුවේ සාක්කුවෙන් රිවෝල්වරයක් එළියට අදිමිනි.

'දෙයියන්ගෙ නාමෙන් මිය කරත්තෙ නවත්තපල්ලා. නැත්නම් මං මේ අශ්වයට වෙඩි තියනවා'

කරත්තය නවතා, අශ්වයාගේ රේන්ස් ලණුව මා අතට දුන් හෝම්ස් කරත්තයෙන් බැස්සේය.

'ඔහේ තමයි අප්ප ඕනකරන මිනිහා. කෝ වයලට් ස්මිත් මෙනෙවිය?' හෝම්ස් ඇසුවේය.

'ඒක තමයි මටත් ඔහේලගෙන් අහන්න තියෙන්නෙ. මේ ඇයව එගෙන ආපු අශ්ව කරත්තෙ. ඇයට මොකද වුණේ කියල දන්නව ඇත්තෙ ඔහේල'

'අපට කරත්තෙ මගදී හම්බවුණා. ඒකෙ කිසිකෙනෙක් හිටියෙ නෑ. අපි ඒ නෝනට උදව් කරන අදහසින් තමයි මේකත් ආපහු පදවාගෙන ආවෙ'.

'අනේ දෙවියනේ ! අනේ දෙවියනේ ! මං දැන් මොකද කරන්නේ? ඔහු කෑගැසුවේ අසරණ වූ අයුරෙනි.

'උන් ඇයව පැහැර ගෙන ගිහිං. අර වනචර බල්ලා වුඩ්ලියි තක්කඩි පූජකයයි තමා මේක කරන්න ඇත්තේ. ඉක්මන් කරනවා! මනුස්සයෝ ! ඔහේල ඇයව බේරාගන්න මට උදව් කරනවා. වාලි·ටත් කැලෑවේ මට මැරුම් කරන්න වුණත් ඇයව බේරාගත යුතුයි.'

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු පිස්තෝලය අතැතිව 'යූ' ගස් වැටේ කපොල්ලක් වෙත දිව ගියේය. එයින් රිංගූ ඔහු, ගස් අතරින් ඉදිරියටම දිව්වේය. අපි ඔහු පසුපසින් දිව ගියෙමු.

'ඔවුන් ගිහින් තියෙන්නේ මේ පැත්තෙන් තමයි' දිය කඩිත්තක් අසල මඩවගුරක සලකුණු වී තිබූ අඩිසටහන් කිහිපයක් පෙන්වමින් ඔහු කීය.

'ඔහොම ඉන්න බලන්න. මේ පඳුරු අස්සේ කවුරු හරි ඉන්නවා. ඒයි කවුද ඔය පඳුරු අස්සේ ?'

අවුරුදු දහඅටක පමණ තරුණියෙක් හිසේ ලොකු කැපුම් තුවාලයක් ද සහිතව උඩුබැලි අතට වැදී සිටියේය.

'මේ තමයි අශ්ව කරත්තය පදවාගෙන ආපු සේවකයා, පීටර්. උන් මොහුව පහර දීල.'

හිසේ තුවාලය එතරම් බැරෑරුම් නොවූ බවත්, ඔහු සිටියේ මියගොස් නොව සිහිවිසඳුව බවත් මම එවෙලෙහිම තේරුම් ගතිමි.

'එහෙම නම් ඔහු මෙහෙම තියන්නේ. අපි යමු ඇයව බේරාගන්න'

ගස් අතරින් වැටී තිබුණු අඩිපාරේ අපි හැකි තරම් වේගයෙන් දිව ගියෙමු. වලව්වට සමීප, පඳුරු සහිත පෙදෙසේදී හෝම්ස් නැවතුණේය.

'ඔවුන් ගෙදරට ගිහිං නැහැ. මෙන්න ඔවුන්ගේ අඩි සටහන්......... වම් පැත්තට...... මෙහෙන් එන්න. අර බලන්න. පඳුරු අතරේ....... මං කිව්වේ'

හෝම්ස් එසේ පවසද්දී තරුණියක යටිලගුරෙන් නගන විලාප හඬ කැලෑවෙරොද දෙසින් ඇසිණ.

'මේ පැත්තෙන් ! මේ පැත්තෙන් ! අර ඉන්නේ. අර ඉන්නේ පාපිෂ්ඨ බල්ලෝ. ! මහත්වරුනි ඔහේල මගේ පස්සෙන් එන්න ! අනේ ජන් ජිවුල්ලියර් මහත්තයා කෑගැසුවේය.

Reading Purpose Only, Not For Print

...blogspot.com



"අර ඉන්නේ ! අර ඉන්නේ පාපිෂ්ඨ බල්ලෝ"

http://sherlockholmesinvestigations.blogspot.com

'අපි ප්‍රමාද වැඩියි ! අනේ මිදේයිගෙන් ප්‍රමාද වැඩියි!'

අප එක්වරම ශිවිධියේ ඉදිරැණි වෘක්ෂ වලින් වටවුණු තණකොළ වවා තිබූ එළිමහන් බිමකට ය. එහි කෙළවර විශාල ඕක් ගහක් සෙවණේ පුද්ගලයින් කිහිපදෙනෙකු සිටිනු අපි දුටුවෙමු. අඩ සිහියෙන් මෙන් සිටි කාන්තාව වයලට් ස්මිත් මෙනෙවියයි. තවත් නැගැසීමට නොහැකි වන සේ ඇගේ කට වසා ලේන්සුවකින් තදින් ගැටගසා තිබිණි. රතු රැවුලක් ඇති මැරවර පෙනුමක් තිබූ තරුණයෙකු ඇය ඉදිරියෙන් සිටියේය. එක් අතක් හිණේ තබාගෙන සිටි ඔහු අනෙක් අතින් අශ්වයන්ට තලන කසයක් ලෙලවමින් සිටියේය. ඔහුගේ මුහුණේ තිබුණේ ජයග්‍රාහී සිනහවකි. ඒ දෙදෙනාට මැදින් සුදු පැහැති රැවුලක් සහිත වයස්ගත පුද්ගලයෙක් සිටියේය. එවිට ඇඳුම කට්ටලයට උඩින්, දේවගැතිවරුන් අඳින සුදු ලෝගුවක් හැඳ සිටි ඔහු, තම අත තිබූ යාච්ඤාපොත සාක්කුවේ දමාගන්නේය. ඒ, තරුණයා හා තරුණිය විවාහ කිරීමේ දේව මෙහෙය ඔහු අවසන් කළ මොහොත බව මම තේරුම් ගතිමි. මැරවර මනාලයාගේ පිටට තට්ටු කරමින් දේවගැතිතුමා සුභ පැතුවේය.

'ඔවුන් කසාද බන්දවලා අවසන්?' මම ඇසීමි.

'යමු ! යමු ! අප සමග සිටි නැනාත්තා කැගැසුවේ අඩියට දෙකට එළිමහන් බිම හරහා දිව යමිනි. අප එතැනට ළං වෙද්දී ස්මිත් මෙනෙවිය ක්ලාන්ත ගතියෙන් මෙන් ඕක් ගසට හේත්තු වූවාය. දේවගැතිවරයා අප දෙසට හිස පහත් කළේ බොරු ආචාරශීලීත්වයක් පෙන්වමිනි. වුඩ්ලි උඩඟු ආකාරයට මහ හඬින් සිනාසීමට පටන් ගත්තේය.

'ඔය බොරු රැවුල ගලවලා දානවා බොබ්. ඕක දැම්මට මට තමුසෙව අඳුනාගන්න පුළුවනි. තමුසෙයි තමුසෙගෙ යාළුවො ටිකයි හොඳ වෙලාවට ආවෙ. මේන්න හමුවෙන්න මගේ බිරිඳ වුඩ්ලි මහත්මිය'

අපේ රැවුල්කාර මිත්‍රයා ඊට දැක්වූයේ පුදුමාකාර ප්‍රතිචාරයකි. ඔහු තම මුහුණ වටා තිබූ බොරු රැවුල ගලවා බිමට විසි කළේය.



ඔහු ඉදිරියට එන් වුඩ්ලි වෙත රිවෝල්වරය එල්ල කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්පසු, තම අත තිබූ කසය ලෙළවමින් ඉදිරියට එන වුඩ්ලි වෙත රිවෝල්වරය එල්ල කළේය.

"ඔව් මම තමයි බොබ් කැරුතර්ස්. මට එල්ලුම් ගස් යන්න සිද්ධ වුණත් මේ අහිංසක තරුණියට වුණු වැරැද්ද නිවැරදි කරන්නට ඕන. මං උඹට කල් ඇතුව කිව්වා ජැක්: මේ කෙල්ලට මොකුත් හිරිහැරයක් කළොත් මං උඹට කරන දේ කිව්වා. දෙයියම්පා! මං කිව්වොත් ඒ වචනේ ඒ හැටියටම ඉෂ්ඨ කරනවා"

"උඹ පරක්කු වැඩියි මිනිහෝ ! දැන් ඇය මගේ බිරිඳ"

"නෑ. ඇය උඹේ වැන්දඹු බිරිඳ!"

ඒ සමගම ඔහු අත තිබූ රිවෝල්වරයෙන් මහ හඬක් නිකුත් විය. වුඩ්ලිගේ පපුව දෙසින් ලේ විසිවෙනු මම දිටිමි. විලාප නගමින් පපුවට අත තබාගත් වුඩ්ලි, කැරකී ගොස් පිටුපසට ඇද වැටුණේය. හිටපු දේවගැතිතුමා සාක්කුවෙන් පිස්තෝලයක් ඇද ගත්තේ, මා කිසිදක නොඇසූ තරම් නරක වචනයෙන් ශාප කරමිනි. එහෙත් ඔහු එය ක්‍රියාත්මක කිරීමට පෙර හෝම්ස්ගේ රිවෝල්වරය ඔහු වෙත එල්ල විය.

"ඒ ඇති. දනවා ඔය පිස්තෝලේ බිම ! හෝම්ස් කෑගැසීය.

"වොට්සන්. ඒක ඇහිඳගෙන ඔය මිනිහගෙ ඔලුවට එල්ල කරල තියාගන්න. අන්න හොඳයි. කැරුතර්ස් දෙනවා ඔහේගෙ පිස්තෝලෙත් මෙහාට. ඉක්මන් කරනවා"

"ඔහේ කවුද?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ !

"ඒ කියන්නේ ඔහේ මං ගැන අහල තියෙනවා ? පොලීසිය එනතුරු මං ඔවුන් වෙනුවෙන් රාජකාරිය ඉටු කරන්නම්. ඒයි ! ඔහේටයි කතා කළේ. මෙහාට එන්න ඉක්මනින් කණකිම

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

කෙළවරට පැමිණ හිනියයන් බලා සිටි සේවකයෙක් දැක හෝම්ස් කෑගැසීය.

'මෙහේට එන්න. මේ ලියුම් කෑල්ල පුළුවන් තරම් ඉක්මනට ෆාන්හැම් පොලීසියට අරගෙන යන්න. එහේ පොලිස් අධිකාරී තුමාට මේක භාරදෙන්න. ඔහු එනතුරු තමුසෙල මගේ අත් අඩංගුවේ'

හෝම්ස්ගේ තේජවන්ත භාවය ඉදිරියේ ඔවුහු රූකඩ මෙන් පසුබා සිටියහ.

'ගෙනියනව මේ තුවාලකාරයාව ගේ ඇතුළට' ඔහු විලියම්සන්ට හා කැරූතර්ස්ට නියම කළේය.

'වොට්සන් ඉස්සර වෙලා බලන්න ස්මිත් මෙනෙවියට කොහොමද කියල. ඊට පස්සෙ මේ තුවාලකාරයා වත් පරීක්ෂා කරල බලන්න'

තුවාල ලැබූ වුඩ්ලි ඇඳක හොවා මම ඔහු සෝදිසි කළෙමි.

'වුඩ්ලි මැරෙන එකෙක් නෑ' මම කීවෙමි

'මොනවා?' කැරූතර්ස් කෝපයෙන් කෑගැසුවේ ඔහු වාඩිවී සිටි පුටුවෙන්ද නැගිටිමිනි.

'මං ඉස්සර වෙලා ඌව ඉවර කරලා හිටින්නම්. ඔහේල කියන්නේ පුංචි සුරංගනාවියක් මගේ වුණාලුව, අර යක්ෂයා ජැක් වුඩ්ලිගේ බිරිඳ වෙන්න ඉඩ තියන්නී කියලද?'

'ඔබ ඒ ගැන කලබල වෙන්න ඕනෙ නෑ'

ඒ හෝම්ස්ය.

'ඇය මොනම ආකාරයකින් වත් ඔහුගේ බිරිඳ නොවීමට කාරණා දෙකක් තියෙනවා. මුලින්ම අපි අහල බලමු විවාහයක් සිදු කරන්න විලියම්සන්ට නීතියෙන් බලයක් තියනවද කියලා?'

http://sherlockholmesinvestigations.blogspot.com

'මං පූජකවරයෙක් ලෙස දිවුරුම් දීල ලෝගු ඇඳපු කෙනෙක්'

'ඒ වගේම ලෝගු ඉවත්කරලා පූජක තනතුරෙන් පහකරපු කෙනෙක්' හෝම්ස් කීය.

'එක , පැරයක් පූජකවරයා හැමදමත් පූජක වරයෙක්' විලියම්සන් කීය.

'මම නං එහෙම හිතන්නේ නෑ. කෝ මේ විවාහය සිදු කරන්න බලපත්‍රයක් තන්නද?'

'ඔව්. විවාහ බලපත්‍රය මං ළඟ තියෙනවා, මගේ සාක්කුවේ'

'ඔහේ මොනවා හරි ප්‍රයෝගයකින් ඒක ලබාගත්ත එක ඇත්ත වෙන්න පුළුවනි. ඒත් අදපස්සයේම කැමැත්ත නැතුව බලෙන් කරන විවාහයක් නීතියක් වලංගු නෑ. ඒ විධියට බලෙන් විවාහ කරවීම බරපතල අපරාධයක්. ඔහේට ඒ ගැන හොඳ හැටි කල්පනා කරල බලන්න නිරගෙදරදී අවුරුදු දහයක් විතර ලැබේවි. කැරුතර්ස් මහත්මයා, ඔහේගෙ පිස්තෝලේ සාක්කුවෙම තියෙන්න ඇරිය නම් ප්‍රතිඵල මීට වඩා හොඳ වෙන්න ඉඩ තිබුණා.'

'මටත් දැන් එහෙම හිතෙනවා හෝම්ස් මහත්මයා. ඒ වුණත් කල්පනා කරල බලන්න. ඇයව ආරක්ෂා කරගන්න මං මොන තරම් උත්සාහයක් දැරුවද? මං ඇත්තෙන්ම ඇයට අවංකව ආදරය කළා. දකුණු අප්‍රිකාවෙ ජයානකම මැරවරයා ජැක් වුඩ්ලි ඇයව බලෙන් අයිති කරගන්නවා කිව්වාම මාව පිස්සු වැටුණා. කිම්බර්ලි ඉඳල ජොහැන්නස් බර්ග් දක්වා මුළු රටම භයෙන් ත්‍රස්ත කළ, ඒ අපරාධකාරයාට වයලට්ව භාරදීල මං නිකං බලාගෙන ඉන්නේ කොහොමද? හෝම්ස් මහත්මයා. ඔබ විශ්වාස කරන එකක් නෑ: මේ ගෑනු ළමයා මගේ ගෙදර රස්සාවට ආව දවසෙ ඉඳල, කිසිම දවසක ඇයට මේ හරියේ තනියෙන් යන්න මං ඉඩ ඇරියෙ නෑ. මේ තක්කඩින්ගෙන් ඇයට හිරිහැරයක් සිදු වෙන්න ඉඩ තියෙන බව මං දැනගෙනියා. හැමදමත් ඇගේ ප්‍රවේසමට පිටිපසින් මං බයිසිකලයෙන් ආවා. ඇයට මාව හඳුනාගන්න බැරිවෙන්න මං බොරු රැවුලක් දමාගෙන ඇඳුම් ඇඳගෙන තරම්

Reading Purpose Only, Not For Print

දුරින් ආවා. ඇය බොහොම හොඳ ගතිගුණ ඇති, වැදගත් විදියට හැදුණු ගැහැනු ළමයෙක්. මේ ගම්බද පාර පාරවල ඈ පිටිපස්සෙන් මං බයිසිකලයෙන් එනවා කියල දැනගත්ත නම්, මගේ ළඟ රස්සාවෙ දිගටම රැඳී ඉන්න එකක් නෑ කියල මට හිතුණා'

'මොවුන්ගෙන් එල්ල විය හැකි අනතුරුදායක තත්වය ගැන ඔබ ඇයට නොකිව්වේ ඇයි?'

'එහෙම කිව්ව නම් ඒත් ඇය රස්සාව අත්හැරදල යනවා. මට ඒක දරන්න බැහැ. ඇය මට ආදරය නොකළ එක ඇත්ත. ඒත් මගේ නිවස තුළ ඇගේ රූපය දකින එක, ඇගේ කටහඬ ඇහෙන එක පවා මට ලොකු සතුටක් වුණා.'

'කැරුතර්ස් මහත්තයා, ඔබ ඒකට කියන්නේ ආදරය කියල වෙන්න ඇති. නමුත් මං කියන්නේ ඒක ආත්මාර්ථකාමීත්වය කියලා'

මම කීවෙමි.

'වෙන්න ඇති. ඒ දෙකම එක ළඟින් පවතින ඒව දෙකක් නෙ. ඒ ඇරත් මේ තක්කඩියන් ගෙන් ඇයව බේරාගන්න කෙනෙක් ළඟමනා වෙලයි තිබුණෙ. දකුණු අප්‍රිකාවෙන් විදුලි පණිවුඩයක් ආවාම මං දැනගත්තා උන් සැලසුම ක්‍රියාත්මක වෙන බව'

'මොන විදුලි පණිවුඩයද?'

'මෙන්න මේක' කැරුතර්ස් සාක්කුවට අත දමා විදුලි පුවතක් එළියට ගත්තේය. එහි සඳහන්ව තිබුණේ කෙටි පණිවුඩයකි.

'**තාත් මියගියා මළා**'

'මට දැන් සෑහෙනතරම් කාරණා සිද්ධවුණු හැටි. ඔහොම ඉන්න ගමන් ඔබට කීමට ඇති හැම දෙයක්ම අපට කියන්න'

හෝම්ස්, කැරුතර්ස්ගෙන් ඉල්ලා සිටියේය. එහෙත් ඊට ප්‍රතිචාරය ලැබුණේ මහලු විලියම්සන් නමැති ස්වාමියාගෙන්

පුපුරන්නා සේ ඔහු නරක වචනවලින් බැණ වදිමින් ශාප කරන්නට පටන් ගත්තේය.

"දෙයියම්පා ! කැරුතර්ස් උඹ අපේ රහස් එළිකරොත් මං උඹට දෙන්නෙ උඹ ජැක් වුඩ්ලිට දීපු දඬුවම. ගෑනු ළමයා ගැන උඹේ හිතේ ඇතිවුණු ආදර හැඟීම් ඕන එකක් කියාපං. ඒකෙන් අපට ප්‍රශ්නයක් නෑ. ඒත් මේ ප්‍රීතිගෝම් නැති පොලිස් කාරයට උඹේ යාළුවෝ පාවා දෙන්න හැදුවොත් ඒක උඹේ අවසානය කියල හිතාගනිං"

"අති ගෞරවණීය පූජකතුමනි. ඔබ වහන්සේ කලබල වෙන්න ඕන නෑ" හෝම්ස් කථාව පටන් ගත්තේය.

"ඔබ වහන්සේ හිර ගෙදරට යවන්න මට ඕනෑ තරම් සාක්ෂි තියෙනවා. මං මේ අවතාර කාරණා අනුවේ මට පෞද්ගලිකව ඇතිවුණු කුතුහලය නිසා. ඒ වුණත් කැරුතර්ස් මහත්තයා ඔහේට මේව කියන්න අපහසු නම්, කථා කරන කොටස මං කරන්නම්. එතකොට ඔහේලට තේරුම් ගන්න පුළුවන් හංගල තියාගන්න රහසක් ඔහේල ළඟ තියෙනවද කියලා.

මුලින්ම, මේ කුමන්ත්‍රණය සැලසුම් කරගෙන ඔබ තිදෙනා, කැරුතර්ස්, වුඩ්ලි හා විලියම්සන් දකුණු අප්‍රිකාවේ ඉඳල එංගලන්තයට ආවා?"

"අන්න බොරුව අංක එක." විලියම්සන් කිය.

"මාස දෙකකට කලින් මේ දෙන්නගෙන් එක්කෙනෙක් වත් මං දැකල නෑ. මං ජීවිතේටම අප්‍රිකාවට ගිහිල්ලත් නෑ. අනුන්ගේ දේවලට ඇඟිලි ගහන හෝම්ස්. ඒ කාරණාව ඔහේගේ පයිප්පය ඇතුළට දාලා හොඳට දුමළට උරන්න"

"ඔහුගේ කතාව ඇත්ත" කැරුතර්ස් කිය.

"හරි. ඔබ සහ වුඩ්ලි දකුණු අප්‍රිකාවේ ඉඳල එංගලන්තයට ආවා. ගෞරවනීය පූජක තුමා එංගලන්තයේ නිෂ්පාදනයක්. ඔබ දකුණු අප්‍රිකාවේදී රැල්ෆ් ස්මිත්ව දැනහැඳින්නගෙන සිටියා. ඔහු

Reading Purpose Only, Not For Print

වැඩිකාලයක් ජීවත් නොවෙන බවත්, ඔහුගෙ මුදලය හිමිවෙන්නේ ඥාති දියණියට බවත් ඔබ සොයා ගත්තා. හරිද?'

කැරුතර්ස් හිස සොලවා එය අනුමත කළේය.

'ඔහුගේ සමීපතම ඥාතිවරිය මියලට් මෙනෙවිය බවත්, මහලු රැල්ෆ් ස්මිත් අන්තිම කැමැති පත්‍රයක් නොලියන බවත් ඔබ තේරුම් ගත්තා?'

'ඔහු ලියන්න කියවන්න බැරි කෙනෙක්. අකුරු උගත් කෙනෙක් නෙමෙයි' කැරුතර්ස් කීවේය.

'ඔබ දෙදෙනා තීරණය කළා එංගලන්තයට ඇවිත් ඔහුගේ ඥාති දියණිය සොයාගන්න. ඇලැස්ම වුණේ දෙදෙනාගෙන් එක්කෙනෙක් ඇය හා විවාහ වෙන්න: ඔහු මුදලයෙන් කොටසක් අනෙකාට ලබාදෙන්න. මොකුත් හරි හේතුවක් නිසා ඇය හා විවාහ වීමේ අයිතිය ලැබුණේ වුඩ්ලිටයි. ඒ කොහොමද?'

'අපි දෙන්නා ඇයව මට්ටුමින අල්ලලා නැවෙදි කාඩ් සෙල්ලම් කළා. ඔහු දිනුවා'

'හරි. මේ තරුණ කාන්තාවට ඔබේ නිවසේ රැකියාවක් ලබා දුන්නේ, විවාහ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා වුඩ්ලිට අවස්ථාවක් ලබාදෙන්න. නමුත් වුඩ්ලි කියන්නේ බේබද්දා, මැරවර, සල්ලාලයකු බව ස්මිත් මෙනෙවිය හොඳින් තේරුම් ගත්තා. ඔහු දකින්නවත් ඇය කැමැති වුණේ නෑ. ඒ අතරේ ඔබ දෙදෙනාගේ වැඩ පිළිවෙළ නොසිතූ අතකට පෙරළුණා. ඒ කොහොමද? ස්මිත් මෙනෙවිය ගැන ඔබේ සිතේ ආදර හැඟීම් පහළවුණා. මේ තක්කඩියාට තරුණිය අයිතිවෙන්න අරින්න ඔබ කොහොමටවත් කැමැති වුණේ නෑ'

'දෙයියම්පා ඒ වගේ අපරාධයකට මං ඉඩ දෙන්නෙ කොහොමද හෝම්ස් මහත්මයා?'

'ඊට පස්සේ ඔබ දෙදෙනා අතර රණ්ඩුවක් ඇතිවුණා. ඔහු ජෝන්ස්ටන් ඔබ ස්මිත් හවුල් ශල්‍යදෙනුවෙන් ගුවන්වුණා. ඊළඟට

ඔබට නොදන්වා ඇයව කොහොම හරි අයිති කරගන්න ඔහු තනියම සැලැසුම් කළා'

'මං හිතන්නේ නෑ විලියම්සන් මේ මහත්තයට හංගන්න තවත් මොකුත් ඉතුරු වෙලා තියෙනවා කියල' කැරුතර්ස් කීය.

'ඔව් අපි දෙන්නා රණ්ඩු වුණා. ඔහු මට බිම ඇදවැටෙන්න පහර දුන්නා. කොහොම වුණත් ඒකට පළිය මං ඔහුගෙන් ගත්තා. ඊට පස්සේ ඔහු කොහේ ගියාද කියන්න මං දැන හිටියෙ නෑ. ඒතකොට තමයි ඔහු බොරු දේවගැතිවරයා හවුලට අරගෙන මෙහාට ගෙනාවෙ. දුම්රිය පොළට යන්න එන්න, ඇයට මේ හරිය පහුකරගෙන ගමන් කරන්න සිද්දවෙනවා. එයින් ප්‍රයෝජනය ගන්නා අදහසින්, ඔවුන් හිස්ව තිබුණු මේවලව්ව කුලියට ගෙන, මෙහේ පදිංචි වුණු බව මං දැනගත්තා. ඊට පස්සෙ තමා මං ඇයගෙ ප්‍රවේසම ගැන වැඩිදුර හිතුවේ. මොනවා හරි නරක දෙයක් සිද්ධවෙන්න ඉඩ තියෙනවා කියලා මට ඉවෙන් වාගේ වැටහුණා. මං වරින්වර ඔවුන් හමුවෙන්න ගියා. ඒ ඔවුන්ගේ සැලැසුම් මොනවද කියල දැනගන්න අදහසින්.

දින දෙකකට කලින් මේ විදුලි පුවතත් අරගෙන වුඩ්ලි මගේ නිවසට ආවා.

'ගිය දේ ගියාවේ බෝසී. දැන් රැල්ෆ් නාකියා මැරිලා. අපි කලින් ඇතිකරගනිපු ගිවිසුමේ හැටියට දිගටම කටයුතු කරන්න තමුසෙ කැමතිද? මං ඇයව කසාද බඳිනවා. තමුසෙ මට උදව් කරනවා. දෙයියම්පා ! මුදලෙයින් භාගයක් මං තමුසෙට දෙනවා' වුඩ්ලි කිව්වා.

'මට එපා. තමුසෙත් එක්ක මගේ ගිවිසුම් ඔක්කොම අහෝසියි. එච්චරයි'

'එහෙනම් තමුසෙ කැමතිද මේ ගෑනි එක්ක විවාහ වෙන්න?'

'මං බොහොම කැමතියි'

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

'ඒහෙනං ඇයව විවාහ කරගෙන මුදලෙන් මගේ කොටස මට දෙනවා' වුඩ්ලි කිව්වා.

'මං කැමති වුණාට ඇය මා එක්ක විවාහ වෙන්න කැමති නෑ. ඒකයි ප්‍රශ්නෙ' මම පිළිතුරු දුන්නා.

'ඉස්සර වෙලා අපි කවුරු හරි ඇයව බලෙන් කසාද බැඳ ගමු. සතියක් දෙකක් යනකොට ඔක්කොම හරියාවි'

'මම ඒකට කැමති නෑ. මැරවර කමෙන් ඒක කරන්න වත්, එවැනි වැඩකට තමුසෙට හවුල් වෙන්න වත් මං කැමති නෑ'

'බොබ් තමුසෙ මට හවුල් වෙන්නෙ නෑ එහෙනම්? හොඳයි බලමු. මං ඇයව කොහොම හරි කසාද බඳිනවා. තමුසෙ මහ වංචාකාරයා. මං තමුසෙටත් හොඳ පාඩමක් උගන්වනවා' මෙහෙම කිව්ව වුඩ්ලි මට ශාප කරමින් යන්න ගියා.

මේ සති අන්තයේ ඇය මා ළඟ රැකියාවෙන් ඉවත් වුණා. ඇයට දුම්රිය පොළට යන්න අශ්ව කරත්තයක් සූදානම් කළත්, ඇගේ ප්‍රවේශම ගැන මගේ හිතේ භයක් ඇතිවුණා. ඒ නිසයි මං බයිසිකලේ නැගල පිටිපස්සෙන් ආවෙ. මා දකින්න කලින් මේ දේ සිද්ධවුණා'

'මෙතනදී මගෙන් පොඩි අතපසු වීමක් වුණා. වොට්සන්. බයිසිකලයෙන් ආව නැනැත්තා ටයිපටිය, කොලරය එහෙම හරිගස්සාගෙන, වනලැහැබ ඇතුළට බයිසිකලයෙන් ගියා කියල ඔබ කිව්වා. ඒ පූර්ව නිරීක්ෂණයෙන්ම මා විසින් නිගමනය කළ යුතුව තිබුණා, හැමදෙයක්ම. කොහොම වුණත් මේ අසාමාන්‍ය විධියේ පරීක්ෂණය සාර්ථකව නිමකිරීමට ලැබීම සතුටට කරුණක්. අශ්ව කරත්තයේ රියැදුරාටත් මේ අපූරු මනමාල මහත්තයටත් ජීවිතේ බේරාගන්න හැකිවීමත් ලොකු දෙයක්.

වොට්සන් ගිහිං බලන්න ස්මිත් මෙනෙවියට කොහොමද කියලා. ඇයව ඇගේ අම්මා ළඟට ඇරලවන එක අපට භාරගන්න පුළුවන් කියන්න. ඇගේ තත්ත්වය ඒ තරම් සතුටුදායක නැත්නම්

http://sherlockholmesinvestigations.blogspot.com

මිඩ්ලන්ඩ් විදුලි සමාගමේ තරුණ ඉංජිනේරුවරයෙකුට විදුලි පණිවුඩයක් යවන්න පුළුවන් කියන්න. ඒකෙන් ඔක්කොම අමාරු හොඳ වේවි.

කැරුතර්ස් මහත්මයා, මේ දුෂ්ට කුමන්ත්‍රණයට ඔබ හවුල්කාරයෙක් වෙලා හිටියත්, පසුව හරි ඒකෙන් ඉවත්වෙලා නිවැරදි ආකාරයට ක්‍රියාකරල තිබෙනවා. ඒ නිසා ඔබට සමාවක් හිමිවිය යුතුයි. මෙන්න මහත්මයා මගේ කාඩ්පත. ඔබේ නඩුවේදී මගේ සාක්ෂි ඔබට ප්‍රයෝජනවත් වේවි කියල හිතනව නම්, ඔබට උදව් කරන්න මම සූදානම්.

* * *

වයලට් ස්මිත් මෙනෙවියට ඇගේ බාප්පා සතුව තිබූ විශාල ධනස්කන්ධයක් උරුම විය. සුප්‍රසිද්ධ විදුලි බල සමාගමක් වන මෝටන් හා කෙනඩි සමාගමේ අධ්‍යක්ෂවරයකු වන සිරිල් මෝටන් සමග වයලට් ස්මිත් විවාහ වූවාය. පැහැරගෙනයාම හා අඩන්තේට්ටම් කිරීමේ චෝදනාව යටතේ විලියම්සන් හා ජැක් වුඩ්ලිට විරුද්ධව නඩුව විභාගයට ගැනිණි. විලියම්සන් අවුරුදු හතකටද ජැක් වුඩ්ලි අවුරුදු දහයකටද සිරගෙට නියම විය. කැරුතර්ස්ට කුමක් සිදුවූවා දැයි මගේ සටහන් පොතේ සඳහන්වී නැත. භයානක මැරවරයකු ලෙස වුඩ්ලි නම් දරා සිටි නිසා, ඔහුට වෙඩි තැබීම ගැන කැරුතර්ස්ට සිර දඬුවමක් නියම වූවා නම් ඒ මාස කිහිපයකට විය යුතු යයි මම සිතමි.

**පාපැදියේ රැඹිනිය සමාප්තයි**

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only... Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ

# මළගිය ඇත්තෝ සාක්කි දෙති !



අභිරහස් ළමා කොල්ලය

මළගිය ඇත්තෝ සාක්ෂි දෙති!

අතුරුදන්වූ සිටුවරිය

රන් උපැස් යුගල

මරු කැඳවූ ලියුම

පාපැදියේ රූමතිය

ISBN 955-95930-9-9

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන